1981 ජූලි

# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1981 අංක 15 දරන.
# ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම
# පිළිබඳ පනත

---

[සහතිකය සටහන් කළේ 1981 මාර්තු මස 12 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1981 මාර්තු මස 13 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිළ : රු. 5.95 යි    තැපැල් ගාස්තුව : රු. 1.50 යි

# 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීම පිළිබඳ පනත

[සහතිකය සටහන් කළේ 1981 මාර්තු මස 12 වන දින]

එල්. ඩී.—ඕ. 55/80.

**ජනතාව විසින්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීම සඳහා ද ඊට සම්බන්ධ වූ හෝ ආනුෂංගික වූ කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීම පිළිබඳ පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

## I වන කොටස

## ප්‍රාරම්භය

කොමසාරිස්වරයා විසින් නාම යෝජනා කිරීමේ දිනය සහ ඡන්ද විමසීම පවත්වන දිනය පිළිබඳ දැන්වීමක් දිය යුතු බව.

2. (1) ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීම පැවැත්වීමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් (මෙහි මින් මතු "කොමසාරිස්වරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) මැතිවරණ කොමසාරිස්වරයාට නියම වන අවස්ථාවක, ඔහු විසින් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින්—

(අ) ඒ නියමය පළ කරන ලද දිනයෙහි සිට දින දහසයකට නොඅඩු හෝ එක් මාසයකට නොවැඩි දිනයක් අපේක්ෂකයන්ගේ නාම යෝජනා කිරීමේ දිනය ලෙස ද නාම යෝජනා කිරීමේ ස්ථානය ද නියම කරනු ලැබිය යුතු ය; තව ද

(ආ) නාම යෝජනා කිරීමේ දින සිට එක් මාසයකට නොඅඩු හෝ මාස දෙකකට නොවැඩි දිනයක් ඡන්ද විමසීම පවත්වන දිනය ලෙස නියම කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ (අ) ඡේදය හෝ (ආ) ඡේදය හෝ යටතේ නියම කරනු ලබන දිනය, පසළොස්වක පොහොය දිනයක් නොවන යම් දිනයක් හෝ 1971 අංක 29 දරන නිවාඩු පනතේ පළමුවන උපලේඛනයෙහි සඳහන් යම් ප්‍රසිද්ධ නිවාඩු දිනයක් නොවන යම් දිනයක් විය යුතු ය; තව ද, (1) වන උපවගන්තිය යටතේ නියමය පළ කරනු ලැබීමෙන් පසු, ඒ නියමයේ සඳහන් යම් දිනයක් ප්‍රසිද්ධ නිවාඩු දිනයක් ලෙස ප්‍රකාශ කරනු ලැබූ අවස්ථාවක, ඒ උපවගන්තියෙහි කාර්ය සඳහා ඒ දිනයේ දී කරන ලද යම් දෙයක වලංගු භාවයට ඒ ප්‍රකාශයෙන් කිසිම ආකාරයකින් බලපෑමක් සිදු නොවිය යුතු ය.

මැතිවරණ කොට්ඨාස, ඡන්ද ප්‍රදේශ සහ ඡන්ද කොට්ඨාස.

3. (1) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 97 වන ව්‍යවස්ථාව යටතේ ප්‍රකාශිත එක් එක් මැතිවරණ කොට්ඨාසය, මේ පනතේ කාර්ය සඳහා මැතිවරණ කොට්ඨාසයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) 1980 අංක 44 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනත යටතේ තත් කාලයෙහි බලාත්මකව පවත්නා එක් එක් ඡන්ද ප්‍රදේශය සහ එක් එක් ඡන්ද කොට්ඨාසය මේ පනතේ කාර්ය සඳහා ඡන්ද ප්‍රදේශයක් සහ ඡන්ද කොට්ඨාසයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

2—ඒ 51455—16,000 (81/04)

**ඡන්ද පොළවල්.**

4. (1) නාම යෝජනා කිරීමේ දිනයෙහි සිට සති දෙකක් ඇතුළත දී, කොමසාරිස්වරයා විසින් එක් එක් මැතිවරණ කොට්ඨාසයෙහි එක් එක් ඡන්ද කොට්ඨාසය සඳහා වූ ඡන්ද පොළ හෝ ඡන්ද පොළවල් පිහිටි ස්ථානය ද, ඡන්දදායිකාවන් සඳහා වෙනම ඡන්ද පොළක් වෙන්කර තිබේ නම් ඒ ඡන්ද පොළ පිහිටි ස්ථානය ද සඳහන් කරමින් දැන්වීමක් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීමට සැලැස්විය යුතු ය.

(2) යම් ඡන්ද කොට්ඨාසයක ඡන්දදායිකාවන් සඳහා වෙන ම ඡන්ද පොළක් සැපයීම යම් විශේෂ කරුණු නිසා අවශ්‍ය යයි හෝ යෝග්‍ය යයි කොමසාරිස්වරයා විසින් සලකනු ලැබුවහොත් මිස, එක් ඡන්ද කොට්ඨාසයක් සඳහා එක් ඡන්ද පොළක් මිස ඊට වැඩි ගණනක් ඡන්ද පොළවල් නොතිබිය යුතු ය.

(3) යම් ඡන්ද කොට්ඨාසයකට විශේෂ වූ කරුණු ගැන සැලකීමේ දී, ඒ ඡන්ද කොට්ඨාසයෙන් පිටත ඡන්ද පොළක් පිහිටුවීමට කොමසාරිස්වරයා විසින් තීරණය කරනු ලබන අවස්ථාවල දී හැර, එක් එක් ඡන්ද කොට්ඨාසය සඳහා වූ ඡන්ද පොළ හෝ ඡන්ද පොළවල් ඒ ඡන්ද කොට්ඨාසය ඇතුළත ම පිහිටා තිබිය යුතු ය. ඡන්ද පොළ පිහිටුවනු ලැබිය යුත්තේ ඡන්ද කොට්ඨාසයෙහි ඡන්ද හිමියන්ට අඩුම අපහසුතාවයක් සිදු විය හැකි ස්ථානයක ය.

(4) යම් ඡන්ද පොළක පිහිටීම, යම් හදිසි තත්ත්වයක් නිසා, (1) වන උපවගන්තිය යටතේ පළ කරන ලද දැන්වීමෙහි සඳහන් පිහිටීමට වඩා වෙනස් විය යුතු වන අවස්ථාවක, කොමසාරිස්වරයා විසින්, තම පරම අභිමතය පරිදි තීරණය කරනු ලබන ආකාරයකට ඒ ඡන්ද පොළෙහි පිහිටීම වෙනස් කිරීමට සලස්වනු ලැබිය හැකි ය.

**ඡන්ද හිමියන්ගේ නාම ලේඛන.**

5. මේ පනතේ කාර්ය සඳහා යම් මැතිවරණ කොට්ඨාසයක භාවිත කරනු ලැබිය යුතු ඡන්ද හිමියන්ගේ නාම ලේඛනය, 2 වන වගන්තිය යටතේ නියමය පළ කරනු ලැබීමෙන් පසුව අලුත් නාම ලේඛනයක් ක්‍රියාත්මක ව තිබුණ ද, ඒ නියමය පළ කරනු ලැබූ දිනයෙහි ඒ මැතිවරණ කොට්ඨාසය සඳහා ක්‍රියාත්මකව තිබුණු ඡන්ද හිමියන්ගේ නාම ලේඛනය විය යුතු ය.

**ඡන්ද හිමියන්ගේ නාම ලේඛනය ඡන්දය දීමට තිබෙන අයිතිය පිළිබඳ තීරණාත්මක සාක්ෂියක් වන බව.**

6. මේ පනත යටතේ තෝරා පත්කර ගැනීමක දී ඡන්දය දීමට යම් තැනැත්තකුට හිමිකමක් තිබේ ද හිමිකමක් නොතිබේ ද යන්න තීරණය කිරීමේ කාර්ය සඳහා, 5 වන වගන්තියෙහි සඳහන් ඡන්ද හිමියන්ගේ නාම ලේඛනයක් තීරණාත්මක සාක්ෂිය විය යුතු අතර, තත් කාලයෙහි ඒ නාම ලේඛනයෙහි නම ඇතුළත් ව තිබෙන යම් තැනැත්තකුගේ නම එසේ නාම ලේඛනයෙහි ඇතුළත් කිරීම සම්බන්ධයෙන් තත්කාලයේ බලපවත්නා යම් ලිඛිත නීතියක් යටතේ විභාගයට භාජනය වී තිබෙන යම් අභියාචනයකින් ඒ තැනැත්තාගේ ඡන්දය දීමේ අයිතියට හානිකර බලපෑමක් නොවිය යුතු ය. තව ද එවැනි අභියාචනයක් විභාගයට භාජනව තිබෙන අතරතුර, එවැනි යම් තැනැත්තකු විසින් දෙන ලද ඡන්දයක්, එවැනි අභියාචනයක් විභාගයට භාජනව නොතිබුණාක් මෙන් ශුද්ධ ඡන්දයක් විය යුතු අතර, අභියාචනයේ දී ගනු ලැබූ තදනන්තර තීරණයකින් එයට බලපෑමක් සිදු නොවිය යුතු ය :

එසේ වුව ද, දූෂණ ක්‍රියාවකට හෝ නීති විරෝධී ක්‍රියාවකට වරදකරු වීමේ හේතුවෙන් හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි විධිවිධාන අතුරින් යම් විධිවිධානයක හේතුවෙන් හෝ මේ පනත යටතේ යම් තෝරාපත්කර ගැනීමක දී ඡන්දය දීමට ශක්‍යතාවක් නොමැති යම් තැනැත්තකු විසින් ඒ තෝරා පත්කර ගැනීමේ දී ඡන්දය දෙනු ලැබුවහොත්, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ ඔහු වරදකරු කරනු ලැබූ විට, ඔහු රුපියල් පන් සියයක් නොඉක්මවන දඩයකට හෝ හය මාසයකට වැඩි නොවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ යටත් විය යුතු ය :

එසේ ම තවදුරටත්, 23 වන වගන්තිය යටතේ පෞද්ගලිකව ඡන්දය දීම හෝ 40 වන වගන්තිය යටතේ බහු ඡන්දය දීම සම්බන්ධයෙන් වූ විධිවිධාන කඩකිරීමක් නිසා යම් දණ්ඩනයකට යම් තැනැත්තකු යටත් වීම කෙරෙහි මේ වගන්තියෙහි සඳහන් කිසිවක් බල නොපෑ යුතු ය.

**තේරීම් භාර නිලධරයෝ.**

7. (1) කොමසාරිස්වරයා විසින්, අවස්ථානුකූලව අවශ්‍ය වන පරිදි, ගැසට් පත්‍රයෙහි දැන්වීමක් මගින් එක් එක් මැතිවරණ කොට්ඨාසයෙහි තේරීම් භාර නිලධරයා ලෙස යම් තැනැත්තකු නමින් හෝ නිලයෙන් පත් කළ යුතු අතර, ඒ තේරීම් භාර නිලධරයාගේ කාර්ය ඉටු කිරීමෙහි ලා ඔහුට සහායවීම පිණිස, එක් තැනැත්තකු හෝ ඊට වැඩි තැනැත්තන් සංඛ්‍යාවක් නමින් හෝ නිලයෙන් පත් කරනු ලැබිය හැකි ය. එසේ යම් තැනැත්තකු, එසේ පත් කරනු ලැබුවේ යම් තේරීම් භාර නිලධරයකුට සහාය වීම පිණිස ද, ඒ තේරීම් භාර නිලධරයාගේ සියලු බලතල ඒ තැනැත්තාට ලැබිය යුතු අතර, ඒ තැනැත්තා විසින් ඒ නිලධරයාගේ සියලු කාර්ය ඉටු කරනු ලැබිය හැකි ය. තව ද, මේ පනතෙහි තේරීම් භාර නිලධරයකු පිළිබඳ යම් සඳහනකට, පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, සහකාර තේරීම් භාර නිලධරයකු පිළිබඳ සඳහනක් ද ඇතුළත් වන ලෙස සැලකිය යුතු ය.

(2) කොමසාරිස්වරයා විසින් (1) වන උපවගන්තිය යටතේ කරන ලද පත්කිරීමක් ඕනෑම අවස්ථාවක දී ඔහු විසින් ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබිය හැකි ය.

(3) රෝගාතුරවීමක් නිසා හෝ වෙනත් හේතුවක් නිසා හෝ තේරීම් භාර නිලධරයකුගේ මේ පනත යටතේ කාර්යයන්ගෙන් කිසිවක් ඉටු කිරීමට ඔහුට නොහැකි වුවහොත් හෝ අශක්නුතාවක් ඇති වුවහොත්, කොමසාරිස්වරයා විසින් වෙනත් තැනැත්තකු පත් කරනු ලැබීම සඳහා කාලයක් නොමැති නම්, තේරීම් භාර නිලධරයා විසින් තමා වෙනුවෙන් වැඩ බැලීම සඳහා තැනැත්තකු නමින් හෝ නිලයෙන් පත් කරනු ලැබිය හැකි ය. එවැනි සෑම පත් කිරීමක් ම හැකිතාක් ඉක්මණින් කොමසාරිස්වරයා වෙත වාර්තා කරනු ලැබිය යුතු අතර, එසේ පත් කරනු ලැබූ තැනැත්තා විසින් එවකටත් කරනු ලැබ ඇති කිසිවක වලංගු භාවයට හානියක් නොමැතිව ඒ පත් කිරීම කොමසාරිස්වරයා විසින් ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබිය හැකි ය.

## II වන කොටස

### නාම යෝජනා

**අපේක්ෂකයන් විසින් ඇප තැන්පත් කිරීම.**

**8.** (1) 2 වන වගන්තිය යටතේ නියමය පළකරන ලද දිනයත්, නාම යෝජනා කිරීමේ දිනයට පෙර දිනයෙහි මධ්‍යාහ්න දොළහට පෙරත් අතර වූ කාලය තුළ, අපේක්ෂකයකු විසින් හෝ අපේක්ෂකයකු වෙනුවෙන් යම් තැනැත්තකු විසින්—

(අ) ඒ අපේක්ෂකයා පිළිගත් දේශපාලන පක්ෂයක් විසින් නාම යෝජනා කරන ලද අපේක්ෂකයකු වන අවස්ථාවක, වලංගු මුදලින් රුපියල් පනස් දහසක් වූ මුදලක් ද;

(ආ) ඒ අපේක්ෂකයා, වෙනත් යම් දේශපාලන පක්ෂයක් විසින් හෝ ඡන්දහිමියකු විසින් හෝ නාම යෝජනා කරන ලද අපේක්ෂකයකු වන අවස්ථාවක වලංගු මුදලින් රුපියල් හැත්තෑපන්දහසක් වූ මුදලක් ද

කොමසාරිස්වරයා වෙත හෝ තත් කාර්ය සඳහා කොමසාරිස්වරයා විසින් බලය පවරන ලද යම් තැනැත්තකු වෙත හෝ ඇප වශයෙන් තැන්පත් කළ යුතු ය. නැතහොත් ඇප වශයෙන් තැන්පත් කිරීමට සැලැස්විය යුතු ය.

(2) අපේක්ෂකයකු විසින් හෝ අපේක්ෂකයකු වෙනුවෙන් වෙනත් යම් තැනැත්තකු විසින් තැන්පත් කරනු ලබන කිසිම මුදලක් එය (1) වන උපවගන්තියෙන් නියමිත කාලය ඇතුළත තැන්පත් කරනු ලැබුවහොත් මිස, නොපිළිගනු ලැබිය යුතු ය.

(3) මේ වගන්තිය යටතේ ඇප තැන්පත් කරන ලද මුදලක් කොමසාරිස්වරයා විසින් හෝ ඔහු විසින් (1) වන උපවගන්තිය යටතේ බලය දෙන ලද යම් තැනැත්තකු විසින් පිළිගනු ලැබූ අවස්ථාවක, ඒ තැන්පත් මුදල තමා විසින් පිළි ගන්නා ලද වග සඳහන් කරමින්, තමා විසින් අත්සන් කරන ලද ලියවිල්ලකින් වූ කුවිතාන්සියක් ඒ මුදල තැන්පත් කළ තැනැත්තා වෙත කොමසාරිස්වරයා විසින් හෝ ඔහු විසින් බලය දෙන ලද තැනැත්තා විසින් හෝ වහා ම නිකුත් කළ යුතු අතර—

(අ) අපේක්ෂකයකු විසින් ඒ මුදල තැන්පත් කරන ලද අවස්ථාවක ඒ අපේක්ෂකයාගේ නම හෝ වෙනත් තැනැත්තකු විසින් ඒ මුදල තැන්පත් කරන ලද අවස්ථාවක ඒ තැනැත්තාගේ නම සහ ඒ මුදල තැන්පත් කරනු ලැබුවේ යම් අපේක්ෂකයකු වෙනුවෙන් ද, ඒ අපේක්ෂකයාගේ නම;

(ආ) තැන්පත් කරන ලද මුදලේ ප්‍රමාණය; සහ

(ඇ) මුදල තැන්පත් කරන ලද දිනය සහ වේලාව

ඒ කුවිතාන්සියෙහි සඳහන් කරනු ලැබිය යුතු ය.

**තැන්පත් මුදල් පිළිබඳව කටයුතු කිරීම.**

**9.** (1) 8 වන වගන්තිය යටතේ තැන්පත් කරන ලද සෑම මුදලක් ම වහා ම තැන්පත් ගිණුමකට බැර කරනු ලැබිය යුතු අතර, (2) වන, (3) වන සහ (4) වන උපවගන්තිවල විධිවිධාන වලට අනුව, ඒ මුදල් පිළිබඳව කටයුතු කරනු ලැබිය යුතු ය.

(2) අපේක්ෂකයකුගේ නාම යෝජනා පත්‍රය, 14 වන වගන්තියේ හෝ 15 වන වගන්තියේ හෝ විධිවිධාන යටතේ ප්‍රතික්ෂේප කරනු ලද අවස්ථාවක, තැන්පත් මුදල, එය තැන්පත් කළ තැනැත්තා වෙත ආපසු ගෙවනු ලැබිය යුතු ය.

(3) යම් අපේක්ෂකයකු ලැබූ ඡන්ද සංඛ්‍යාව, තෝරා පත්කර ගැනීමේ දී දෙන ලද මුළු ඡන්ද සංඛ්‍යාවෙන් අටෙන් එකක්, නොඉක්මවන අවස්ථාවක ඒ අපේක්ෂකයා සම්බන්ධයෙන් තැන්පත් කරන ලද මුදල රජය සන්තක වූ ලෙස ප්‍රකාශ කරනු ලැබිය යුතු අතර, කොමසාරිස්වරයා විසින් එය තැන්පත් ගිණුමෙන් ඒකාබද්ධ අරමුදල වෙත මාරු කළ යුතු ය. තව ද අනෙකුත් සෑම අවස්ථාවක දී ම, තෝරා පත්කර ගැනීමේ ඡන්ද ප්‍රතිඵල ප්‍රකාශ කරනු ලැබීමෙන් පසු හැකිතාක් ඉක්මණින්, තැන්පත් මුදල තැන්පත් කළ තැනැත්තා වෙත එය ආපසු ගෙවනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ කාර්ය සඳහා, තෝරා පත්කර ගැනීමේ දී ඇත්ත වශයෙන් ම දෙන ලද ඡන්ද සංඛ්‍යාව ගණන් කරන ලද ඡන්ද සංඛ්‍යාව ලෙස සලකනු ලැබිය යුතු අතර, ශුන්‍ය ලෙස ප්‍රතික්ෂේප කරනු ලැබූ ඡන්ද හෝ යම් දෙවන මනාපයක් හෝ තුන්වන මනාපයක් ඊට ඇතුළත් නොවිය යුතු ය.

පිළිගත් දේශපාලන පක්ෂයක ප්‍රතිවිරුද්ධ කණ්ඩායම් අතුරින් ඒ පක්ෂය වන්නේ කවර කණ්ඩායම දැයි තීරණය කිරීමට කොමසාරිස්වරයාට ඇති බලය.

**10.** (1) මේ පනත යටතේ වූ තෝරා පත්කර ගැනීමක දී, පිළිගත් දේශපාලන පක්ෂයක ප්‍රතිවිරුද්ධ කණ්ඩායම් සිටීමේ සහ ඒ එක් එක් කණ්ඩායම විසින් ඒ පක්ෂය තමන් යයි කියා සිටීමේ හේතුවෙන් දුෂ්කරතා උද්ගත විය හැකි යයි විශ්වාස කිරීමට කොමසාරිස්වරයාට සෑහෙන හේතු තිබෙන අවස්ථාවක, ඒ දුෂ්කරතා ඉවත් කිරීම පිණිස, කොමසාරිස්වරයා විසින්, සිය පරම අභිමතය අනුව, ඒ විරුද්ධ කණ්ඩායම් අතුරින් යම් එක් කණ්ඩායමක් ඒ පිළිගත් දේශපාලන පක්ෂය වන්නේ යයි හෝ ඒ කණ්ඩායම් අතුරින් කිසිම කණ්ඩායමක් ඒ පිළිගත් දේශපාලන පක්ෂය නොවන්නේ යයි හෝ තීරණය කරනු ලැබිය හැකි ය.

(2) කිසිම සිවිල් නඩුවක් හෝ නඩු කටයුත්තක්—

(අ) කොමසාරිස්වරයා විසින් (1) වන උපවගන්තිය යටතේ තීරණයක් කිරීමේ හේතුව නිසා ඔහුට විරුද්ධව ; හෝ

(ආ) ඒ තීරණයට අනුව යම් ක්‍රියාවක් හෝ දෙයක් කිරීම නිසා හෝ නොකර හැරීම නිසා තේරීම් භාර නිලධරයකුට හෝ වෙනත් යම් නිලධරයකුට විරුද්ධව,

නොපැවරිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ කරන ලද තීරණයක් අවසානාත්මක විය යුතු අතර එය කිසිම අධිකරණයක දී ප්‍රශ්න නොකරනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ ඉහත සඳහන් විධිවිධාන සහ ඒ යටතේ කරන ලද යම් තීරණයක්, මේ පනතෙහි වූ වෙනත් යම් විධිවිධානයක හෝ වෙනත් යම් ලිඛිත නීතියක වූ යම් විධිවිධානයක හෝ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, බලපැවැත්විය යුතු ය.

තෝරා පත් කර ගැනීමක දී තරග කිරීමට නාම යෝජනා කරනු ලැබිය හැක්කේ කවුරුන් ද යන වග.

**11.** ජනාධිපති ධුරයට තෝරා පත්කර ගනු ලැබීම සඳහා සුදුසුකම් දරන ඕනෑම පුරවැසියකුගේ නාමය, මෙහි මින් මතු විධිවිධාන සලසා ඇති ආකාරයට, ඒ ධුරය සඳහා අපේක්ෂකයකු ලෙස යෝජනා කරනු ලැබිය හැකි ය.

නාම යෝජනා පත්‍ර.

**12.** (1) වෙන වෙනම වූ නාම යෝජනා පත්‍ර තුනකට වැඩි සංඛ්‍යාවක් මගින් කිසිම අපේක්ෂකයකුගේ නාම යෝජනා කරනු නො ලැබිය යුතු ය.

(2) සෑම නාම යෝජනා පත්‍රයක් ම, මේ පනතේ පළමුවන උපලේඛනයෙහි දක්වා ඇති "අ" ආකෘතියට සාරානුකූල විය යුතු ය.

(3) (අ) යම් අපේක්ෂකයකුගේ නාම එක් නාම යෝජනා පත්‍රයක් මගින් යෝජනා කරනු ලබන අවස්ථාවක, ඒ නාම යෝජනා පත්‍රය—

(i) ඒ අපේක්ෂකයාගේ නාම පිළිගත් දේශපාලන පක්ෂයක් විසින් යෝජනා කරනු ලබන අවස්ථාවක, ඒ පක්ෂයේ ලේකම්වරයා විසින් ;

(ii) ඒ අපේක්ෂකයාගේ නාම වෙනත් යම් දේශපාලන පක්ෂයක් විසින් යෝජනා කරනු ලබන අවස්ථාවක, ඒ පක්ෂයේ ලේකම්වරයා විසින් ;

(iii) ඒ අපේක්ෂකයාගේ නාම යම් ඡන්ද හිමියකු විසින් යෝජනා කරනු ලබන අවස්ථාවක, තත් කාලයෙහි ක්‍රියාත්මකව පවත්නා යම් ඡන්ද හිමියන්ගේ නාම ලේඛනයක නාම ඇතුළත්ව ඇති ඡන්ද හිමියකු විසින්

අත්සන් කළ යුතු ය.

(ආ) එක් නාම යෝජනා පත්‍රයකට වැඩි නාම යෝජනා පත්‍ර සංඛ්‍යාවක් මගින්, යම් අපේක්ෂකයකුගේ නාම යෝජනා කරනු ලැබූ අවස්ථාවක, (අ) ඡේදයට අනුව නාම යෝජනා පත්‍රය අත්සන් කරන ලද තැනැත්තා විසින් ම ඒ එක් එක් නාම යෝජනා පත්‍රය අත්සන් කළ යුතු අතර, මේ ඡේදයේ විධිවිධාන අනුව ක්‍රියා කර නොමැති අවස්ථාවක, ඒ අපේක්ෂකයාගේ නාම යෝජනා කර නොමැති ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) යම් නාම යෝජනා පත්‍රයක් අත්සන් කරන තැනැත්තාගේ අත්සන, සමාදාන විනිශ්චයකාරවරයකු විසින් හෝ ප්‍රසිද්ධ නොතාරිස්වරයකු විසින් හෝ සහතික කරනු ලැබිය යුතු ය.

(5) නාම යෝජනා කරනු ලබන එක් එක් අපේක්ෂකයාගේ ලිඛිත කැමැත්ත නාම යෝජනා පත්‍රයෙහි පිටසන් කරනු ලැබිය යුතු ය.

(6) කිසිම තැනැත්තකු විසින් එක් අපේක්ෂකයකුට වැඩි අපේක්ෂකයන් සංඛ්‍යාවක් වෙනුවෙන් නාම යෝජනා පත්‍රයක් හෝ පත්‍ර අත්සන් නොකළ යුතු ය. තව ද ඔහු එසේ අත්සන් කළහොත්, පළමුවෙන් භාර දුන් නාම යෝජනා පත්‍රය හෝ පත්‍ර සම්බන්ධයෙන් පමණක් ඔහුගේ අත්සන වලංගු විය යුතු ය.

13. (1) අපේක්ෂකයා විසින් හෝ ඔහුගේ නාම යෝජනා පත්‍රය අත්සන් කළ තැනැත්තා විසින් එක් එක් නාම යෝජනා පත්‍රය, නාම යෝජනා කිරීමේ දිනයෙහි පෙරවරු 8 සිට පෙරවරු 11 දක්වා වූ කාල සීමාව තුළ, නාම යෝජනා කිරීමේ ස්ථානයේ දී, කොමසාරිස්වරයා වෙත භාර දිය යුතු ය. නාම යෝජනා පත්‍රය කොමසාරිස්වරයා වෙත භාර දීම.

(2) කොමසාරිස්වරයා විසින් තමා වෙත ලැබුණු එක් එක් නාම යෝජනා පත්‍රයෙහි පිටපතක් හැකි පමණ ඉක්මණින් පිළියෙල කොට, නාම යෝජනා කිරීමේ ස්ථානයේ පිටත තම දැන්වීම් පුවරුවෙහි ඒ පිටපත ප්‍රදර්ශනය කළ යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ නාම යෝජනා සඳහා නියම කර ඇති කාලය ඉකුත් වීමට පෙර කරනු ලබන ඉල්ලීමක් මත, ඕනෑම තැනැත්තකුට නාම යෝජනා පත්‍රයක් අය කිරීමක් නොකර කොමසාරිස්වරයා විසින් සැපයිය යුතු ය ; එහෙත් කොමසාරිස්වරයා විසින් සපයනු නොලැබූ යම් නාම යෝජනා පත්‍ර ආකෘතියක්, මේ පනතේ පළමුවන උපලේඛනයෙහි දක්වා ඇති “අ” ආකෘති යට සැරානුකූලවන තාක්, ඒ ආකෘතිය පාවිච්චි කිරීම මේ පනතේ ඇතුළත් කිසිවකින් වළක්වන්නේ යයි සලකනු නොලැබිය යුතු ය.

(4) (අ) මේ වගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද නාම යෝජනා පත්‍රයක යම් අත්හැරීමක් හෝ ලිපිකාර දෝෂයක් හෝ සිදු වී ඇතැයි පෙනී යන අවස්ථාවක, අපේක්ෂකයා විසින් හෝ ඒ නාම යෝජනා පත්‍රය අත්සන් කළ තැනැත්තා විසින් හෝ ඒ අත්හැරීම හෝ දෝෂය නිවැරදි කිරීම පිණිස ඉල්ලීමක් නාම යෝජනා සඳහා නියම කර ඇති කාලය ඉකුත් වීමට පෙර කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කළ හැකි ය.

(ආ) ඒ අත්හැරීම හෝ දෝෂය අනවධානය නිසා සිදු වී ඇති බවට කොමසාරිස්වරයා සෑහීමට පත් වූ අවස්ථාවක, ඒ අත්හැරීම හෝ දෝෂය තමා ඉදිරිපිට දී නිවැරදි කිරීමට කොමසාරිස්වරයා විසින් ඒ අපේක්ෂකයාට හෝ තැනැත්තාට ඉඩ දෙනු ලැබිය හැකි ය.

(ඇ) අපේක්ෂකයකුගේ නාම අත්හැර තිබීම හෝ තම කැමැත්ත නාම යෝජනා පත්‍රයක පිටසන් කිරීමට අපේක්ෂකයකු පැහැර හැරීම හෝ නාම යෝජනා පත්‍රයක් අත්සන් කිරීමට පිළිගත් දේශපාලන පක්ෂයක ලේකම්වරයා හෝ වෙනත් යම් දේශපාලන පක්ෂයක ලේකම්වරයා හෝ ඡන්ද හිමියකු හෝ පැහැර හැරීම හෝ එවැනි අත්සනක් සහතික කිරීමට සමාදාන විනිශ්චයකාරවරයකු හෝ ප්‍රසිද්ධ නොතාරිස්වරයකු හෝ පැහැර හැරීම අනවධානය නිසා සිදු වූ අත්හැරීමක් නැතහොත් ලිපිකාර දෝෂයක් ලෙස මේ උප වගන්තියෙහි කාර්ය සඳහා නොසලකනු ලැබිය යුතු ය.

14. (1) යම් ප්‍රතිවිරුද්ධ අපේක්ෂකයකු විසින් හෝ, ඒ ප්‍රතිවිරුද්ධ අපේක්ෂකයාගේ නාම යෝජනා පත්‍රය අත්සන් කළ තැනැත්තා විසින් හෝ අපේක්ෂකයකුගේ නාම යෝජනා පත්‍රවලට— නාම යෝජනා පත්‍රවලට විරෝධය දැක්වීම.

(අ) ජනාධිපතිවරයා ලෙස තෝරා පත්කර ගැනීම සඳහා ඒ අපේක්ෂකයා සුදුසුකම් ලබා නොමැති බව නාම යෝජනා පත්‍රයෙහි අඩංගු කරුණුවලින් පැහැදිලි වීමේ ;

(ආ) දූෂණ ක්‍රියාවකට හෝ නීති විරෝධී ක්‍රියාවකට හෝ ඔහු වරදකරු කරනු ලැබීමේ හේතුවෙන් හෝ 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජ සභා ආඥාව හෝ 1981 පාර්ලිමේන්තු මැතිවරණ පනත හෝ යටතේ මැතිවරණ විනිශ්චයකාරවරයකුගේ වාර්තාව හේතුවෙන් හෝ මේ පනත යටතේ, ශ්‍රේෂ්ඨාධිකරණයේ වාර්තාව හේතුවෙන් ජනාධිපතිවරයා ලෙස තෝරා පත්කර ගැනීම සඳහා ඒ අපේක්ෂකයා සුදුසුකම් ලබා නොමැති වීමේ (මේ ඡේදයේ කාර්යයන් සඳහා, ඔහු එසේ වරදකරු කරනු ලැබුවේ අධිකරණයේ යම් නඩු තීන්දුවක් හෝ ආඥාවක් මගින් ද, ඒ නඩු තීන්දුව හෝ ආඥාව භාරව සිටින අධිකරණයේ නිල ධරයා විසින් සහතික කරන ලද ඒ නඩු තීන්දුවේ හෝ ආඥාවේ පිටපතක් හෝ එසේ වරදකරු කිරීමට විරුද්ධව අභියාචනයක් ඉදිරිපත් කර ඇති යම් අවස්ථාවක, ඒ නඩු තීන්දුව හෝ ආඥාව ස්ථිර කරමින් ඒ අභියාචනය පිළිබඳව අභියාචනාධිකරණය හෝ ශ්‍රේෂ්ඨාධිකරණය විසින් කරන ලද ආඥාවේ පිටපතක් හෝ ඉහත කී පනත්වල විධිවිධාන මගින් නියම කරනු ලැබ ඇති පරිදි, ඒ වාර්තාව පළ කරන ලද ගැසට් පත්‍රයෙහි පිටපතක් හෝ උධෘතයක් ඒ නුසුදුසුකම පිළිබඳව තීරණාත්මක සාක්ෂියක් විය යුතු ය) ;

(ඇ) පාර්ලිමේන්තුව විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 81 වන ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාව ප්‍රකාර, ඒ අපේක්ෂකයා විෂයෙහි ප්‍රජා අශක්නුතාව පනවනු ලැබීමේ (මේ ඡේදයේ කාර්යයන් සඳහා පාර්ලිමේන්තු මහ ලේකම්වරයාගේ අත්සනින් සහතික කරන ලද, ඒ ව්‍යවස්ථාවේ සඳහන් යෝජනා සම්මතයේ පිටපතක් ඒ අශක්නුතාව පැනවීම පිළිබඳව තීරණාත්මක සාක්ෂියක් විය යුතු ය)

හේතුව මත විරෝධය දැක්වීමක් කරනු ලැබිය හැකි ය.

(2) යම් නාම යෝජනා පත්‍රයකට විරෝධය දැක්වීමක් නාම යෝජනා කිරීමේ දිනයේ පෙරවරු 8.00 සහ පෙරවරු 11.30 අතර කාලය තුළ කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබුවහොත් මිස, ඒ විරෝධය දැක්වීමට ඉඩ නොදිය යුතු ය.

(3) සෑම විරෝධය දැක්වීමක් ම, විරෝධය දක්වන්නා විසින් අත්සන් තබන ලද ලියවිල්ලකින් කළ යුතු අතර, විරෝධය දැක්වීමට හේතු ද එහි නිශ්චිතව සඳහන් කළ යුතු ය.

(4) (1) වන උපවගන්තියේ (අ) ඡේදයෙහි සඳහන් හේතුව මත කරන ලද සෑම විරෝධය දැක්වීමක ම වලංගුභාවය පිළිබඳව කොමසාරිස්වරයා විසින් අනවශ්‍ය ප්‍රමාදයකින් තොරව තීරණය කළ යුතු අතර තම තීරණය ද විරෝධය දැක්වීමට ඉඩ දෙමින් ඒ තීරණය කරනු ලැබිණි නම්, ඊට හේතු ද අදාළ අපේක්ෂකයාට දැනුම් දිය යුතු ය.

(5) (1) වන උපවගන්තියේ (අ) ඡේදයෙහි සඳහන් හේතුව මත කරන ලද විරෝධය දැක්වීමකට ඉඩ නොදෙමින් කොමසාරිස්වරයා විසින් කරනු ලබන තීරණය අවසානාත්මක විය යුතු ය; එහෙත් එවැනි විරෝධය දැක්වීමකට ඉඩ දෙමින් ගනු ලැබූ තීරණයක් ඡන්ද පෙත්සමක දී ප්‍රතිවර්තනය කිරීමට යටත් විය යුතු ය.

(6) (1) වන උපවගන්තියේ (ආ) ඡේදයෙහි හෝ (ඇ) ඡේදයෙහි සඳහන් යම් හේතුවක් මත කරන ලද යම් විරෝධය දැක්වීමක් කොමසාරිස්වරයා විසින් ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය සඳහා ශ්‍රේෂ්ඨාධිකරණය වෙත යොමු කළ යුතු ය.

(7) අදාළ අපේක්ෂකයාගේ නාම යෝජනාව පිළිබඳව කරන ලද යම් විරෝධය දැක්වීමක් සම්බන්ධයෙන්, (6) වන උපවගන්තිය යටතේ වූ සෑම යොමුකිරීමක් ම—

(අ) මුද්දර ගාස්තුවෙන් නිදහස් ලියවිල්ලකින් වූ පෙත්සමක් මඟින් කරනු ලැබිය යුතු ය;

(ආ) නාම යෝජනා කිරීමේ දිනයෙන් පසු දින තුනක් ඇතුළත දී කරනු ලැබිය යුතු ය;

(ඇ) විරෝධය දක්වන්නාගේ සහ අදාළ අපේක්ෂකයාගේ නම් සහ ලිපින ඇතුළත්ව තිබිය යුතු ය;

(ඈ) විරෝධය දැක්වීම පදනම්ව ඇත්තේ යම් ලේඛනයක් හෝ ලේඛන මත ද, ඒ ලේඛනයෙහි පිටපතක් හෝ ලේඛනවල පිටපත් හෝ සමග ඉදිරිපත් කරනු ලැබ තිබිය යුතු ය; තව ද

(ඉ) ඒ යොමුකිරීම ලැබුණ දිනයෙන් පසු දින හතක් ඇතුළත දී අවශ්‍ය යයි ශ්‍රේෂ්ඨාධිකරණය සලකන ලඝු විභාගයකින් පසු, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයන් පස් දෙනකු විසින් විභාග කොට, තීරණය කළ යුතු ය.

යොමුකිරීම සම්බන්ධයෙන් මේ උපවගන්තියේ (ඉ) ඡේදයෙහි සඳහන් කාලසීමාව ඇතුළත ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තීරණයක් කරනු නොලැබුවහොත්, ඒ යොමුකිරීම, මේ පනතේ කාර්යයන් සඳහා, නතර කර ඇති ලෙස සලකනු ලැබිය යුතු නමුත් ඡන්ද පෙත්සමක මාර්ගයෙන් එය ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(8) අදාළ අපේක්ෂකයාගේ නාම යෝජනාව සම්බන්ධයෙන් (1) වන උපවගන්තියේ (ආ) ඡේදය හෝ (ඇ) ඡේදය හෝ යටතේ කරන ලද යම් විරෝධය දැක්වීමක් ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය සඳහා යොමු කිරීමට (6) වන උපවගන්තියෙන් කොමසාරිස්වරයාට නියම වී ඇති අවස්ථාවක, ඒ අපේක්ෂකයා මේ පනතේ කාර්ය සඳහා, නාම යෝජනා කිරීමේ දිනයෙහි නම නම යෝජනා කරනු ලැබ සිටින අපේක්ෂකයකු විය යුතු අතර, ඒ අධිකරණයේ තීරණයක් මඟින් විරෝධය දැක්වීමට ඉඩ දෙනු ලැබ තිබුණහොත් ජීවතෙක්, ඔහු එසේ නම යෝජනා කරනු ලැබ සිටින අපේක්ෂකයා වූව සිටීම අවසන් විය යුතු ය. මේ උපවගන්තියේ ඉහත දැක්වෙන විධිවිධාන බලාත්මක කිරීම සඳහා හා ක්‍රියාත්මක කිරීම සඳහා කොමසාරිස්වරයා විසින් මේ පනත යටතේ ක්‍රියා කළ යුතු ය.

(9) (1) වන උපවගන්තියේ (අ) ඡේදයෙහි සඳහන් හේතුව මත අදාළ යම් අපේක්ෂකයකුට විරුද්ධව යම් විරෝධය දැක්වීමකට කොමසාරිස්වරයා විසින් ඉඩ දෙනු ලැබූ විටෙක, (6) සහ (8) වන උපවගන්තිවල විධිවිධාන අදාළ නොවිය යුතු ය.

නාම යෝජනා පත්‍ර ප්‍රතික්ෂේප කිරීම.

**15.** (1) තමා වෙත නාම යෝජනා පත්‍රයක් භාර දෙනු ලැබීමෙන් පසුව, කොමසාරිස්වරයා විසින් හැකිතාක් ඉක්මණින්, ඒ නාම යෝජනා පත්‍රය පරීක්ෂා කොට,—

(අ) 13 වන වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධානවලට අනුව භාර දී නොමැති ; හෝ

(ආ) ඒ වෙනුවෙන් 8 වන වගන්තිය යටතේ තැන්පත් කිරීමට නියමිත ඇප මුදල තැන්පත් කරනු ලැබ නොමැති ; හෝ

(ඇ) 12 වන වගන්තියේ (3) (ආ), (4) වන, (5) වන සහ (6) වන උපවගන්තිවල විධිවිධානවලට අනුකූල නොවන ; හෝ

(ඈ) අවස්ථාවෝචිත පරිදි, පිළිගත් දේශපාලන පක්ෂයක ලේකම්වරයාගේ හෝ වෙනත් යම් දේශපාලන පක්ෂයක ලේකම්වරයාගේ හෝ ඡන්ද හිමියකුගේ හෝ අත්සන නොමැති ; හෝ

(ඉ) 14 (1) වන වගන්තියේ (අ) ඡේදය යටතේ විරෝධය දැක්වීමක් කරනු ලැබ, ඒ විරෝධය දැක්වීමට කොමසාරිස්වරයා විසින් ඉඩ දෙනු ලැබ ඇති

යම් නාම යෝජනා පත්‍රයක් ප්‍රතික්ෂේප කළ යුතු ය.

(2) යම් නාම යෝජනා පත්‍රයක් (1) වන උපවගන්තිය යටතේ කොමසාරිස්වරයා විසින් ප්‍රතික්ෂේප කරන ලද අවස්ථාවක, ඒ ප්‍රතික්ෂේප කිරීම ගැන අපේක්ෂකයාට හෝ ඒ නාම යෝජනා පත්‍රය භාර දුන් තැනැත්තාට ඔහු විසින් දන්වා සිටිය යුතු ය. එවැනි නාම යෝජනා පත්‍රයක් (1) වන උපවගන්තියේ (අ) සිට (ඈ) තෙක් වූ ඡේදවල දක්වා ඇති හේතු අතුරින් යම් හේතුවක් මත ප්‍රතික්ෂේප කිරීමට කොමසාරිස්වරයා තීරණය කළ විටක, ඒ තීරණය අවසානාත්මක විය යුතු ය.

නාම යෝජනා කිරීමේ දී පැමිණ සිටීමට හිමිකම් ඇති තැනැත්තෝ.

**16.** කොමසාරිස්වරයා, අපේක්ෂකයන්, ඔවුන්ගේ නාම යෝජනා පත්‍ර අත්සන් කළ තැනැත්තන් සහ එක් එක් අපේක්ෂකයා විසින් තෝරා ගන්නා ලද වෙනත් යම් තැනැත්තකු වේ නම් ඒ තැනැත්තා ද හැර, කිසිම තැනැත්තකුට කොමසාරිස්වරයාගේ අනුමතය ඇතිව සහ ඔහුට සහාය දීමේ කාර්ය සඳහා මිස, 13 වන, 14 වන සහ 15 වන වගන්ති යටතේ වූ කටයුතුවල දී පැමිණ සිටීමට හිමිකමක් නොතිබිය යුතු ය.

නිතරගයෙන් තේරී පත්වීම.

**17.** (1) නාම යෝජනා පත්‍රයක් භාර දීම සඳහා වූ නියමිත කාලය සහ නාම යෝජනා පත්‍රයකට විරෝධය දැක්වීමක් කරනු ලැබිය හැකි කාල සීමාව ඉකුත්වීමෙන් සහ නාම යෝජනා පත්‍රයක් හෝ නාම යෝජනා පත්‍ර ප්‍රතික්ෂේප කිරීමෙන් පසුව, තෝරා පත්කිරීම සඳහා එක් අපේක්ෂකයකුගේ නම පමණක් යෝජනා කරනු ලැබ සිටින අවස්ථාවක, ඒ අපේක්ෂකයා ජනාධිපති ධූරයට තෝරා පත්කර ගනු ලැබූ බව ප්‍රකාශ කරනු ලැබිය යුතු ය.

(2) තෝරා පත්කර ගනු ලැබූ බවට එසේ ප්‍රකාශයට පත් කරනු ලැබූ අපේක්ෂකයාගේ නම, කොමසාරිස්වරයා විසින් නොපමාව ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීමට සැලැස්විය යුතු ය.

නාම යෝජනා පත්‍ර ලැබී නොමැති අවස්ථාවල කාර්ය පටිපාටිය.

**18.** 13 වන, 14 වන සහ 15 වන වගන්ති යටතේ වූ කටයුතු අවසානයේ දී, කිසිම අපේක්ෂකයකුගේ නම යථා පරිදි යෝජනා කරනු ලැබ නොමැති බව කොමසාරිස්වරයාට පෙනී යන අවස්ථාවක, දෙවන නාම යෝජනා කිරීමේ දිනයක් නියම කරමින් ඔහු විසින් දැන්වීමක් පළ කරනු ලැබිය යුතු අතර, ඒ දිනය, ඒ දැන්වීම පළ කරනු ලබන දිනයෙන් පසු දින හතකට කලින් වූ සහ දින දහ හතරකට පසුව වූ දිනයක් නොවිය යුතු ය. මේ පනතේ විධිවිධාන දෙවන නාම යෝජනා කිරීමේ දිනය සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

කොමසාරිස්වරයා විසින් බලතල පැවරිය හැකි බව.

**19.** අසනීපයක් හෝ වෙනත් යම් හේතුවක් හෝ නිසා මේ කොටස යටතේ වූ නාම කාර්යයන් ඉටු කිරීමට කොමසාරිස්වරයාට නොහැකි වුවහොත් හෝ අශක්නුතාවක් ඇති වුවහොත් ඔහු වෙනුවෙන් ක්‍රියා කිරීම සඳහා ඔහු විසින් යම් තැනැත්තකු, නමින් හෝ තිලයෙන් පත් කරනු ලැබිය හැකි ය.

අනුමත ලකුණ යනාදිය වෙන් කර දීම.

**20.** (1) තෝරා පත්කර ගැනීම සඳහා යථා පරිදි එක් අපේක්ෂකයකුට වැඩි අපේක්ෂකයන් සංඛ්‍යාවකගේ නම් යෝජනා කරනු ලැබ තිබේ නම්, කොමසාරිස්වරයා විසින්—

(අ) පිළිගත් දේශපාලන පක්ෂයක් විසින් නාම යෝජනා කරනු ලැබූ අපේක්ෂකයාට 1981 පාර්ලිමේන්තු මැතිවරණ පනත යටතේ ඒ පක්ෂය සඳහා වෙන් කරන ලද අනුමත ලකුණ ; සහ

(ආ) වෙනත් යම් අපේක්ෂකයන් සම්බන්ධයෙන් වන විට, ඒ එක් එක් අපේක්ෂකයා සඳහා—

(i) පළමුව ඒ අපේක්ෂකයන් අතර වූ එකඟත්වයක් මගින් ; හෝ

(ii) එබඳු එකඟත්වයක් නොමැති විට, කොමසාරිස්වරයා විසින් සිය පරම අභිමතය පරිදි තීරණය කරනු ලබන ආකාරයකට දමනු ලබන හෝ අදිනු ලබන කුසපත් මගින්

තීරණය කරනු ලබන අනුමත ලකුණ

නොපමාව වෙන් කළ යුතු අතර, ඒ ලකුණ ඒ එක් එක් අපේක්ෂකයාගේ නමට ඉදිරියෙන් ඡන්ද පත්‍රිකාවෙහි මුද්‍රණය කරනු ලැබිය යුතු ය. ඉහත (ආ) ඡේදය යටතේ කටයුතුවල දී පැමිණ සිටීමට අපේක්ෂකයකුට නොහැකි වන අවස්ථාවක, ඒ අපේක්ෂකයාගේ නාම යෝජනා පත්‍රය අත්සන් කළ තැනැත්තා විසින් ඔහු වෙනුවෙන් ක්‍රියා කළ හැකි ය.

(2) යම් පිළිගත් දේශපාලන පක්ෂයක අනුමත ලකුණ, තෝරා පත් කිරීමක දී ඒ පක්ෂය තරඟ කළත් නොකළත්, (1) වන උප වගන්තියේ (ආ) ඡේදය යටතේ වෙනත් යම් අපේක්ෂකයකුට වෙන් කර දෙනු නොලැබිය යුතු ය.

(3) අපේක්ෂකයකුගේ නම යෝජනා කරනු ලැබූ අවස්ථාවක, අනුමත ලකුණ (1) වන උපවගන්තිය යටතේ ඔහුට වෙන් කර දෙනු ලැබීමෙන් පසුව, නාම යෝජනා පත්‍රයෙහි සඳහන් තම නම් අතුරින් කවර නම් අත් හැරීමට සහ කවර නම් මුල් අකුරින් පමණක් දැක්වීමට තමා කැමැත්තේ ද යන වග සිය අත්සනින් වූ

ලියවිල්ලකින් ඔහු විසින් නොපමාව දක්වා සිටිය හැකි ය. එවිට තෝරා පත්කිරීම පිළිබඳ කාර්ය සඳහා, අපේක්ෂකයා විසින් අත් හැරීමට කැමැත්ත දක්වන ලද නම් අත්හළ හැකි අතර, ඔහු විසින් මුල් අකුරින් දැක්වීමට කැමැත්ත දක්වන ලද නම් වෙනුවට මුල් අකුරු යෙදිය හැකි ය.

(4) (1) වන උපවගන්තිය යටතේ ලකුණු වෙන් කිරීමෙන් සහ (3) වන උපවගන්තිය යටතේ කටයුතු කිරීමෙන් පසුව, මෙයි මින් මතු සඳහන් විධිවිධානවලට අනුකූලව ඡන්ද විමසීමට හැකි වන පරිදි කොමසාරිස්වරයා විසින් නොපමාව ඒ තෝරා පත්කිරීම කල් තැබිය යුතු ය.

## III වන කොටස

## ඡන්ද විමසීම

ඡන්ද විමසීම පිළිබඳ දැන්වීම.

21. නාම යෝජනා කිරීමේ දිනයෙහි සිට දින දහ හතරක් ඉකුත් වීමට පෙර, කොමසාරිස්වරයා විසින්—

(අ) තෝරා පත්කිරීම සඳහා තරඟ කරනු ලබන බව;

(ආ) ඡන්ද විමසීම කරනු ලබන දිනය සහ ඡන්ද විමසීම පවත් වනු ලබන වේලාවල් ; සහ

(ඇ) ඡන්ද පත්‍රිකාවල අපේක්ෂකයන්ගේ නම් මුද්‍රණය කරනු ලබන අනු පිළිවෙල අනුව ඒ අපේක්ෂකයන්ගේ නම් සහ එක් එක් අපේක්ෂකයාට වෙන් කරන ලද ලකුණ, සහ

(i) පිළිගත් දේශපාලන පක්ෂයක් විසින් හෝ වෙනත් යම් දේශපාලන පක්ෂයක් විසින් හෝ නාම යෝජනා කරන ලද අපේක්ෂකයකු සම්බන්ධ යෙන් වූ විට, ඒ දේශපාලන පක්ෂයේ නම ; සහ

(ii) ඡන්ද හිමියකු විසින් නාම යෝජනා කරන ලද අපේක්ෂකයකු සම්බන්ධයෙන් වූ විට, ඒ ඡන්ද හිමියාගේ නම ද

සඳහන් කරමින් දැන්වීමක් ගැසට් පත්‍රයෙහි ද යටත් පිරිසෙයින් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි පුවත් පතක ද පළ කළ යුතු ය.

අපේක්ෂකයකු මිය ගිය අවස්ථාවක දී කාර්ය පටිපාටිය.

22. (1) තෝරා පත්කිරීම ඡන්ද විමසීම සඳහා කල් තැබීමෙන් පසුව, පිළිගත් දේශපාලන පක්ෂයක් විසින් හෝ වෙනත් යම් දේශපාලන පක්ෂයක් විසින් හෝ නාම යෝජනා කරන ලද අපේක්ෂකයකු ඡන්දය විමසීම ආරම්භ කිරීමට පෙර මිය ගිය හොත්, ඒ මරණය සිදු වූ බවට කොමසාරිස්වරයා සෑහීමට පත් වීමෙන් පසු, කොමසාරිස්වරයා විසින් මිය ගිය අපේක්ෂකයා වෙනුවට වෙනත් අපේක්ෂකයකුගේ නාම, නම විධානය කරන ලද දින සිට දින තුනක් ඇතුළත, යෝජනා කරන ලෙස ඒ පක්ෂයේ ලේකම්වරයා වෙත විධානය කළ යුතු ය. ඒ නාම යෝජනාව මේ පනතේ පළමුවන උපලේඛනයේ දැක්වෙන "අ" ආකෘතියට සාරානුකූල විය යුතු ය.

(2) කොමසාරිස්වරයා විසින් ඒ මරණය සිදු වූ බව සඳහන් කරමින් හා ඒ මිය ගිය අපේක්ෂකයා වෙනුවට (1) වන උප වගන්තිය යටතේ නාම යෝජනා කරන ලද අපේක්ෂකයාගේ නම ඡන්ද පත්‍රිකාවල හා තෝරා පත්කර ගැනීම හා සම්බන්ධ වෙනත් සියලු ලේඛනවල ආදේශ කරනු ලැබුවාක් මෙන් 21 වන වගන්තිය යටතේ වූ දැන්වීමේ සඳහන් කර ඇති පරිදි ඡන්ද විමසීම පවත්වනු ලබන බව ප්‍රකාශ කරමින් දැන්වීමක් ඒ නාම යෝජනාව ලැබීමෙන් පසු විගාම ගැසට් පත්‍රයේ පළ කළ යුතු ය.

(3) (1) වන හා (2) වන උපවගන්තිවල විධිවිධාන, ඡන්දහිමියකු විසින් නාම යෝජනා කරන ලද අපේක්ෂකයකුගේ මරණයට හා ඒ මරණය සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු අතර, ඒ අපේක්ෂක යාගේ මරණය නොතකා, 21 වන වගන්තිය යටතේ වූ දැන්වීමේ සඳහන් කර ඇති පරිදි, ඡන්ද විමසීම පවත්වනු ලැබිය යුතු ය.

23. (1) මේ පනත යටතේ තෝරා පත්කර ගැනීමක කාර්යය සඳහා තැපැල් ඡන්දදායකයකු වශයෙන් සලකනු ලැබීමට මේ වගන්තිය යටතේ හිමිකම ඇති තැනැත්තකු විසින් තැපැලෙන් ඡන්දය දිය හැකි අතර, ඒ තෝරා පත්කරගැනීමේ දී පෞද්ගලිකව ගොස් ඡන්දය නොදිය යුතු ය. තැපැලෙන් ඡන්දය දීම.

මේ උපවගන්තියේ ඉහතින් වූ විධිවිධාන කඩ කරමින් තෝරා පත්කර ගැනීමක දී පෞද්ගලිකව ගොස් ඡන්දය දෙන යම් තැනැත්තකු වරදක් කරන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් පන්සියයක් නොඉක්මවන දඩයකට හෝ එක් අවුරුද්දක් නොඉක්මවන කාලය කට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කරනු ලැබීම යන දඬුවම් දෙකටම හෝ ඔහු යටත් විය යුතු ය.

(2) තෝරා පත්කර ගැනීමක කාර්යය සඳහා, තැපැල් ඡන්දදායක යකු වශයෙන් සලකනු ලැබීමට කරනු ලබන ඉල්ලීමක්—

(අ) ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ, ශ්‍රී ලංකා නාවික හමුදාවේ හෝ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සාමාජිකයකු වශයෙන් හෝ පොලිස් දෙපාර්තමේන්තුවේ, ශ්‍රී ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුවේ, තැපැල් දෙපාර්තමේන්තුවේ, විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ හෝ ශ්‍රී ලංකා මධ්‍යම ගමනා ගමන මණ්ඩලයේ හෝ යම් ප්‍රාදේශිය ගමනාගමන මණ්ඩලයක හෝ නිලධරයකු හෝ සේවකයකු වශයෙන් තම සේවා නියුක්තියේ විශේෂ කටයුතු හේතුකොටගෙන පෞද්ගලිකව ගොස් තමන්ට වෙන් කරන ලද ඡන්ද පොළෙහි දී ඡන්දය දීමට තමාට නොහැකි වීමේ හෝ නොහැකිවීමට ඉඩ තිබීමේ හේතුව නිසා, ඒ සාමාජිකයා, නිලධරයා හෝ සේවකයා විසින් ; සහ

(ආ) ඡන්ද විමසීම පවත්වන දිනයෙහි දී තෝරා පත්කර ගැනීම සම්බන්ධ කාර්යයක් සඳහා තම සේවා නියුක්තියේ විශේෂ කටයුතු හේතුකොටගෙන හෝ ඒ කාර්යය සඳහා සේවයෙහි නියුක්ත කරනු ලැබීමට ඉඩ තිබීමේ හේතුව

නිසා, රජයේ සේවයේ හෝ ශ්‍රී ලංකා මහ බැංකුවේ හෝ පළාත් පාලන සේවයේ වෙනත් යම් නිලධරයකු විසින් හෝ සේවකයකු විසින් ; සහ

(ඈ) තමාට වෙන් කරන ලද ඡන්ද පොළෙහි දී පෞද්ගලිකව ගොස් ඡන්දය දීමට තම අපේක්ෂකත්වයේ හේතුව නිසා තමාට නොහැකි වීමේ හෝ නොහැකිවීමට ඉඩ තිබීමේ හේතුව නිසා තෝරා පත්කර ගැනීමක අපේක්ෂකයකු විසින්

කළ හැකි ය.

(3) තෝරා පත්කර ගැනීමක කාර්යය සඳහා තැපැල් ඡන්ද දායකයකු වශයෙන් සලකනු ලැබීමට ඉල්ලීමක් ඒ ඉල්ලුම්කරු ඡන්ද හිමියකු වශයෙන් ලියාපදිංචි වී සිටින ම තිවරණ කොට්ඨාසයේ තේරීම් භාර නිලධරයා වෙත, 2 වන වගන්තිය යටතේ නියමය පළ කරනා ලද දින සිට දින දහයක් ඇතුළත ඔහුට ලැබෙන පරිදි ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. ඒ ඉල්ලීම, මේ පනතේ දෙවන උපලේඛනයෙහි ඇතුළත් නියෝගවලින් තත් කාර්යය සඳහා නියම කරන ලද ආකෘතියට සංරානුකූල විය යුතු ය.

(4) තෝරා පත්කර ගැනීමක කාර්යය සඳහා, තැපැල් ඡන්ද දායකයකු වශයෙන් සලකනු ලැබීම පිණිස කරනු ලබන යම් ඉල්ලීමක් මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධානවලට අනුකූල බවට තමා සෑහීමට පත්වන්නේ නම් මිස තේරීම් භාර නිලධරයකු විසින් ඒ ඉල්ලීමට ඉඩ නොදිය යුතු ය.

(5) තැපැල් ඡන්දදායකයන් වශයෙන් සලකනු ලැබීම පිණිස කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සුදුස්සක් කිරීමේ කාර්යය සඳහා, තේරීම් භාර නිලධරයා විසින් ඒ කාර්යය සඳහා අවශ්‍ය වන තොරතුරු ඒ නිලධරයට දෙන ලෙස යම් තැනැත්තකුට දැන්වීමක් මගින් නියම කරනු ලැබිය හැකි ය.

(6) තෝරා පත්කර ගැනීමක කාර්යය සඳහා තැපැල් ඡන්ද දායකයකු වශයෙන් සලකනු ලැබීම පිණිස කරනු ලබන ඉල්ලීමක් පිළිබඳව තේරීම් භාර නිලධරයාගේ තීරණය ඉල්ලුම්කරු වෙත ලිය විල්ලකින් දැනුම් දෙනු ලැබිය යුතු ය.

(7) තෝරා පත්කර ගැනීමක කාර්යය සඳහා තැපැල් ඡන්ද දායකයකු වශයෙන් සලකනු ලැබීම පිණිස කරනු ලබන ඉල්ලීමකට ඉඩ දීමට හෝ ඉඩ නොදීමට තේරීම් භාර නිලධරයා ගත් තීරණය අවසානාත්මක විය යුතු ය.

(8) තෝරා පත්කර ගැනීමක කාර්යය සඳහා තැපැල් ඡන්දදායකයකු වශයෙන් සලකනු ලැබීම පිණිස කරනු ලබන ඉල්ලීමට තේරීම් භාර නිලධරයකු විසින් ඉඩ දෙනු ලැබූ අවස්ථාවක, ඉල්ලුම්කරු ඒ කාර්යය සඳහා තැපැල් ඡන්දදායකයකු වශයෙන් සලකනු ලැබීම පිණිස හිමිකම් ඇති තැනැත්තකු විය යුතු ය.

(9) මැතිවරණ කොට්ඨාසයක තේරීම් භාර නිලධරයා විසින් තෝරා පත්කර ගැනීමක කාර්යය සඳහා, තැපැල් ඡන්දදායකයකු වශයෙන් සලකනු ලැබීම පිණිස හිමිකම් ඇති එක් එක් තැනැත්තා වෙත, ඒ තැනැත්තා විසින් සපයන ලද ලිපිනයට—

(අ) ඡන්ද පත්‍රිකාවක් ;

(ආ) අනන්‍යතාව ප්‍රකාශ කිරීමේ ආකෘතියක් ;

(ඇ) මේ උපවගන්තියේ (ඈ) ඡේදයේ සඳහන් කවරයකට වඩා කුඩා විය යුතු වූ ද "ඡන්ද පත්‍රිකා කවරය" යනුවෙන් සලකුණු කරනු ලැබුවා වූ ද එසේම ඒ තැනැත්තා වෙත නිකුත් කරන ලද තැපැල් ඡන්ද පත්‍රිකාවේ මුද්‍රිත අංකය සලකුණු කරනු ලැබුවා වූ ද විධිමත් ලෙස සලකුණු කොට තැපැල් ඡන්ද පත්‍රිකාව ආපසු එවනු ලබන විට එය බහාලිය යුතු වූ ද කවරයක් ; සහ

(ඈ) ඉහත සඳහන් ලේඛන ආපසු එවීම සඳහා කවරයක් හැකිතාක් ඉක්මණින් තැපෑලෙන් යැවිය යුතු ය.

(10) තෝරා පත්කර ගැනීමක කාර්යය සඳහා තැපැල් ඡන්දදායකයන් වශයෙන් සලකනු ලැබීමට හිමිකම් ඇති තැනැත්තන් විසින් පාවිච්චි කළ යුතු ඡන්ද පත්‍රිකාවේ ආකෘතිය සහ අනන්‍යතා ප්‍රකාශයේ ආකෘතිය සහ ඒවා නිකුත් කිරීම පිළිබඳ කටයුතුවල දී පිළිපැදිය යුතු කාර්ය පටිපාටිය මේ පනතේ දෙවන උපලේඛනයෙහි ඇතුළත් නියෝගවලට අනුකූල විය යුතු ය.

(11) තෝරා පත්කර ගැනීමක කාර්යය සඳහා තැපැල් ඡන්දදායකයකු වශයෙන් සලකනු ලැබීමට හිමිකම් ඇති තැනැත්තකුට නිකුත් කරනු ලබන ඡන්ද පත්‍රිකාවක් "තැපැල් ඡන්ද පත්‍රිකාවක්" යනුවෙන් මේ පනතෙහි සඳහන් කරනු ලැබේ.

(12) යම් මැතිවරණ කොට්ඨාසයක තේරීම් භාර නිලධරයා විසින් තෝරා පත්කර ගැනීමක කාර්යය සඳහා තැපැල් ඡන්දදායකයකු වශයෙන් සලකනු ලැබීමට හිමිකම ඇති සෑම තැනැත්තකුගේම නාම, ලිපිනය සහ අංකය ඡන්ද හිමියන්ගේ ලේඛනයේ සඳහන් වන පරිදි, (මේ පනතෙහි "තැපැල් ඡන්දදායකයන් පිළිබඳ ලැයිස්තුව" යනුවෙන් සඳහන් කරනු ලබන) ලැයිස්තුවක් හැකිතාක් ඉක්මණින් සකස් කළ යුතු ය. ඒ ලැයිස්තුව, මේ පනතේ දෙවන උපලේඛනයෙහි ඇතුළත් නියෝගවලින් තත් කාර්යය සඳහා නියම කරනු ලබන ආකාරයට සකස් කරනු ලැබිය යුතු ය.

නිල ඡන්ද දැන්වීම් පත්‍රිකාව.

24. (1) යම් මැතිවරණ කොට්ඨාසයක් සඳහා තේරීම් භාර නිලධරයකු විසින්, ඒ මැතිවරණ කොට්ඨාසය සඳහා වූ නාම ලේඛනයෙහි නම දැක්වෙන එක් එක් ඡන්දහිමියා වෙත, කොමසාරිස්වරයා විසින් නිරණය කරනු ලබන ආකෘතියක් අනුව සහ පහත දැක්වෙන කරුණු සඳහන් කොට (මේ පනතෙහි "නිල ඡන්ද දැන්වීම් පත්‍රිකාව" යනුවෙන් සඳහන් කරනු ලබන) ඡන්ද දැන්වීම් පත්‍රිකාවක් යැවිය යුතු ය:—

(අ) මැතිවරණ කොට්ඨාසයේ නාම සහ අංකය ;

(ආ) නාම ලේඛනයෙහි දක්වන ලද පරිදි ඡන්ද හිමියාගේ නාම, සුදුසුකම් ලැබීමේ ලිපිනය සහ ලියාපදිංචි අංකය ;

(ඇ) ඡන්ද ප්‍රදේශය සහ ඡන්ද කොට්ඨාසය;

(ඈ) ඡන්ද හිමියාට වෙන් කරන ලද ඡන්ද පොළ; සහ

(ඉ) ඡන්ද විමසීම පවත්වන දිනය සහ වේලාවල්:

එසේ වුවද, තැපැල් ඡන්දදායකයකු වශයෙන් සලකනු ලැබීමට හිමිකම ඇති ඡන්ද හිමියකුට එවැනි පත්‍රිකාවක් නොයැවිය යුතු ය.

(2) මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ නිල ඡන්ද දැන්වීම් පත්‍රිකාවක් ඡන්ද විමසීම පවත්වන දිනයට යටත් පිරිසෙයින්, දින හතකටවත් පෙර ඡන්ද හිමියාට ලැබෙන පරිදි සාමාන්‍ය තැපෑලෙන් ඔහුට යැවිය යුතු ය. ඒ පත්‍රිකාව අමතනු ලැබූ තැනැත්තාට ඒ පත්‍රිකාව භාර දීමට තැපැල් කාර්යාලයකට නොහැකි වී ඇති අවස්ථාවක, ලිපිනයෙහි නම සඳහන් තැනැත්තා විසින් එය ඉල්ලනු ලැබුවහොත් ඔහුට එය භාර දීම සඳහා ඡන්ද විමසීම පවත්වන දිනය වන තෙක් ඒ තැපැල් කාර්යාලයෙහි එය තබා ගත යුතු ය.

(3) (අ) වෙනත් යම් තැනැත්තකුට යම් නිල ඡන්ද දැන්වීම් පත්‍රිකාවක් බලය නොමැතිව සපයන; හෝ

(ආ) යම් නිල ඡන්ද දැන්වීම් පත්‍රිකාවක් වෙනත් යම් තැනැත්තකුට විකුණන හෝ විකිණීමට ඉදිරිපත් වන හෝ වෙනත් යම් තැනැත්තකුගෙන් යම් නිල ඡන්ද දැන්වීම් පත්‍රිකාවක් මිලයට ගන්නා වූ හෝ මිලට ගැනීමට ඉදිරිපත් වන,

සෑම තැනැත්තකු ම වරදක් කරන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් පන්සියයක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ ඔහු යටත් විය යුතු ය.

(4) වෙනත් යම් තැනැත්තකුගේ නිල ඡන්ද දැන්වීම් පත්‍රිකාවක් තම සන්තකයෙහි තබා ගෙන සිටින, රජයේ නිලධරයකු ලෙස තම ධුරයට අයත් කාර්යයෙහි යෙදී සිටින නිලධරයකු හැර, වෙනත් සෑම තැනැත්තකුම වරදක් කරන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්සියයක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ ඔහු යටත් විය යුතු ය.

ඡන්ද ස්ථානාධිපතිවරයෝ.

25. (1) කොමසාරිස්වරයාගේ සාමාන්‍ය හෝ විශේෂ විධානවලට යටත්ව, එක් එක් තේරීම් භාර නිලධරයා විසින් තම මැතිවරණ කොට්ඨාසයේ එක් එක් ඡන්ද පොළෙහි ස්ථානාධිපතිත්වය දැරීම සඳහා මෙහි මින් මතු ඡන්ද ස්ථානාධිපතිවරයා යනුවෙන් හඳුන්වනු ලබන එක් තැනැත්තෙක් හෝ තැනැත්තන් වැඩි ගණනක් හෝ පත් කළ යුතු ය. තවද, ඒ පත්කිරීම ඔහු විසින් ප්‍රත්‍යාදිෂ්ට කළ හැකි ය. යම් ඡන්ද පොළක් සඳහා එක් ඡන්ද ස්ථානාධිපතිවරයකුට වැඩි ගණනක් පත් කරනු ලැබුවහොත් ඒ ඡන්ද ස්ථානාධිපති

වරුන් අතරින් එක් ඡන්ද ස්ථානාධිපතිවරයකු ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයා ලෙස තේරීම් භාර නිලධරයා විසින් පත් කළ හැකි අතර, ඔහු විසින් සෙසු ඡන්ද ස්ථානාධිපතිවරයන් විෂයයෙහි සහ ඒ ඡන්ද පොළෙහි ඡන්දය ගැනීම පවත්වා ගෙන යාම සඳහා සියළු සංවිධාන කටයුතු විෂයයෙහි සාමාන්‍ය අධීක්ෂණය ක්‍රියාත්මක කළ යුතු ය.

(2) යම් ඡන්ද ස්ථානාධිපතිවරයකු රෝගාතුර වීම හෝ වෙනත් හේතුවක් නිසා හෝ තෝරා පත්කර ගැනීමක දී ක්‍රියා කිරීමට ඔහුට නොහැකි වුවහොත් සහ තේරීම් භාර නිලධරයා විසින් වෙනත් තැනැත්තකු පත් කරනු ලැබීමට කාලය නොතිබුණහොත් ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් තමා වෙනුවෙන් ක්‍රියා කිරීමට නියෝජ්‍ය යකු පත් කළ හැකි ය. එවැනි සෑම පත්කිරීමක් ම හැකිතාක් ඉක්මණින් තේරීම් භාර නිලධරයා වෙත වාර්තා කරනු ලැබිය යුතු අතර, ඒ නියෝජ්‍යයා විසින් එවකටත් කරන ලද යම් දෙයක වලංගුභාවයට හානියක් නොවන පරිදි එවැනි සෑම පත්කිරීමක් ම තේරීම් භාර නිලධරයා විසින් ප්‍රත්‍යාදිෂ්ට කළ හැකි ය.

(3) සුදුසු යයි තමා අදහස් කරන්නේ නම් තේරීම් භාර නිලධරයා විසින් යම් ඡන්ද පොළක ස්ථානාධිපතිත්වය දැරිය හැකි අතර ඡන්ද ස්ථානාධිපතිවරයකුට අදාළ මේ පනතේ විධිවිධාන ඒ තේරීම් භාර නිලධරයාට අදාළ විය යුතු ය.

26. (1) තෝරා පත්කර ගැනීමක කාර්යය සඳහා, මැතිවරණ කොට්ඨාසයක තේරීම් භාර නිලධරයා විසින්— *ඡන්ද පොළවල සැලසිය යුතු පහසුකම්.*

(අ) ඡන්ද විමසීම පැවැත්වීම සඳහා අවශ්‍ය නිලධරයන් සහ සේවකයන් පත් කළ යුතු ය ;

(ආ) යම් එක් අවස්ථාවක දී ඡන්දදායකයන් සාධාරණ සංඛ්‍යාවකට ඉඩකඩ සැලසිය හැකි පරිදි සහ ඡන්දදායකයන් විසින් තම ඡන්ද පත්‍රිකා සලකුණු කරනු ලබන විට කිසිවකු විසින් ඔවුන් නිරීක්ෂණය කිරීමට නොහැකි වන පරිදි අවශ්‍ය වන කුටි සංඛ්‍යාවක් ඒ මැතිවරණ කොට්ඨාසයේ එක් එක් ඡන්ද පොළකට සැපයිය යුතු ය ;

(ඇ) තම ඡන්ද පොළට වෙන් කරන ලද ඡන්ද හිමියන්ගේ නම් ඇතුළත් වී තිබෙන්නේ ඡන්ද හිමියන්ගේ නාම ලේඛන යේ යම් කොටසක ද, ඒ කොටසේ පිටපතක් හා තැපැල් ඡන්දදායකයන්ගේ ලැයිස්තුවේ දැක්වෙන පරිදි ඒ පිට පතෙහි ඇති ඡන්ද හිමියන්ගේ නාම් ලැයිස්තුවක් එක් එක් ඡන්ද ස්ථානාධිපතිවරයාට සැපයිය යුතු ය. ඒ එක් එක් ඡන්ද ස්ථානාධිපතිවරයාට සපයන ලද ඒ නාම ලේඛනයේ කොටසේ සඳහන් තැපැල් ඡන්දදායකයකු වශයෙන් සලකනු ලැබීමට හිමිකම ඇති සෑම ඡන්ද හිමියකුගේ ම නම ඉදිරියෙන් හඳුනාගැනීමේ සලකුණක් තබනු ලැබිය යුතු ය ;

(ඇ) යම් ඡන්ද පොළකට වෙන් කරන ලද ඡන්දදායකයන්ගේ සංඛ්‍යාව සඳහා, තේරීම් භාර නිලධරයාගේ මතය අනුව, අවශ්‍ය විය හැකි ඡන්ද පෙට්ටි සහ ඡන්ද පත්‍රිකා සංඛ්‍යාව එක් එක් ඡන්ද ස්ථානාධිපතිවරයාට සැපයිය යුතුය ;

(ඉ) ඡන්ද පත්‍රිකා සලකුණු කිරීමට ඡන්දදායකයන්ට හැකි වන පිණිස ද්‍රව්‍ය සහ ඒ මත නිල සලකුණ සිදුරු කිරීම සඳහා හෝ මුද්‍රා තැබීම සඳහා උපකරණ එක් එක් ඡන්ද පොළට සැපයිය යුතු ය ;

(ඊ) මේ පනතින් විධිවිධාන සලස්වා ඇති ආකාරයට තෝරා පත් කරගැනීම ඵලදායී ලෙස පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය වෙනත් ක්‍රියා සහ දේ කළ යුතු ය.

(2) මේ වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධාන නොපිළිපැදීමේ හේතුව නිසා හෝ ඡන්ද පොළවලට අදාළ යම් අවිධිමත් භාවයක හේතුව නිසා හෝ තෝරා පත්කර ගැනීමක් පිළිබඳව ප්‍රශ්න කරනු නොලැබිය යුතු ය.

ඡන්ද පොළවල ප්‍රදර්ශනය කරනු ලැබිය යුතු දැන්වීම්.

27. (1) ඡන්ද විමසීම පවත්වනු ලබන කාලය තුළ සෑම ඡන්ද පොළකම ඡන්ද ස්ථානාධිපතිවරයා විසින්—

(අ) ඡන්දදායකයන්ට අවශ්‍ය උපදෙස් දෙමින් මේ පනතේ තුන් වන උපලේඛනයෙහි දක්වා ඇති ආකෘතියට සාරානුකූල දැන්වීමක් ඡන්ද පොළ පිටත සහ එහි සෑම කුටියකම ; සහ

(ආ) එක් එක් අපේක්ෂකයාගේ නාම සහ ඒ අපේක්ෂකයාට වෙන් කරන ලද ලකුණ සහ—

(i) පිළිගත් දේශපාලන පක්ෂයක් හෝ වෙනත් යම් දේශපාලන පක්ෂයක් විසින් නාම යෝජනා කරන ලද අපේක්ෂකයකු සම්බන්ධයෙන් වන විට ඒ පක්ෂයේ නාම ; සහ

(ii) ඡන්ද හිමියකු විසින් නාම යෝජනා කරන ලද අපේක්ෂකයකු සම්බන්ධයෙන් වන විට, ඒ ඡන්ද හිමියාගේ නාම

සඳහන් දැන්වීමක් ඡන්ද පොළ පිටත ප්‍රදර්ශනය කරනු ලැබීමට සැලැස්විය යුතු ය.

(2) මේ වගන්තිය යටතේ වූ සෑම දැන්වීමක් ම සිංහලෙන්, දෙමළෙන් සහ ඉංග්‍රීසියෙන් විය යුතු ය.

ඡන්ද පෙට්ටි.

28. සෑම ඡන්ද පෙට්ටියක් ම, යතුරු දමා විවෘත නොකොට එතුළට ඡන්ද පත්‍රිකා ඇතුළු කළ හැකි ලෙසත් එයින් ඡන්ද පත්‍රිකා ඉවතට ගත නොහැකි ලෙසත් තැනිය යුතු ය.

ඡන්ද පත්‍රිකා.

29. (1) තෝරා පත්කරගැනීමක දී පත්‍රිකා මාර්ගයෙන් ඡන්ද දෙනු ලැබිය යුතු ය. එක් එක් ඡන්දදායකයාගේ පත්‍රිකාව මෙහි මින් මතු නියම කරනු ලබන ආකෘතිය අනුව වූ ද විස්තර ඇතුළත් වන්නා වූ ද ඡන්ද පත්‍රිකාවකින් සංයුක්ත විය යුතු ය.

(2) සෑම ඡන්ද පත්‍රිකාවක් ම මේ පනතේ පළමුවන උපලේඛනයෙහි දක්වා ඇති "ආ" ආකෘතියට සරුනුකූල විය යුතු ය. තවද—

(අ) 20 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව අපේක්ෂකයන්ගේ ඒ ඒ නාම යෝජනා පත්‍රවල ඇති පරිදි සඳහන් කරන ලද්දා වූ ද ඔවුන්ගේ පෙළපත් නම්වල හෝ පෙළපත් නම් නොමැති විට "ගේ" නාමවල හෝ පෙළපත් නම් නැතහොත් "ගේ" නාමයන් නොමැති විට ඔවුන්ගේ වෙනත් නම්වල හෝ අකාරාදී අනුපිළිවෙලට සිංහලෙන් පිළියෙළ කරන ලද්දා වූ ද අපේක්ෂකයන්ගේ ලැයිස්තුවක්, සිංහලෙන්, දෙමළෙන් හා ඉංග්‍රීසියෙන් එහි ඇතුළත් විය යුතු ය;

(ආ) එය නැමීමට හැකි විය යුතු ය;

(ඇ) එහි පිටුපස අංකයක් මුද්‍රණය කොට තිබිය යුතු ය;

(ඈ) ඒ අංකය ම මුහුණතෙහි මුද්‍රණය කළ උපපත්‍රිකාවක් ඊට යා කොට තිබිය යුතු ය.

**ඡන්ද විමසීම පවත්වන කාලය.**

**30.** ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නිවේදනයකින් කොමසාරිස්වරයා විසින් වෙනත් යම් වේලාවක් නියම කරනු ලැබුවහොත් මිස, 2 වන වගන්තිය යටතේ නියම කරන ලද දිනයේ පෙරවරු හතට ඡන්ද විමසීම ආරම්භ කළ යුතු අතර, එදින පස්වරු හතරට එය අවසන් කළ යුතු ය.

**ඡන්ද නියෝජිතයන් පත්කිරීම.**

**31.** (1) නාම යෝජනා කිරීමේ දින හෝ ඊට පෙර ඒ තෝරා පත්කර ගැනීම සඳහා එක් එක් අපේක්ෂකයාගේ නියෝජිතයා වශයෙන් ඒ අපේක්ෂකයා විසින් හෝ වෙනුවෙන් යම් තැනැත්තකු ලියවිල්ලකින් පත් කළ යුතු අතර, ඒ තැනැත්තා මේ පනතේ ඡන්ද නියෝජිතයා ලෙස හඳුන්වනු ලැබේ. එදින හෝ එදිනට පෙර යම් අපේක්ෂකයකු විසින් හෝ වෙනුවෙන් එවැනි පත්කිරීමක් කරනු ලැබ නොමැති විටක, ඒ අපේක්ෂකයා විසින් තම ඡන්ද නියෝජිතයා වශයෙන් තමා ම පත් කරනු ලැබ ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) අපේක්ෂකයකු විසින් තමාගේ ඡන්ද නියෝජිතයා ලෙස තමා ම පත් කරනු ලැබිය හැකි අතර එවිට, අවස්ථානුගත කරුණු අනුව හැකිතාක් දුරට ඔහු, අපේක්ෂකයකු වශයෙන් මෙන් ම ඡන්ද නියෝජිතයකු වශයෙන් ද මේ පනතේ විධිවිධානවලට යටත් විය යුතු ය. තවද මේ පනතේ ඡන්ද නියෝජිතයකු පිළිබඳ යම් සඳහනක්, ඡන්ද නියෝජිතයකු වශයෙන් ක්‍රියා කරන ඒ අපේක්ෂකයා පිළිබඳව කරනු ලබන සඳහනක් ලෙස තේරුම් ගත යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ තම ඡන්ද නියෝජිතයා පත් කරනු ලැබූ පසු, එක් එක් අපේක්ෂකයා විසින් හෝ ඔහු වෙනුවෙන් වෙනත් යම් තැනැත්තකු විසින් ඒ නියෝජිතයාගේ නම සහ ලිපිනය කොමසාරිස්වරයා වෙත වහාම ලියවිල්ලකින් ප්‍රකාශ කළ යුතු අතර, එසේ ප්‍රකාශ කරනු ලැබූ සෑම ඡන්ද නියෝජිතයකුගේ ම නම හා ලිපිනය පිළිබඳව ප්‍රසිද්ධ නිවේදනයක් කොමසාරිස්වරයා විසින් වහාම තම කාර්යාලයේ පිටත ප්‍රකටව පෙනෙන ස්ථානයක දැන්වීමක් ඇලවීමෙන් කළ යුතු ය.

(4) එක් එක් අපේක්ෂකයා සඳහා එක් ඡන්ද නියෝජිතයකු පමණක් පත් කරනු ලැබිය යුතු නමුත් පත් කරන ලද ඡන්ද නියෝජිතයා අපේක්ෂකයා ම වුව ද, නොවුව ද, ඒ පත් කිරීම ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබිය හැකි අතර, එසේ ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබූ විටක හෝ නියෝජිතයාගේ මරණය සිදුවූ විටක, ඒ ප්‍රත්‍යාදිෂ්ට කිරීම හෝ මරණය සිදුවූයේ තෝරා පත්කරගැනීමට පෙර වුවද, තෝරා පත් කරගැනීම අතරතුර වුව ද නැතහොත් තෝරා පත්කරගැනීමෙන් පසුව වුව ද, වහාම වෙනත් ඡන්ද නියෝජිතයකු පත් කරනු ලැබිය යුතු ය. තවද ඔහුගේ නම හා ලිපිනය කොමසාරිස්වරයා වෙත ලියවිල්ලකින් ප්‍රකාශ කරනු ලැබිය යුතු අතර ඉහත දක්වා ඇති ආකාරයෙන් කොමසාරිස්වරයා විසින් වහාම ඒ සම්බන්ධයෙන් ප්‍රසිද්ධ දැන්වීමක් කළ යුතු ය.

වෙනත් ඡන්ද නියෝජිතයකු එසේ පත් කරනු නොලැබූ විටක, මිය ගිය ඡන්ද නියෝජිතයා අපේක්ෂකයාම වූ අවස්ථාවක දී හැර, පත් කිරීම ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබූ නියෝජිතයා වෙනුවට හෝ මිය ගිය නියෝජිතයා වෙනුවට, ඒ අපේක්ෂකයා විසින් තම ඡන්ද නියෝජිතයා වශයෙන් තමාම පත් කරනු ලැබ ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.

බලයලත් සහ වෙනත් නියෝජිතයන් පත් කිරීම.

32. (1) එක් එක් ඡන්ද නියෝජිතයා විසින් එක් එක් මැතිවරණ කොට්ඨාසය සම්බන්ධයෙන් එක් බලයලත් නියෝජිතයකුට වැඩි නොවන සංඛ්‍යාවක් පත් කරනු ලැබිය හැකි ය. ඒ එක් එක් බලයලත් නියෝජිතයාගේ නම සහ ලිපිනය නාම යෝජනා කිරීමේ දින සිට එක් සතියක් ඇතුළත, ඡන්ද නියෝජිතයා විසින් ඒ ඒ මැතිවරණ කොට්ඨාසයේ තේරීම් භාර නිලධරයා වෙත ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය. ඉහත කී පරිදි පත්කිරීමක් කරනු නොලැබූ විටක, ඒ ඡන්ද නියෝජිතයා විසින් තම බලයලත් නියෝජිතයා වශයෙන් තමාම පත් කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් බලයලත් නියෝජිතයකු විසින් ඒ මැතිවරණ කොට්ඨාසය ඇතුළත එක් එක් ඡන්ද ප්‍රදේශය සම්බන්ධයෙන් එක් ප්‍රාදේශීය නියෝජිතයකුට වැඩි නොවන සංඛ්‍යාවක් පත් කරනු ලැබිය හැකි ය. ඒ එක් එක් ප්‍රාදේශීය නියෝජිතයාගේ නම සහ ලිපිනය නාම යෝජනා කිරීමේ දින සිට සති දෙකක් ඇතුළත බලයලත් නියෝජිතයා විසින් ඒ කොට්ඨාසයේ තේරීම් භාර නිලධරයාට ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය. ඉහත කී පරිදි පත් කිරීමක් කරනු නොලැබුවහොත්, ඒ බලයලත් නියෝජිතයා විසින් තම ප්‍රාදේශීය නියෝජිතයා වශයෙන් තමාම පත් කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) (අ) ඡන්ද විමසීම පවත්වන කාලය තුළ එක් එක් ඡන්ද පොළ සඳහා වූ යම් ඡන්ද ස්ථාන නියෝජිතයකුගේ පත්වීම ප්‍රත්‍යාදිෂ්ට කිරීමේ අවශ්‍යතාව කෙරෙහි සැලකිලිමත්ව, එක් එක් ප්‍රාදේශීය නියෝජිතයා විසින්, ඒ ඡන්ද ප්‍රදේශය ඇතුළත එක් එක් ඡන්ද පොළ සඳහා ඡන්ද ස්ථාන නියෝජිතයන් සාධාරණ සංඛ්‍යාවක් පත් කරනු ලැබිය හැකි ය. පත් කරන ලද තැනැත්තන්ගේ නම් සහ ලිපිනයන් ද සඳහන් කරමින් එකී සෑම පත් කිරීමක් පිළිබඳව ලියවිල්ලකින් වූ දැන්වීමක් ඡන්ද විමසීම ආරම්භ කිරීමට පෙර හෝ ඡන්ද විමසීමේ කාලය තුළ ප්‍රාදේශීය නියෝජිතයා විසින් ඡන්ද ස්ථානාධිපතිවරයාට දිය යුතු ය.

(ආ) එක් එක් අපේක්ෂකයා සම්බන්ධයෙන් ඡන්ද ස්ථාන නියෝජිතයන් දෙදෙනකුට වැඩි නොවන සංඛ්‍යාවකට යම් අවස්ථාවක දී යම් ඡන්ද පොළකට ඇතුළු වීමට ඉඩ දෙනු ලැබිය යුතු ය. නැතහොත් එහි රැඳී සිටීමට ඉඩ දෙනු ලැබිය යුතු ය.

(ඇ) (අ) ඡේදයෙන් නියම කරන ලද පරිදි, ඡන්ද ස්ථානාධිපතිවරයාට නම් දැනුම් දෙනු නොලැබූ කිසිම ඡන්ද ස්ථාන නියෝජිතයකුට ඡන්ද පොළකට ඇතුළු වීමට ඉඩ දෙනු නොලැබිය යුතු ය.

ඡන්ද විමසීම පැවැත්වීම.

33. (1) යම් තැනැත්තකු අයත් වන්නේ යම් ඡන්දදායකයන් සමූහයකට ද ඒ සමූහය සඳහා වෙන් කරන ලද ඡන්ද පොළ නොවන වෙනත් යම් ඡන්ද පොළක දී ඡන්දය දීම සඳහා ඇතුළුවීමට කිසිම තැනැත්තකුට ඉඩ දෙනු නොලැබිය යුතු ය.

(2) ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් ස්වකීය ඡන්ද පොළෙහි සාමය පවත්වා ගත යුතු අතර, යම් එක් අවස්ථාවක දී ඇතුළුවීමට ඉඩ දෙනු ලබන ඡන්දදායකයන්ගේ සංඛ්‍යාව සීමා කළ යුතු ය. තවද අපේක්ෂකයන්, ඡන්ද නියෝජිතයන්, බලයලත් නියෝජිතයන්, ප්‍රාදේශීය නියෝජිතයන් සහ ඡන්ද ස්ථාන නියෝජිතයන් සහ ඡන්ද පොළෙහි කාර්යයෙහි යෙදී සිටින පොලිස් නිලධරයන් සහ නිල වශයෙන් සේවයෙහි නියුක්ත කර ගනු ලැබූ වෙනත් තැනැත්තන් හැර සෙසු සියලු තැනැත්තන් ඉන් ඉවත් කළ යුතු ය.

(3) යම් තැනැත්තකු ඡන්ද පොළේ දී වැරදි ලෙස හැසුරුනහොත් හෝ ඡන්ද ස්ථානාධිපතිවරයාගේ නීත්‍යනුකූල නියමයන්ට අවනතවීම පැහැර හැරියහොත්, යම් පොලිස් නිලධරයකු විසින් හෝ ඡන්ද ස්ථානාධිපතිවරයා හෝ තේරීම් භාර නිලධරයා විසින් ලියවිල්ලකින් බලය දෙනු ලැබූ වෙනත් යම් තැනැත්තකු විසින් ඔහු ඡන්ද පොළෙන් වහාම ඉවත් කරනු ලැබීමට ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් සැලැස්විය හැකි ය.

(4) ඡන්ද පොළකින් (3) වන උපවගන්තිය යටතේ ඉවත් කරනු ලැබූ යම් තැනැත්තකුට—

(අ) ඡන්ද ස්ථානාධිපතිවරයාගේ අවසරය ඇතිව මිස, ඡන්ද විමසීම පවත්නා කාලය තුළ නැවත ඡන්ද පොළට ඇතුළු වීමට ඉඩ දෙනු නො ලැබිය යුතු ය; තවද

(ආ) විරුද්ධව, ඒ ඡන්ද පොළෙහි දී යම් වරදක් කිරීම සම්බන්ධයෙන් චෝදනා කරනු ලැබ තිබුණහොත්, ඔහු මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියට ගෙන එනු ලබන තෙක්, ඔහු ආරක්ෂාභාරයේ තැබිය හැකි ය:

එසේ වුවද, මේ වගන්තියෙන් පවරන ලද බලතල යම් ඡන්ද පොළක දී ඡන්දය දීමට අන්‍යාකාරයකින් හිමිකම ඇති යම් ඡන්දදායකයකු විසින් ඒ ඡන්ද පොළේ දී ඡන්දය දෙනු ලැබීමේ අවස්ථාව වළක්වන ආකාරයකින් ක්‍රියාත්මක කරනු නොලැබිය යුතු ය.

ඡන්ද පෙට්ටි මුද්‍රා තැබීම සහ ඡන්ද විමසීම ආරම්භ කිරීම.

34. (1) ඡන්ද විමසීම ආරම්භ කිරීමට පෙරාතුවම ඡන්ද පොළක ඡන්ද ස්ථානාධිපතිවරයා විසින්—

(අ) ඡන්ද විමසීමේ දී පාවිච්චි කරනු ලබන ඡන්ද පත්‍රිකා, නිල මුද්‍රාව, නිල සලකුණ සහ ඡන්ද හිමියන්ගේ නාම ලේඛනයේ කොටස්වල පිටපත් ඒ ඡන්ද පොළට පැමිණ සිටින තැනැත්තන්ට පෙන්විය යුතු ය; තවද

(ආ) පාවිච්චි කරනු ලබන එක් එක් ඡන්ද පෙට්ටිය, එය හිස්ව තිබෙන බව බලාගත හැකි වන පරිදි, ඉහත කී තැනැත්තන්ට ඡන්ද විමසීම ආරම්භයේ දී පෙන්විය යුතු අතර, ඉක්බිතිව එයට යතුරු දමා, මුද්‍රාව නොකඩා එය විවෘත කළ නොහැකි වන ආකාරයට, ඒ මත තම මුද්‍රාව තැබිය යුතු ය. තවද ඡන්ද පත්‍රිකා බහා ලීම සඳහා එය තමාට පෙනෙන සේ තැබිය යුතු අතර ඉහත කී පරිදි යතුරු දමා, මුද්‍රාතබා තැබිය යුතු ය.

මේ පනතින් නියම කරන ලද වේලාවට ඡන්දය දීම ආරම්භ කිරීම සහතික කෙරෙන අයුරින්, ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධානවලින් තමා වෙත නියම කරන ලද කාර්ය ඉටු කළ යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන, ඡන්ද විමසීම ආරම්භ කිරීමෙන් පසු පාවිච්චි කරනු ලබන සෑම ඡන්ද පෙට්ටියකට ම අදාළ විය යුතු ය.

ඡන්ද පත්‍රිකා නිකුත් කිරීම.

35. (1) එක් එක් ඡන්දදායකයා වෙත එක් ඡන්ද පත්‍රිකාවක් දෙනු ලැබිය යුතු අතර ඔහුට එක් ඡන්දයක් තිබිය යුතු ය.

(2) ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් නැතහොත් ඔහුගේ බලය යටතේ ක්‍රියා කරන තැනැත්තකු විසින් ඡන්ද පත්‍රිකාව ඡන්දදායකයා වෙත භාර දෙනු ලැබිය යුතු ය. ඡන්ද පත්‍රිකාව ඡන්දදායකයා වෙත භාර දීමට පෙරාතුව ම—

(අ) ඡන්ද හිමියන්ගේ නාම ලේඛනයේ පිටපතෙහි සඳහන් පරිදි ඡන්දදායකයාගේ අංකය, නම සහ විස්තරය හඬ නඟා කියවිය යුතු ය ;

(ආ) ඡන්දදායකයාගේ අංකය උපපත්‍රිකාවෙහි ලකුණු කොට ඡන්ද පත්‍රිකාව එයින් වෙන් කළ යුතු ය ;

(ඇ) ඡන්ද පත්‍රිකාව නිල සලකුණින් මුද්‍රා තැබිය යුතු ය ; නැතහොත් නිල සලකුණ තෙරපිය යුතු ය. නැතහොත් නිල සලකුණ එහි සිදුරු කළ යුතු ය ; තවද

(ඈ) ඡන්දදායකයා විසින් ඡන්ද පත්‍රිකාවක් ලබා ඇති බව දැක්වීම පිණිස, එහෙත් ඔහු ලැබූ නිශ්චිත ඡන්ද පත්‍රිකාව කුමක් දැයි නොදක්වා, නාම ලේඛනයෙහි ඔහුගේ අංකය ඉදිරියෙන් සලකුණක් තැබිය යුතු ය.

ඡන්දදායකයා පරීක්ෂා කිරීම සහ උචිත සලකුණින් සලකුණු කිරීම.

36. (1) තෝරා පත්කර ගැනීමක දී යම් ඡන්දදායකයකු—

(අ) ඡන්ද ස්ථානාධිපතිවරයාට හෝ ඔහුගේ බලය යටතේ ක්‍රියා කරන තැනැත්තකුට උචිත පරීක්ෂණය කිරීමට ඉඩ දීම ප්‍රතික්ෂේප කළහොත් ; හෝ

(ආ) එසේ පරීක්ෂණයට ඉඩ දීමෙන් පසු, ඒ ඡන්දදායකයා ඒ වන විටත් උචිත සලකුණින් සලකුණු කරනු ලැබ ඇති බව ඒ පරීක්ෂණයෙන් අනාවරණය වුවහොත් ; හෝ

(ඇ) එසේ පරීක්ෂණයට ඉඩ දීමෙන් පසු, ඒ ඡන්දදායකයා ඒ වන විට උචිත සලකුණින් සලකුණු කොට නොමැති බව ඒ පරීක්ෂණයෙන් අනාවරණය වුව ද, ඒ ඡන්දදායකයා උචිත සලකුණින් තමා සලකුණු කරනු ලැබීමට ඒ නිලධර යාට හෝ තැනැත්තාට ඉඩ දීම ප්‍රතික්ෂේප කළහොත් ; හෝ

ඒ ඡන්දදායකයාට කිසිම ඡන්ද පත්‍රිකාවක් භාර නොදිය යුතු අතර ඒ අනුව, මේ පනතේ වෙනත් යම් විධිවිධානවල පටහැනිව කුමක් සඳහන් වුව ද, ඒ ඡන්දදායකයා ඒ තෝරා පත්කර ගැනීමේ දී ඡන්දය දීමට හිමිකම් නොලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ඡන්ද පොළක දී ඡන්ද පත්‍රිකාවක් භාර නො දෙන ලද එක් එක් ඡන්දදායකයාට අදාළ පහත සඳහන් විස්තර, ඒ ඡන්ද පොළ භාර ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් මේ පනතේ පළමුවන උපලේඛනයේ දක්වා ඇති 'ඇ' ආකෘතියට සාරානුකූල වූ ලැයිස්තුවක ඇතුළත් කළ යුතු ය :—

(අ) ඡන්ද හිමියන්ගේ නාම ලේඛනයෙහි දැක්වෙන පරිදි ඒ ඡන්දදායකයාගේ අංකය ;

(ආ) ඒ නාම ලේඛනයේ දැක්වෙන පරිදි ඒ ඡන්දදායකයාගේ නම සහ ලිපිනය ; සහ

(ඇ) ඒ ඡන්දදායකයාට ඡන්ද පත්‍රිකාවක් භාර නොදෙනු ලැබීමට හේතු වූ කරුණ.

ඒ ලැයිස්තුව "36 වන වගන්තිය යටතේ ඡන්ද පත්‍රිකා භාර නොදෙන ලද ඡන්දදායකයන්ගේ ලැයිස්තුව" යනුවෙන් මේ පනතෙහි හඳුන්වනු ලැබේ.

(3) මේ වගන්තියේ—

(අ) "උචිත සලකුණ" යන යෙදුමෙන් නොමැකිය හැකි තීන්තෙන් කරන ලද සලකුණක් අදහස් වේ ; තවද

(ආ) ඡන්දදායකයකු පරීක්ෂා කිරීම හෝ සලකුණු කිරීම හා සම්බන්ධ හෝ ඊට අදාළ යම් පද සම්බන්ධයක දී "උචිත" යන පාඨයෙන්—

(i) ඒ ඡන්දදායකයාගේ වම් අතේ සුලැඟිල්ල හෝ ඒ සුලැඟිල්ල නොමැති නම්, ඔහුගේ වම් අතේ වෙනත් යම් ඇඟිල්ලක් ; හෝ

(ii) ඔහුගේ වම් අතේ ඇඟිලි සියල්ලම නොමැති නම්, ඔහුගේ දකුණු අතේ සුලැඟිල්ල හෝ ඒ සුලැඟිල්ල නොමැති නම්, ඔහුගේ දකුණු අතේ වෙනත් යම් ඇඟිල්ලක් ; හෝ

(iii) ඔහුගේ වම් හා දකුණු අත්වල සියලුම ඇඟිලි නොමැති නම්, ඔහුට තිබෙන වම් හෝ දකුණු අතෙහි කෙළවර

අදහස් වේ.

ඡන්දය දෙන ආකාරය.

37. (1) ඡන්ද පත්‍රිකාව ලැබුණු විට, ඡන්දදායකයා ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් හෝ ඒ නිලධරයාගේ බලය යටතේ ක්‍රියා කරන යම් තැනැත්තකු විසින් හෝ පෙන්වා දෙනු ලබන ආවෘත ස්ථානයකට අප්‍රමාදව යා යුතු අතර මේ පනතේ තුන්වන උපලේඛනයෙහි ඡන්දදායකයන්ට දී ඇති උපදෙස්වලට හැකි තාක් දුරට අනුකූලව එහි දී ඒ ඡන්ද පත්‍රිකාව රහසින් සලකුණු කළ යුතු ය. ඉක්බිති ඡන්දදායකයා විසින් තම ඡන්දය නො පෙනෙන සේ ඡන්ද පත්‍රිකාව නමා නිල සලකුණ පෙනෙන සේ ඡන්ද පත්‍රිකාවේ පිටුපස ඡන්ද ස්ථානාධිපතිවරයාට පෙන්වා එසේ නමන ලද ඡන්ද පත්‍රිකාව ඡන්ද ස්ථානාධිපතිවරයා ඉදිරිපිට දී ඡන්ද පෙට්ටිය තුළට බහාලිය යුතු ය.

(2) ඡන්ද පත්‍රිකා සලකුණු කිරීම සඳහා වෙන් කරන ලද යම් ස්ථානයක කිසිම ඡන්දදායකයකු අනිසි ලෙස ප්‍රමාද නොවන බවට වග බලා ගැනීම සඳහා අවශ්‍ය පියවර ඡන්ද විමසීම පැවැත්වෙන අතරතුර කවර හෝ වේලාවක ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් ගනු ලැබිය හැකි ය.

ඡන්දය දීම සඳහා ඡන්ද දායකයන්ට සහාය දීම.

38. (1) ඡන්දය දීමේ ක්‍රමය පහදා දෙන ලෙස යම් ඡන්ද දායකයකු විසින් ඉල්ලීමක් කරන ලද විට, එසේ පහදා දීම සුදුසු යයි ඡන්ද ස්ථානාධිපතිවරයා හෝ ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් බලය පවරන ලද යම් තැනැත්තකු හෝ අදහස් කළහොත්, ඔහු විසින් මේ පනතේ තුන්වන උපලේඛනයෙහි සඳහන් උපදෙස්වල දක්වා ඇති ඡන්දය දීමේ ක්‍රමය, ඡන්ද ස්ථාන නියෝජිතයන් පැමිණ සිටි නම්, ඔවුන්ට පෙනෙන සේ සහ ඇසෙන සේ ඒ ඡන්ද දායකයාට පහදා දිය හැකි ය ; එහෙත් එසේ කිරීමේ දී, යම් නිශ්චිත අපේක්ෂකයකුට ඡන්දය දෙන ලෙස උපදෙස් දීමක් හෝ පොළඹවා ගැනීමක් වශයෙන් ඡන්දදායකයා විසින් තේරුම් ගත හැකි යම් ක්‍රියාවක් කිරීමෙන් ඔහු වැළකිය යුතු ය.

(2) අන්ධභාවය නිසා හෝ වෙනත් ශාරීරික හේතුවක් නිසා හෝ මේ පනතේ තුන්වන උපලේඛනයේ සඳහන් උපදෙස්වලට අනුකූලව ඡන්දය දීමට නොහැකි ඡන්දදායකයකු විසින් තම ඡන්ද පත්‍රිකාව සලකුණු කරදෙන ලෙස ඉල්ලීමක් කරනු ලැබූ කල්හි, ඒ ඡන්දදායකයාගේ ඡන්ද පත්‍රිකාව ඒ ඡන්දදායකයා විසින් නියම කරනු ලබන ආකාරයෙන් ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් තම ඡන්ද පොළේ කාර්ය මණ්ඩලයේ වෙනත් සාමාජිකයකු ඉදිරිපිට දී සලකුණු කළ යුතු අතර ඒ ඡන්ද පත්‍රිකාව ඡන්ද පෙට්ටිය තුළට බහාලීමට ද සැලැස්විය යුතු ය.

ප්‍රතියුක්තයකු මඟින් ඡන්දය දීම තහනම් බව.

39. මේ පනත යටතේ තෝරා පත්කරගැනීමක දී ප්‍රතියුක්තයකු මඟින් ඡන්දය දීමට කිසිම ඡන්දදායකයකුට හිමිකම නොතිබිය යුතු ය.

බහු ඡන්දය දීම තහනම් බව.

40. මේ පනත යටතේ වූ යම් තෝරා පත්කරගැනීමක දී යම් තැනැත්තකු විසින්—

(අ) එක් මැතිවරණ කොට්ඨාසයකට වැඩි ගණනක ඡන්දය දෙනු ලැබුවහොත් හෝ එසේ ඡන්දය දීම සඳහා ඡන්ද පත්‍රිකාවක් ඉල්ලා සිටියහොත් ; හෝ

(ආ) එකම මැතිවරණ කොට්ඨාසයේ දී එක් වරකට වඩා ඡන්දය දෙනු ලැබුවහොත් හෝ එසේ ඡන්දය දීම සඳහා ඡන්ද පත්‍රිකාවක් ඉල්ලා සිටියහොත්

ඔහු නීති විරෝධී ක්‍රියාවක් කරන්නේ ය.

41. (1) යම් ඡන්දදායකයකුට ඡන්ද පත්‍රිකාවක් දීමට පෙර, මේ පනතේ පළමුවන උපලේඛනයේ "ඈ", "ඉ", "ඊ" සහ "උ" ආකෘතිවල සඳහන් සියලුම ප්‍රකාශ හෝ ඒ අතුරින් යම් ප්‍රකාශයක් හෝ කරන ලෙස සහ ඒවා හෝ එය අත්සන් කරන ලෙස යම් ඡන්ද පොළක ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් තම අභිමතය පරිදි, ඒ ඡන්දදායකයාට නියම කළ හැකි අතර එසේ නියම කරන ලෙස ඡන්ද ස්ථාන නියෝජිතයකු විසින් ඡන්ද ස්ථානාධිපතිවරයාගෙන් ඉල්ලා සිටියහොත්, එසේ කරන ලෙස ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් නියම කළ යුතු ය. ඒ සෑම ප්‍රකාශයක් ම මුද්දර ගාස්තුවකින් නිදහස් විය යුතු ය. ප්‍රකාශයක් කරන ලෙස ඡන්දදායකයකුට නියම කිරීමේ බලය.

(2) එකී යම් ප්‍රකාශයක් කිරීම යම් තැනැත්තකු විසින් ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත්, ඔහුට ඡන්ද පත්‍රිකාවක් දීම ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් ප්‍රතික්ෂේප කළ හැකි ය.

(3) යම් තැනැත්තකු විසින් එකී යම් ප්‍රකාශයක ඕනෑකමින් ම අසත්‍ය ප්‍රකාශයක් කරනු ලැබුවහොත්, ඔහු වරදක් කරන අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පවත්වනු ලබන ලඝු නඩු විභාගය කින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්සියයක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමට හෝ ඔහු යටත් විය යුතු ය.

42. ස්වකීය ඡන්ද පත්‍රිකාව පහසුවෙන් ඡන්ද පත්‍රිකාවක් ලෙස පාවිච්චි කළ නොහැකි වන සේ අනවධානයෙන් පරිහරණය කොට ඇති ඡන්දදායකයකු විසින් එසේ අනවධානයෙන් පරිහරණය කළ ඡන්ද පත්‍රිකාව ඡන්ද ස්ථානාධිපතිවරයාට භාර දී, ඡන්ද ස්ථානාධිපතිවරයා සෑහීමට පත්වන පරිදි අනවධානය පිළිබඳ සිද්ධිය ඔප්පු කරනු ලැබූ විට, එසේ භාර දෙන ලද (මේ පනතේ "නරක් වූ ඡන්ද පත්‍රිකාවක්" යනුවෙන් සඳහන් කරනු ලබන) ඡන්ද පත්‍රිකාව වෙනුවට වෙනත් ඡන්ද පත්‍රිකාවක් ඒ ඡන්ද දායකයාට ලබාගත හැකි අතර නරක් වූ ඡන්ද පත්‍රිකාව ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් වහාම අවලංගු කළ යුතු ය. නරක් වූ ඡන්ද පත්‍රිකා.

43. නාම ලේඛනයෙහි නම සඳහන් එක්තරා ඡන්දහිමියකු ලෙස පෙනී සිටින තැනැත්තකු විසින්, ඒ ඡන්දහිමියා ලෙස වෙනත් තැනැත්තකු ඡන්දය දීමෙන් පසු, ඡන්ද පත්‍රිකාවක් ඉල්ලා සිටිනු ලැබුවහොත්, ඉල්ලුම්කරු විසින්, මුද්දර ගාස්තුවලින් නිදහස් විය යුතු වූ ද, මේ පනතේ පළමුවන උපලේඛනයෙහි "ඌ" ආකෘතියට සාරානුකූල විය යුතු වූ ද, ප්‍රකාශයක් කොට, එය අත්සන් කළ විට ඡන්ද පත්‍රිකාවක් ලැබීමට සහ වෙනත් යම් ඡන්දදායකයකු ඡන්දය දෙන ආකාරයෙන් ම ඡන්දය දීමට ඒ තැනැත්තා හිමිකම් ලැබිය යුතු ය. එහෙත් මේ පනතෙහි "ද්විත්ව ඡන්ද පත්‍රිකාවක්" යනුවෙන් සඳහන් කරනු ද්විත්ව ඡන්ද

ලබන ඒ ඡන්ද පත්‍රිකාව සෙසු ඡන්ද පත්‍රිකාවලින් වෙනස් වූ වර්ණයකින් යුක්ත විය යුතු අතර එය ඡන්ද පෙට්ටිය තුළට බහා ලීමට පෙර, ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් ඡන්දදායකයාගේ නමත්, ලේඛනයෙහි වූ ඔහුගේ අංකයත් එහි පිටපසත් කළ යුතු ය. තවද, ඒ අංකය, මේ පනතෙහි "ද්විත්ව ඡන්ද ලැයිස්තුව" යනුවෙන් සඳහන් කරනු ලබන්නා වූද, මේ පනතේ පළමු වන උපලේඛනයෙහි "ඵ" ආකෘතියට සාරානුකූල විය යුතු වූ ද ලැයිස්තුවක ඇතුළත් කළ යුතු ය. ද්විත්ව ඡන්ද පත්‍රිකා පරිහරණය කිරීම මෙහි මින් මතු විධිවිධාන සැලැස්වෙන ආකාරයෙන් කළ යුතු ය.

ඡන්ද විමසීම අවසන් කිරීම.

**44.** ඡන්ද විමසීම අවසන් කිරීම සඳහා නියමිත වේලාවෙන් පසු, ඡන්දදායකයකුට කිසිම ඡන්ද පත්‍රිකාවක් භාර දෙනු නොලැබිය යුතු ය. එහෙත් ඡන්ද පත්‍රිකාවක් භාර දෙනු ලැබූ යම් ඡන්ද දායකයකු ඉහත කී වේලාවේ දී යම් ඡන්ද පොළක් තුළ සිටිය හොත්, ඒ ඡන්දදායකයාගේ ඡන්දය සටහන් කිරීමට ඔහුට ඉඩ දිය යුතු ය.

ඡන්ද විමසීම අවසන් වූ විට කාර්ය පටිපාටිය.

**45.** (1) ඡන්ද විමසීම අවසන් කිරීමෙන් පසු, හැකි තාක් ඉක්මණින්, එක් එක් ඡන්ද පොළෙහි ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් ඡන්ද ස්ථාන නියෝජිතයන් ඉදිරිපිට දී පහත සඳහන් දේ වෙන වෙනම පැකැට්ටුවල දමා, ඒ පැකැට්ටුවලට තමාගේ මුද්‍රාවෙන් සහ තම මුද්‍රා තැබීමට කැමැති එම ඡන්ද ස්ථාන නියෝජිතයන්ගේ ද මුද්‍රා තබා, ඒ පැකැට්ටු ඡන්ද ගණන් කිරීමේ නිලධරයට භාර දිය යුතුය:—

(අ) ඒ ඡන්ද පොළෙහි වූ එක් එක් ඡන්ද පෙට්ටිය; ඒ එක් එක් ඡන්ද පෙට්ටිය ඡන්ද විමසීම ආරම්භ කළ වේලාවේ දී තිබුණු ආකාරයෙන් ම යතුරු දමා තිබිය යුතු අතර ඡන්දය විමසීම අවසන් කරනු ලැබීමෙන් පසු, ඡන්ද පත්‍රිකා, එහි බහාලිය නොහැකි වන සේ මුද්‍රා තබා තිබිය යුතු ය;

(ආ) එක් එක් ඡන්ද පෙට්ටියේ යතුර;

(ඇ) එකට තබනු ලැබූ, පාවිච්චි නොකළ හා නරක් වූ ඡන්ද පත්‍රිකා;

(ඈ) ඡන්දහිමියන්ගේ නාම ලේඛනයේ සලකුණු කළ පිටපත් සහ ඡන්ද පත්‍රිකාවල උපපත්‍රිකා;

(ඉ) 36 වන වගන්තිය යටතේ ඡන්ද පත්‍රිකා භාර නොදෙන ලද ඡන්දදායකයන්ගේ ලැයිස්තුව; සහ

(ඊ) ද්විත්ව ඡන්ද ලැයිස්තුව.

(2) ඡන්ද ස්ථානාධිපතිවරයාට භාර දෙනු ලැබූ ඡන්ද පත්‍රිකා සංඛ්‍යාව දැක්වෙන්නා වූ ද—

(අ) නරක් වූ ඡන්ද පත්‍රිකා හැර, ඡන්දදායකයන් වෙත නිකුත් කරන ලද ඡන්ද පත්‍රිකා;

(ආ) නරක් වූ ඡන්ද පත්‍රිකා ; සහ

(ඇ) පාවිච්චි නොකළ ඡන්ද පත්‍රිකා

යන ශීර්ෂ යටතේ, ඒ පිළිබඳ විස්තර පෙන්වන්නා වූ ද (මෙහි මින් මතු "ඡන්ද පත්‍රිකා විස්තරය" යනුවෙන් සඳහන් කරනු ලබන) මේ පනතේ පළමුවන උපලේඛනයෙහි "ඒ" ආකෘතියට සාරානුකූල විය යුතු වූ ද ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් සාදනු ලැබූ ප්‍රකාශයක් සමඟ, ඒ පැකැට්ටු භාර දිය යුතු ය.

තමාට සහායවීම පිණිස පත්කර ඇති නිලධරයන් මගින් ඡන්ද ස්ථානාධිපතිවරයාට ක්‍රියා කළ හැකි බව.

**46.** යම් තැනැත්තකු අත්අඩංගුවට ගැනීමට හෝ ඡන්ද පොළෙන් බැහැර කිරීමට හෝ ඉවත් කිරීමට නියම කිරීම හැර යම් ඡන්ද පොළක දී කිරීමට මේ පනතින් ඒ ඡන්ද පොළේ ඡන්ද ස්ථානාධිපතිවරයාට නියම කර තිබෙන හෝ බලය දී තිබෙන යම් ක්‍රියාවක්, තමාට සහායවීම පිණිස පත්කර ඇති නිලධරයන් මගින්. ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් කරනු ලැබිය හැකි ය.

## IV වන කොටස

## ඡන්ද ගණන් කිරීම

ගණන් කිරීමේ නිලධරයෝ.

**47.** (1) කොමසාරිස්වරයාගේ සාමාන්‍ය හෝ විශේෂ විධාන යන්ට යටත්ව, එක් එක් තේරීම් භාර නිලධරයා විසින් එක් එක් ගණන් කිරීමේ මධ්‍යස්ථානයේ ඡන්ද ගණන් කිරීමේ කාර්යය භාරව කටයුතු කිරීම සඳහා ගණන් කිරීමේ නිලධරයකු ද ඒ ගණන් කිරීමේ නිලධරයාගේ කාර්ය ඉටු කිරීමේ දී ඔහුට සහායවීම පිණිස අවශ්‍ය සහායකයන්, ලිපිකරුවන් සහ වෙනත් නිලධරයන් සංඛ්‍යාවක් ද පත් කළ යුතු අතර ඒ පත් කිරීමක් ඔහු විසින් ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබිය හැකි ය.

(2) ගණන් කිරීමේ නිලධරයකුගේ කාර්ය තමා විසින් ඉටු කරනු ලැබීම සුදුසු යයි තේරීම් භාර නිලධරයා අදහස් කළහොත් ඔහු විසින් ගණන් කිරීමේ නිලධරයාගේ කාර්යය ඉටු කරනු ලැබිය හැකි අතර ගණන් කිරීමේ නිලධරයකු සම්බන්ධයෙන් මේ පනතේ ඇති විධිවිධාන ඒ තේරීම් භාර නිලධරයාට අදාළ විය යුතු ය.

ගණන් කිරීම පිළිබඳ දැන්වීම.

**48.** ඡන්ද විමසීම අවසන් වූ පසු, හැකි තාක් ඉක්මනින් තේරීම් භාර නිලධරයා විසින් ඡන්ද ගණන් කිරීම සඳහා කටයුතු පිළියෙළ කළ යුතු අතර, එක් එක් ගණන් කිරීමේ මධ්‍යස්ථානයේ පිහිටීම සහ ගණන් කිරීම ආරම්භ කරනු ලබන දිනය සහ වේලාව පිළිබඳ වූ ලියවිල්ලකින් වූ දැන්වීමක් ද, ඒ එක් එක් ඡන්ද ගණන් කිරීමේ මධ්‍යස්ථානයට වෙන් කර තිබෙන ඡන්ද පොළ හෝ ඡන්ද පොළවල් දක්වන ප්‍රකාශයක් ද එක් එක් අපේක්ෂකයා වෙත ද එක් එක් ඡන්ද නියෝජිතයා වෙත ද එක් එක් බලයලත් නියෝජිතයා වෙත ද දෙනු ලැබිය යුතු ය.

ඡන්ද ගණන් කිරීමේ නියෝජිතයන් පත් කිරීම.

**49.** (1) එක් එක් ඡන්ද ගණන් කිරීමේ මධ්‍යස්ථානයේ ඡන්ද ගණන් කරන විට පැමිණ සිටීම සඳහා (මෙහි මින් මතු "ගණන් කිරීමේ නියෝජිතයෝ" යනුවෙන් සඳහන් කරනු ලබන) නියෝජිතයන් පස් දෙනකුට නොවැඩි සංඛ්‍යාවක් ඡන්ද ගණන් කිරීමට පෙර එක් එක් බලයලත් නියෝජිතයා විසින් පත් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ පත් කරනු ලැබූ තැනැත්තන්ගේ නම් සහ ලිපින සඳහන් කරමින් එකී පත් කිරීම් පිළිබඳ ලියවිල්ලකින් වූ දැන්වීමක් ඒ බලය ලත් නියෝජිතයා විසින් ඡන්ද ගණන් කිරීම ආරම්භ කිරීමට පෙර ගණන් කිරීමේ නිලධරයා වෙත දිය යුතු ය. එසේ යම් ගණන් කිරීමේ නියෝජිතයකුගේ නම සහ ලිපිනය ඉදිරිපත් කරනු නොලැබූ විටක ඒ ගණන් කිරීමේ නියෝජිතයාට ඡන්ද ගණන් කිරීමේ මධ්‍යස්ථානයට ඇතුළුවීමට ඉඩ දීම ගණන් කිරීමේ නිලධරයා විසින් ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි ය.

ඡන්ද ගණන් කිරීම.

**50.** (1) 48 වන වගන්තිය යටතේ තමාගේ ගණන් කිරීමේ මධ්‍යස්ථානයට වෙන් කරන ලද සෑම ඡන්ද පොළකින් ම සියලුම ඡන්ද පෙට්ටි තමාට ලැබුණු පසුව ගණන් කිරීමේ නිලධරයා විසින් ඡන්ද ගණන් කිරීම ආරම්භ කළ යුතු ය.

(2) ගණන් කිරීමේ නිලධරයා ඡන්ද ගණන් කිරීම ආරම්භ කිරීමට පෙර, ඒ ගණන් කිරීමේ නිලධරයා විසින් හෝ ඔහු විසින් බලය දෙන ලද තැනැත්තකු විසින්, පැමිණ සිටින ගණන් කිරීමේ නියෝජිතයන් ඉදිරිපිට—

(අ) 45 වන වගන්තියේ (2) වන උපවගන්තියෙහි සඳහන් ඡන්ද පත්‍රිකා විස්තරය ඒ ගණන් කිරීමේ නියෝජිතයන්ට පෙන්විය යුතු අතර එහි පිටපත් ගැනීමට ඔවුන්ට අවසර දිය යුතු ය; තවද

(ආ) එක් එක් ඡන්ද පෙට්ටිය විවෘත කොට, එහි ඇති ඡන්ද පත්‍රිකා එළියට ගෙන, ඒ එක් එක් ඡන්ද පෙට්ටියේ ඇති ඒ පත්‍රිකාවන් ගණන් කර සටහන් කළ යුතු අතර, ඉන් පසු ඡන්ද පෙට්ටිවල තිබුණු සියලු ඡන්ද පත්‍රිකා එකට මිශ්‍ර කළ යුතු ය.

(3) ඡන්ද ගණන් කරන විට, ගණන් කිරීමේ නිලධරයා විසින් ඡන්ද පත්‍රිකා මුහුණත උඩුකුරුව සිටින සේ තැබිය යුතු අතර, ඒ පත්‍රිකාවල පිටුපස මුද්‍රිත අංක යම් තැනැත්තකු විසින් දකිනු ලැබීම වැළැක්වීම සඳහා නිසි සියලු පූර්වෝපායයන් ද යෙදිය යුතු ය.

(4) ගණන් කිරීමේ නිලධරයා විසින් ඡන්ද ගණන් කිරීම හැකි තාක් දුරට අඛණ්ඩව කර ගෙන යා යුතු අතර, අවලංගු යයි ඔහු විසින් ප්‍රතික්ෂේප කරනු ලබන යම් ඡන්ද පත්‍රිකාවක "ප්‍රතික්ෂේප කරන ලදී" යනුවෙන් සටහන් කළ යුතු ය.

(5) මේ වගන්තියේ කාර්යය සඳහා, ගණන් කිරීමේ නිලධරයා විසින්—

(අ) අපේක්ෂකයන් තුන් දෙනකු සිටින අවස්ථාවක දී, යම් අපේක්ෂකයකුගේ වාසියට දී ඇති දෙවන මනාපය; සහ

(ආ) අපේක්ෂකයන් තුන් දෙනකුට වැඩි සංඛ්‍යාවක් සිටින අවස්ථාවක දී, යම් අපේක්ෂකයකුගේ වාසියට දී ඇති දෙවන සහ තුන්වන මනාපයන්

ගණන් නොකළ යුතු ය.

(6) ගණන් කිරීමේ නිලධරයා විසින් ද්විත්ව ඡන්ද පත්‍රිකා ගණන් නොකළ යුතු අතර, අපේක්ෂකයන් අනුව, ඒවා වෙන වෙනම පැකැට්ටුවල දැමිය යුතු ය. තව ද ඔහු විසින්, ඒ එක් එක් පැකැට්ටුවෙහි ඒ ඒ අපේක්ෂකයාගේ නම සටහන් කළ යුතු අතර, ඒ පැකැට්ටු තේරීම් භාර නිලධරයාට භාර දිය යුතු ය. මේ උපවගන්තියේ කාර්යය සඳහා, යම් අපේක්ෂකයකුගේ වාසියට දී ඇති දෙවන සහ තුන්වන මනාපයන් සැලකිල්ලට නොගත යුතු ය.

(7) ඡන්ද ගණන් කරනු ලබන අවස්ථාවේ දී, ගණන් කිරීමේ නිලධරයාට, ඔහුගේ සහායකයන්ට සහ ලිපිකරුවන්ට සහ ගණන් කිරීමේ නියෝජිතයන්ට එහි පැමිණ සිටිය හැකි නමුත් ගණන් කිරීමේ නිලධරයාගේ කැමැත්ත ඇතිව මිස, වෙනත් කිසිම තැනැත්තකුට එහි පැමිණ සිටිය නොහැකි ය.

ප්‍රතික්ෂේප කරනු ලැබිය යුතු ඡන්ද පත්‍රිකා සහ එක් එක් අපේක්ෂකයාගේ වාසියට දෙන ලද ඡන්ද සංඛ්‍යාව පිළිබඳ ප්‍රකාශයක් පිළියෙළ කිරීම.

**51.** (1) (අ) නිල සලකුණ නොදරන යම් ඡන්ද පත්‍රිකාවක් ; හෝ

(ආ) පිට පැත්තෙහි ඇති මුද්‍රිත අංකය හැර, ඡන්දදායකයා හඳුනාගත හැකි වන පරිදි යම් දෙයක් ලියනු ලැබූ හෝ සලකුණු කරනු ලැබූ ඡන්ද පත්‍රිකාවක් ; හෝ

(ඇ) සලකුණු නොකරන ලද යම් ඡන්ද පත්‍රිකාවක් ; හෝ

(ඈ) අවිනිශ්චිත භාවය හේතුකොටගෙන අවලංගු වන යම් ඡන්ද පත්‍රිකාවක් ; හෝ

(ඉ) ඡන්දදායකයකු විසින්—

(i) කිසිම අපේක්ෂකයකුට ඡන්දය දෙනු ලැබ නොමැති යම් ඡන්ද පත්‍රිකාවක් ; හෝ

(ii) එක් අපේක්ෂකයකුට වැඩි සංඛ්‍යාවකට ඡන්දය දෙන ලද යම් ඡන්ද පත්‍රිකාවක් ; හෝ

(iii) දෙවන මනාපය හෝ තුන්වන මනාපය පමණක් හෝ ඒ මනාපයන් දෙක පමණක් දක්වා ඇති යම් ඡන්ද පත්‍රිකාවක්

ගණන් කිරීමේ නිලධරයා විසින් ප්‍රතික්ෂේප කළ යුතු ය. ගණන් කිරීමේ නිලධරයා විසින් එවැනි යම් ඡන්ද පත්‍රිකාවක, "ප්‍රතික්ෂේප කරන ලදී." යන වචන පිටසන් කළ යුතු ය.

(2) ඡන්දදායකයාගේ ඡන්දය යම් අපේක්ෂකයකුට දීමේ චේතනාව හෝ දෙවන මනාපය නැතහොත් දෙවන හා තුන්වන මනාප යම් අපේක්ෂකයකුගේ වාසියට දැක්වීමට ඒ ඡන්දදායකයා අදහස් කර තිබේ නම්, එසේ මනාපය දැක්වීමේ චේතනාව ඡන්ද පත්‍රිකාවක් මත කරනු ලැබූ යම් සලකුණකින් පැහැදිලිව පෙනෙන බවට ගණන් කිරීමේ නිලධරයා සෑහීමට පත්වන අවස්ථාවක, ඡන්ද දායකයන්ට උපදෙස් දීම සඳහා වූ මේ පනතේ තුන්වන උපලේඛනයෙහි සඳහන් උපදෙස්වලට සෑම අන්දමකින්ම අනුකූලව ඡන්ද පත්‍රිකාව සලකුණු කොට නොතිබීමේ හේතුව නිසාම පමණක් ගණන්

කිරීමේ නිලධරයා විසින් ඒ ඡන්ද පත්‍රිකාව (1) වන උපවගන්තිය යටතේ ප්‍රතික්ෂේප නොකළ යුතු ය.

(3) ඡන්ද පත්‍රිකාවක් ව්‍යාජ හෝ කූට ඡන්ද පත්‍රිකාවක් නොවන බවට ගණන් කිරීමේ නිලධරයා සෑහීමට පත්වන අවස්ථාවක, නිල සලකුණින් මුද්‍රා තබා හෝ සිදුරු කර හෝ නොතිබීමේ හේතුව නිසාම පමණක් ගණන් කිරීමේ නිලධරයා විසින් ඒ ඡන්ද පත්‍රිකාව ප්‍රතික්ෂේප නොකළ යුතු ය. මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධාන යටතේ ඡන්ද පත්‍රිකාවක් ප්‍රතික්ෂේප නොකිරීමට තීරණය කිරීමට පෙර, ගණන් කිරීමේ නිලධරයා විසින්, ගණන් කිරීමේ නියෝජිතයන් පැමිණ සිටින්නේ නම්, ඒ එක් එක් ගණන් කිරීමේ නියෝජිතයාට එය පෙන්වා, ඒ පිළිබඳව ඔහුගේ අදහස්වලට සවන් දිය යුතු ය.

(4) ඡන්ද පත්‍රිකාවක් ප්‍රතික්ෂේප කිරීමට පෙර, ගණන් කිරීමේ නිලධරයා විසින්, ඡන්ද පත්‍රිකාවේ පිටුපස මුද්‍රිත අංකය යම් තැනැත්තකු විසින් දකිනු ලැබීම වළක්වනු පිණිස නිසි සියලු පූර්වෝපායයන් යොදා, ගණන් කිරීමේ නියෝජිතයන් පැමිණ සිටින්නේ නම්, ඒ එක් එක් ගණන් කිරීමේ නියෝජිතයාට එය පෙන්වා ඒ පිළිබඳව ඔහුගේ අදහස්වලට සවන් දිය යුතු ය.

(5) ගණන් කිරීමේ නිලධරයා විසින් (1) වන උපවගන්තිය යටතේ ප්‍රතික්ෂේප කරනු ලද යම් ඡන්ද පත්‍රිකාවක් ඔහු විසින් ගණන් නොකළ යුතු ය.

(6) (1) වන උපවගන්තියෙහි සඳහන් එක් එක් හේතුව යටතේ ප්‍රතික්ෂේප කරන ලද ඡන්ද පත්‍රිකා ගණන වෙන වෙනම දැක්වෙන ප්‍රකාශයක් ගණන් කිරීමේ නිලධරයා විසින් පිළියෙළ කළ යුතු අතර, යම් ගණන් කිරීමේ නියෝජිතයකුගේ ඉල්ලීම පිට, ඒ ප්‍රකාශයේ පිටපත් කර ගැනීමට ඔහුට ඉඩ දිය යුතු ය.

(7) යම් අපේක්ෂකයකුගේ වාසියට දෙනු ලැබූ දෙවන හෝ තුන් වන මනාපය ගණන් නොගෙන එක් එක් අපේක්ෂකයාගේ වාසියට දෙනු ලැබූ ඡන්ද සංඛ්‍යාව පිළිබඳව වචනයෙන් මෙන් ම ඉලක්කමෙන් වූ ලිඛිත ප්‍රකාශයක් ගණන් කිරීමේ නිලධරයා විසින් පිළියෙළ කළ යුතු ය. ගණන් කිරීමේ නිලධරයා විසින් ඒ ප්‍රකාශය සහතික කළ යුතු අතර ඔහුගේ සහායකයන් අතුරින් එක් කෙනකු විසින් ද පැමිණ සිටින සහ අත්සන් කිරීමට කැමති යම් අපේක්ෂකයකුගේ නියෝජිතයන් විසින් ද සාක්ෂි වශයෙන් එය අත්සන් කළ යුතු ය. යම් ගණන් කිරීමේ නියෝජිතයකුගේ ඉල්ලීම පිට, ඒ ප්‍රකාශය පිටපත් කර ගැනීමට ගණන් කිරීමේ නිලධරයා විසින් ඒ නියෝජිතයාට ඉඩ දිය යුතු ය.

(8) ගණන් කිරීමේ නිලධරයා විසින් (7) වන උපවගන්තියේ සඳහන් ලිඛිත ප්‍රකාශය පිළියෙළ කරනු ලැබීමට පෙර, ඒ ගණන් කිරීමේ නිලධරයා විසින් අවශ්‍ය යයි සලකනු ලබන යම් වාර ගණනක් නැවත ගණන් කිරීම කළ හැකි ය. ගණන් කිරීමේ නියෝජිතයකුගේ ඉල්ලීම පිට එක් වාරයක් නැවත ගණන් කිරීම හෝ ඊට වැඩි වාර ගණනක් නැවත ගණන් කිරීම හෝ කළ යුතු අතර යම් ගණන් කිරීමේ නියෝජිතයකුගේ හෝ සියලුම ගණන් කිරීමේ නියෝජිතයන්ගේ ඉල්ලීම පිට, එසේ කරනු ලැබිය යුතු උපරිම නැවත ගණන් කිරීමේ වාර ගණන දෙකක් විය යුතු ය.

(9) යම් ඡන්ද පත්‍රිකාවක් පිළිබඳව පැන නැගෙන යම් ප්‍රශ්නයක් සම්බන්ධයෙන් ගණන් කිරීමේ නිලධරයාගේ තීරණය අවසානාත්මක හා තීරණාත්මක විය යුතු ය.

50 වන සහ 51 වන වගන්ති යටතේ බලතලවලට, කාර්යයන්ට හා කර්තව්‍යවලට අදාළ විශේෂ විධිවිධාන.

**52.** 50 වන වගන්තිය හෝ 51 වන වගන්තිය හෝ යටතේ ගණන් කිරීමේ නිලධරයකුගේ බලතල, කාර්ය හෝ කර්තව්‍ය අතුරින් සියල්ලක්, ඒ නිලධරයාගේ අධීක්ෂණය සහ විධානය යටතේ ක්‍රියා කරන ඔහුගේ සහායකයන් හෝ ලිපිකරුවන් අතුරින් කෙනකු විසින් ඒ නිලධරයා සඳහා සහ වෙනුවෙන් ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම හෝ කිරීම කරනු ලැබිය හැකි ය.

ඡන්ද ගණන් කිරීම අවසන් කිරීම.

**53.** යම් ඡන්ද ගණන් කිරීමේ මධ්‍යස්ථානයක ඡන්ද ගණන් කිරීම අවසන් කරනු ලැබූ විට, ගණන් කිරීමේ නිලධරයා විසින් පහත දැක්වෙන දේ මුද්‍රා තැබූ පැකැට්ටුවල බහා, අප්‍රමාදව තේරීම් භාර නිලධරයා වෙත භාර දිය යුතු ය—

(අ) එක් එක් අපේක්ෂකයාට පක්ෂව තිබුණ ඡන්ද පත්‍රිකා, ඒ එක් එක් අපේක්ෂකයාගේ නම ඒ එක් එක් පැකැට්ටු වෙහි සඳහන් කර තිබිය යුතු ය ;

(ආ) ප්‍රතික්ෂේප කරන ලද ඡන්ද පත්‍රිකා ;

(ඇ) ද්විත්ව ඡන්ද පත්‍රිකා ;

(ඈ) ඡන්ද පත්‍රිකා විස්තරය ;

(ඉ) 45 (1) වන වගන්තියේ (ඇ) සිට (ඊ) දක්වා වූ ඡේදවල සඳහන් පැකැට්ටු ;

(ඊ) 50 වන වගන්තියේ (2) (ආ) උපවගන්තිය යටතේ ගණන් කිරීම පිළිබඳ වාර්තාව ;

(උ) 51 (6) වන වගන්තිය යටතේ ප්‍රකාශය ; සහ

(ඌ) 51(7) වන වගන්තිය යටතේ එක් එක් අපේක්ෂකයාට දෙන ලද ඡන්ද සංඛ්‍යාව පිළිබඳ ලිඛිත ප්‍රකාශය.

තැපැල් ඡන්ද පත්‍රිකා ගණන් කිරීම.

**54.** තේරීම් භාර නිලධරයා විසින් තීරණය කරනු ලබන වෙනත් ඡන්ද ගණන් කිරීමේ මධ්‍යස්ථානයක දී හෝ මධ්‍යස්ථාන ගණනාවක දී යම් මැතිවරණ කොට්ඨාසයක් සම්බන්ධයෙන් වූ තැපැල් ඡන්ද පත්‍රිකා මේ පනතේ දෙවන උපලේඛනයේ දක්වා ඇති තැපැල් ඡන්දදායකයන් පිළිබඳ නියෝගවලට අනුකූලව ගණන කරනු ලැබිය යුතු ය.

තේරීම් භාර නිලධරයා ප්‍රකාශයක් පිළියෙළ කළ යුතු බව.

**55.** (1) 53 වන වගන්තියේ සඳහන් ලේඛන ලැබුණු පසුව 51 වන වගන්තියේ (7) වන උපවගන්තිය යටතේ තේරීම් භාර නිලධරයා වෙත (තැපැල් ඡන්ද පත්‍රිකා ගණන් කරනු ලැබූ ඡන්ද ගණන් කිරීමේ මධ්‍යස්ථානවල ගණන් කිරීමේ නිලධරයන් ද ඇතුළුව) සියලු ගණන් කිරීමේ නිලධරයන් විසින් සපයන ලද ප්‍රකාශවලින් ඒ මැතිවරණ කොට්ඨාසයේ එක් එක් අපේක්ෂකයාගේ වාසියට දී ඇති ඡන්ද සංඛ්‍යාව ඒ තේරීම් භාර නිලධරයා විසින් එකතු කොට, නිශ්චය කොටගෙන, ඒ බවට ඉලක්කමෙන් මෙන්ම වචනයෙන් ප්‍රකාශයක් පිළියෙළ කළ යුතු ය. ඔහුගේ සහායකයන්ගෙන් එක් තැනැත්තකු විසින් ද යම් අපේක්ෂකයකු වෙනුවෙන් පැමිණ සිටින හා අත්සන් කිරීමට කැමති යම් අපේක්ෂකයකුගේ

බලයලත් නියෝජිතයකු විසින් ද ඒ ප්‍රකාශයට සාක්ෂි වශයෙන් අත්සන් තැබිය යුතු ය. තේරීම් භාර නිලධරයා විසින්, ඉල්ලීමක් පිට, ප්‍රකාශය පිටපත් කිරීම සඳහා යම් බලයලත් නියෝජිතයකුට ඉඩ දිය යුතු ය.

(2) තේරීම් භාර නිලධරයා විසින් (1) වන උපවගන්තියේ සඳහන් ප්‍රකාශය නොපමාව කොමසාරිස්වරයා වෙත යැවිය යුතු ය.

(3) තේරීම් භාර නිලධරයා, ඔහුගේ සහායකයන් හා ලිපිකරුවන්, බලයලත් නියෝජිතයන් හා එක් එක් බලයලත් නියෝජිතයා විසින් තෝරා ගත් හා ලද වෙනත් එක් තැනැත්තකු හැර කිසිම තැනැත්තකුට මේ වගන්තිය යටතේ වූ කටයුතුවල දී පැමිණ සිටීමට හිමිකම නොතිබිය යුතු ය.

යම් අපේක්ෂකයකු පරම බහුතරය ලබාගෙන තිබේදැයි කොමසාරිස්වරයා විසින් නිශ්චය කරගත යුතු බව.

56. (1) තෝරා පත්කර ගැනීමේ දී දෙන ලද වලංගු ඡන්දවලින් එක් අඩකට වැඩි සංඛ්‍යාවක් යම් අපේක්ෂකයකුට ලැබී තිබේදැයි සියලුම තේරීම් භාර නිලධරයන් විසින් 55 වන වගන්තිය යටතේ තමා වෙත සපයන ලද ප්‍රකාශවලින්, කොමසාරිස්වරයා විසින් වහාම නිශ්චය කරගත යුතු ය.

(2) දෙන ලද වලංගු ඡන්දවලින් එක් අඩකට වැඩි සංඛ්‍යාවක් යම් අපේක්ෂකයකුට ලැබී තිබෙන අවස්ථාවක, ඒ අපේක්ෂකයා ජනාධිපති ධුරයට තෝරා පත්කර ගෙන ඇති බව කොමසාරිස්වරයා විසින් නොපමාව ම ප්‍රකාශ කළ යුතු ය.

කිසිම අපේක්ෂකයකුට පරම බහුතරයක් නොලැබුණු අවස්ථාවක අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය.

57. (1) තෝරා පත්කර ගැනීමේ දී දෙන ලද වලංගු ඡන්දවලින් එක් අඩකට වැඩි සංඛ්‍යාවක් කිසිම අපේක්ෂකයකුට නොලැබුණු අවස්ථාවක, කොමසාරිස්වරයා විසින්—

(අ) තෝරා පත්කර ගැනීමේ දී අපේක්ෂකයන් තිදෙනකු තරඟ කරන අවස්ථාවක—

(i) ඉතාම අඩු ඡන්ද සංඛ්‍යාව ලැබූ අපේක්ෂකයා තරඟයෙන් ඉවත් කළ යුතු ය ; තව ද

(ii) මේ ඡේදයේ (i) වන අනුඡේදය යටතේ ඉවත් කරන ලද අපේක්ෂකයාට ඡන්දය දුන් එක් එක් ඡන්දදායකයාගේ දෙවන මනාපය ඉතිරි අපේක්ෂකයන් දෙදෙනාගෙන් එක් තැනැත්තකුගේ නැතහොත් අනෙක් තැනැත්තාගේ වාසියට දෙන ලද ඡන්දයක් වශයෙන් ගණන් කිරීම සඳහා අවශ්‍ය වන පියවර ගැනීමට එක් එක් තේරීම් භාර නිලධරයාට නියම කළ යුතු ය ; නැතහොත්

(ආ) තෝරා පත්කර ගැනීමේ දී අපේක්ෂකයන් තිදෙනකුට වැඩි සංඛ්‍යාවක් තරඟ කරන අවස්ථාවක—

(i) ඉතාම වැඩි ඡන්ද සංඛ්‍යාව හා ඊළඟට වැඩි ඡන්ද සංඛ්‍යාව ලැබූ අපේක්ෂකයන් හැර අනෙක් අපේක්ෂකයන් තරඟයෙන් ඉවත් කළ යුතු ය ; තව ද

(ii) (අඅ) මේ ඡේදයේ (i) වන අනුඡේදය යටතේ ඉවත් කරන ලද අපේක්ෂකයකුට ඡන්දය දුන් එක් එක් ඡන්දදායකයාගේ දෙවන මනාපය ඉතිරි අපේක්ෂකයන් දෙදෙනාගෙන් එක්

තැනැත්තකු සඳහා නම්, ඒ තැනැත්තාගේ වාසියට දෙන ලද ඡන්දයක් වශයෙන්, ඒ දෙවන මනාපය ගණන් කිරීමට ; සහ

(ආආ) මේ අනුඡේදය යටතේ ඡන්දදායකයකුගේ දෙවන මනාපය ගණන් නොකරන ලද අවස්ථාවක, ඒ ඡන්දදායකයාගේ තුන්වන මනාපය ඉතිරි අපේක්ෂකයන් දෙදෙනාගෙන් එක් තැනැත්තකු සඳහා නම්, ඒ තැනැත්තාගේ වාසියට දෙන ලද ඡන්දයක් වශයෙන්, ඒ ඡන්දදායකයාගේ තුන්වන මනාපය ගණන් කිරීමට

අවශ්‍ය වන පියවර ගන්නා ලෙස එක් එක් තේරීම් භාර නිලධරයාට විධාන කළ යුතු ය.

(2) (1) වන උපවගන්තියේ කාර්ය සඳහා—

(අ) ඡන්දදායකයා විසින් එක් අපේක්ෂකයකුට වැඩි අපේක්ෂකයන් සංඛ්‍යාවක් සඳහා තම දෙවන මනාපය දක්වා තිබේ නම්, ඒ දෙවන මනාපය ගණන් නොකළ යුතු ය ;

(ආ) ඡන්දදායකයා විසින් එක් අපේක්ෂකයකුට වැඩි අපේක්ෂකයන් සංඛ්‍යාවක් සඳහා තම තුන්වන මනාපය දක්වා තිබේ නම්, ඒ තුන්වන මනාපය ගණන් නොකළ යුතු ය.

58. (1) 57 වන වගන්තිය යටතේ විධානයක් ලැබුණු විට, තරගයෙන් ඉවත් කරන ලද අපේක්ෂකයන්ට පක්ෂව දුන් ඡන්ද බහා මුද්‍රා තබන ලද පැකැට්ටුවල පමණක් මුද්‍රා කඩන ලෙසත්, 57 වන වගන්තියේ විධිවිධාන පිළිපදින ලෙසත් තේරීම් භාර නිලධරයා විසින් ගණන් කිරීමේ නිලධරයන්ට විධාන කළ යුතු ය. කොමසාරිස් වරයාගේ විධාන පිළිපදින ලෙස තේරීම් භාර නිලධරයා විසින් ගණන් කිරීමේ නිලධරයන්ට විධාන කළ යුතු බව.

(2) 57 (2) වන වගන්තිය යටතේ ගණන් කිරීමේ නිලධරයා විසින් ගණන් නොකරන ලද යම් ඡන්ද පත්‍රිකාවක් මත "ගණන් නොකරන ලදී" යන වචන පිටසන් කළ යුතු ය. ඒ වගන්තියේ විධිවිධාන යටතේ ඡන්ද පත්‍රිකාවක් ගණන් නොකිරීමට තීරණය කිරීමට පෙර, ගණන් කිරීමේ නිලධරයා විසින් පැමිණ සිටින එක් එක් ගණන් කිරීමේ නියෝජිතයාට එය පෙන්වා ඒ පිළිබඳව ඔහුගේ අදහස් විමසිය යුතු ය.

59. (1) 58 වන වගන්තිය යටතේ ගණන් කිරීම අවසන් වූ විට, ගණන් කිරීමේ නිලධරයා විසින් ඉතිරි අපේක්ෂකයන් දෙදෙනාගෙන් එක් එක් තැනැත්තාගේ වාසියට දුන් ඡන්දයක් වශයෙන් ගණන් කරන ලද දෙවන මනාපය හෝ දෙවන මනාපය සහ තුන් වන මනාපය දැක්වෙන ප්‍රකාශයක් ඉලක්කමෙන් මෙන්ම අකුරෙන් ද පිළියෙළ කළ යුතු ය. ගණන් කිරීමේ නිලධරයා විසින් තේරීම් භාර නිලධරයාට ප්‍රතිඵල වාර්තා කළ යුතු බව.

(2) (1) වන උපවගන්තියේ සඳහන් ප්‍රකාශය, ඔහු විසින් සහතික කළ යුතු අතර ඔහුගේ සහායකයන් අතුරෙන් එක් තැනැත්තකු විසින් ද, පැමිණ සිටින සහ අත්සන් කිරීමට කැමති ගණන් කිරීමේ නියෝජිතයන් කිසිවකු විසින් ද එම ප්‍රකාශයට සාක්ෂි වශයෙන් අත්සන් තැබිය යුතු ය. ඉන් පසුව, ඒ ප්‍රකාශය, තේරීම් භාර නිලධරයා වෙත ඉදිරිපත් කළ යුතු ය. ගණන් කිරීමේ නිලධරයා විසින් යම් ගණන් කිරීමේ නියෝජිතයකු ඉල්ලීමක් කළ හොත්, ප්‍රකාශය පිටපත් කර ගැනීමට ඔහුට අවසර දෙනු ලැබිය යුතු ය.

(3) ගණන් කිරීමේ නිලධරයා විසින් (1) වන උපවගන්තිය යටතේ ලිඛිත ප්‍රකාශයක් පිළියෙළ කරනු ලැබීමට පෙර, ඒ ගණන් කිරීමේ නිලධරයා විසින් අවශ්‍ය යයි සලකනු ලබන යම් වාර ගණනක් නැවත ගණන් කිරීම කළ හැකි ය. ගණන් කිරීමේ නියෝජිතයකුගේ ඉල්ලීම පිට, එක් වාරයක් නැවත ගණන් කිරීම හෝ ඊට වැඩි වාරයක් නැවත ගණන් කිරීම හෝ කළ යුතු අතර යම් ගණන් කිරීමේ නියෝජිතයකුගේ හෝ සියලුම ගණන් කිරීමේ නියෝජිතයන්ගේ ඉල්ලීම පිට එසේ කරනු ලැබිය යුතු නැවත ගණන් කිරීමේ උපරිම වාර ගණන දෙකක් විය යුතු ය.

(4) 58 වන වගන්තිය යටතේ ගණන් කිරීම අවසන් වූ විට, ගණින ලද ඡන්ද පත්‍රිකා ගණන් කිරීමේ නිලධරයා විසින් නොපමාව ම මුද්‍රා තැබිය යුතු අතර මුද්‍රා තබන ලද පැකැට්ටු තේරීම් භාර නිලධරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

(5) 58 වන වගන්තිය හා මේ වගන්තිය යටතේ කටයුතුවලට 50 (7) වන වගන්තියේ විධිවිධාන අදාළ විය යුතු ය.

තේරීම් භාර නිලධරයා විසින් මනාපයන් එකතු කොට ප්‍රකාශය පිළියෙළ කළ යුතු බව.

**60.** සියලු ගණන් කිරීමේ නිලධරයන් විසින් 50 වන වගන්තිය යටතේ එවන ලද ප්‍රකාශයන් තමා වෙත ලැබුණු විට, තේරීම් භාර නිලධරයා විසින් මැතිවරණ කොට්ඨාසය සම්බන්ධයෙන් ඉතිරි අපේක්ෂකයන් දෙදෙනාගේ වාසියට දක්වා ඇති දෙවන මනාපයන් සහ තුන්වන මනාපයන් සංඛ්‍යාව දැක්වෙන ප්‍රකාශයක් පිළියෙළ කළ යුතු ය. ඒ ප්‍රකාශය ඔහු විසින් සහතික කළ යුතු අතර ඊට සාක්ෂි වශයෙන් අත්සන් කිරීමට කැමති යම් බලයලත් නියෝජිතයකු විසින් එසේ අත්සන් කළ යුතු ය. එවිට ඒ ප්‍රකාශය කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය. මේ වගන්තිය යටතේ කටයුතුවලට 55 (3) වන වගන්තියේ විධිවිධාන අදාළ විය යුතු ය.

කොමසාරිස්වරයා ප්‍රතිඵල ප්‍රකාශයට පත් කළ යුතු බව.

**61.** සෑම මැතිවරණ කොට්ඨාසයක ම තේරීම් භාර නිලධරයාගෙන් 60 වන වගන්තියේ සඳහන් ප්‍රකාශය තමාට ලැබුණු විට, කොමසාරිස්වරයා විසින්, ඒ ප්‍රකාශවල දක්වා ඇති පරිදි දෙවන හා තුන්වන මනාපයන් 55 වන වගන්තිය යටතේ ඒ වන විට ගණින ලද ඡන්දවලට එකතු කොට, ඉතිරි අපේක්ෂකයන් දෙදෙනා අතුරෙන් එසේ ගණින ලද ඡන්ද අතුරින් බහුතර සංඛ්‍යාවක් ලබා ගෙන ඇත්තේ කවරකු දැයි ඉන් නිසැකව ම දැන ගත යුතු අතර, එවැනි බහුතර ඡන්ද සංඛ්‍යාවක් ලබා ගෙන ඇති අපේක්ෂකයා ජනාධිපති ධුරයට තෝරා පත්කර ගන්නා ලද බව අප්‍රමාදව ප්‍රකාශයට පත් කළ යුතු ය.

කොමසාරිස්වරයා විසින් ඇතැම් අවස්ථාවල දී අලුතින් තෝරා පත්කර ගැනීම පැවැත්විය යුතු බව.

**62.** (1) මේ පනතේ කුමක් සඳහන්ව ඇත ද—

(අ) 17(1) වන වගන්තිය හෝ 56 (2) වන වගන්තිය යටතේ හෝ 61 වන වගන්තිය යටතේ හෝ ජනාධිපති ධුරයට තෝරා පත්කර ගනු ලැබූ ලෙස ප්‍රකාශයට පත් කරනු ලැබීමට හිමිකම ඇති අපේක්ෂකයා මියගොස් ඇති බවට කොමසාරිස්වරයා සෑහීමට පත් වුවහොත්, ඒ අපේක්ෂකයා තෝරා පත්කර ගනු ලැබූ බව ඔහු විසින් ප්‍රකාශයට පත් කරනු ලැබ නොමැති නම්, ඒ අපේක්ෂකයා තෝරා පත් කර ගනු ලැබූ ලෙස ප්‍රකාශයට පත් කරනු නොලැබිය යුතු අතර නාම යෝජනා කිරීමේ සහ තෝරා පත්කර ගැනීමේ අලුත් දින නියම කිරීමට කටයුතු කළ යුතු ය;

(ආ) 17(1) වන වගන්තිය හෝ 56 (2) වන වගන්තිය හෝ 61 වන වගන්තිය හෝ යටතේ ජනාධිපති ධුරයට තෝරා පත්කර ගනු ලැබූ ලෙස ප්‍රකාශයට පත් කරනු ලැබූ අපේක්ෂකයා තම ධුර කාලය ආරම්භ කිරීමට පෙර මිය ගියහොත්, කොමසාරිස්වරයා විසින් නාම යෝජනා කිරීමේ සහ තෝරා පත්කර ගැනීමේ අලුත් දින නියම කරනු ලැබිය යුතු ය.

(2) මේ පනතේ විධිවිධාන, (1) වන උපවගන්තියේ සඳහන් නාම යෝජනා කිරීමේ සහ තෝරා පත්කර ගැනීමේ අලුත් දිනවලට සහ ඒ සම්බන්ධයෙන් අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතු ය.

ඡන්ද සංඛ්‍යා අතර සමානත්වයක් තිබීම.

63. (1) අපේක්ෂකයන් දෙදෙනා විසින් ලබා ගන්නා ලද ඡන්ද සංඛ්‍යා අතර සමානත්වයක් ඇති සහ මේ පනත යටතේ ජනාධිපතිවරයා වශයෙන් තෝරා පත්කර ගන්නා ලද්දේ කවර අපේක්ෂකයා දැයි ප්‍රකාශයට පත් කිරීම එක ඡන්දයක් එකතු කිරීමෙන් තීරණය කරනු ලැබිය හැකි අවස්ථාවක, එසේ තීරණය කිරීමේ කාර්යය සඳහා ඒ අතිරේක ඡන්දය දෙනු ලැබූ ලෙස සැලකිය යුත්තේ කවර අපේක්ෂකයාට දැයි තීරණය කිරීම, කොමසාරිස්වරයා විසින්, තම පරම අභිමතය අනුව තීරණය කරන ආකාරයකින් කුසපත් ඇදීම මගින් කළ යුතු අතර ඔහු විසින් ඒ අපේක්ෂකයා ජනාධිපති ධුරයට තේරී පත් වූ බව නොපමාව ප්‍රකාශයට පත් කළ යුතු ය.

(2) අපේක්ෂකයන් දෙදෙනකු හෝ ඊට වැඩි දෙනකු විසින් ලබා ගන්නා ලද ඡන්ද සංඛ්‍යා අතර සමානත්වයක් ඇති බව පෙනී යන, මේ පනත යටතේ ඉවත් නොකළ යුත්තේ කවර අපේක්ෂකයා දැයි එක ඡන්දයක් එකතු කිරීමෙන් තීරණය කරනු ලැබිය හැකි අවස්ථාවක, එසේ තීරණය කිරීමේ කාර්යය සඳහා, ඒ අතිරේක ඡන්දය දෙනු ලැබූ ලෙස සැලකිය යුත්තේ කවර අපේක්ෂකයාටදැයි තීරණය කිරීම, කොමසාරිස්වරයා විසින් තම පරම අභිමතය අනුව තීරණය කරන ආකාරයකින් කුසපත් ඇදීම මගින් කළ යුතු ය.

ප්‍රතිඵල ප්‍රකාශයට පත් කරනු ලබන වේලාව හා ස්ථානය කොමසාරිස්වරයා විසින් අපේක්ෂකයන් වෙත දැනුම් දිය යුතු බව.

64. (1) කොමසාරිස්වරයා විසින්, 56 වන වගන්තිය යටතේ හෝ 61 වන වගන්තිය යටතේ හෝ 63 වන වගන්තිය යටතේ හෝ තෝරා පත්කර ගැනීමේ ප්‍රතිඵල ප්‍රකාශයට පත් කිරීමට පෙර, ප්‍රතිඵල ප්‍රකාශයට පත් කරනු ලබන වේලාව සහ ස්ථානය අපේක්ෂකයන් වෙත හා ඡන්ද නියෝජිතයන් වෙත දැනුම් දිය යුතු ය.

(2) 56 වන වගන්තිය යටතේ හෝ 61 වන වගන්තිය යටතේ හෝ 63 වන වගන්තිය යටතේ හෝ ජනාධිපතිවරයා වශයෙන් තෝරා පත් කර ගත් ලෙස ප්‍රකාශයට පත් කරනු ලැබූ අපේක්ෂකයාගේ නම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

(3) කොමසාරිස්වරයා, ඔහුගේ සහායකයන් හා ලිපිකරුවන්, අපේක්ෂකයන්, අපේක්ෂකයන්ගේ ඡන්ද නියෝජිතයන් හා එක් එක් අපේක්ෂකයා විසින් තෝරා ගන්නා ලද එක් තැනැත්තකු හැර කිසිම තැනැත්තකුට 56 වන වගන්තිය හෝ 61 වන වගන්තිය හෝ 63 වන වගන්තිය යටතේ වූ කටයුතුවල දී පැමිණ සිටීමට හිමිකම් නොතිබිය යුතු ය.

ඡන්ද පත්‍රිකා ආදිය බැහැර කිරීම.

65. (1) 53 වන, 55 වන හා 59 වන වගන්ති යටතේ තමා වෙත එවනු ලැබූ පැකැට්ටු සහ සියළුම ලේඛන, ඒවා ලැබුණු දින සිට ආරම්භ වන මාස හයක කාලයක් තේරීම් භාර නිලධරයා විසින්,

තබා ගත යුතු අතර ඉන් පසුව, කොමසාරිස්වරයා අන්‍යාකාර විධාන යක් කළහොත් හැර, එකී පැකැට්ටු සහ ලේඛන විනාශ කර දැමීමට සැලැස්විය යුතු ය.

(2) මේ පනත යටතේ නියමිත පරිදි මුද්‍රා තබන ලද සහ තෝරා පත්කර ගැනීමකට අදාළ යම් ඡන්ද පත්‍රිකාවක් හෝ වෙනත් ලේඛනයක්, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයකු විසින් යෝග්‍ය යැයි සලකන යම් වේලාවක දී හා ස්ථානයක දී සහ එසේ සලකන යම් කොන්දේසිවලට යටත්ව, පරීක්ෂා කරනු ලැබීම, එහි පිටපත් ලබා ගැනීම හෝ එය ඉදිරිපත් කරනු ලැබීම කළ යුතු යයි ඒ විනිශ්චයකාරවරයා විසින් ආඥාවක් කළ හැකි ය. එහෙත් තෝරා පත්කර ගැනීමක් පිළිබඳ නඩුවක් හෝ ඡන්ද පෙත්සමක් ඉදිරිපත් කිරීමේ, පැවරීමේ හෝ පවත්වාගෙන යාමේ කාර්යය සඳහා ඒ පරීක්ෂා කිරීම, පිටපත් ලබා ගැනීම හෝ ඉදිරිපත් කිරීම අවශ්‍ය යයි ඒ විනිශ්චයකාරවරයා සෑහීමට පත් වුවහොත් මිස, ඔහු විසින් එවැනි ආඥාවක් නොකළ යුතු ය. ඉහත දැක්වූ පරිදි හැර, එවැනි යම් ඡන්ද පත්‍රිකාවක් හෝ ලේඛනයක් තේරීම් භාර නිලධරයා භාරයේ තිබිය දී පරීක්ෂා කිරීමට කිසිම තැනැත්තකුට ඉඩ දෙනු නොලැබිය යුතු ය.

## V වන කොටස

## වැරදි

නාම යෝජනා පත්‍ර, ඡන්ද පත්‍රිකා, නිල ඡන්ද දැන්වීම් පත්‍රිකා ආදියට අදාළ වැරදි.

66. (අ) යම් නාම යෝජනා පත්‍රයක් කූට ලෙස පිළියෙළ කරන හෝ වංචනික ලෙස විරූප කරන හෝ වංචනික ලෙස විනාශ කරන හෝ යම් නාම යෝජනා පත්‍රයක් කූට ලෙස පිළියෙළ කර ඇති බව දැන දැනම එය කොමසාරිස්වරයාට භාර දෙන; හෝ

(ආ) යම් ඡන්ද පත්‍රිකාවක් හෝ යම් ඡන්ද පත්‍රිකාවක නිල සලකුණ කූට ලෙස පිළියෙළ කරන හෝ එහි එසේ අනුකරණයක් කරන හෝ එය වංචනික ලෙස විරූප කරන හෝ වංචනික ලෙස විනාශ කරන; හෝ

(ඇ) නීති බලය නොමැතිව යම් ඡන්ද පත්‍රිකාවක් යම් තැනැත්තකුට සපයන; හෝ

(ඈ) යම් ඡන්ද පත්‍රිකාවක් යම් තැනැත්තකුට විකුණන හෝ විකිණීම සඳහා ඉදිරිපත් කරන හෝ යම් ඡන්ද පත්‍රිකාවක් යම් තැනැත්තකුගෙන් මිල දී ගන්නා හෝ මිල දී ගැනීමට ඉදිරිපත් වන; හෝ

(ඉ) මේ පනත අනුව නිල සලකුණකින් සලකුණු කොට ඇති යම් ඡන්ද පත්‍රිකාවක් සන්තකයේ තබා ගැනීමට මේ පනත යටතේ හිමිකම ලත් තැනැත්තකු නොවී සිටිය දී, එවැනි ඡන්ද පත්‍රිකාවක් තමා සන්තකයේ තබා ගෙන සිටින; හෝ

(ඊ) යම් ඡන්ද පෙට්ටියක් තුළ බහාලීමට නීතියෙන් තමාට බලය පැවරී ඇති ඡන්ද පත්‍රිකාව හැර වෙනත් දෙයක් ඒ පෙට්ටිය තුළ බහාලන; හෝ

(උ) නීති බලය නොමැතිව යම් ඡන්ද පත්‍රිකාවක් ඡන්ද පොළෙන් පිටතට ගෙන යන හෝ ඡන්ද පොළකින් පිටත යම් ඡන්ද පත්‍රිකාවක් තම සන්තකයේ තබා ගෙන සිටිය දී හසුවන; හෝ

(ඍ) තෝරා පත්කර ගැනීමක කාර්යය සඳහා පාවිච්චි කරනු ලබන හෝ පාවිච්චි කිරීමට අදහස් කරන ලද යම් ඡන්ද පෙට්ටියක් හෝ ඡන්ද පත්‍රිකා පැකැට්ටුවක්, නිසි බලය නොමැතිව විනාශ කරන, ලබා ගන්නා, විවෘත කරන හෝ අන් ලෙසකින් ඊට යමක් කරන ; හෝ

(එ) තෝරා පත්කර ගැනීමක දී යම් ඡන්ද පත්‍රිකාවක් හෝ ඡන්ද පත්‍රිකාවක් ලෙස සැලකෙන හෝ පාවිච්චි කළ හැකි යමක්, නිසි බලය නොමැතිව මුද්‍රණය කරන ; හෝ

(ඒ) තෝරා පත්කර ගැනීමක දී ඡන්දය විමසීම කෙරෙන අතරතුර, ඡන්ද පත්‍රිකාවක් ඡන්ද පෙට්ටියක් තුළ බහාලනු ලැබීමෙන් පසු එය ඉවතට ගැනීමට, ඊට බලපෑමක් කිරීමට හෝ එය වෙනස් කිරීමට උපයෝගී කරගත හැකි යම් උපකරණයක්, සූත්‍රයක් හෝ යන්ත්‍රයක් තෝරා පත්කර ගැනීමක කාර්යය සඳහා සාදන, තනන, ජනරජයට ආනයනය කරන, තම සන්තකයෙහි තබා ගන්නා, සපයන හෝ පාවිච්චි කරන හෝ තෝරා පත්කර ගැනීමක කාර්ය සඳහා, එය සෑදීමට, තැනීමට, ජනරජයට ආනයනය කිරීමට, සැපයීමට හෝ පාවිච්චි කිරීමට සලස්වන ; හෝ

(ඔ) මේ පනත යටතේ තැපැල් ඡන්දදායකයකු වශයෙන් සලකනු ලැබීම පිණිස කරනු ලබන යම් ඉල්ලීමක හෝ මේ පනතේ දෙවන උපලේඛනයේ දක්වා ඇති තැපැල් ඡන්දදායකයන් පිළිබඳ නියෝග යටතේ තමා වෙත එවන ලද අනන්‍යතාව පිළිබඳ යම් ප්‍රකාශයක මිනැකමින් ම අසත්‍ය ප්‍රකාශයක් කරන ; හෝ

(ඕ) මේ පනතේ දෙවන උපලේඛනයේ දක්වා ඇති තැපැල් ඡන්දදායකයන් පිළිබඳ නියෝගවල අර්ථානුකූල වූ තැපැල් ඡන්දදායකයකු වශයෙන් සලකනු ලැබීම පිණිස කරනු ලබන යම් ඉල්ලීමක් හෝ යම් අනන්‍යතාව පිළිබඳ ප්‍රකාශයක් හෝ ආවරණ ලියුම් කවරයක් හෝ ඡන්ද පත්‍රිකා ලියුම් කවරයක්, නිසි බලය නොමැතිව, විනාශ කරන, ලබා ගන්නා, විවෘත කරන හෝ අන්‍යාකාරයකින් එයට අයුතු දෙයක් කරන හෝ ඊට යමක් කරන ; හෝ

(ක) තෝරා පත්කර ගැනීමක දී යම් නිල ඡන්ද දැන්වීම් පත්‍රිකාවක් හෝ නිල ඡන්ද දැන්වීම් පත්‍රිකාවක් ලෙස දක්වෙන හෝ පාවිච්චි කළ හැකි යමක් හෝ නිසි බලය නොමැතිව මුද්‍රණය කරන ; හෝ

(ග) නිසි බලය නොමැතිව, තෝරා පත්කර ගැනීමක දී උචිත සලකුණක් හෝ ඒ සලකුණ වශයෙන් දැක්වෙන හෝ වරදවා තේරුම් ගනු ලැබිය හැකි යමක් යම් ඡන්දදායකයකුට තබන ; හෝ

(ච) තෝරා පත්කර ගැනීමක දී ඡන්දදායකයකුට තබන ලද උචිත සලකුණක් නිසි බලය නොමැතිව, වංචා සහගත ලෙස විරූප කරන ; හෝ

(ජ) තෝරා පත්කර ගැනීමක දී ඡන්දය දීමට තමාට නීත්‍යනුකූලව නොහැකි බව හෝ ඡන්දය දීමට තමා නුසුදුස්සකුව සිටින බව දැන දැනම එසේ ඡන්දය දෙන

සෑම තැනැත්තකු ම වරදක් කරන අතර මහාධිකරණය ඉදිරියේ වරදකරු කරනු ලැබූ විට, අවුරුදු දෙකක් නොඉක්මවන කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට යටත් විය යුතු ය. තවද, වරදකරු කරනු ලැබීම හේතුකොටගෙන ඔහුට වරදකරු කරනු ලැබූ දින සිට අවුරුදු හතක කාලයක් ඡන්ද හිමියකු වශයෙන් ලියාපදිංචි වීමට හෝ මේ පනත යටතේ තෝරා පත්කර ගැනීමක දී ඡන්දය දීමට හෝ ජනාධිපති ධුරයට තේරී පත්වීමට හෝ නොහැකි විය යුතු ය.

ඇතැම් තැනැත්තන් විසින් ඡන්ද ආයාචනය කිරීම හෝ නියෝජිතයන් වශයෙන් කටයුතු කිරීම හෝ නොකළ යුතු බව.

**67.** (1) යම් තැනැත්තකු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 81 වන ව්‍යවස්ථාව ප්‍රකාර පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලැබූ යෝජනා සම්මතයක් මගින් තමා සම්බන්ධයෙන් ප්‍රජා අශක්නුතා නියම කර ඇත්තා වූ ද, ඒ යෝජනා සම්මතයෙහි නියම කර ඇති එකී ප්‍රජා අශක්නුතා කාලසීමාව ඉකුත් වී නොමැති වූ ද තැනැත්තකු නම් ඒ තැනැත්තා අපේක්ෂකයකු වෙනුවෙන්, ඡන්ද ආයාචනය කිරීම හෝ අපේක්ෂකයකුගේ නියෝජිතයකු වශයෙන් කටයුතු කිරීම හෝ කතා පැවැත්වීම හෝ තෝරා පත්කර ගැනීමක දී කවර වූ හෝ ආකාරයකින් සහභාගිවීම හෝ නොකළ යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන කඩකරන සෑම තැනැත්තකුම, වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් එක් දහසක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.

ඡන්ද විමසීම පවත්වන දිනයෙහි ඇතැම් තහනම් ක්‍රියා.

**68.** (1) ඡන්ද පොළක ඡන්ද විමසීම පවත්වන යම් දිනයක, ඒ ඡන්ද පොළ සීමාව ඇතුළත දී හෝ ඒ ඡන්ද පොළට ඇතුළු වන දොරටුවේ සිට කිලෝ මීටර් භාගයක දුර ප්‍රමාණයක් ඇතුළත දී කිසිම තැනැත්තකු විසින් පහත දැක්වෙන ක්‍රියා අතුරින් කිසිවක් නොකළ යුතු ය :—

(අ) ඡන්ද ආයාචනය කිරීම ;

(ආ) යම් ඡන්ද හිමියකුගේ ඡන්දය ඉල්ලීම ;

(ඇ) යම් නිශ්චිත අපේක්ෂකයකුට ඡන්දය නොදෙන ලෙස යම් ඡන්දහිමියකු පෙළඹවීම ;

(ඈ) තෝරා පත්කර ගැනීමේ දී ඡන්දය නොදෙන ලෙස යම් ඡන්ද හිමියකු පෙළඹවීම ;

(ඉ) තෝරා පත් කර ගැනීමට අදාලව, (යම් නිල අත් පත්‍රිකාවක්, ප්‍රදර්ශන පත්‍රයක්, දැන්වීම් කොළයක්, ඡායාරූපයක් හෝ චිත්‍රයක් හෝ දැන්වීමක් නොවන) යම් අත් පත්‍රිකාවක්, ප්‍රදර්ශන පත්‍රයක්, දැන්වීම් කොළයක්, ඡායාරූපයක් හෝ චිත්‍රයක් හෝ දැන්වීමක් හෝ, 20 වන වගන්තිය යටතේ යම් අපේක්ෂකයකුට වෙන් කර ඇති යම් ලකුණක් බෙදා දීම හෝ ප්‍රදර්ශනය කිරීම.

මේ උපවගන්තියේ විධිවිධාන කඩ කරන සෑම තැනැත්තකුම වරදක් කරන අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් සියයක් නොඉක්මවන දඩයකට හෝ එක් මාසයක් නොඉක්මවන කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ ඔහු යටත් විය යුතු ය.

(2) යම් ඡන්ද පොළක ඡන්ද විමසීමක් පවත්වනු ලබන යම් දිනයක, කිසිම තැනැත්තකු විසින්, ඡන්දය දීම සඳහා ඡන්ද පොළට පැමිණෙන යම් තැනැත්තකුට කරදරයක් වන පරිදි හෝ ඡන්ද පොළේ රාජකාරියෙහි යෙදී සිටින නිලධරයන්ගේ හෝ වෙනත් තැනැත්තන්ගේ වැඩවලට බාධා ඇතිවන පරිදි—

(අ) ඡන්ද පොළ ඇතුළත හෝ ඡන්ද පොළට ඇතුළුවන දොරටුව ළඟ හෝ නදාසන්නයේ වූ යම් පොදු හෝ පෞද්ගලික ස්ථානයක යම් මෙගපෝනයක් හෝ ශබ්ද විකාශන යන්ත්‍රයක් හෝ මිනිස් කටහඬ විස්තාරණය කිරීම හෝ ප්‍රත්‍යුත්පාදනය කිරීම සඳහා වූ වෙනත් උපකරණයක් පාවිච්චි කිරීම හෝ ක්‍රියා කරවීම නොකළ යුතු ය; නැත හොත්

(ආ) ඡන්ද පොළ ඇතුළත හෝ ඡන්ද පොළට ඇතුළුවන දොරටුව ළඟ හෝ නදාසන්නයේ වූ යම් පොදු හෝ පෞද්ගලික ස්ථානයක දී කෑ ගැසීම හෝ වෙනත් අන්දමකින් අසංවර ලෙස ක්‍රියා කිරීම නොකළ යුතු ය.

මේ උපවගන්තියේ විධිවිධාන කඩ කරන සෑම තැනැත්තකුම වරදක් කරන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් සියයක් නොඉක්මවන දඩයකට හෝ එක් මාසයක් නොඉක්මවන කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ ඔහු යටත් විය යුතු ය.

(3) (2) වන උපවගන්තියේ විධිවිධාන කඩ කිරීමක් වැළැක්වීම සඳහා යුක්ති සහගත ලෙස අවශ්‍ය විය හැකි පියවර ගැනීම සහ බලය පාවිච්චි කිරීම යම් පොලිස් නිලධරයකු විසින් කළ හැකි අතර ඒ කඩ කිරීමෙහි ලා පාවිච්චි කරන ලද යම් උපකරණයක් තහනමට ගැනීම ද ඔහු විසින් කළ හැකි ය.

පෙරහැරවල් පරිසීමා කිරීම.

**69.** කිසිම තැනැත්තකු විසින්—

(අ) නාම යෝජනා කිරීමේ දින ආරම්භ වී ඒ තෝරා පත්කර ගැනීමේ දී පවත්වන ලද ඡන්ද විමසීම පිළිබඳ ප්‍රතිඵලය, කොමසාරිස්වරයා විසින් මේ පනත යටතේ ප්‍රකාශයට පත් කරනු ලැබූ දින සිට සතියකින් අවසන් වන කාලසීමාව තුළ යම් වේලාවක, ඒ වර්ෂයේ මැයි මස 1 වන දින පවත්වනු ලබන පෙරහැරක් හෝ ආගමික හෝ සමාජයීය කාර්ය සඳහා වූ යම් පෙරහැරක් හෝ නොවන වෙනත් යම් පෙරහැරක් මෙහෙයවීම, පැවැත්වීම හෝ ඊට සහභාගිවීම ; හෝ

(ආ) මේ උපවගන්තියේ (අ) ඡේදයේ සඳහන් කාලය තුළ පවත් වනු ලැබූ හෝ මෙහෙයවනු ලැබූ යම් පෙරහැරක දී එකී (අ) ඡේදයේ සඳහන් තෝරා පත්කර ගැනීමට අනුබල දීම අරමුණු කොට ගත් යම් ක්‍රියාවක් හෝ දෙයක් කිරීම

නොකළ යුතු ය.

මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධාන අතුරෙන් යම් විධිවිධාන යක් කඩ කරන සෑම තැනැත්තකු ම වරදක් කරන අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් සියයක් නොඉක්මවන දඩයකට හෝ එක් මාසයක් නොඉක්මවන කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ ඔහු යටත් විය යුතු ය.

ප්‍රසිද්ධ රැස්වීම් පරිසීමා කිරීම.

**70.** ඡන්ද විමසීම සඳහා නියම කරන ලද දිනයට පැය හතලිස් අටකට පෙර සිට ආරම්භ වී, ඡන්ද විමසීම පිළිබඳ ප්‍රතිඵල ප්‍රකාශ කළ වේලාවේ සිට එක් සතියකින් අවසන් වන කාල සීමාව තුළ කිසිම ප්‍රසිද්ධ රැස්වීමක් පවත්වනු නොලැබිය යුතු ය. මේ වගන්තියේ ඉහත දක්වන ලද යම් විධිවිධානයක් උල්ලංඝනය කරන සෑම තැනැත්තකුම වරදකට වරදකරු විය යුතු අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ කල්හි රුපියල් එක් සියයකට වැඩි නොවූ දඩයකට හෝ මාසයකට වැඩි නොවූ කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කරනු ලැබීම යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය.

66 වන, 67 වන, 68 වන, 69 වන හෝ 70 වන වගන්ති යටතේ වැරදි වලට අදාළ සාමාන්‍ය විධිවිධාන

**71.** (1) 66 වන වගන්තියේ හෝ 67 වන වගන්තියේ හෝ 68 වන වගන්තියේ හෝ 69 වන වගන්තියේ හෝ 70 වන වගන්තියේ සඳහන් වරදක් කිරීමට තැත් කරන සෑම තැනැත්තකුම, ඒ වරද සඳහා නියමිත දඬුවමට යටත් විය යුතු ය.

(2) 66 වන වගන්තිය හෝ 67 වන වගන්තිය හෝ 68 වන වගන්තිය හෝ 69 වන වගන්තිය හෝ 70 වන වගන්තිය යටතේ වූ සෑම වරදක් ම 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ අර්ථානුකූලව සංජ්ඥෙය වරදක් විය යුතු ය.

(3) තෝරා පත්කර ගැනීමක දී, නාම යෝජනා පත්‍රයකට, ඡන්ද පෙට්ටියකට, ඡන්ද පත්‍රිකාවකට හෝ සලකුණු කිරීමේ උපකරණයකට අදාළ වරදක් සඳහා නඩු පැවරීමක දී, ඒ නාම යෝජනා පත්‍රයේ, ඡන්ද පෙට්ටියේ, ඡන්ද පත්‍රිකාවේ හෝ සලකුණු කිරීමේ උපකරණ

යේ අයිතිය මෙන්ම යම් ඡන්ද පත්‍රිකාවක උපපත්‍රිකාවේ අයිතිය ද අවස්ථාවෝචිත පරිදි, කොමසාරිස්වරයා හෝ තේරීම් භාර නිලධරයා වෙත පැවරී ඇති බව සඳහන් කරනු ලැබිය හැකි ය.

(4) 66 වන වගන්තිය හෝ 67 වන වගන්තිය හෝ 68 වන වගන්තිය හෝ 69 වන වගන්තිය හෝ 70 වන වගන්තිය හෝ යටතේ වූ වරදක් සඳහා නඩු පැවරීමක්, නීතිපතිවරයාගේ අනුමතය නොමැතිව, නොකළ යුතු ය.

අපේක්ෂකයන් නොවන වෙනත් තැනැත්තන් විසින් තෝරා පත්කර ගැනීම පිළිබඳ ප්‍රකාශන මුද්‍රණය කිරීම.

72. යම් තෝරා පත්කර ගැනීමක් ගැන සඳහන් කෙරෙන සහ මුද්‍රණකරුගේ සහ ප්‍රකාශකගේ නම් සහ ලිපිනයන් මුහුණතේ නො දක්වෙන යම් ප්‍රචාරක දැන්වීමක්, අත් පත්‍රිකාවක්, ප්‍රදර්ශන පත්‍රයක් හෝ දැන්වීම් කොළයක් මුද්‍රණය කරන, පළ කරන, බෙදා හරින හෝ අලවා තබන හෝ මුද්‍රණය කිරීමට, පළ කිරීමට, බෙදා හැරීමට හෝ අලවා තැබීමට සලස්වන, අපේක්ෂකයකු නොවන සෑම තැනැත්තකු ම වරදක් කරන අතර මහෙස්ත්‍රාත්වරයකු විසින් වරද කරු කරනු ලැබූ විට, රුපියල් පන් සියයක් නොඉක්මවන දඩයකට ඔහු යටත් විය යුතු ය:

එසේ වුවද, අවස්ථාවෝචිත පරිදි, ඉහත කී නම් සහ ලිපින හෝ එවැනි යම් නමක් හෝ ලිපිනයක් සඳහන් කර නොතිබීම අනවධානයක් හෝ ඒ ආකාරයේ වෙනත් යම් සාධාරණ හේතුවක් නිසා සිදු වූ බවටත් එය යම් අසද්භාවයක් නිසා සිදු නොවූ බවටත් යම් තැනැත්තකු විසින් මහෙස්ත්‍රාත්වරයා සෑහීමට පත් කරනු ලැබුව හොත් යම් ප්‍රචාරක දැන්වීමකට, අත් පත්‍රිකාවකට, ප්‍රදර්ශන පත්‍රයකට හෝ දැන්වීම් කොළයකට අදාළව, මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධාන යටතේ ඒ තැනැත්තා වරදකට වරදකරු නොවිය යුතු ය.

ඡන්ද කාර්යාල ගණන සීමා කිරීම.

73. (1) තෝරා පත්කර ගැනීමක අපේක්ෂකයකුට හෝ ඒ අපේක්ෂකයාගේ නියෝජිතයා වන තැනැත්තකුට,—

(අ) ඒ තෝරා පත්කර ගැනීමේ නාම යෝජනා කිරීමේ දිනයෙන් ආරම්භව ඒ ඡන්දය සම්බන්ධයෙන් ඡන්ද විමසීමේ දිනයට ඉක්බිතිව ම ඇති දිනයෙන් අවසන් වන කාලය ඇතුළත එක් එක් මැතිවරණ කොට්ඨාසයෙහි එක් නිවේදිත මධ්‍ය ඡන්ද කාර්යාලයක් හා එක් එක් ඡන්ද කොට්ඨාසයෙහි එක් නිවේදිත ශාඛා ඡන්ද කාර්යාලයක් හැර යම් ඡන්ද කාර්යාලයක් නොතිබිය යුතු ය;

(ආ) ඒ ඡන්ද විමසීමේ දිනයට පෙරාතුව ම වූ දිනයෙන් ආරම්භව ඒ ඡන්ද විමසීමේ දිනයට ඉක්බිතිව ම එන දිනයෙන් අවසන් වන කාලය ඇතුළත ඒ මැතිවරණ කොට්ඨාසයෙහි එක් නිවේදිත මධ්‍ය ඡන්ද කාර්යාලයක් හා එක් එක් ඡන්ද ප්‍රදේශයෙහි එක් නිවේදිත ශාඛා ඡන්ද කාර්යාලයක් හැර යම් ඡන්ද කාර්යාලයක් නොතිබිය යුතු ය.

(2) යම් අපේක්ෂකයකුගේ හෝ ඔහුගේ බලයලත් නියෝජිතයාගේ සාමාන්‍ය පදිංචි ස්ථානය ඡන්ද කාර්යාලයක් ලෙස පාවිච්චි කිරීම (1) වන උපවගන්තියේ විධිවිධාන උල්ලංඝනය කිරීමක් නොවන බව සැලකිය යුතු ය.

(3) මේ වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරන සෑම තැනැත්තකුම වරදකට වරදකරු විය යුතු අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් සියයකට නොවැඩි දඩයකට හෝ එක් මාසයකට නොවැඩි කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කරනු ලැබීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.

(4) මේ වගන්තියෙහි සඳහන් යම් වරදක් කිරීමට තැත් කරන සෑම තැනැත්තකු ම ඒ වරදට නියමිත දඬුවමට යටත් විය යුතු ය.

(5) මේ වගන්තිය යටතේ වූ වරදක් සම්බන්ධයෙන් නඩු පැවරීමක් නීතිපතිවරයාගේ අනුමතය නොමැතිව නොකරනු ලැබිය යුතු ය.

(6) මේ වගන්තියේ කාර්යය සඳහා යම් ඡන්ද කාර්යාලයක් සම්බන්ධයෙන් වූ "නිවේදිත" යන පාඨයෙන් ඒ කාර්යාලය පිහිටි ප්‍රදේශයේ පොලිස් ස්ථානය භාර නිලධරයා වෙත ද ඒ කාර්යාලය පිහිටි මැතිවරණ දිස්ත්‍රික්කයේ තේරීම් භාර නිලධරයා වෙත ද ඒ කාර්යාලය පිහිටුවීමට පෙර දැනුම් දෙනු ලැබූ බව අදහස් වේ.

අත් පත්‍රිකා, දැන්වීම් කොළ ආදිය ප්‍රදර්ශනය කිරීම සම්බන්ධයෙන් විධිවිධාන.

74. (1) තෝරා පත්කර ගැනීමක දී නාම යෝජනා කිරීමේ දිනයෙන් ආරම්භ වන හා ඒ තෝරා පත්කර ගැනීම සම්බන්ධයෙන් ඡන්ද විමසීමේ දිනයට ඉක්බිතිව ම ඇති දිනයෙන් අවසාන වන කාලය තුළ, ඒ තෝරා පත්කර ගැනීමේ දී යම් අපේක්ෂකයකු තෝරා පත්කර ගැනීමේ ඉඩ කඩ වැඩි කිරීමේ කාර්යය සඳහා කිසි ම තැනැත්තකු විසින්—

(අ) ඒ තෝරා පත්කර ගැනීමේ දී අපේක්ෂකයකු ගෙනයාම සඳහා පාවිච්චි කරනු ලබන යම් වාහනයක් තුළ හෝ වාහනයක් මත හැර පොදු හෝ පෞද්ගලික කිසි ම ස්ථානයක යම් කොඩියක් හෝ පතාකයක් ; හෝ

(ආ) ඒ තෝරාපත් කර ගැනීමේ දී යම් ස්ථානයක ඡන්ද රැස්වීමක් පැවැත්වීමට නියමිත යම් දිනයක ඒ ස්ථානය තුළ හෝ ඒ ස්ථානයෙහි හැර මහජනයාට පැමිණීමට අයිතියක් ඇති හෝ ලබා දී ඇති යම් ස්ථානයක යම් අත් පත්‍රිකාවක්, ප්‍රදර්ශන පත්‍රයක්, දැන්වීම් කොළයක්, දැන්වීමක්, අපේක්ෂකයකුගේ ඡායාරූපයක්, සලකුණක්, ලකුණක් හෝ චිත්‍රයක් ; හෝ

(ඇ) යම් මහා මාර්ගයක් මත හෝ හරහා යම් අත් පත්‍රිකාවක්, ප්‍රදර්ශන පත්‍රයක්, දැන්වීම් කොළයක්, දැන්වීමක්, අපේක්ෂකයකුගේ ඡායාරූපයක්, සලකුණක්, ලකුණක්, චිත්‍රයක්, කොඩියක් හෝ පතාකයක් ; හෝ

(ඈ) ඒ තෝරා පත්කර ගැනීමේ දී අපේක්ෂකයකු ගෙනයාම සඳහා පාවිච්චි කරනු ලබන යම් වාහනයක් තුළ හෝ වාහනයක් මත හැර යම් වාහනයක් තුළ හෝ වාහනයක් මත යම් අත් පත්‍රිකාවක්, ප්‍රදර්ශන පත්‍රයක්, දැන්වීම් කොළයක්, දැන්වීමක්, අපේක්ෂකයකුගේ ඡායාරූපයක්, සලකුණක්, ලකුණක් හෝ චිත්‍රයක්

ප්‍රදර්ශනය නො කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියෙහි විධිවිධාන උල්ලංඝනය කරන සෑම තැනැත්තකුම වරදකට වරදකරු විය යුතු අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ කල්හි රුපියල් එක්සියයකට වැඩි නොවූ දඩයකට හෝ මාසයකට වැඩි නොවූ කාලයක් දෙයාකාර දෙයින් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කරනු ලැබීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.

(3) මේ වගන්තියෙහි සඳහන් වරදක් කිරීමට තැත් කරන සෑම තැනැත්තකු ම ඒ වරදට නියමිත දඬුවමට යටත් විය යුතු ය.

(4) මේ වගන්තිය යටතේ වූ සෑම වරදක් ම 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ අර්ථානුකූලව සංඥේය වරදක් විය යුතු ය.

(5) (1) වන උපවගන්තියේ විධිවිධාන පිළිබඳ යම් උල්ලංඝනය කිරීමක් වැළැක්වීම සඳහා සාධාරණ ලෙස අවශ්‍ය විය හැකි පියවර ගැනීම හා බලයක් පාවිච්චි කිරීම යම් පොලිස් නිලධරයකු විසින් කරනු ලැබිය හැකි අතර ඒ උල්ලංඝනයෙහි ලා පාවිච්චි කරන ලද යම් අත්පත්‍රිකාවක්, ප්‍රදර්ශන පත්‍රයක්, දැන්වීම් කොළයක්, දැන්වීමක්, අපේක්ෂකයකුගේ ඡායාරූපයක්, සලකුණක්, ලකුණක්, චිත්‍රයක්, කොඩියක් හෝ පතාකයක් තහනමට ගැනීම සහ ඉවත් කිරීම ද කරනු ලැබිය හැකි ය.

තෝරා පත්කර ගැනීමේ දී රහස්‍යතාව පැවැත්වීම

75. (1) ඡන්ද පොළකට හෝ ඡන්ද ගණන් කරනු ලබන විට දී පැමිණ සිටීමට බලය දෙනු ලැබූ සෑම නිලධරයකු, ලිපිකරුවකු, අපේක්ෂකයකු සහ නියෝජිතයකු විසින් එසේ පැමිණීමට පෙර මේ පනතේ පළමුවන උපලේඛනයෙහි දැක්වෙන "ඔ" ආකෘතියට සාරානුකූලව ව්‍යවස්ථානුකූල රහස්‍යතා ප්‍රකාශයක් කරනු ලැබිය යුතු ය. ඒ ප්‍රකාශය තේරීම් භාර නිලධරයා විසින් සමාදාන විනිශ්චයකාරවරයකු ඉදිරිපිට දී ද ඡන්ද ස්ථානාධිපතිවරයකු හෝ ගණන් කිරීමේ නිලධරයකු විසින් සමාදාන විනිශ්චයකාරවරයකු හෝ තේරීම් භාර නිලධරයා ඉදිරිපිට දී ද, වෙනත් යම් තැනැත්තකු විසින් තේරීම් භාර නිලධරයා හෝ සමාදාන විනිශ්චයකාරවරයකු හෝ ඡන්ද ස්ථානාධිපතිවරයකු හෝ ගණන් කිරීමේ නිලධරයකු ඉදිරිපිට දී ද කරනු ලැබිය යුතු ය.

(2) ඡන්ද පොළකට පැමිණ සිටින සෑම නිලධරයකු, ලිපිකරුවකු, අපේක්ෂකයකු සහ නියෝජිතයකු විසින් ඒ ඡන්ද පොළෙහි ඡන්දය දීම පිළිබඳ රහස්‍යතාව පැවැත්වීම සහ පැවැත්වීමට ආධාර දීම කරනු ලැබිය යුතු අතර නීතියෙන් බලය දෙන ලද යම් කාර්යයක් සඳහා හැර, ඒ ඡන්ද පොළෙහි දී ඡන්ද පත්‍රිකාවක් ඉල්ලුම් කොට ඇති හෝ නැති නොහොත් ඡන්දය දී ඇති හෝ නැති යම් ඡන්දහිමියකුගේ ඡන්ද හිමි නාම ලේඛනයෙහි සඳහන් නාම හෝ අංකය පිළිබඳ වූ හෝ නිල සලකුණ පිළිබඳ වූ යම් තොරතුරක් ඒ කිසිම තැනැත්තකු විසින් ඡන්ද විමසීම අවසන් කිරීමට පෙර යම් තැනැත්තකුට දැනුම් දීම නොකරනු ලැබිය යුතු ය.

(3) ඒ කිසිම නිලධරයකු, ලිපිකරුවකු, අපේක්ෂකයකු හෝ නියෝජිතයකු විසින් සහ කවර වූ හෝ තැනැත්තකු විසින්, ඡන්ද පොළෙහි දී, ඒ ඡන්ද පොළෙහි යම් ඡන්දදායකයකු කවර අපේක්ෂකයකුට ඡන්දය දීමට යන්නේ ද නැතහොත් ඡන්දය දී ඇත්තේ ද යන තොරතුරු ලබා ගැනීමට තැත් කිරීම නොකරනු ලැබිය යුතු අතර ඡන්ද පොළෙහි යම් ඡන්දදායකයකු කවර අපේක්ෂකයකුට ඡන්දය දීමට යන්නේ ද නැතහොත් ඡන්දය දී ඇත්තේ ද යන වග පිළිබඳ ව හෝ ඒ ඡන්ද පොළෙහි යම් ඡන්දදායකයකුට දෙන ලද ඡන්ද පත්‍රිකාවේ පිට පැත්තෙහි සඳහන් අංකය පිළිබඳ ව ඒ ඡන්ද පොළෙහි දී ලබා ගත් යම් තොරතුරක් කවර වූ හෝ විටෙක යම් තැනැත්තකුට දැනුම් දීම නොකරනු ලැබිය යුතු ය.

(4) ඡන්ද ගණන් කිරීමේ දී පැමිණ සිටින සෑම නිලධරයකු, ලිපිකරුවකු, අපේක්ෂකයකු සහ නියෝජිතයකු විසින් ම ඡන්දය දීම පිළිබඳ රහස්‍යතාව පැවැත්වීම සහ පැවැත්වීමට ආධාර දීම කරනු ලැබිය යුතු අතර යම් ඡන්ද පත්‍රිකාවක පිට පැත්තෙහි සඳහන් අංකය ඒ ගණන් කිරීමේ දී දැන ගැනීමට තැත් කිරීම හෝ යම් ඡන්ද පත්‍රිකාවක් මගින් යම් ඡන්දයක් දෙන ලද අපේක්ෂකයා කවුරුද යන්න පිළිබඳව ඒ ගණන් කිරීමේ දී ලබා ගත් යම් තොරතුරක් කිසිවකුට දැනුම් දීම නො කරනු ලැබිය යුතු ය.

(5) මේ පනතින් බලය දෙනු ලැබූ කාර්යයක් සඳහා ක්‍රියා කරන ඡන්ද ස්ථානාධිපතිවරයකු හෝ ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් බලය දෙනු ලැබ එවැනි කාර්යයක් සඳහා ක්‍රියා කරන තැනැත්තකු හැර වෙනත් කිසි ම තැනැත්තකු විසින්, යම් ඡන්දදායකයකු ඡන්ද පත්‍රිකාවක් ලැබීමෙන් පසුව සහ ඔහු එය ඡන්ද පෙට්ටියක් තුළට බහාලීමට පෙර ඒ ඡන්දදායකයාට යමක් දැනුම් දීම හෝ දැනුම් දීමට තැත් කිරීම නො කරනු ලැබිය යුතු ය.

(6) මෙම වගන්තියේ විධිවිධාන උල්ලංඝණය කරන සෑම තැනැත්තකු ම වරදකට වරදකරු විය යුතු අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ කල්හි රුපියල් පන්සියයකට වැඩි නොවූ දඩයකට හෝ මාස හයකට වැඩි නො වූ කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමට යටත් විය යුතු ය.

(7) මේ වගන්තිය යටතේ වරදකරු කරනු ලබන සෑම තැනැත්තකු ම ඔහු වරදකරු කරනු ලැබූ දින සිට අවුරුදු හතක කාලය තුළ ඡන්ද හිමියකු ලෙස ලියාපදිංචි කරනු ලැබීමට හෝ මේ පනත යටතේ තෝරා පත්කර ගැනීමක දී ඡන්දය දීමට ඒ වරදකරු කරනු ලැබීමේ හේතුවෙන් නුසුදුසු විය යුතු ය.

### දූෂණ ක්‍රියා

හොර ඡන්ද දීම.

**76.** (1) තෝරා පත්කර ගැනීමක දී—

(අ) ජීවත් ව සිටින හෝ මිය ගිය හෝ කල්පිත වූ හෝ වෙනත් යම් තැනැත්තකු වශයෙන් පෞද්ගලික ව හෝ තැපැලෙන් ඡන්දය දෙන ; හෝ

(ආ) ඒ තෝරා පත්කර ගැනීමේ දී තමාගේ ම නමින් හෝ නම යටතේ එක් වරකට වඩා ඡන්දය දෙන

සෑම තැනැත්තකුම හොර ඡන්ද දීමේ වරදට වරදකරු විය යුතු ය. තවද ඒ වරද 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ අර්ථානුකූලව සංඥෙය වරදක් විය යුතු ය.

(2) මේ වගන්තියේ කාර්යයන් සඳහා—

(අ) පෞද්ගලික ව ඡන්දය දීමේ කාර්යය සඳහා ඡන්ද පත්‍රිකාවක් ඉල්ලුම් කොට ඇති ; හෝ

(ආ) තැපැල් ඡන්දදායකයකු ලෙස සලකනු ලැබීමට ඉල්ලීමක් කර ඇති ; හෝ

(ඇ) තැපෑලෙන් ඡන්දය දීමේ කාර්යය සඳහා නිකුත් කරනු ලැබූ ඡන්ද පත්‍රිකාවක් වලංගු ආකාරයෙන් හෝ අන්‍යාකාරයෙන් සලකුණු කොට එවා ඇති

තැනැත්තකු, ඡන්දය දී ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.

**77.** තෝරා පත්කර ගැනීමකට පෙර හෝ තෝරා පත්කර ගැනීමක් පැවැත්වෙන අතර හෝ ඉන් පසු තමා විසින් හෝ වෙනත් යම් තැනැත්තකු මාර්ගයෙන් යම් තැනැත්තකුට හෝ ඒ තැනැත්තා උදෙසා ඒ තෝරා පත්කර ගැනීමේ දී ඒ තැනැත්තාගේ හෝ වෙනත් යම් තැනැත්තකුගේ ඡන්දය දීමට හෝ දීමෙන් වැළකීමට දූෂිත ලෙස බලපෑමේ කාර්යය සඳහා, නැතහොත් ඒ තෝරා පත්කර ගැනීමේ එබඳු යම් තැනැත්තකු හෝ වෙනත් යම් තැනැත්තකු ඡන්දය දී තිබීම හෝ ඡන්දය දීමෙන් වැළකී සිටීම හෝ ඡන්දය දීමට නොහොත් ඡන්දය දීමෙන් වැළකීමට සූදානම් ව සිටීම නිසා, නියම ලෙස හෝ අනියම් ලෙස හෝ යම් කෑමක්, බීමක්, අන්නපානයක් හෝ ආහාර ද්‍රව්‍යයක් දෙන හෝ සපයන නැතහොත් දීමට හෝ සැපයීමට සලස්වන නැතහොත් දීමට හෝ සැපයීමට ආධාර වන, නැතහොත් යම් කෑමක්, බීමක්, අන්න පානයක් හෝ ආහාර ද්‍රව්‍යයක් දීමේ හෝ සැපයීමේ සම්පූර්ණ වියදම හෝ කොටසක් ගෙවන හෝ ගෙවීමට බැඳෙන නැතහොත් යම් කෑමක්, බීමක්, අන්නපානයක් හෝ ආහාර ද්‍රව්‍යයක් ලබාගත හැකි වනු පිණිස යම් මුදලක් හෝ ටිකට් පතක් හෝ වෙනත් මාර්ගයක් හෝ උපක්‍රමයක් දීමේ හෝ සැපයීමේ සම්පූර්ණ වියදම හෝ කොටසක් ගෙවන හෝ ගෙවීමට බැඳෙන සෑම තැනැත්තකු ම හා එබඳු යම් කෑමක්, බීමක් හෝ අන්නපානයක් හෝ ආහාර ද්‍රව්‍යයක් නැතහොත් එබඳු යම් මුදලක් හෝ ටිකට් පතක් දූෂිත ලෙස භාරගන්නා හෝ ලබාගන්නා නැතහොත් එබඳු කෑමක්, බීමක්, අන්නපානයක් හෝ ආහාර ද්‍රව්‍යයක් ලබාගත හැකිවනු පිණිස එබඳු වෙනත් යම් මාර්ගයක් හෝ උපක්‍රමයක් යොදා ගන්නා සෑම ඡන්ද හිමියකුම සංග්‍රහ කිරීමේ වරදට වරදකරු විය යුතු ය. සංග්‍රහ කිරීම.

**78.** (1) මේ පනත යටතේ තෝරා පත්කර ගැනීමක දී යම් තැනැත්තකුගේ ඡන්දය දීමට හෝ දීමෙන් වැළකීමට ඒ තැනැත්තා පෙළඹවීම හෝ ඔහුට බල කිරීම සඳහා නැතහොත් ඒ තැනැත්තා ඒ තෝරා පත්කර ගැනීමේ දී ඡන්දය දී තිබීම හෝ ඡන්දය දීමෙන් වැළකී සිටීම හේතු කොට ගෙන නියම ලෙස හෝ අනියම් ලෙස, තමා විසින් ම හෝ තමා වෙනුවෙන් වෙනත් යම් තැනැත්තකු මාර්ගයෙන් ඒ තැනැත්තාට යම් බලහත්කාරයක්, අයුතු බලපෑම.

හැඟැසිකමක් හෝ අවහිරයක් කරන හෝ කරන බවට තර්ජනය කරන නැතහොත් තමා විසින් ම හෝ වෙනත් යම් තැනැත්තකු මාර්ගයෙන් ඔහුට යම් ලෞකික හෝ අධ්‍යාත්මික පීඩාවක්, සාධුවක්, හානියක්, අලාභයක් කරන හෝ කිරීමට තර්ජනය කරන නැතහොත් පැහැරගෙන යාමෙන්, අසේධ කිරීමෙන්, හෝ යම් වංචනික උපායකින් හෝ උපක්‍රමයකින් යම් ඡන්ද හිමියකු විසින් ඔහුගේ ඡන්ද බලය නිදහස් ලෙස පාවිච්චි කිරීම සම්බන්ධයෙන් බාධා කරන හෝ එසේ කිරීම වළකාලන නැතහොත් යම් තෝරා පත්කර ගැනීමක දී යම් ඡන්ද හිමියකු ඡන්දය දීමට හෝ ඡන්දය දීමෙන් වැළකීමට එමගින් බල කරන, පොළඹවන හෝ කැමති කරවන සෑම තැනැත්තකු ම අයුතු බලපෑමේ වරදට වරදකරු විය යුතු ය.

(2) යම් තෝරා පත්කර ගැනීමක නාම යෝජනා කිරීමේ දින යෙන් ආරම්භව ඒ තෝරා පත්කර ගැනීමේ ඡන්දය විමසීමේ දින යට ඉක්බිතිව ම එන දිනයෙහි අවසන් වන කාලය තුළ යම් විටක දී—

(අ) ඒ තෝරා පත්කර ගැනීමේ ප්‍රතිඵලය කෙරේ බලපෑමේ කාර්යය සඳහා හෝ ඒ තෝරා පත්කර ගැනීමේ දී යම් අපේක්ෂකයකුට ඡන්දය දෙන ලෙස හෝ ඡන්දය දීමෙන් වළකින ලෙස යම් ඡන්ද හිමියකු පෙළඹවීමේ කාර්යය සඳහා යම් ආගමික රැස්වීමක දී යම් වචන පවසන ; නැතහොත්

(ආ) ඒ කාර්යය සඳහා යම් ආගමික රැස්වීමක දී යම් අත් පත්‍රිකා වක්, ප්‍රදර්ශන පත්‍රයක්, දැන්වීම් කොළයක්, චිත්‍රයක්, දැන්වීමක්, අපේක්ෂකයකුගේ ඡායාරූපයක්, සලකුණක්, ලකුණක්, කොඩියක් හෝ පතාකයක් බෙදාහරින හෝ ප්‍රදර්ශනය කරන ; නැතහොත්

(ඇ) ඒ තෝරා පත්කර ගැනීමේ දී යම් අපේක්ෂකයකු තෝරා පත්කර ගැනීමේ ඉඩකඩ වැඩි දියුණු කිරීමේ කාර්යය සඳහා වන්දනා ස්ථානයක මහජන රැස්වීමක් පවත්වන හෝ පැවැත්වීමට සලස්වන

සෑම තැනැත්තකුම අයුතු බලපෑමේ වරදට වරදකරු විය යුතු ය.

(3) ආගමික නිකායක හෝ සංවිධානයක යම් සාමාජිකයෙක් හෝ නිලධරයෙක් ඒ නිකායෙහි හෝ සංවිධානයෙහි සාමාජිකයකු හෝ භක්තිකයකු මේ පනත යටතේ තෝරා පත්කර ගැනීමක දී යම් අපේක්ෂකයකුට ඡන්දය දීමට හෝ ඡන්දය දීමෙන් වැළකීමට හෝ ඒ තෝරා පත් කර ගැනීමේ දී යම් අපේක්ෂකයකුට ආධාර දීමට හෝ ආධාර දීමෙන් වැළකීමට පෙළඹවීම සඳහා හෝ ඔහුට බල කිරීම සඳහා, නොහොත් ඒ සාමාජිකයා හෝ භක්තිකයා ඒ තෝරා පත් කර ගැනීමේ දී යම් අපේක්ෂකයකුට ඡන්දය දී තිබීම හෝ ඡන්දය දීමෙන් වැළකීම හේතුකොට ගෙන, නැතහොත් ඔහු ඒ මැතිවරණයේ දී යම් අපේක්ෂකයකුට ආධාර දී තිබීම හෝ ආධාර දීමෙන් වැළකීම හේතුකොට ගෙන—

(අ) ඒ සාමාජිකයාට හෝ භක්තිකයාට හෝ ඒ සාමාජිකයාගේ හෝ භක්තිකයාගේ පවුලේ යම් කෙනකුට, සාමාන්‍ය යෙන් ඒ සාමාජිකයාට හෝ භක්තිකයාට හිමිවිය හැකිව

තිබුණු යම් අධ්‍යාත්මික සේවයක්, මෙහෙයක් හෝ යහපතක් ප්‍රතික්ෂේප කරයි නම් හෝ ප්‍රතික්ෂේප කිරීමට තර්ජනය කරයි නම්; හෝ

(ආ) ඒ සාමාජිකයා හෝ භක්තිකයා ඒ නිකායෙන් හෝ සංවිධානයෙන් බැහැර කරයි නම් හෝ බැහැර කිරීමට තර්ජනය කරයි නම්

එසේ කරන සාමාජිකයා හෝ නිලධරයා අයුතු බලපෑමේ වරදට වරදකරු විය යුතු ය.

(4) යම් තැනැත්තෙක් වෙනත් තැනැත්තකුගේ සේවායෝජකයකුව, ඒ වෙනත් තැනැත්තා මේ පනත යටතේ තෝරා පත්කර ගැනීමක දී යම් අපේක්ෂකයකුට ඡන්දය දීමට හෝ ඡන්දය දීමෙන් වැළකීමට හෝ යම් අපේක්ෂකයකුට ආධාර කිරීමට හෝ ආධාර කිරීමෙන් වැළකීමට පෙළඹවීම හෝ ඔහුට බල කිරීම සඳහා, නැතහොත් ඒ වෙනත් තැනැත්තා ඒ තෝරා පත්කර ගැනීමේ දී යම් අපේක්ෂකයකුට ඡන්දය දී තිබීම හෝ ඡන්දය දීමෙන් වැළකීම හෝ යම් අපේක්ෂකයකුට ආධාර කර තිබීම හෝ ආධාර කිරීමෙන් වැළකීම හේතුකොට ගෙන—

(අ) ඒ වෙනත් තැනැත්තාගේ ඒ සේවය අවසාන කරයි නම් හෝ අවසාන කිරීමට තර්ජනය කරයි නම්; හෝ

(ආ) ඒ වෙනත් තැනැත්තා ඒ සේවයෙහි දී සාමාන්‍යයෙන් එවකට ලැබූ හෝ ලැබිය හැකිව තිබුණු යම් ප්‍රතිලාභයක් හෝ සේවාවක් ඒ වෙනත් තැනැත්තාට ප්‍රතික්ෂේප කරයි නම් හෝ ප්‍රතික්ෂේප කිරීමට තර්ජනය කරයි නම්

ඒ තැනැත්තා අයුතු බලපෑමේ වරදට වරදකරු විය යුතු ය.

**79.** පහත සඳහන් තැනැත්තන් අල්ලස් වරදට වරදකරුවන් ලෙස සලකනු ලැබිය යුතු ය :— අල්ලස.

(අ) මේ පනත යටතේ වූ යම් තෝරා පත්කර ගැනීමක දී ඡන්දය දීමට හෝ ඡන්දය දීමෙන් වැළකීමට යම් ඡන්ද හිමියකු පෙළඹවීම සඳහා තමා විසින් හෝ තමා වෙනුවෙන් වෙන යම් තැනැත්තකු මගින් යම් ඡන්ද හිමියකුට හෝ ඡන්ද හිමියකු සඳහා හෝ යම් ඡන්ද හිමියකු වෙනුවෙන් යම් තැනැත්තකුට හෝ යම් තැනැත්තකු සඳහා හෝ, වෙනත් යම් තැනැත්තකුට හෝ වෙනත් යම් තැනැත්තකු සඳහා නියම ලෙස හෝ අනියම් ලෙස, යම් මුදලක් හෝ අගනා ප්‍රතිෂ්ඨාවක් දෙන හෝ ණයට දෙන හෝ දීමට නැතහොත් ණයට දීමට එකඟ වන හෝ අර්පනය කරන හෝ පොරොන්දු වන හෝ ලබාදීමට නැතහොත් ලබාදීම පිණිස උත්සාහ කිරීමට පොරොන්දු වන හෝ ඒ ඡන්ද හිමියා ඡන්දය දී තිබීම හෝ ඡන්දය දීමෙන් වැළකී සිටීම හේතු කොට ගෙන ඉහත කී යම් ක්‍රියාවක් දූෂිත ලෙස කරන සෑම තැනැත්තෙක් ;

(ආ) මේ පනත යටතේ වූ යම් තෝරා පත්කර ගැනීමක දී ඡන්දය දීමට හෝ ඡන්දය දීමෙන් වැළකීමට යම් ඡන්ද හිමියකු පෙළඹවීම සඳහා තමා විසින් හෝ තමා වෙනුවෙන් වෙනත් යම් තැනැත්තකු මගින් ඒ ඡන්ද හිමියාට හෝ ඒ

ඡන්ද හිමියා සඳහා හෝ ඒ ඡන්ද හිමියා වෙනුවෙන් යම් තැනැත්තකුට හෝ යම් තැනැත්තකු සඳහා හෝ වෙනත් යම් තැනැත්තකුට හෝ වෙනත් යම් තැනැත්තකු සඳහා, නියම ලෙස හෝ අනියම් ලෙස, යම් තිලයක්, තනතුරක් හෝ රක්ෂාවක් දෙන හෝ ලබාදෙන, හෝ දීමට නැතහොත් ලබා දීමට එකඟ වන, හෝ අර්පනය කරන හෝ පොරොන්දු වන හෝ ලබා දීමට නැතහොත් ලබා දීම පිණිස උත්සාහ කිරීමට පොරොන්දු වන හෝ යම් ඡන්ද හිමියකු ඡන්දය දී තිබීම හෝ ඡන්දය දීමෙන් වැළකී සිටීම හේතුකොට ගෙන ඉහත කී යම් ක්‍රියාවක් දූෂිත ලෙස කරන සෑම තැනැත්තෙක් ;

(ඇ) යම් තැනැත්තකු ජනාධිපති ධුරයට තෝරා පත්කර ගැනීම හෝ මේ පනත යටතේ වූ යම් තෝරා පත්කර ගැනීමක දී යම් ඡන්ද හිමියකුගේ ඡන්දය ලබාදීමට හෝ ලබාදීමට උත්සාහ කිරීමට යම් තැනැත්තකු පෙළඹවීම සඳහා තමා විසින් හෝ තමා වෙනුවෙන් වෙනත් යම් තැනැත්තකු මගින් ඒ තැනැත්තාට හෝ ඒ තැනැත්තා සඳහා නියම ලෙස හෝ අනියම් ලෙස ඉහත කී යම් තෑග්ගක්, ණයක්, අර්පනයක්, පොරොන්දුවක්, ලබාදීමක් හෝ එකඟවීමක් දෙන හෝ කරන සෑම තැනැත්තෙක් ;

(ඈ) එවැනි යම් තෑග්ගක්, ණයක්, අර්පනයක්, පොරොන්දුවක්, ලබාදීමක් හෝ එකඟවීමක් අනුව හෝ හේතුකොට ගෙන යම් තැනැත්තකු ජනාධිපති ධුරයට තෝරා පත්කර ගැනීම හෝ මේ පනත යටතේ වූ යම් තෝරා පත්කර ගැනීමක දී යම් ඡන්ද හිමියකුගේ ඡන්දය ලබාදෙන හෝ ලබාදීමට බැඳෙන නැතහොත් පොරොන්දු වන නැතහොත් උත්සාහ කරන සෑම තැනැත්තෙක් ;

(ඉ) මේ පනත යටතේ වූ යම් තෝරා පත්කර ගැනීමක දී අල්ලස් වශයෙන් යම් මුදලක් හෝ ඉන් යම් කොටසක් වියදම් කළ යුතු ය යන චේතනාවෙන් වෙනත් යම් තැනැත්තකුට හෝ වෙනත් යම් තැනැත්තකුගේ ප්‍රයෝජනය පිණිස ඒ මුදල කලින් දෙන හෝ ගෙවන හෝ ගෙවීමට සලස්වන, නැතහොත් එබඳු යම් තෝරා පත්කර ගැනීමක දී අල්ලස් වශයෙන් වියදම් කරන ලද යම් මුදලක්, සම්පූර්ණයෙන් ම හෝ ඉන් යම් කොටසක් නිදහස් කිරීම හෝ ආපසු ගෙවීම පිණිස යම් තැනැත්තකුට යම් මුදලක් දැන දැනම ගෙවන හෝ ගෙවීමට සලස්වන සෑම තැනැත්තෙක් ;

(ඊ) මේ පනත යටතේ වූ යම් තෝරා පත්කර ගැනීමකට පෙර හෝ එය පැවැත්වෙන අතරතුර දී තමා විසින් හෝ තමා වෙනුවෙන් වෙනත් යම් තැනැත්තකු මගින් ඒ තෝරා පත්කර ගැනීමේ දී ඡන්දය දීම හෝ ඡන්දය දීමට එකඟ වීම නැතහොත් ඡන්දය දීමෙන් වැළකීම හෝ ඡන්දය දීමෙන් වැළකීමට එකඟවීම වෙනුවෙන් තමා ම හෝ වෙන යම් තැනැත්තකු සඳහා නියම ලෙස හෝ අනියම් ලෙස යම් මුදලක්, තෑග්ගක්, ණයක් හෝ අගනා ප්‍රතිෂ්ඨාවක්,

නිලයක්, තනතුරක් හෝ රක්ෂාවක් ලබන හෝ ඒ සම්බන්ධයෙන් එකඟ වන හෝ ගිවිසුමක් ඇති කර ගන්නා සෑම ඡන්ද හිමියෙක් ;

(උ) මේ පනත යටතේ වූ යම් තෝරා පත්කර ගැනීමකින් පසු, තමා විසින් හෝ තමා වෙනුවෙන් වෙනත් යම් තැනැත්තකු මගින්, නියම ලෙස හෝ අනියම් ලෙස, ඒ ඡන්දයේ දී යම් තැනැත්තකු ඡන්දය දී තිබීම නැතහොත් ඡන්දය දීමෙන් වැළකී සිටීම හෝ ඡන්දය දීමට නැතහොත් ඡන්දය දීමෙන් වැළකීමට වෙනත් යම් තැනැත්තකු පොළඹවා තිබීම හේතුකොට ගෙන යම් මුදලක් හෝ අගනා ප්‍රතිඡ්ඨාවක් ලබන සෑම තැනැත්තෙක් ;

(ඌ) තෝරා පත්කර ගැනීමක දී යම් අපේක්ෂකයකුට ඡන්දය දීම හෝ ඡන්දය දී තිබීම හෝ ඡන්දය දීමට එකඟ වීම හෝ ඡන්දය දීමට එකඟ වී සිටීම හේතුකොට ගෙන හා ඒ සඳහා වූ ගෙවීමක් වශයෙන්, නැතහොත් තෝරා පත්කර ගැනීමක දී යම් අපේක්ෂකයකුට සහාය වී තිබීම හෝ සහාය වීමට එකඟව සිටීම හේතුකොට ගෙන හා ඒ සඳහා වූ ගෙවීමක් වශයෙන් යම් මුදලක් හෝ අගනා ප්‍රතිඡ්ඨාවක් තෑගි කරන ලෙස හෝ ණයට දෙන ලෙස නැත හොත් යම් මුදලක් හෝ අගනා ප්‍රතිඡ්ඨාවක් තෑගි කිරීමට හෝ ණයට දීමට පොරොන්දු වන ලෙස නැතහොත් යම් නිලයක්, තනතුරක් හෝ රක්ෂාවක් ලබා දෙන ලෙස නැතහොත් යම් නිලයක්, තනතුරක් හෝ රක්ෂාවක් පොරොන්දු වන ලෙස ඒ අපේක්ෂකයා වෙත නැත හොත් ඔහුගේ නියෝජිතයා හෝ නියෝජිතයන් වෙත තමා විසින් හෝ තමා වෙනුවෙන් වෙන යම් තැනැත්තකු මගින් නියම ලෙස හෝ අනියම් ලෙස ඉල්ලුම් කරන සෑම තැනැත්තෙක් ; හා

(එ) අපේක්ෂකයකු ලෙස නාම යෝජනා කරනු ලැබීමට එකඟ වීමට හෝ අපේක්ෂකයකු වීමෙන් වැළකීමට හෝ අපේක්ෂකයකු වී ඇතහොත් අස්වීමට වෙනත් යම් තැනැත්තකු පෙළඹවීම සඳහා තමා විසින් හෝ තමා වෙනුවෙන් යම් තැනැත්තකු මගින් නියම ලෙස හෝ අනියම් ලෙස ඒ වෙනත් තැනැත්තාට යම් නිලයක්, තනතුරක් හෝ රක්ෂාවක් දෙන හෝ ලබා දෙන නැතහොත් ඒ වෙනත් තැනැත්තාට යම් නිලයක්, තනතුරක් හෝ රක්ෂාවක් දීමට හෝ ලබා දීමට එකඟ වන නැතහොත් ලබා දීමට හෝ ලබා දීම පිණිස උත්සාහ කිරීමට අර්පනය කරන හෝ පොරොන්දු වන නැතහොත් යම් තැනැත්තකුට හෝ ඒ වෙනත් තැනැත්තාට හෝ ඒ වෙනත් තැනැත්තා වෙනුවෙන් යම් තැනැත්තකුට යම් මුදලක් හෝ අගනා ප්‍රතිඡ්ඨාවක් දෙන හෝ ණයට දෙන නැතහොත් දීමට හෝ ණයට දීමට එකඟ වන, නැතහොත් ලබාදීමට හෝ ලබාදීම පිණිස උත්සාහ කිරීමට අර්පනය කරන හෝ පොරොන්දු වන සෑම තැනැත්තෙක්.

දූෂණ ක්‍රියා සම්බන්ධයෙන් දණ්ඩන හා අශක්‍යතා.

80. (1) (අ) හොර ඡන්ද දීමේ වරද කරන හෝ හොර ඡන්ද දීමේ වරද කිරීමට ආධාර කරන, අනුබල දෙන, උපදෙස් දෙන හෝ ඒ වරද කරවන; නැත හොත්

(ආ) සංග්‍රහ කිරීමේ හෝ අයුතු බලපෑමේ හෝ අල්ලස් පිළිබඳ හෝ වරද කරන; නැතහොත්

(ඇ) යම් තෝරා පත්කර ගැනීමක ප්‍රතිඵලයට බල පෑමේ කාර්යය සඳහා යම් අපේක්ෂකයකුගේ පෞද්ගලික චරිතය හෝ හැසිරීම සම්බන්ධ යෙන් යම් අසත්‍ය සිද්ධි ප්‍රකාශයක් ඒ තෝරා පත් කර ගැනීමට පෙර හෝ එය පැවැත්වෙන අතර තුර දී කරන හෝ ප්‍රසිද්ධ කරන; නැතහොත්

(ඈ) යම් තෝරා පත්කර ගැනීමක ප්‍රතිඵලයට බල පෑමේ කාර්යය සඳහා ඒ තෝරා පත්කර ගැනීමට පෙර හෝ එය පැවැත්වෙන අතරතුර දී යම් අපේක්ෂකයකුගේ අස්වීම සම්බන්ධයෙන් අසත්‍ය ප්‍රකාශයක් කරන හෝ ප්‍රසිද්ධ කරන

සෑම තැනැත්තකුම දූෂණ ක්‍රියාවකට වරදකරු විය යුතු අතර මහාධිකරණය විසින් වරදකරු කරනු ලැබූ විට මේ උපවගන්තියේ (අ) ඡේදයේ සඳහන් අවස්ථාවේ දී වන විට බරපතල වැඩ ඇතිව දොළොස් මසකට නොවැඩි කාලයක් බන්ධනාගාරගත කිරීමකට ද, වෙනත් අවස්ථාවක දී වන විට රුපියල් පන්සියයකට නොවැඩි දඩයකට හෝ හයමසකට වැඩි නොවූ කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.

(2) දූෂණ ක්‍රියාවකට වරදකරු කරනු ලැබූ සෑම තැනැත්තකුම වරදකරු කරනු ලැබීම මත ඔහු වරදකරු කරනු ලැබූ දින සිට අවුරුදු හතක කාලයකට ඡන්ද හිමියකු වශයෙන් ලියා පදිංචි කරනු ලැබීමට හෝ මේ පනත යටතේ වූ යම් තෝරා පත්කර ගැනීමක දී ඡන්දය දීමට හෝ ජනාධිපති ධූරයට තෝරා පත්කර ගනු ලැබීමට නුසුදුසු විය යුතු ය.

(3) දූෂණ ක්‍රියාවක් සඳහා වූ නඩු පැවරීමක් නීතිපතිවරයාගේ අනුමතය නොමැතිව නොකරනු ලැබිය යුතු ය.

තෝරා පත්කර ගැනීමක දී පරාජිත අපේක්ෂකයකු විසින් කරන ලද දූෂණ ක්‍රියාවක් සම්බන්ධයෙන් වූ දඬුවමට හා අශක්‍යතාවට අදාළ විශේෂ විධිවිධාන.

81. (1) මේ පනත යටතේ වූ යම් තෝරා පත් කර ගැනීමක දී ජනාධිපති ධූරයට තෝරා පත්කර ගනු නොලැබූ යම් අපේක්ෂක යකු විසින් හෝ ඔහුගේ අනුදැනුම හෝ කැමැත්ත ඇතිව හෝ ඔහුගේ නියෝජිතයන් අතුරින් යම් නියෝජිතයකු විසින් ඒ තෝරා පත්කර ගැනීම සම්බන්ධයෙන් යම් දූෂණ ක්‍රියාවක් කරනු ලැබූ අවස්ථාවක, ඒ අපේක්ෂකයා මහාධිකරණය විසින් වරදකරු කරනු ලැබූ විට, හොර ඡන්ද දීමේ වරද සම්බන්ධයෙන් වන විට මාස දොළහකට නොවැඩි කාලයකට බන්ධනාගාරගත කරනු ලැබීමට ද, වෙනත් වරදක් සම්බන්ධයෙන් වන විට රුපියල්

පන්සියයකට නොවැඩි දඩයකට හෝ හය මාසයකට නොවැඩි කාල යක් දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබී මට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කරනු ලැබීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය:

එසේ වුව ද ඒ අපේක්ෂකයා විසින්—

(අ) ඒ තෝරා පත්කර ගැනීමේ දී ඒ අපේක්ෂකයා හෝ ඔහු ගේ බලයලත් නියෝජිතයා විසින් කිසිම දූෂණ ක්‍රියාවක් හෝ නීති විරෝධී ක්‍රියාවක් නො කරන ලද බවට සහ ඒ වරද කරනු ලැබුවේ ඒ අපේක්ෂකයාගේ නියෝගයන්ට පටහැනිව හා ඔහුගේ අනුමතය හා ගුප්තානුකූලතාව නොමැතිව බව; සහ

(ආ) තෝරා පත්කර ගැනීමේ දී දූෂණ ක්‍රියා හෝ නීති විරෝධී ක්‍රියා කිරීම වැළැක්වීමට සියලු යුක්ති සහගත ක්‍රියා මාර්ග යන් ඒ අපේක්ෂකයා විසින් ගන්නා ලද බව; සහ

(ඇ) එවැනි යම් වරදක් සුලු, නොවැදගත් හා සීමා සහිත ස්ව භාවයේ වරදක් වූ බව; සහ

(ඈ) වෙනත් සියලු කරුණු අතින් ඒ තෝරා පත්කර ගැනීම ඒ අපේක්ෂකයාගෙන් හෝ ඔහුගේ නියෝජිතයන් ගෙන් සිදු වූ කවර වූ හෝ දූෂණ ක්‍රියාවකින් හෝ නීති විරෝධී ක්‍රියාවකින් තොර වූ බව

මහාධිකරණයට ඔප්පු කළ හොත්, තමාගේ නියෝජිතයන් ගෙන් කිසිවකු විසින් කරන සංග්‍රහ කිරීමේ වරදින් හෝ අයුතු බලපෑමේ වරදින් සමන්විත දූෂණ ක්‍රියාවක් කිරීමේ වරදක් සම් බන්ධයෙන් ඒ අපේක්ෂකයා මේ වගන්තිය යටතේ වරදකරු නොකරනු ලැබිය යුතු ය.

(2) දූෂණ ක්‍රියාවක් සම්බන්ධයෙන් මේ වගන්තිය යටතේ වරදකරු කරනු ලැබූ සෑම තැනැත්තෙක් ම, ඔහු වරදකරු කරනු ලැබූ දින සිට වර්ෂ හතක කාලයක් තුළ ඡන්ද හිමියකු ලෙස ලියා පදිංචි කරනු ලැබීමට හෝ මේ පනත යටතේ වූ යම් තෝරා පත් කර ගැනීමක දී ඡන්දය දීමට හෝ ජනාධිපති ධුරයට තෝරා පත් කර ගනු ලැබීමට ඒ වරදකරු කරනු ලැබීමේ හේතුවෙන් නුසුදුසු විය යුතු ය.

(3) මේ පනත යටතේ වූ යම් තෝරා පත්කර ගැනීමක දී ජනාධිපති ධුරයට තෝරා පත්කර ගනු නොලැබූ යම් අපේක්ෂක යකු සම්බන්ධයෙන් වූ විට—

(අ) ඒ තෝරා පත්කර ගැනීමේ දී ඔහු ජනාධිපති ධුරයට තෝරා පත්කර ගනු ලැබ සිටියේ නම් ඔහුගේ ඒ තෝරා පත්කර ගනු ලැබීම සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව ඡන්ද පෙත්සමක් ඉදිරිපත් කළ හැකිව තිබුණු කාලය තුළ දී හැර; සහ

(ආ) 93 වන වගන්තිය යටතේ එවැනි පෙත්සමක් ඉදිරිපත් කිරීමට අයිතිවාසිකමක් ඇතිව සිටිය හැකි වූ තැනැත් තකු විසින් හැර; සහ

(ඇ) නීතිපතිවරයාගේ අනුමතය ඇතිව මිස

දූෂණ ක්‍රියාවක් සම්බන්ධයෙන් මේ වගන්තිය යටතේ ඒ අපේක්ෂක යාට විරුද්ධව නඩු පැවරීමක් නො කරනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ ඉහතින් දක්වුණු විධිවිධානවල කිසිවකින් මේ පනත යටතේ වූ තෝරා පත් කර ගැනීමක දී කරන ලද දූෂණ ක්‍රියාවක් සම්බන්ධයෙන් ඒ තෝරා පත්කර ගැනීමේ දී ජනාධිපති ධුරයට තෝරා පත්කර ගනු නොලැබූ අපේක්ෂකයකුට විරුද්ධව 80 වන වගන්තිය යටතේ නඩු පවරනු ලැබීම බැහැර කෙරෙන ලෙස හෝ වැළැක්වෙන ලෙස ඇළකීම හෝ අර්ථ දක්වීම නො කරනු ලැබිය යුතු ය.

## නීති විරෝධී ක්‍රියා

ඇතැම් වියදම් කිරීම නීති විරෝධී ක්‍රියාවක් බව.

82. (1) මේ පනත යටතේ තෝරා පත්කර ගැනීමක දී අපේක්ෂකයකු තෝරා ගැනීමේ ඉඩ කඩ වැඩි කිරීමේ නැතහොත් තෝරා පත්කර ගැනීම සිදු කරවා ගැනීමේ කාර්යය සඳහා—

(අ) ඡන්ද විමසන ස්ථානයෙහි සිට හෝ ඡන්ද විමසන ස්ථානය දක්වා ඡන්ද හිමියන් ගෙන යාම හේතු කොට ගෙන කවරාකාරයක හෝ වාහන හෝ ප්‍රවාහනය සඳහා යොදා ගන්නා සතුන් කුලියට ගැනීම සඳහා හෝ දුම්රිය ගාස්තු හෝ වෙනත් ගාස්තු සඳහා; නැතහොත්

(ආ) යම් ඇමතීම් පත්‍රිකාවක්, පත්‍රිකාවක් හෝ දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම සඳහා යම් ගෙයක්, ඉඩමක්, ගොඩනැගිල්ලක් හෝ ස්ථානයක් පාවිච්චි කිරීම හේතු කොට ගෙන නැතහොත් යම් ඇමතීම් පත්‍රිකාවක්, පත්‍රිකාවක් හෝ දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම හේතු කොට ගෙන ඡන්ද හිමියකුට හෝ ඡන්ද හිමියකු සමග

කවර වූ හෝ ගෙවීමක් කිරීම හෝ ගෙවීම සඳහා වූ කවර වූ හෝ ගිවිසුමක් ඇති කිරීම නොකරනු ලැබිය යුතු ය.

(2) මේ පනත ප්‍රකාර ඉඩ දිය හැකි ව්‍යතිරේකයකට යටත්ව, තෝරා පත්කර ගැනීමකට පෙර, තෝරා පත්කර ගැනීමක් පැවැත්වෙන අතරතුර දී හෝ තෝරා පත්කර ගැනීමකින් පසු, දැන දැනම මේ වගන්තිය උල්ලංඝනය කරමින් යම් ගෙවීමක් හෝ ගෙවීම සඳහා වූ ගිවිසුමක් ඇති කිරීම කරනු ලැබුවහොත්, ඒ ගෙවීම කළ හෝ ගිවිසුම ඇති කළ තැනැත්තා නීති විරෝධී ක්‍රියාවකට වරදකරු විය යුතු අතර මේ වගන්තිය උල්ලංඝනය කිරීමක් වන බව දැන දැනම ඒ ගෙවීම ලබන හෝ එබඳු යම් ගිවිසුමකට පාර්ශ්වකරුවකු වන යම් තැනැත්තකු ද නීති විරෝධී ක්‍රියාවකට වරදකරු විය යුතු ය.

(3) මෙම පනත මගින් හෝ ඒ යටතේ පැනවුණු හෝ පනවනු ලැබිය හැකි යම් ප්‍රකාශිත ව්‍යතිරේකයන්ට යටත්ව, යම් තෝරා පත් කර ගැනීමක දී ඡන්දය විමසීම ආරම්භ වීමේ වේලාවට එක් පැයකට පෙර ආරම්භ වන්නා වූ ද ඒ ඡන්ද විමසීම අවසන් කරන වේලාවෙන් පැයකට පසුව අවසන් වන්නා වූ ද කාලය තුළ—

(අ) ඡන්ද විමසන ස්ථානයට හෝ ඡන්ද විමසන ස්ථානයේ සිට ඡන්දදායකයන් ගෙන යාමේ කාර්ය සඳහා; හෝ

(ආ) (i) යම් නීත්‍යානුකූල කටයුත්තක් හෝ,

(ii) යම් නිල කටයුත්තක්, එනම් තමා විසින් දරනු ලබන හෝ කරගෙන යනු ලබන හෝ පවත්වාගෙන යනු ලබන යම් නිලයකින්, සේවයකින් හෝ සේවා නියුක්තියකින් හට ගන්නා හෝ ඊට සම්බන්ධ වූ හෝ ආනුෂංගික වූ යම් කාර්යයක් ඉටු කිරීම හෝ යම් කර්තව්‍යයක් කිරීම සඳහා

නොවන වෙනත් යම් කාර්යයක් සඳහා

යම් වාහනයක්, ජල යාත්‍රාවක් හෝ සතකු කුලියට දීම, අතමාරුවට දීම, සේවයෙහි යෙදීම, කුලියට ගැනීම, අතමාරුවට ගැනීම හෝ පාවිච්චි කිරීම, හෝ යම් වාහනයක්, ජල යාත්‍රාවක් හෝ සතකු කුලියට දීමට, අතමාරුවට දීමට, සේවයෙහි යෙදීමට, කුලියට ගැනීමට, අතමාරුවට ගැනීමට හෝ පාවිච්චි කිරීමට වෙනත් යම් තැනැත්තකුට අධාර දීම හෝ අනුබල දීම යම් තැනැත්තකු විසින් නොකරනු ලැබිය යුතු ය.

දැන දැනම මෙම උපවගන්තිය උල්ලංඝනය කරමින් ක්‍රියා කරන යම් තැනැත්තකු නීති විරෝධී ක්‍රියාවකට වරදකරු විය යුතු ය.

(4) මෙම වගන්තියේ ඉහත දැක්වෙන විධිවිධානවල කුමක් සඳහන් වුව ද—

(අ) ප්‍රචාරක දැන්වීම් නියෝජිතයකු වශයෙන් ගෙවීම් සඳහා පත්‍රිකා සහ ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීම ඡන්ද හිමියකුගේ සාමාන්‍ය ව්‍යාපාරය වන අවස්ථාවක, ඒ ඡන්ද හිමියාට ගෙවීමක් කිරීම හෝ ඔහු සමග ගිවිසුමක් ඇති කිරීම සාමාන්‍ය ව්‍යාපාර කටයුතු කර ගෙන යාමේ දී කරනු ලැබුවහොත් එය මේ වගන්තියේ අර්ථානුකූලව නීති විරෝධී ක්‍රියාවක් ලෙස නොසැලකිය යුතු ය ;

(ආ) තෝරා පත්කර ගැනීමක දී ඡන්ද හිමියන්ට තමන් පදිංචි ස්ථානයේ සිට මුහුද හෝ මුහුදේ කොටසක් හෝ මුහුදු කඩිත්තක් නැතහොත් ගංගාවක් තරණය නොකර තම ඡන්ද පොළවලට පැමිණීමට නොහැකි අවස්ථාවක දී ඒ ඡන්ද හිමියන් ඡන්ද පොළවල් කරා මුහුදින් ගෙන යාමට හෝ ඔවුන්ට ඡන්ද පොළවලට ළඟාවීමට ගඟින් එතෙර වීමට හෝ ක්‍රම සලසා දිය හැකි ය ;

(ඇ) ශ්‍රී ලංකා මධ්‍යම ගමනාගමන මණ්ඩලය, යම් ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයක් හෝ ශ්‍රී ලංකා ආණ්ඩුවේ දුම්රිය සේවය මගින් සැපයෙන යම් මහජන ප්‍රවාහන සේවාවකින් යම් තෝරා පත්කර ගැනීමක දී යම් තැනැත්තකු තමාගේ වියදමින් ඡන්ද විමසන ස්ථානයට හෝ ඡන්ද විමසන ස්ථානයෙන් යාම හෝ ඡන්ද විමසන ස්ථානයට හෝ ඡන්ද විමසන ස්ථානයෙන් තමා ගෙන යාමේ කාර්යය සඳහා යම් තැනැත්තකු විසින් තමාගේ වියදමින් එබඳු සේවයක් පාවිච්චි කිරීම මේ වගන්තියෙහි අර්ථානුකූලව නීති විරෝධී ක්‍රියාවක් නොවන බව සැලකිය යුතු ය ;

(ඈ) මැතිවරණ කොට්ඨාසයක තේරීම් භාර නිලධරයා, යම් තැනැත්තකුට කවර හෝ ශාරීරික දුබලතාවක් හේතුවෙන් ඡන්ද විමසන ස්ථානය වෙත සහ එහි සිට පා ගමනින් හෝ (ඇ) ඡේදයේ සඳහන් පොදු ගමනාගමන සේවාවක් මඟින් යාමට හා ඊමට නො හැකි බවට, ඒ තැනැත්තා විසින් හෝ ඒ තැනැත්තා වෙනුවෙන් (අපේක්ෂකයකු, ඡන්ද නියෝජිතයකු, බලයලත් නියෝජිතයකු, ප්‍රාදේශීය නියෝජිතයකු නොවන) වෙනත් තැනැත්තකු විසින් එකී නිලධරයා වෙත මේ පනත යටතේ යම් තෝරා පත්කර ගැනීමක ඡන්ද විමසන දිනයට දින හතකට පෙර ඉදිරිපත් කරන ලද ලිඛිත ඉල්ලීමක් පිළිබඳව සෑහීමකට පත්වේ නම්, තේරීම් භාර නිලධරයා විසින් ඒ තැනැත්තාට ඡන්දය විමසන ස්ථානය වෙත හා එහි සිට යාමේ හා ඊමේ කාර්යය සඳහා යම් වාහනයක්, යාත්‍රාවක් හෝ සතකු පාවිච්චි කිරීමට ලිඛිතව බලය දිය හැකි අතර, ඒ අනුව, යම් තැනැත්තකු විසින් ඒ යාමේ හා ඊමේ කාර්යය සඳහා වාහනයක්, යාත්‍රාවක් හෝ සතකු පාවිච්චි කිරීම මේ වගන්තියේ අර්ථානුකූලව නීති විරෝධී ක්‍රියාවක් නොවන බව සැලකිය යුතු ය.

(5) යම් මැතිවරණ කොට්ඨාසයක ඡන්ද විමසීමක දී, යම් පොලිස් නිලධරයකු තමාගේම මෙහෙයීමෙන් හෝ යම් තැනැත්තකුගේ පැමිණිල්ලක් අනුව තමා විසින් කරනු ලැබිය යුතු බවට මෙයින් නියම කරනු ලබන විමර්ශනයක් කිරීමෙන් පසුව (1) වන උපවගන්තියේ හෝ (3) වන උපවගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරමින්, යම් වාහනයක්, යාත්‍රාවක් හෝ සතකු පාවිච්චි කරනු ලබන බවට සෑහීමට පත්වේ නම්, ඒ නිලධරයා විසින් එකී වාහනය, යාත්‍රාව හෝ සතා නවත්වා තහනමට ගෙන, පොලිස් ස්ථානයකට ගෙන ගොස් ඡන්ද විමසීම අවසන්වන තුරු එය හෝ ඌ එහි රඳවා ගනු ලැබිය යුතු ය.

(6) මහාධිකරණය විසින් යම් තැනැත්තකු මෙම වගන්තියේ අර්ථානුකූලව නීති විරෝධී ක්‍රියාවක් කිරීම සම්බන්ධයෙන් වරද කරු කරනු ලබන විට, ඒ ක්‍රියාව කිරීමේ දී හෝ ඒ සම්බන්ධයෙන් පාවිච්චි කරන ලද යම් වාහනයක්, යාත්‍රාවක් හෝ සතකු ජනරජය සන්තක විය යුතු බව ප්‍රකාශ කරමින් ආඥාවක් කරනු ලැබිය හැකි ය.

පුවත් පත් වල අසත්‍ය වාර්තා.

83. (1) (අ) තෝරා පත්කර ගැනීමක දී තරග කරන යම් අපේක්ෂකයකුගේ කියමන් හා කටයුතුවලට ; හෝ

(ආ) එවැනි අපේක්ෂකයකු විසින් කරන ලද ඒ තෝරා පත්කර ගැනීම පිළිබඳ කටයුතු කිරීමට සහ මෙහෙයවීමට

අදාළ හෝ ඒ හා සම්බන්ධ කවර වූ හෝ අසත්‍ය ප්‍රකාශයක් කවර වූ හෝ ප්‍රවෘත්ති පත්‍රයක ප්‍රසිද්ධ කරනු ලැබූ සහ ඒ ප්‍රකාශය මගින් ඒ තෝරා පත්කර ගැනීමේ ප්‍රතිඵලය කෙරෙහි බලපෑමක් වීමට ඉඩ ඇති අවස්ථාවක ඒ ප්‍රසිද්ධ කිරීම කරනු ලබන අවස්ථාවේ දී එම ප්‍රවෘත්ති පත්‍රයේ අයිතිකරු, කළමනාකරු, සංස්කාරක, ප්‍රකාශක හෝ වෙනත් සමාන නිලධරයකු හෝ ඒ තත්ත්වය

කින් ක්‍රියාකරන බව අඟවමින් ක්‍රියා කළ යම් තැනැත්තකු, යන සෑම තැනැත්තකුම, ඒ ප්‍රසිද්ධ කිරීම කරනු ලැබුවේ තම කැමැත්ත හෝ ගුප්තානුකූලතාව නොමැතිව බව එකී තැනැත්තා විසින් ඔප්පු කරනු ලැබුවහොත් සහ ඒ සම්බන්ධයෙන් තම කර්තව්‍යයෙහි ස්වභාවය හා සියලු අවස්ථානුගත කරුණු සැලකිල්ලට ගෙන ඒ ප්‍රසිද්ධ කිරීම වැළැක්වීමට ඔහු විසින් ක්‍රියා කළ යුතු වූ පරිදි පූර්ණ උද්යෝගයෙන් ක්‍රියා කළ බව එම තැනැත්තා විසින් ඔප්පු කරනු ලැබුවහොත් මිස නීති විරෝධී ක්‍රියාවකට වරදකරු විය යුතු ය.

(2) මෙම වගන්තියෙහි 'ප්‍රවෘත්ති පත්‍රය' යන යෙදුමට කවර වූ හෝ වාර සංග්‍රහයක්, සඟරාවක්, පත්‍රිකාවක් හෝ වෙනත් ප්‍රකාශන යක් ඇතුළත් වන්නේ ය.

ඇතැම් සේවා නියුක්ති නීති විරෝධී බව.

84. (1) පහත සඳහන් කාර්යයන් සඳහා හෝ තත්ත්වයන්හි හැර කවර වූ කාර්යයක් සඳහා හෝ කවර වූ හෝ තත්ත්වයක මේ පනත යටතේ තෝරා පත්කර ගැනීමක දී අපේක්ෂකයකු තෝරා පත් කරනු ලැබීමේ ඉඩකඩ වැඩි කිරීමේ හෝ තෝරා පත්කර ගැනීම සිදු කරවීමේ කාර්ය සඳහා යම් තැනැත්තකු, ගෙවීමක් හෝ ගෙවීමක් සඳහා වූ පොරොන්දුවක් මත බඳවා ගැනීම හෝ සේව යෙහි යෙදවීම කිසිම තැනැත්තකු විසින් නොකරනු ලැබිය යුතු ය :—

(අ) එක් ඡන්ද නියෝජිතයෙක් පමණක් ;

(ආ) එක් එක් මැතිවරණ කොට්ඨාසය සඳහා එක් බලයලත් නියෝජිතයකු බැගින් ;

(ඇ) එක් එක් ඡන්ද ප්‍රදේශය සඳහා එක් ඡන්ද ප්‍රදේශ නියෝජිතයකු බැගින් ;

(ඈ) ඡන්ද විමසීමේ දී ඡන්ද කොට්ඨාසයක කවර වූ හෝ ඡන්ද නියෝජිතයකුගේ පත්වීම ප්‍රත්‍යාදිෂ්ට කිරීමේ අවශ්‍යතාව සැලකිල්ලට ගත් විට එක් එක් ඡන්ද කොට්ඨාසය සඳහා සාධාරණ වන ඡන්ද නියෝජිතයන් සංඛ්‍යාවක් සහ එක් එක් ගණන් කිරීමේ මධ්‍යස්ථානය සඳහා පස් දෙනකු වැඩි නොවන ගණන් කිරීමේ නියෝජිතයන් සංඛ්‍යාවක් ;

(ඉ) ලිපිකරුවන් හා පණිවිඩකරුවන් සාධාරණ සංඛ්‍යාවක්.

(2) මේ පනත ප්‍රකාර ඉඩදිය හැකි ව්‍යතිරේකයකට යටත්ව, තෝරා පත්කර ගැනීමකට පෙර හෝ එය පැවැත්වෙද්දී හෝ ඉන් පසුව මේ වගන්තිය උල්ලංඝනය කරමින් යම් තැනැත්තකු සේවයට බඳවා ගනු ලැබේ නම් හෝ සේවයෙහි යොදවනු ලැබේ නම්, ඔහු සේවයට බඳවා ගන්නා හෝ සේවයෙහි යොදවන තැනැත්තා නීති විරෝධී ක්‍රියාවකට වරදකරු විය යුතු ය.

තෝරා පත්කර ගැනීම පිළිබඳ ප්‍රකාශන අපේක්ෂකයන් හා බලයලත් නියෝජිතයන් විසින් මුද්‍රණය කිරීම ආදිය.

85. මේ පනත යටතේ තෝරා පත්කර ගැනීමකට අදාළ වන කවර වූ හෝ ප්‍රචාරක දැන්වීමක් හෝ අත් පත්‍රිකාවක් හෝ ප්‍රදර්ශන පත්‍රයක් හෝ දැන්වීම් කොළයක් එහි මුහුණතෙහි මුද්‍රණකරුගේ හා ප්‍රකාශකගේ නම් හා ලිපිනයන් නොමැතිව, මුද්‍රණය කරන, ප්‍රසිද්ධ කරන, බෙදා හරින හෝ ප්‍රදර්ශනය කරන හෝ මුද්‍රණය කිරීමට, ප්‍රසිද්ධ කිරීමට, බෙදා හැරීමට හෝ ප්‍රදර්ශනය කිරීමට සලස්වන, අපේක්ෂකයකු හෝ ඔහුගේ නියෝජිතයා නීති විරෝධී ක්‍රියාවකට වරදකරු විය යුතු ය.

නීති විරෝධී ක්‍රියාවකට වරදකරු වූ විට දණ්ඩනය.

86. (1) නීති විරෝධී ක්‍රියාවක් කරන සෑම තැනැත්තකුම මහාධිකරණය විසින් වරදකරු කරනු ලැබූ විට, රුපියල් තුන් සියයකට නොවැඩි දඩයකට යටත් විය යුතු අතර, වරදකරු වීම ඉක්මවා නොගෙන වරදකරු කරනු ලැබූ දිනයේ සිට වර්ෂ තුනක කාලයකට මේ පනත යටතේ වූ තෝරා පත්කර ගැනීමක දී ඡන්ද හිමියකු වශයෙන් ලියාපදිංචි කරනු ලැබීමට හෝ ඡන්දය දීමට නුසුදුසු වන්නේ ය.

(2) නීතිපතිවරයාගේ අනුමතය නොමැතිව නීති විරෝධී ක්‍රියාවක් පිළිබඳ වූ නඩු පැවරීමක් නොකරනු ලැබිය යුතු ය.

තෝරා පත්කර ගැනීමක දී පරාජිත අපේක්ෂකයකු කළ නීති විරෝධී ක්‍රියාවක් සම්බන්ධයෙන් දණ්ඩන හා අශක්‍යතාව පිළිබඳ විශේෂ විධිවිධාන.

87. (1) තෝරා පත්කර ගැනීමේ දී ජනාධිපති ධුරයට තෝරා පත්කර ගනු නොලැබූ කවර වූ හෝ අපේක්ෂකයකු විසින් හෝ ඔහුගේ දැනුම හෝ කැමැත්ත ඇතිව හෝ ඔහුගේ කවර වූ හෝ නියෝජිතයකු විසින් හෝ මේ පනත යටතේ වූ තෝරා පත්කර ගැනීමක් සම්බන්ධයෙන් නීති විරෝධී ක්‍රියාවක් කරනු ලැබූ විට, ඒ අපේක්ෂකයා මහාධිකරණය විසින් වරදකරු කරනු ලැබූ විට රුපියල් තුන්සියයකට නොවැඩි දඩයකට යටත් විය යුතු ය :

එසේ වුව ද,—

(අ) ඒ අපේක්ෂකයා විසින් හෝ ඔහුගේ නියෝජිතයන් විසින් තෝරා පත්කර ගැනීමේ දී දූෂණ ක්‍රියාවක් හෝ නීති විරෝධී ක්‍රියාවක් නො කරන ලද බව හා එම නඩු විභාගයෙහි විෂය කරුණ වන නීති විරෝධී ක්‍රියාව ඒ අපේක්ෂකයාගේ හෝ ඔහුගේ නියෝජිතයන්ගේ නියමයන්ට පටහැණිව සහ අනුමතය හා ගුප්තානුකූලතාව නොමැතිව කරන ලද බව ; සහ

(ආ) තෝරා පත්කර ගැනීමේ දී දූෂණ ක්‍රියා හා නීති විරෝධී ක්‍රියා කිරීම වැළැක්වීම සඳහා ඒ අපේක්ෂකයා හා ඔහුගේ නියෝජිතයන් විසින් සියලු සාධාරණ ක්‍රියා මාර්ග ගන්නා ලද බව ; සහ

(ඇ) ඒ නීති විරෝධී ක්‍රියාව සංයුක්ත වන වරද හෝ වරදවල් සුළු, නොවැදගත් හා සීමිත ස්වභාවයකින් යුතු වූ බව ; සහ

(ඈ) වෙනත් සෑම අංශයකින් ම තෝරා පත්කර ගැනීම ඒ අපේක්ෂකයා හෝ ඔහුගේ නියෝජිතයන් සම්බන්ධ කවර වූ දූෂණ ක්‍රියාවකින් හෝ නීති විරෝධී ක්‍රියාවකින් තොර වූ බව

ඔහු විසින් මහාධිකරණයට ඔප්පු කරනු ලැබුවහොත්, ඔහුගේ කවර වූ හෝ නියෝජිතයකු විසින් කරන ලද ඒ නීති විරෝධී ක්‍රියාව සම්බන්ධයෙන් මේ වගන්තිය යටතේ ඒ අපේක්ෂකයා වරදකරු නොකරනු ලැබිය යුතු ය.

(2) මෙම වගන්තිය යටතේ නීති විරෝධී ක්‍රියාවකට වරදකරු කරනු ලැබූ සෑම තැනැත්තකු ම, වරදකරු කරනු ලැබීම හේතුකොට ගෙන, වරදකරු කරනු ලැබූ දිනයේ සිට තුන් වර්ෂයක කාලයකට මේ පනත යටතේ වූ තෝරා පත්කර ගැනීමක දී ඡන්ද හිමියකු වශයෙන් ලියාපදිංචි කරනු ලැබීමට හෝ ඡන්දය දීමට නුසුදුසු වන්නේ ය.

(3) මේ පනත යටතේ වූ තෝරා පත්කර ගැනීමක දී ජනාධිපති ධුරයට තෝරා පත්කර ගනු නොලැබූ කවර වූ හෝ අපේක්ෂකයකුට විරුද්ධව, නීති විරෝධී ක්‍රියාවක් සම්බන්ධයෙන් මේ වගන්තිය යටතේ නඩු පැවරීමක්—

(අ) ඒ අපේක්ෂකයා ඒ තෝරා පත්කර ගැනීමේ දී ජනාධිපති ධුරයට තෝරා පත් කර ගනු ලැබී නම්, ඔහු තෝරා පත්කර ගැනීම සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව ඡන්ද පෙත්සමක් ඉදිරිපත් කළ හැකිව තිබූ කාලය තුළ දී මිස ; සහ

(ආ) 93 වන වගන්තිය යටතේ ඒ පෙත්සම ඉදිරිපත් කිරීමට අයිතිවාසිකම තිබිය හැකි වූ තැනැත්තකු විසින් මිස ; සහ

(ඇ) නීතිපතිවරයාගේ අනුමතය ඇතිව මිස,

නොකරනු ලැබිය යුතු ය.

(4) මේ පනත යටතේ වූ තෝරා පත්කර ගැනීමක දී ජනාධිපති ධුරයට තෝරා පත්කර ගනු නොලැබූ අපේක්ෂකයකුට විරුද්ධව ඒ තෝරා පත්කර ගැනීම හා සම්බන්ධ නීති විරෝධී ක්‍රියාවක් සම්බන්ධයෙන් 86 වන වගන්තිය යටතේ නඩු පවරනු ලැබීම, මේ වගන්තියේ ඉහත සඳහන් විධිවිධාන කිසිවක් මගින් බැහැර කෙරෙන හෝ වැළැක්වෙන ලෙස සැලකීම හෝ අර්ථ දැක්වීම නොකරනු ලැබිය යුතු ය.

## දූෂණ ක්‍රියා හෝ නීති විරෝධී ක්‍රියා සඳහා ක්ෂමාව

88. මේ පනත යටතේ වූ තෝරා පත්කර ගැනීමක් සම්බන්ධයෙන් වූ ඡන්ද පෙත්සමක නඩු විභාගයේ දී, ඒ තෝරා පත්කර ගැනීමේ දී අපේක්ෂකයකු ඔහුගේ නියෝජිතයන් මගින් සංග්‍රහ කිරීම හෝ අයුතු බලපෑම හෝ ඒ තෝරා පත්කර ගැනීම හා සම්බන්ධ කවර හෝ නීති විරෝධී ක්‍රියාවක් සම්බන්ධයෙන් වරද කරු වී ඇති බව ශ්‍රේෂ්ඨාධිකරණය විසින් වාර්තා කරන්නා වූ, සහ නීතිපතිවරයාට කරුණු කියා සිටීමට අවස්ථාවක් දීමෙන් පසු— *නියෝජිතයා විසින් කරන ලද ඇතැම් දූෂණ ක්‍රියා හා නීති විරෝධී ක්‍රියා සම්බන්ධයෙන් අපේක්ෂකයා දෝෂමුක්ත කිරීමේ වාර්තාව*

(අ) අපේක්ෂකයා හෝ ඔහුගේ නියෝජිතයන් විසින් ඒ තෝරා පත්කර ගැනීමේ දී දූෂණ ක්‍රියාවක් හෝ නීති විරෝධී ක්‍රියාවක් නොකරන ලද බවත්, ඒ වාර්තාවේ සඳහන් වැරදි කරන ලද්දේ ඒ අපේක්ෂකයාගේ හෝ ඔහුගේ නියෝජිතයන්ගේ නියමයන්ට පටහැණිව සහ අනුමතය හෝ ගුප්තානුකූලතාව නොමැතිව බවත් ; තව ද

(ආ) ඒ තෝරා පත්කර ගැනීමේ දී දූෂණ ක්‍රියා හා නීති විරෝධී ක්‍රියා කිරීම වැළැක්වීමට ඒ අපේක්ෂකයා සහ ඔහුගේ නියෝජිතයන් විසින් සියලු සාධාරණ ක්‍රියාමාර්ගයන් ගත් බවත් ; තව ද

(ඇ) ඒ වාර්තාවේ සඳහන් වැරදි සුළු, නොවැදගත් හා සීමිත ස්වභාවයකින් යුතු බවත් ; තව ද

(ඈ) අන් සියලු අංශයන්ගෙන් ම තෝරා පත්කර ගැනීම ඒ අපේක්ෂකයා හා ඔහුගේ නියෝජිතයන් හා සම්බන්ධ කවර වූ හෝ දූෂණ ක්‍රියාවකින් හෝ නීති විරෝධී ක්‍රියාවකින් තොර වූ බවත්

අපේක්ෂකයා අධිකරණයට ඔප්පු කර ඇති බව ශ්‍රේෂ්ඨාධිකරණය නවදුරටත් වාර්තා කරන්නා වූ ද අවස්ථාවක, ඒ වාර්තාවේ සඳහන් වැරදි හේතුකොටගෙන ඒ අපේක්ෂකයා තෝරා පත්කර ගැනීම අවලංගු නොවිය යුතු අතර, මෙම පනත යටතේ කවර හෝ අශක්‍යතාවකට අපේක්ෂකයා යටත් නොවිය යුතු ය.

**ඇතැම් ක්‍රියාවක් නීති විරෝධී ක්‍රියාවක් වීමෙන් බැහැර කිරීමට ශ්‍රේෂ්ඨාධිකරණය සතු බලය.**

**89.** ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබ ශ්‍රේෂ්ඨාධිකරණයට ප්‍රමාණවත් යයි පෙනී යන සාක්ෂි මගින්—

(අ) මේ පනත යටතේ තෝරා පත්කර ගැනීමක අපේක්ෂකයකුගේ හෝ, ඔහුගේ නියෝජිතයන්ගේ හෝ වෙනත් තැනැත්තකුගේ ක්‍රියාවක් හෝ නොකර හැරීමක්, මේ පනතේ විධිවිධාන උල්ලංඝනය කරන ගෙවීමක්, බඳවා ගැනීමක්, සේවයෙහි යෙදවීමක් හෝ ගිවිසුමක් වීම හේතු කොටගෙන නැතහොත් මේ පනතේ කවර වූ හෝ විධිවිධානයක් අන්‍යාකාරයකින් උල්ලංඝනය කිරීමක් වීම හේතුකොටගෙන මේ වගන්තිය නිසා නොවේ නම් නීති විරෝධී ක්‍රියාවක් වන බව ; හා

(ආ) එවැනි යම් ක්‍රියාවක් හෝ නොකර හැරීමක් අනවධානයක් හෝ අහඹුවක් නිසා වූ සාවද්‍ය නිශ්චය කිරීමකින් හෝ ඒ හා සමාන ස්වභාවයක වෙනත් සාධාරණ හේතුවකින් සිදු වූ බව සහ ඒ කිසිවක් වංකභාවයෙන් සිදු වූයේ නැති බව

ශ්‍රේෂ්ඨාධිකරණයට පෙන්වා දෙනු ලැබ අපේක්ෂකයන්ට සහ යම් ඡන්ද හිමියකුට කරුණු කියා සිටීමට අවස්ථාවක් දීමෙන් පසු අවස්ථානුගත කරුණු අනුව මේ පනත යටතේ ඒ ක්‍රියාවේ නොහොත් නොකර හැරීමේ කවර වූ හෝ ප්‍රතිඵලයකට අදාළ අපේක්ෂකයා සහ ඔහුගේ නියෝජිතයා හෝ වෙනත් තැනැත්තා හෝ ඔවුන් අතුරින් කිසිවකු යටත් නොවිය යුතු බව අධිකරණයට පෙනී යන අවස්ථාවක, අන්‍යාකාරව මේ පනතේ විධිවිධාන අනුව නීති විරෝධී ක්‍රියාවක්, ගෙවීමක්, සේවයෙහි යෙදවීමක් හෝ කුලියට ගැනීමක් විය හැකිව තිබූ ඒ ක්‍රියාව හෝ නොකර හැරීම මේ පනතේ විධිවිධානවල ව්‍යතිරේකයක් ලෙස ඉඩ හරිමින් අධිකරණය විසින් ආඥාවක් කරනු ලැබිය හැකි අතර එවිට ඒ අපේක්ෂකයා, නියෝජිතයා හෝ තැනැත්තා මේ පනත යටතේ ඒ ක්‍රියාවේ හෝ නොකර හැරීමේ ප්‍රතිඵල කිසිවකට යටත් නොවිය යුතු ය.

## VI වන කොටස

### ඡන්ද පෙත්සම්

අපේක්ෂකයා වරදකරු කිරීම මත තෝරා පත් කර ගැනීම අවලංගු වීම.

**90.** යම් අපේක්ෂකයකු ජනාධිපති ධුරයට තෝරා පත් කරගනු ලැබීම ඔහු යම් දූෂණ ක්‍රියාවකට හෝ නීති විරෝධී ක්‍රියාවකට වරද කරු කරනු ලැබීම හේතුකොට ගෙන අවලංගු වේ.

තෝරා පත්කර ගැනීම ඡන්ද පෙත්සමක් මත අවලංගු වීම.

**91.** ඡන්ද පෙත්සමක් අනුව ශ්‍රේෂ්ඨාධිකරණය සෑහීමට පත්වන පරිදි ඔප්පු කරනු ලබන පහත සඳහන් කවර වූ හෝ කරුණක් මත ජනාධිපති ධුරයට යම් අපේක්ෂකයකු තෝරා පත්කර ගැනීම අවලංගු යයි ප්‍රකාශ කරනු ලැබිය යුතු ය:—

(අ) සාමාන්‍ය අල්ලස් දීම, සාමාන්‍ය සංග්‍රහ කිරීම හෝ සාමාන්‍ය බිය ගැන්වීම හෝ වෙනත් විෂමාචාර හෝ ඉහත දක්වන ලද අවස්ථානුගත කරුණුවලට සමාන වූ හෝ නොවූ වෙනත් අවස්ථානුගත කරුණු හේතුකොට ගෙන ඡන්ද හිමියන්ගෙන් බහුතර සංඛ්‍යාව තමන් අභිමත අපේක්ෂකයා තෝරා පත්කර ගැනීමෙන් වළක්වනු ලැබීම හෝ වළක්වනු ලැබිය හැකි වීම ;

(ආ) තෝරා පත්කර ගැනීම්වලට අදාළ මේ පනතේ විධිවිධාන මගින් නියමිත ප්‍රතිපත්තිවලට අනුකූලව තෝරා පත්කර ගැනීම නොපැවැත්වුණු බව සහ ඒ විධිවිධාන නොපිළිපැදීම තෝරා පත්කර ගැනීමේ ප්‍රතිඵලය කෙරෙහි බලපා ඇති බව පෙනී යන්නේ නම්, ඒ විධිවිධාන නොපිළිපැදීම ;

(ඇ) අපේක්ෂකයා විසින් හෝ, ඔහුගේ දැනුම හෝ කැමැත්ත ඇතිව හෝ අපේක්ෂකයාගේ කවර වූ හෝ නියෝජිතයකු විසින් හෝ, තෝරා පත්කර ගැනීම සම්බන්ධයෙන් දූෂණ ක්‍රියාවක් හෝ නීති විරෝධී ක්‍රියාවක් කරනු ලැබීම ;

(ඈ) අපේක්ෂකයා විසින් තම ඡන්ද ආයාචකයකු හෝ නියෝජිතයකු හෝ තමා වෙනුවෙන් කතා පවත්වන්නකු හෝ වශයෙන් යම් තැනැත්තකු බඳවා ගන්නා අවස්ථාවට පෙරාතුවම වූ සත් වසර තුළ ඒ තැනැත්තා 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජ සභා ආඥාව යටතේ හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් තෝරා පත්කර ගැනීමට අදාළ නීතිය යටතේ හෝ ජනමතවිචාරණවලට අදාළ නීතිය යටතේ හෝ මේ පනත යටතේ හෝ දූෂණ ක්‍රියාවකට වරද කරු කරනු ලැබ තිබූ බව දැන දැනම ඒ තැනැත්තා අපේක්ෂකයා විසින් පෞද්ගලිකව ම එසේ බඳවා ගනු ලැබීම ;

(ඉ) යම් තැනැත්තකු, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 81 වන ව්‍යවස්ථාව ප්‍රකාර, පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලැබූ යෝජනා සම්මතයක් මගින් තමා සම්බන්ධයෙන් ප්‍රජා අශක්තතා නියම කර ඇත්තා වූ ද, ඒ යෝජනා සම්මතයෙහි නියම කර ඇති එකී ප්‍රජා අශක්තතා කාලසීමාව ඉකුත් වී නොමැති වූ ද තැනැත්තකු බව දැන දැනම ඒ තැනැත්තා ඡන්ද ආයාචකයකු හෝ නියෝජිතයකු හෝ අපේක්ෂකයා වෙනුවෙන් කතා පවත්වන්නකු ලෙස අපේක්ෂකයා විසින් පෞද්ගලිකව සේවයෙහි යොදවා ගැනීම ;

(ඊ) තෝරා පත්කර ගන්නා අවස්ථාවේ දී අපේක්ෂකයා ජනාධිපති ධුරයට තෝරා පත්කර ගනු ලැබීමට නුසුදුසු වූ තැනැත්තකු වීම.

**ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීම සම්බන්ධයෙන් වූ ඡන්ද පෙත්සම් විභාග කිරීමෙහිලා ශ්‍රේෂ්ඨාධිකරණයේ බලය.**

**92.** ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීම සම්බන්ධයෙන් වූ නඩු කටයුත්තක් විභාග කොට තීරණය කිරීම, යටත් පිරිසෙයින් ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයන් පස් දෙනකු විසින් කළ යුතු අතර, අග්‍රවිනිශ්චයකාරවරයා විසින් අන්‍යාකාර විධානයක් කරනු ලැබුවහොත් මිස, ඔහු ඒ පස් දෙනාගෙන් එක් විනිශ්චයකාරවරයකු විය යුතු ය.

**පෙත්සම ඉදිරිපත් කළ යුත්තේ කා විසින් ද යන වග.**

**93.** පහත සඳහන් තැනැත්තන් අතුරින් එක් අයකු විසින් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් විසින් ඡන්ද පෙත්සමක් ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කරනු ලැබිය හැකි ය:—

(අ) මේ පනත යටතේ වූ තෝරා පත්කර ගැනීමක දී අපේක්ෂකයකු වූ හා ඒ තෝරා පත්කර ගැනීමේ දී තෝරා පත්කරනු ලැබූ බව ප්‍රකාශ කරනු ලැබීමට හෝ තෝරා පත්කර ගනු ලැබීමට අයිතියක් තිබූ බව කියා පාන තැනැත්තෙක් ;

(ආ) (අ) ඡේදයෙහි සඳහන් කරන ලද යම් අපේක්ෂකයකුගේ නාමයෝජනා පත්‍රය හෝ පත්‍ර අත්සන් කළ යම් තැනැත්තෙක්.

**ඉල්ලා සිටිය හැකි සහන.**

**94.** පෙත්සම්කරුට හිමි විය හැකි පහත දැක්වෙන සහන සියල්ල හෝ ඉන් යම් එකක් ඡන්ද පෙත්සමකින් ඉල්ලා සිටිනු ලැබිය හැකි ය:—

(අ) තෝරා පත්කර ගැනීම අවලංගු බව ප්‍රකාශ කිරීමක් ;

(ආ) තෝරා පත්කර ගනු ලැබූ තැනැත්තා තෝරා පත්කර ගනු ලැබූ බව ප්‍රකාශ කිරීම අයථා බව ප්‍රකාශ කිරීමක් ;

(ඇ) යම් අපේක්ෂකයකු යථා පරිදි තෝරා පත්කර ගනු ලැබූ බව ද තෝරා පත්කර ගනු ලැබූ බව ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ බව ද ප්‍රකාශ කිරීමක් ;

(ඈ) තෝරා පත්කර ගනු නොලැබූ අපේක්ෂකයකු, නීත්‍යානුකූල ඡන්ද බහුතර සංඛ්‍යාවක් තමාට තිබුණේය යන කරුණ මත ජනාධිපති ධුරයට හිමිකම් පාන අවස්ථාවක සමීක්ෂණයක්.

**පෙත්සමක පාර්ශ්වකරුවෝ.**

95. (1) පෙත්සම්කරුවකු විසින්—

(අ) තෝරා පත්කර ගනු ලැබූ බවට ප්‍රකාශ කරන ලද අපේක්ෂකයාගේ තෝරා පත්කර ගනු ලැබීම අවලංගු යයි හෝ අයථා යයි කියා පෑමට අතිරේක වශයෙන්, තමාම හෝ වෙනත් යම් අපේක්ෂකයකු හෝ යථා පරිදි තෝරා පත්කර ගනු ලැබූ බවට වූ තවදුරටත් ප්‍රකාශයක් පෙත්සමින් ඉල්ලා සිටින්නේ නම්, පෙත්සම්කරු හැර තරග කළ අන් සියලු අපේක්ෂකයන් ද, එවැනි තවදුරටත් ප්‍රකාශයක් ඉල්ලා නොසිටින්නේ නම්, තෝරා පත්කර ගනු ලැබූ බවට ප්‍රකාශ කරන ලද අපේක්ෂකයා ; සහ

(ආ) වෙනත් යම් අපේක්ෂකයකුට හෝ තැනැත්තකුට එරෙහිව දූෂණ ක්‍රියා හෝ නීති විරෝධී ක්‍රියා සම්බන්ධයෙන් පෙත්සමෙහි චෝදනා කොට තිබේ නම් ඒ වෙනත් යම් අපේක්ෂකයා හෝ තැනැත්තා

එම ඡන්ද පෙත්සමේ වගඋත්තරකරුවන් ලෙස සම්බන්ධ කරනු ලැබිය යුතු ය.

(2) ඡන්ද පෙත්සමක වගඋත්තරකරුවකු වශයෙන් නොසිටින යම් අපේක්ෂකයකුට, තත් කාර්ය සඳහා ඔහු විසින් ශ්‍රේෂ්ඨාධිකරණයට කරනු ලබන ඉල්ලීම මත, ඒ පෙත්සමේ වගඋත්තරකරුවකු ලෙස සම්බන්ධ කරනු ලැබීමට හිමිකම ලැබිය යුතු ය :

එසේ වුව ද, ශ්‍රේෂ්ඨාධිකරණය විසින් නිශ්චය කරනු ලබන පරිදි නඩු ගාස්තු සඳහා ඇපයක් යම් අපේක්ෂකයකු විසින් දෙනු ලැබ තිබේ නම් මිස තමාගේ මෙහෙයීමෙන් එවැනි පෙත්සමක වගඋත්තරකරුවකු වශයෙන් සම්බන්ධ කරනු ලැබීමට කිසිම අපේක්ෂකයකුට මෙම වගන්තියේ ඉහතින් සඳහන් විධිවිධාන යටතේ හිමිකම නොලැබිය යුතු ය.

96. ඡන්ද පෙත්සමක් මගින්— පෙත්සමෙහි අඩංගු විය යුතු කරුණු.

(අ) 93 වන වගන්තිය යටතේ පෙත්සම ඉදිරිපත් කිරීමට පෙත්සම්කරු සතු අයිතිය ප්‍රකාශ කරනු ලැබිය යුතු ය;

(ආ) තෝරා පත්කර ගැනීම පැවැත්වුණු බව සහ එහි ප්‍රතිඵලය ප්‍රකාශ කරනු ලැබිය යුතු ය;

(ඇ) පෙත්සම්කරු තමාට ආධාර වෙතැයි විශ්වාස කරන වැදගත් කරුණු පිළිබඳ සංක්ෂිප්ත ප්‍රකාශයක් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය;

(ඈ) යම් දූෂණ ක්‍රියා හෝ නීති විරෝධී ක්‍රියා සිදු කරනු ලැබුවේ යයි පෙත්සම්කරු කියා සිටින්නේ ද, ඒ දූෂණ ක්‍රියා හෝ නීති විරෝධී ක්‍රියා සිදු කරනු ලැබුවේ යයි කියනු ලබන තැනැත්තන්ගේ නම් එය සිදු කළ දිනය සහ ස්ථානය ද හැකිතාක් දුරට අඩංගු වන සම්පූර්ණ ප්‍රකාශයක් ද ඇතුළුව ඒ දූෂණ ක්‍රියාව හෝ නීති විරෝධී ක්‍රියාව පිළිබඳව සම්පූර්ණ විස්තර ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර සිදු කරනු ලැබුවේ යයි චෝදනා කරනු ලබන ඒ දූෂණ ක්‍රියා සහ නීති විරෝධී ක්‍රියා සහ ඒවා සිදු කරනු ලැබූ දිනය සහ ස්ථානය සනාථ කරනු පිණිස දිවුරුම් ප්‍රකාශයක් ද ඉදිරිපත් කරනු ලැබිය යුතු ය;

(ඉ) උදාහරණ වශයෙන් යම් නිශ්චිතව සඳහන් කරන ලද තැනැත්තකු යථා පරිදි තෝරා පත්කර ගනු ලැබූ බව ප්‍රකාශ කරනු ලැබිය යුතු යයි හෝ තෝරා පත්කර ගනු ලැබුවේ යයි අධිකරණය විසින් ප්‍රකාශ කරනු ලැබිය යුතු බව හෝ තෝරා පත්කර ගැනීම අවලංගු බව ප්‍රකාශ කරනු ලැබිය යුතු බව හෝ අවස්ථාවෝචිත පරිදි සඳහන් ආයාචන යක් අවසාන වශයෙන් ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර පෙත්සම්කරුවන් සියලු දෙනා විසින් එහි අත්සන් කළ යුතු ය:

එසේ වුව ද, මෙම වගන්තියේ ඉහත සඳහන් කිසිදු විධිවිධාන යකින් පෙත්සමෙහි සාක්ෂි සඳහන් කරනු ලැබිය යුතු බව නියම කෙරෙතැ යි සැලකීම හෝ අර්ථ දැක්වීම නොකරනු ලැබිය යුතු ය.

**ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියෙහි කාර්ය පටිපාටිය පිළිබඳ විශේෂ විධිවිධාන.**

97. (1) ඡන්ද පෙත්සම සාධාරණ සහ කාර්ය සාධන ආකාර යෙන් විභාග වීම සහතික කරනු පිණිස අවශ්‍ය යයි ශ්‍රේෂ්ඨාධිකරණයේ මතය වන ආකාරයට ඡන්ද පෙත්සමක නිශ්චිතව සඳහන් කර ඇති යම් දූෂණ ක්‍රියා හෝ නීති විරෝධී ක්‍රියා පිළිබඳ විස්තර, සංශෝධනය කිරීමට හෝ විස්තාරණය කිරීමට නඩු ගාස්තු පිළිබඳව හෝ අන්‍යාකාරයෙන් සුදුසු යයි ශ්‍රේෂ්ඨාධිකරණය සලකන නියම යන්ට යටත්ව, ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ඉඩ දෙනු ලැබිය හැකි ය. එසේ වුව ද, පෙත්සමෙහි කලින් චෝදනා කොට නොතිබුණු යම් දූෂණ ක්‍රියාවන් හෝ නීති විරෝධී ක්‍රියාවන් පිළිබඳ විස්තර ඇතුළත් කිරීමක් එවැනි සංශෝධනයකින් හෝ විස්තාරණයකින් සිදු වන්නේ නම්, ඒ සංශෝධනයට හෝ විස්තාරණයට ශ්‍රේෂ්ඨාධි කරණය විසින් ඉඩ නොදිය යුතු ය.

(2) සෑම ඡන්ද පෙත්සමක් ම හැකිතාක් ඉක්මණින් විභාග කරනු ලැබිය යුතු අතර, පෙත්සම ඉදිරිපත් කිරීමේ දිනයෙන් පසු මාස හයක කාලයක් ඇතුළත ඒ පෙත්සම පිළිබඳ විභාගය නිම කිරීමට සෑම ප්‍රයත්නයක් ම දරනු ලැබිය යුතු ය. පෙත්සම විභාග කිරීම නිම කිරීමේ දිනයෙන් පසු අනිසි ප්‍රමාදයකින් තොරව ඒ පෙත්සම පිළිබඳ තීරණය දෙමින් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ආඥාවක් කරනු ලැබිය යුතු ය.

**ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය.**

98. ඡන්ද පෙත්සමක් පිළිබඳ විභාගය අවසාන වූ විට එහි පැමිණිලිකර ඇත්තේ යම් තැනැත්තකු තෝරා පත්කර ගනු ලැබීම පිළිබඳ ප්‍රකාශයට හෝ තෝරා පත්කර ගනු ලැබීමට විරුද්ධව ද ඒ තැනැත්තා හෝ වෙනත් යම් තැනැත්තකු නැතහොත් කවර තැනැත්තකු යථා පරිදි තෝරා පත්කර ගනු ලැබ ඇතැයි ප්‍රකාශ කරනු ලැබ නැතහොත් තෝරා පත්කර ගනු ලැබ ඇත්ද යන බව හෝ තෝරා පත්කර ගැනීම අවලංගු ද යන බව ශ්‍රේෂ්ඨාධිකරණය විසින් නිරණය කරනු ලැබිය යුතු අතර ඒ තීරණය ලිඛිතව සහතික කරනු ලැබිය යුතු ය.

මින් මතු විධිවිධාන සලසා ඇති පරිදි ඒ සහතිකය සම්බන්ධයෙන් ක්‍රියා කරනු ලැබිය යුතු ය.

99. ඡන්ද පෙත්සමක නඩු විභාගය අවසානයේ දී ශ්‍රේෂ්ඨාධිකරණය විසින්— දූෂණ ක්‍රියා හෝ නීති විරෝධී ක්‍රියා විෂයෙහි ශ්‍රේෂ්ඨාධිකරණයේ වාර්තාව

(අ) තෝරා පත්කර ගැනීමේ දී යම් අපේක්ෂකයකු විසින් හෝ, ඔහුගේ දැනුම හා අනුමතය ඇතිව හෝ ඔහුගේ නියෝජිතයා විසින් හෝ යම් දූෂණ ක්‍රියාවක් හෝ නීති විරෝධී ක්‍රියාවක් කරන ලද බව ඔප්පු වී තිබේ ද නැද්ද යන බව හා එවැන්නක් ඔප්පු වී තිබේ නම් ඒ දූෂණ ක්‍රියාවේ හෝ නීති විරෝධී ක්‍රියාවේ ස්වභාව ; සහ

(ආ) නඩු විභාගයේ දී යම් දූෂණ ක්‍රියාවකට හෝ නීති විරෝධී ක්‍රියාවකට වරදකරුවන් බව ඔප්පු වූ යම් තැනැත්තෙක් වෙතොත් ඒ සියලු තැනැත්තන්ගේ නම් හා විස්තර

දක්වමින් වාර්තාවක් ද කරනු ලැබිය යුතු ය :

එසේ වුව ද, ඡන්ද පෙත්සමක පාර්ශ්වකරුවකු නොවූ හෝ ඡන්ද පෙත්සමකින් තමා වෙනුවෙන් ජනාධිපති ධුරයට හිමිකම් පෑමක් කෙරෙන අපේක්ෂකයකු නොවූ යම් තැනැත්තකු පිළිබඳව මේ වගන්තිය යටතේ ශ්‍රේෂ්ඨාධිකරණය විසින් වාර්තා කරනු ලැබීමට පෙර ඒ තැනැත්තා පිළිබඳව එසේ වාර්තා නොකරනු ලැබිය යුත්තේ මන්දැයි පෙන්වීම පිණිස කරුණු කියා සිටීමට ද සාක්ෂි දීමට හා කැඳවීමට ද ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ඔහුට අවස්ථාවක් දෙනු ලැබිය යුතු ය.

මෙහි මින් මතු විධිවිධාන සලසා ඇති පරිදි ඒ වාර්තාව සම්බන්ධයෙන් ක්‍රියා කරනු ලැබිය යුතු ය.

100. ශ්‍රේෂ්ඨාධිකරණය විසින් 98 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද ශ්‍රේෂ්ඨාධිකරණයේ සහතිකය 99 වන වගන්තිය යටතේ කරන ලද වාර්තාව සමග කථානායකවරයාට ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. ඉන් අනතුරුව කථානායකවරයා විසින් ඒ සහතිකය ඒ වාර්තාව සමග කොමසාරිස්වරයා වෙත යවනු ලැබිය යුතු ය. සහතිකය හා වාර්තාව කථානායකවරයාට ඉදිරිපත් කළ යුතු බව.

101. (1) 100 වන වගන්තියෙන් නියම කරන ලද පරිදි ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය පිළිබඳ සහතිකය කොමසාරිස්වරයා වෙත යවනු ලැබූ පසු තීරණය ක්‍රියාත්මක විය යුතු ය ; තව ද ඒ අනුව,— වාර්තාවේ හා සහතිකයේ බලපෑම.

(අ) තෝරා පත්කර ගනු ලැබූ බව ප්‍රකාශ කිරීම හෝ තෝරා පත්කර ගනු ලැබීම ස්ථිර කරනු ලැබිය යුතු ය ; නැතහොත්

(ආ) ඒ තීරණය අනුව තෝරා පත්කර ගනු ලැබූ බව ප්‍රකාශ කිරීම හෝ තෝරා පත්කර ගනු ලැබීම වෙනස් කරනු ලැබිය යුතු ය ; නැතහොත්

(ඇ) තෝරා පත්කර ගැනීම අවලංගු යයි ප්‍රකාශ කරනු ලැබිය යුතු බව තීරණය වන අවස්ථාවක, ඒ සහතිකය ලැබීමෙන් මාසයක් ඇතුළත කොමසාරිස්වරයා විසින් ගැසට් පත්‍රයේ දැන්වීමක් මගින්, තෝරා පත්කර ගැනීමක් පැවැත්වීම නියම කරනු ලැබිය යුතු ය.

(2) (අ) 100 වන වගන්තිය යටතේ කොමසාරිස්වරයාට එවනු ලැබූ ශ්‍රේෂ්ඨාධිකරණයේ වාර්තාව ලැබීමෙන් පසු කොමසාරිස්වරයා විසින් ඒ වාර්තාවේ පිටපතක් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීමට සැලැස්විය යුතු ය.

(ආ) (i) යම් තැනැත්තකු විසින් දූෂණ ක්‍රියාවක් හෝ නීති විරෝධී ක්‍රියාවක් කරන ලද බව (අ) ඡේදයෙහි සඳහන් වාර්තාවෙහි වාර්තා වූ අවස්ථාවක, ඒ තැනැත්තා ඒ වාර්තාවේ දිනයේ දී ඒ ක්‍රියාවට වැරදිකරු කරනු ලැබ සිටියේ නම් අදාළ වන අශක්‍යතා වලට යටත් විය යුතු ය.

(ii) ඒ දූෂණ ක්‍රියාව හෝ නීති විරෝධී ක්‍රියාව යම් තෝරා පත්කර ගැනීමක අපේක්ෂකයකු වූ තැනැත්තකුගේ දැනුම හා අනුමතය ඇතිව හෝ ඔහුගේ නියෝජිතයා විසින් කරන ලද බව (අ) ඡේදයේ සඳහන් වාර්තාවෙහි වාර්තා වූ අවස්ථාවක ඒ තැනැත්තා ඉහත සඳහන් අශක්‍යතාවලට ම යටත් විය යුතු ය.

(3) (2) වන උපවගන්තියෙහි විධිවිධාන සලසා ඇති පරිදි ගැසට් පත්‍රයෙහි පළ කරන ලද ඒ සෑම වාර්තාවක් අප්‍රමාදව කියවා ඒ වාර්තාව අනුව තෝරා පත්කර ගැනීමක දී ඡන්දය දීමට අශක්‍ය බව පෙනී යන සෑම තැනැත්තකුගේ ම නම, අප්‍රමාදව ඡන්ද හිමි නාමලේඛනයෙන් ඉවත් කිරීම සෑම ලියාපදිංචි කිරීමේ නිලධරයකු ගේ ම කාර්යය විය යුතු ය.

ඉදිරිපත් කිරීමේ කාලය.

102. (1) සෑම ඡන්ද පෙත්සමක් ම තෝරා පත්කර ගැනීමේ ප්‍රතිඵල ගැසට් පත්‍රයෙහි පළ කිරීමේ දිනයේ සිට දින විසි එකක් ඇතුළත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය :

එසේ වුව ද දූෂණ ක්‍රියාවක් හේතුකොට ගෙන යම් තෝරා පත් කර ගනු ලැබූ බව ප්‍රකාශ කිරීමක් හෝ තෝරා පත්කර ගනු ලැබීමක් සම්බන්ධයෙන් ප්‍රශ්න කරන්නා වූ ද ඒ දූෂණ ක්‍රියාව ක්‍රියාත්මක කිරීම හෝ ඉදිරියට ගෙනයාම සඳහා, යම් තැනැත්තකු තෝරා පත් කර ගනු ලැබීම ප්‍රශ්න කරනු ලබන්නේ නම් ඒ තැනැත්තා විසින් හෝ ඒ තැනැත්තාගේ නියෝජිතයකු විසින් හෝ ඒ තැනැත්තාගේ හෝ ඔහුගේ බලයලත් නියෝජිතයාගේ සම්බන්ධය ඇතිව හෝ ඉහත සඳහන් දිනයෙන් පසු කරන ලද මුදල් ගෙවීමක් හෝ වෙනත් ක්‍රියාවක් ගැන නිශ්චිත ව චෝදනා කරන්නා වූ ද ඡන්ද පෙත්සමක් ඒ දූෂණ ක්‍රියාව සම්බන්ධයෙන් වන තාක් ඒ ගෙවීමේ හෝ ක්‍රියාවේ දිනයේ සිට දින විසි අටක් ඇතුළත කවර වූ හෝ අවස්ථාවක ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(2) නිසි කාලය තුළ ඉදිරිපත් කරන ලද ඡන්ද පෙත්සමක් දූෂණ ක්‍රියාවක් හෝ නීති විරෝධී ක්‍රියාවක් පිළිබඳ චෝදනාවක් මත තෝරා පත්කරගනු ලැබූ බව ප්‍රකාශ කිරීම හෝ තෝරා පත්කරගනු ලැබීම හෝ ප්‍රශ්න කිරීමේ කාර්යය සඳහා ඒ හේතුව මත තෝරා පත්කර ගනු ලැබූ බව ප්‍රකාශ කිරීම හෝ තෝරා පත්කර ගනු ලැබීම හෝ ප්‍රශ්න කරන ඡන්ද පෙත්සමක් ඉදිරිපත් කරනු ලැබිය හැකි කාලය තුළ, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයකුගේ අවසරය ඇතිව, සංශෝධනය කරනු ලැබිය හැකි ය.

**103.** යම් තෝරා පත්කර ගැනීමක දී ඡන්දය දුන් කවර වූ හෝ ඡන්ද හිමියකුට තමා ඡන්දය දුන්නේ කවරකුට ද යන්න ප්‍රකාශ කිරීමට තෝරා පත්කර ගැනීම ප්‍රශ්න කිරීමේ යම් නඩු කටයුත්තක දී නියම නොකළ යුතු ය.

ඡන්දය දීම එළිදරව් කිරීම තහනම් කිරීම.

**104.** (1) ඡන්ද පෙත්සමක් පිළිබඳ විභාගයක දී කෙරෙන සමීක්ෂණයකට පසුව පහත සඳහන් ඡන්ද පමණක් ඉවත් කරනු ලැබිය යුතු ය. එනම් :—

සමීක්ෂණයක දී ඉවත් කළ යුතු ඡන්ද.

(අ) ඡන්දය සටහන් කරනු ලැබූ ඡන්ද පොළට පවරන ලද ඡන්ද හිමි නාම ලේඛනයෙහි නම සඳහන් නොවූ යම් තැනැත්තකුගේ ඡන්දය ;

(ආ) අල්ලස් දීම, සංග්‍රහ කිරීම හෝ අයුතු බලපෑම මගින් යම් තැනැත්තකුගේ ඡන්දය ලබා ගන්නා ලද්දේ ද ඒ තැනැත්තාගේ ඡන්දය ;

(ඇ) තෝරා පත්කර ගැනීමේ දී හොර ඡන්දය දීමේ වරද කළ හෝ කර වූ යම් තැනැත්තකුගේ ඡන්දය ;

(ඈ) එක් මැතිවරණ කොට්ඨාසයකට වඩා වැඩි මැතිවරණ කොට්ඨාස ගණනක දී හෝ එකම මැතිවරණ කොට්ඨාසයෙහි එක් වරකට වඩා වැඩි වාර ගණනක් ඡන්දය දී ඇති බව ඔප්පු වූ යම් තැනැත්තාගේ ඡන්දය ;

(ඉ) ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 89 වන ව්‍යවස්ථාවේ (ඉ), (ඊ), (උ), (ඌ), (එ) සහ (ඒ) ඡේද ක්‍රියාත්මක වීමේ හේතුවෙන් තෝරා පත්කර ගැනීමේ දී ඡන්දය දීමට අශක්‍ය බවට පත්වූ යම් තැනැත්තකුගේ ඡන්දය ;

(ඊ) 23 වන වගන්තියේ (1) වන උපවගන්තිය හේතුකොට ගෙන තෝරා පත් කර ගැනීමේ දී පෞද්ගලිකව ඡන්දය දීමේ හිමිකම් නොමැතිව තෝරා පත් කර ගැනීමේ දී පෞද්ගලිකව ඡන්දය දුන් යම් තැනැත්තකුගේ ඡන්දය.

(2) ලියාපදිංචි ඡන්ද හිමියකුගේ ඡන්දය සමීක්ෂණයක දී ඉවත් කිරීම මේ වගන්තියේ (1) වන උපවගන්තියේ (ඉ) ඡේදයෙහි දක්වා ඇති අවස්ථාවේ දී හැර, එම ඡන්දදායකයා තමාගේ නම ඡන්ද හිමි නාමලේඛනයෙහි ඇතුළත් කරනු ලැබීමට සුදුසුකම් ඇතිව නොසිටීම හෝ සුදුසුකම් නොමැතිවීම පමණක් හේතුකොට ගෙන නොකරනු ලැබිය යුතු ය.

(3) සමීක්ෂණයක් කිරීමේ දී, වලංගු ඡන්දයක් බවට ඔප්පු වූ යම් ද්විත්ව ඡන්දයක්, පෙත්සමේ යම් පාර්ශ්වකරුවකු විසින් කරනු ලබන ඉල්ලීමක් මත, ඡන්ද විමසීමට එකතු කරනු ලැබිය යුතු ය.

**105.** (1) පාර්ලිමේන්තුව විසින් අන්‍යාකාර විධිවිධාන සලස්වනු ලබන තුරු, මේ වගන්තියේ විධිවිධානවලට යටත්ව, ඡන්ද පෙත්සම් පිළිබඳ කාර්ය පටිපාටිය හා පරිචය මේ පනතේ හතරවන උපලේඛනයෙහි අඩංගු රීති මගින් පාලනය කරනු ලැබිය යුතු ය.

ඡන්ද පෙත්සම් පිළිබඳ කාර්ය පටිපාටිය සහ පරිචය.

4—ඒ 51455 (81/4)

(2) ඡන්ද පෙත්සමක් පිළිබඳ කාර්ය පටිපාටිය සහ පරිචය සම්බන්ධයෙන් මේ පනත මගින් හෝ ඒ රීති මගින් හෝ පාර්ලිමේන්තුවේ යම් පනතක් මගින් විධිවිධාන සලසා නොමැති යම් කාරණයක් උද්ගත වන්නේ නම්, ඒ කාරණය සම්බන්ධයෙන් අග්‍ර විනිශ්චයකාරවරයා විසින් නියම කරනු ලැබිය හැකි යම් ආකාරයකට ක්‍රියා කරනු ලැබිය යුතු ය.

ගණන් කිරීමේ නිලධරයා විසින් ඡන්ද පත්‍රිකාව ප්‍රතික්ෂේප කිරීම අවසානාත්මක විය යුතු බව.

106. 51 වන වගන්තිය යටතේ ඡන්ද පත්‍රිකාවක් ප්‍රතික්ෂේප කළ යුතුද නැද්ද යන්න පිළිබඳව ගණන් කිරීමේ නිලධරයාගේ තීරණය, ඡන්ද පෙත්සමක දී ප්‍රශ්න කරනු නො ලැබිය යුතු ය.

## VII වන කොටස

## සාමාන්‍ය කරුණු

මැතිවරණ කොමසාරිස්වරයාගේ බලතල.

107. (අ) ජනාධිපති ධුරය සඳහා වූ තෝරා පත්කර ගැනීමක් පැවැත්වීම පරිපාලනය කිරීම පිළිබඳ සාමාන්‍ය විධානය සහ අධීක්ෂණය කොමසාරිස්වරයා විසින් කරනු ලැබිය යුතු ය;

(ආ) මේ පනතේ විධිවිධාන ඵලදායී ලෙස ක්‍රියාවේ යෙදවීම සහතික කරනු පිණිස අවශ්‍ය යයි තමා සලකන විධානයන් නියෝජ්‍ය සහ සහකාර මැතිවරණ කොමසාරිස්වරයන්ට, තේරීම් භාර නිලධරයන්ට, ඡන්ද ස්ථානාධිපතිවරයන්ට, ගණන් කිරීමේ නිලධරයන්ට සහ අනෙක් මැතිවරණ නිලධරයන්ට නිකුත් කිරීමට කොමසාරිස්වරයාට බලය ඇත්තේ ය;

(ඇ) කොමසාරිස්වරයා විසින් මේ පනත මගින් තමා වෙත පවරා ඇති සහ නියම කොට ඇති අනෙක් සියලු බලතල සහ කාර්ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම කරනු ලැබිය යුතු ය.

ස්ථාන හා තැනැත්තන් පිළිබඳ සාවද්‍ය විස්තර.

108. මේ පනත යටතේ හෝ එහි කාර්ය සඳහා පිළියෙළ කරන ලද හෝ නිකුත් කරන ලද කවර වූ හෝ නාම ලේඛනයක, දැන්වීමක හෝ වෙනත් ලේඛනයක නම් කොට ඇති හෝ විස්තර කොට ඇති යම් තැනැත්තකු හෝ ස්ථානයක් සම්බන්ධයෙන් වූ කිසිම වැරදි නාමයක් හෝ සාවද්‍ය විස්තරයක් ඒ තැනැත්තා හෝ ස්ථානය හඳුනාගත හැකි වන පරිදි ඒ නාම ලේඛනයෙහි, දැන්වීමෙහි හෝ ලේඛනයෙහි ඒ තැනැත්තා හෝ ස්ථානය නම් කරනු ලැබ ඇත්නම්, ඒ තැනැත්තා හෝ ස්ථානය සම්බන්ධයෙන් මේ පනත ක්‍රියාත්මක කිරීම කෙරෙහි කවර වූ හෝ ආකාරයකින් බලපෑමක් ඇති නොකළ යුතු ය.

දැන්වීම් ආදිය ප්‍රසිද්ධ කිරීම.

109. (1) යම් දැන්වීමක් ප්‍රසිද්ධ කරනු ලැබිය යුතු බව මේ පනත මගින් නියමිතව ඇති සහ නියමිත ප්‍රසිද්ධ කිරීමේ ක්‍රමය අනුව දැන්වීමට ප්‍රමාණවත් ප්‍රචාරයක් නොලැබෙන බව ඒ දැන්වීම ප්‍රසිද්ධ කිරීමට නියම කරන ලද බලධරයා අදහස් කරන අවස්ථාවක, ඔහු විසින් මේ පනත මගින් නියමිත පරිදි දැන්වීම ප්‍රසිද්ධ කිරීමට

අමතරව, දැන්වීම් අදාළ වන්නා වූ ප්‍රදේශය ඇතුළත ප්‍රකටව පෙනෙන ස්ථානවල දැන්වීමේ පිටපත් ප්‍රදර්ශනය කිරීම හෝ ඊට ප්‍රචාරය දීම සඳහා අවශ්‍ය යයි ඔහු විසින් සලකනු ලැබිය හැකි වෙනත් යම් පියවර ගැනීම කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය සටතේ යම් බලධරයකු විසින් ප්‍රදර්ශනය කරනු ලබන දැන්වීමක් හෝ මේ පනතට අනුකූලව පරීක්ෂණය සඳහා තබා ඇති යම් ලේඛනයක් හෝ නීත්‍යනුකූල බලයක් නොමැතිව, විනාශ කරන, පලුදු කරන, විරූපි කරන හෝ ඉවත් කරන සෑම තැනැත්තකුම වරදකට වරදකරු වන අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ වරදකරු කරනු ලැබූ විට රුපියල් පනහක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

*සේවා නියුක්තයන්ට ඡන්දය දීමට හැකිවීම පිණිස නිවාඩු දීම සේවා යෝජකයන්ගේ යුතුකම බව.*

**110.** (1) තෝරා පත්කර ගැනීමක දී පුද්ගලිකව ඡන්දය දීමට හිමිකම් ඇති යම් තැනැත්තකුගේ සේවායෝජකයා වන වෙනත් යම් තැනැත්තකු විසින්, ඒ තැනැත්තා විසින් ලියවිල්ලකින් කරනු ලබන ඉල්ලීමක් අනුව, ඒ තෝරා පත්කර ගැනීමේ දී ඒ තැනැත්තාට පුද්ගලිකව ඡන්දය දීමට හැකි වන සේ ප්‍රමාණවත් යයි ඒ වෙනත් තැනැත්තා විසින් සලකනු ලැබිය හැකි (පැය හතරකට නොඅඩු) අඛණ්ඩ කාලයක් සඳහා වැටුප් අඩු නොවන පරිදි නිවාඩු දෙනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරන හෝ ඊට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරින යම් තැනැත්තකු වරදකට වරදකරු වන අතර මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ ලඝු නඩු විභාගයකට පසුව වරදකරු කරනු ලැබූ විට, රුපියල් පන්සියය නොඉක්මවන දඩයකට හෝ මාසයක් නොඉක්මවන කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය.

*ඡන්ද පොළවල් වශයෙන් පාසල් පාවිච්චි කිරීම.*

**111.** (1) පාර්ලිමේන්තුව විසින් ප්‍රතිපාදනය කරනු ලබන මුදල් වලින් ආධාර මුදල් ලබන පාසලක් හෝ එවැනි පාසලක යම් කොටසක් තේරීම් භාර නිලධරයා විසින් ඡන්ද පොළක් වශයෙන් නොමිලයේ පාවිච්චි කරනු ලැබිය හැකි ය.

(2) ඡන්ද පොළක් වශයෙන් පාවිච්චි කරනු ලැබීම හේතු කොට ගෙන පූර්වෝක්ත යම් පාසලකට හෝ එහි කොටසකට සිදු වූ යම් හානියක් පියවීම හෝ ඒ පාසලේ හෝ කොටසේ පාලනය භාරව සිටින තැනැත්තා විසින් දරන ලද යම් වියදමක් ගෙවීම හෝ තේරීම් භාර නිලධරයා විසින් කරනු ලැබිය යුතු ය.

*ඡන්ද පොළවල් වශයෙන් පාවිච්චි කිරීම සඳහා ස්ථානයන්හි බුක්තිය අත්කර ගැනීම.*

**112.** (1) 111 වන වගන්තියෙහි සඳහන් යම් පාසලක් නොවන යම් ස්ථානයක්, ඡන්ද පොළක් වශයෙන් පාවිච්චි කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය වන බව කොමසාරිස්වරයා විසින් සලකනු ලබන අවස්ථාවක, ඒ ස්ථානයේ සැබෑ සන්තකය දරන තැනැත්තා වෙත හෝ එසේ සැබෑ සන්තකය දරන කිසිවකු නොමැති අවස්ථාවක, ඒ ස්ථානයේ අයිතිකරු වෙත හෝ යොමු කරන ලද හා භාර දෙන ලද ලියවිල්ලකින් වූ විධානයක් මගින් ඔහු විසින් ඒ කාර්යය සඳහා ඒ ස්ථානයේ බුක්තිය අත්කර ගනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ යම් ස්ථානයක බුත්තිය අත්කර ගනු ලැබූ අවස්ථාවක, ඒ බුත්තිය අත්කර ගැනීමේ කාලය සති හතරක් නො ඉක්ම විය යුතු ය.

(3) මේ වගන්තියෙහි "ස්ථානය" යන්නෙන් යම් ඉඩමක්, ගොඩනැගිල්ලක් හෝ ගොඩනැගිල්ලක කොටසක් අදහස් වන අතර පැල්පතක්, මඩුවක් හෝ ඉදිකිරීමක් හෝ ඉන් යම් කොටසක් ඊට ඇතුළත් වේ.

ස්ථානවල බුත්තිය අත්කර ගැනීම වෙනුවෙන් වන්දිය.

113. (1) 112 වන වගන්තිය යටතේ යම් ස්ථානයක් පිළිබඳ බුත්තිය අත්කරගනු ලබන අවස්ථාවක, කොමසාරිස්වරයා විසින්, ඒ අත්තර ගැනීමට පෙරාතුව ම ඒ ස්ථානයේ සැබෑ සන්තකය දැරූ තැනැත්තාට හෝ එහි සැබෑ සන්තකය දැරූ කිසිවකු නොසිටි අවස්ථාවක, ඒ ස්ථානයේ අයිතිකරුට හෝ ඒ අත්කර ගැනීම සම්බන්ධයෙන් වන්දි පාර්ලිමේන්තුව විසින් ඒ කාර්යය සඳහා ප්‍රතිපාදනය කරන ලද මුදල්වලින් ගෙවනු ලැබිය යුතු අතර ඒ අත්කර ගැනීමේ කාලය තුළ දී ඒ ස්ථානයට කරන ලද යම් හානියක් පියවනු ලැබිය යුතු ය.

(2) යම් ස්ථානයක් සම්බන්ධයෙන් (1) වන උපවගන්තිය යටතේ ගෙවිය යුතු වන්දි මුදල—

(අ) ඒ ස්ථානය සම්බන්ධයෙන් ගෙවිය යුතු කුලිය හෝ, කිසිම කුලියක් එසේ නොගෙවිය යුතු අවස්ථාවක, එම ප්‍රදේශයේ සමාන ස්ථානයක් සඳහා ගෙවිය යුතු කුලිය, සහ

(ආ) එම ස්ථානයේ බුත්තිය අත්කර ගැනීමේ ප්‍රතිඵලයක් වශයෙන්, ඒ අත්කර ගැනීමට පෙරාතුව ම එහි සැබෑ සන්තකය දැරූ තැනැත්තාට තම වාසස්ථානය හෝ ව්‍යාපාරික ස්ථානය අවශ්‍යයෙන්ම වෙනස් කිරීමට සිදු වූයේ නම් ඒ වෙනස් කිරීමට ආනුෂංගික වූ යම් සාධාරණ වියදම් වී නම්, ඒ වියදම්

සැලකිල්ලට ගනිමින් නිශ්චය කරනු ලැබිය යුතු ය.

(3) මේ වගන්තිය යටතේ වන්දියකට හිමිකම් ඇති යම් තැනැත්තකු, වන්දි මුදල සම්බන්ධයෙන් කොමසාරිස්වරයාගේ තීරණයෙන් අතෘප්තියට පත් වුණු අවස්ථාවක, ඒ තැනැත්තා විසින් ඒ තීරණය සම්බන්ධයෙන් අභියාචනාධිකරණය වෙත ලියවිල්ලකින් අභියාචනය කරනු ලැබිය හැකි ය.

තෝරා පත්කර ගැනීම හා සම්බන්ධ කාරණා තැපැල් ගාස්තුවෙන් තොරව යැවීමට අපේක්ෂකයාට අයිතිය ඇති බව.

114. (1) මේ වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, තෝරා පත්කර ගැනීමක දී අපේක්ෂකයකු වශයෙන් නාම යෝජනා කරනු ලැබූ තැනැත්තකු විසින්, නාම යෝජනා කිරීමේ දිනය සහ ඒ තෝරා පත්කර ගැනීමේ දී ඡන්ද විමසීම පවත්වනු ලබන දිනයට කලින් වූ හත්වන දිනය අතර යම් අවස්ථාවක, යම් ඡන්ද කොට්ඨාසයක් සඳහා වූ ඡන්ද හිමි නාම ලේඛනයක නම දක්වෙන එක් එක් ඡන්ද හිමියාට, ඒ තෝරා පත්කර ගැනීමට පමණක්

සම්බන්ධ කාරණා ඇතුළත් එක තැපැල් සන්දේශයක් තැපැල් ගාස්තුව සඳහා යම් අයකිරීමකින් තොරව සාමාන්‍ය තැපෑලෙන් යැවීමට හිමිකම් ඇත්තේ ය.

(2) තැපැල් සන්දේශයක් යැවීම සඳහා (1) වන උපවගන්තිය මගින් නැනැත්තකු වෙත පවරනු ලබන අයිතිය පහත දැක්වෙන කොන්දේසිවලට යටත් විය යුතු අතර, ඉන් යම් කොන්දේසියක් අනුව ක්‍රියා කර නොතිබුණොත් පෝස්ට්මාස්ටර් ජනරාල්වරයා හෝ ඔහුගේ අධිකාරය යටතේ වැඩබලන යම් තැනැත්තකු හෝ විසින් එවැනි සන්දේශයක් ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි ය—

(අ) ඒ සන්දේශය පරීක්ෂා කිරීම සඳහා විවෘතව තිබිය යුතු අතර බරින් ග්‍රෑම් තිහකට වැඩි නොවිය යුතු ය ; තව ද,

(ආ) ඒ සන්දේශයේ දිග හා පළල සහ එහි තිල මුද්‍රාව තබන, එය පිළියෙළ කරන හා පරිහරණය කරන ආකාරය පෝස්ට් මාස්ටර් ජනරාල්වරයා විසින් කලින් කල තීරණය කරනු ලබන පරිදි විය යුතු ය.

පනතේ විධිවිධාන අනුව ක්‍රියා කිරීම පැහැර හැරීම.

**115.** කිසිම තෝරා පත්කර ගැනීමක දී තෝරා පත්කර ගැනීම් සම්බන්ධයෙන් මේ පනතේ විධිවිධාන අනුව ක්‍රියා කිරීමෙහි ලා වූ යම් පැහැර හැරීමක් වූ අවස්ථාවක ඒ විධිවිධානවල නියම කර ඇති ප්‍රතිපත්තිවලට අනුකූලව ඒ තෝරා පත්කර ගැනීම පවත්වනු ලැබූ බවත්, ඒ පැහැර හැරීම තෝරා පත්කර ගැනීමේ ප්‍රතිඵලයට බලපෑමක් ඇති නොකළ බවත් පෙනී යන්නේ නම් ඒ තෝරා පත්කර ගැනීම නිර්බල නොවිය යුතු ය.

නියෝජිතයන් නොපැමිණීම.

**116.** මේ පනත යටතේ යම් ක්‍රියාවක් හෝ දෙයක් යම් අපේක්ෂකයකුගේ නියෝජිතයා හෝ නියෝජිතයන් ඉදිරියේ කරනු ලැබීමට නියමිත හෝ බලය දෙන ලද අවස්ථාවක, ඒ ක්‍රියාව හෝ දේ අන්‍යාකාරයෙන් නිසි පරිදි කරන ලද්දේ නම්, ඒ කාර්යය සඳහා නියමිත වේලාවට හා ස්ථානයට ඒ අපේක්ෂකයාගේ යම් නියෝජිතයකුගේ හෝ නියෝජිතයන්ගේ නොපැමිණීම නිසා ඒ ක්‍රියාව හෝ දේ නිර්බල නොවිය යුතු ය.

අපේක්ෂකයන් විසින් කෙරෙන ගුවන් විදුලි ප්‍රචාර.

**117.** (1) ගුවන් විදුලි අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තීරණය කරනු ලබන කොන්දේසිවලට යටත්ව, නාම යෝජනා කිරීමේ දිනයේ සිට සතියක් ඇතුළත තත් කාර්ය සඳහා කරන ලද ඉල්ලීමක් මත ඒ ඉල්ලීම කිරීම සඳහා නියම කර තිබෙන අවසාන දිනයෙන් පසු එළඹෙන දිනයෙන් ආරම්භ වී, ඡන්ද විමසීම ආරම්භ කිරීමට පැය හැත්තෑ දෙකකට පෙර අවසාන වන කාලය තුළ ගුවන් විදුලි ප්‍රචාරක පහසුකම් පාවිච්චි කිරීමට එක් එක් අපේක්ෂකයාට හිමිකම් ඇත්තේ ය.

(2) තත් කාර්ය සඳහා ඉල්ලීමක් ඉදිරිපත් කරන යම් අපේක්ෂකයකුට (1) වන උපවගන්තියෙහි සඳහන් කාලය තුළ ගුවන් විදුලි ප්‍රචාරක කාලය වෙන් කර දීමේ දී, ගුවන් විදුලි අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්—

(අ) ගුවන් විදුලි ප්‍රචාරය සම්බන්ධයෙන් වන විට, එක් අවස්ථාවක දී හෝ එක් එක් අවස්ථාව මිනිත්තු පහළොවකට නොවැඩි අවස්ථා තුනකට නොවැඩිව හෝ පාවිච්චි කරනු ලැබිය හැකි මුළුමනින් මිනිත්තු හතළිස් පහකට නොවැඩි කාලයක් ;

(ආ) රූපවාහිනී ප්‍රචාරය සම්බන්ධයෙන් වන විට, එක් අවස්ථාවක දී හෝ එක් එක් අවස්ථාව මිනිත්තු පහළොවකට නොවැඩි අවස්ථා තුනකට නොවැඩිව හෝ පාවිච්චි කරනු ලැබිය හැකි මුළුමනින් මිනිත්තු හතළිස් පහකට නොවැඩි කාලයක්

පාවිච්චි කිරීමට ඒ එක් එක් අපේක්ෂකයාට අවසර දෙනු ලබන බවට වගබලා ගත යුතු ය.

(3) අපේක්ෂකයන් දෙදෙනකු හෝ ඊට වැඩි ගණනක් හෝ ජාතික වැදගත්කමින් යුතු යම් කාරණයක් සම්බන්ධයෙන් විවාද කිරීමට එකඟ වන අවස්ථාවක, ඒ අපේක්ෂකයන්ට ගුවන් විදුලි ප්‍රචාරක පහසුකම් සැලසීම ගුවන් විදුලි අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ යුතුකම වන්නේ ය. එසේ වුව ද, එවැනි විවාදයක් සඳහා අවසර දෙනු ලබන කාලය, (2) වන උපවගන්තිය යටතේ ඒ එක් එක් අපේක්ෂකයාට දෙනු ලබන කාලයට නොවැඩි විය යුතු ය.

(4) එක් එක් අපේක්ෂකයා විසින් ගුවන් විදුලි ප්‍රචාරක පහසුකම් පාවිච්චි කරනු ලැබීමේ අනුපිළිවෙළ—

(අ) පළමුකොට, අපේක්ෂකයන් අතර එකඟත්වයක් මගින් ; හෝ

(ආ) එවැනි එකඟත්වයක් නොමැති විට, තම පරම අභිමතය අනුව, ගුවන් විදුලි අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තීරණය කරනු ලබන ආකාරයට දමනු ලබන හෝ අදිනු ලබන කුසපත් මගින්

තීරණය කරනු ලැබිය යුතු ය.

(5) මේ වගන්තියෙහි විධිවිධාන සලසා ඇති පරිදි හැර, කිසිම අපේක්ෂකයකු විසින් තමාගේ ම තෝරා පත් කර ගනු ලැබීමේ ඉඩකඩ වැඩි කිරීමේ කාර්ය සඳහා ගුවන් විදුලි ප්‍රචාරක පහසුකම් නියම ලෙසින් හෝ අනියම් ලෙසින් පාවිච්චි කරනු නොලැබිය යුතු ය.

මේ පනත යටතේ උද්ගත වන දුෂ්කරතා මගහරවා ගැනීම සඳහා නියම ආදිය කිරීමේ බලය.

118. මේ පනතේ යම් විධිවිධානයක් පළමුවරට බලාත්මක කිරීමේ දී යම් දුෂ්කරතාවක් උද්ගත වන්නේ නම්, කොමසාරිස්වරයා විසින්, අවස්ථාව අනුව අවශ්‍ය විය හැකි පරිදි, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින්, ඒ දුෂ්කරතාව ඉවත් කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය යයි තමාට පෙනී යන යම් දෙයක් කරනු ලැබිය හැකි ය.

**119.** (1) කොමසාරිස්වරයා විසින්, මේ පනතේ දෙවන උපලේඛනයෙහි දක්වා ඇති නියෝග සංශෝධනය කරමින්, සුළු වශයෙන් වෙනස් කරමින්, ප්‍රත්‍යාදිෂ්ට කරමින් හෝ ප්‍රතියෝජනය කරමින් නියෝග සාදනු ලැබිය හැකි ය. **නියෝග හා රීති සෑදීමට කොමසාරිස්වරයා සතු බලය.**

(2) කොමසාරිස්වරයා විසින් සාදනු ලබන රීති මගින්, මේ පනතේ පළමුවන උපලේඛනය සංශෝධනය කිරීම, වෙනස් කිරීම හෝ ප්‍රතියෝජනය කිරීම කරනු ලැබිය හැකි ය.

(3) කොමසාරිස්වරයා විසින් මේ වගන්තිය යටතේ සාදන ලද කිසිම නියෝගයක් හෝ රීතියක්, පාර්ලිමේන්තුව මගින් අනුමත කරනු ලැබ ඒ අනුමතය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන තුරු බලාත්මක නොවිය යුතු ය. ඒ සෑම නියෝගයක් හෝ රීතියක් ම, බලාත්මක වීම මත, මෙහි පනවනු ලැබුවාක් මෙන් වලංගු හා බලාත්මක විය යුතු ය.

**120.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි— **අර්ථ නිරූපණය.**

"අනුමත ලකුණ" යන්නෙන්, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නිවේදනයක් මගින් 1981 පාර්ලිමේන්තු මැතිවරණ පනතේ කාර්ය සඳහා කොමසාරිස්වරයා විසින් අනුමත කරන ලද ලකුණක් අදහස් වේ;

"අපේක්ෂකයා" යන්නෙන්, මේ පනත යටතේ වූ තෝරා පත්කර ගැනීමක දී අපේක්ෂකයකු වශයෙන් නාම යෝජනා කරනු ලැබූ තැනැත්තකු අදහස් වේ;

"මැතිවරණ කොමසාරිස්වරයා" යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 103 වන ව්‍යවස්ථාව යටතේ පත් කරනු ලැබූ මැතිවරණ කොමසාරිස්වරයා අදහස් වේ;

"තෝරා පත්කර ගැනීම" යන්නෙන්, ජනාධිපති ධුරයට තැනැත්තකු තෝරා පත්කර ගැනීමේ කාර්යය සඳහා පැවැත්වෙන තෝරා පත්කර ගැනීමක් අදහස් වේ;

"ඡන්ද හිමියා", "මැතිවරණ කොට්ඨාසය", "ඡන්ද හිමි නාම ලේඛනය" සහ "ලියාපදිංචි කිරීමේ නිලධරයා" යන යෙදුම් වල 1980 අංක 44 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ අර්ථ ම ඇත්තේ ය;

"පිළිගත් දේශපාලන පක්ෂය" යන යෙදුමෙහි 1981 පාර්ලිමේන්තු මැතිවරණ පනතේ අර්ථය ම ඇත්තේ ය; තව ද

"ඡන්දදායකයා" යන්නෙන්, ඡන්ද හිමි නාම ලේඛනයක තම නම සඳහන් වුව ද නො වුව ද, තෝරා පත්කර ගැනීමක දී ඡන්දය දීමට ඉල්ලුම් කරන හෝ ඡන්දය දෙන තැනැත්තකු අදහස් වේ.

පළමුවන උපලේඛනය

"අ" ආකෘතිය

12(2) වන වගන්තිය

නාම යෝජනා පත්‍රයේ ආකෘතිය

පිළිගත් දේශපාලන පක්ෂයක් වන*............................................................ !

(පිළිගත් දේශපාලන පක්ෂයේ නම ඇතුළත් කරන්න)

පිළිගත් දේශපාලන පක්ෂයක් නොවන* ............................................................! තත් කාලයෙහි බල පවත්නා ඡන්දහිමි නාම ලේඛනයක තමාගේ නම ඇතුළත් කරනු ලැබ තිබෙන, ඡන්ද හිමියකු වන*

.............................................................. විසින් ජනාධිපති ධුරයට තෝරා පත්කර ගැනීම සඳහා අපේක්ෂකයකු වශයෙන්, තමාගේ නම සහ අනෙක් විස්තර පහත දක්වා ඇති තැනැත්තාගේ නම මෙයින් යෝජනා කරනු ලැබේ.

අපේක්ෂකයාගේ සම්පූර්ණ නම : ..............................................................

උපන් දිනය : .............................

වයස : .......................

රක්ෂාව : ..............................................

ලිපිනය : ..............................................................................

පිළිගත් දේශපාලන පක්ෂයක් නොවන දේශපාලන පක්ෂයක් විසින් හෝ ඡන්ද හිමියකු විසින් අපේක්ෂකයාගේ නම යෝජනා කරනු ලැබ ඇති අවස්ථාවක, අපේක්ෂකයා ව්‍යවස්ථාදායක මණ්ඩලයේ තෝරා පත්කර ගනු ලැබූ මන්ත්‍රීවරයකු වන්නේ ද නැතහොත් එසේ වී සිටියේ ද යන වග ප්‍රකාශ කරන්න. (විස්තර සඳහන් කරන්න.)

ඡන්ද හිමියකු විසින් අපේක්ෂකයාගේ නම යෝජනා කරනු ලබන අවස්ථාවක, ඒ ඡන්දහිමියා පිළිබඳ පහත සඳහන් විස්තර සපයන්න :—

(අ) ඡන්ද හිමියා ලියාපදිංචි කරනු ලැබ ඇති මැතිවරණ කොට්ඨාසයේ නම සහ අංකය: ..................................................

(ආ) ඡන්ද ප්‍රදේශය : ..................................................

(ඇ) ඡන්ද කොට්ඨාසය : ..............................................

(ඈ) පවත්නා ඡන්ද හිමි නාම ලේඛනයෙහි ලියාපදිංචි අංකය: ...................

..............................................
පිළිගත් දේශපාලන පක්ෂයේ*/
අන්‍ය දේශපාලන පක්ෂයේ*/
ලේකම්වරයාගේ/ඡන්දහිමියාගේ අත්සන.

..............................................
පිළිගත් දේශපාලන පක්ෂයේ*/
අන්‍ය දේශපාලන පක්ෂයේ*/
ලේකම්වරයාගේ/ඡන්ද හිමියාගේ නම

ලිපිනය : ....................................
....................................

පිළිගත් දේශපාලන පක්ෂයේ*/ අන්‍ය දේශපාලන පක්ෂයේ*/ ඉහත නම සඳහන් ලේකම්වරයා/ඡන්ද හිමියා විසින් මා ඉදිරිපිට දී 19........., ............මස............වන දින ................දී අත්සන් කරන ලදී.

..................................................
සමාදාන විනිශ්චයකාර හෝ ප්‍රසිද්ධ නොතාරිස්.

### අපේක්ෂකයා විසින් කරනු ලබන ප්‍රකාශය

........................................................................................ වන මම, ඉහත සඳහන් නාම යෝජනාවට මෙයින් අනුමතය දෙන අතර මා සම්බන්ධයෙන් ඉහත දක්වා ඇති විස්තර සත්‍ය බවත්, ජනාධිපති ධුරයට තෝරා පත්කර ගනු ලැබීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ප්‍රකාර මා කිසිම ආකාරයක නුසුදුසුකමකට භාජන වී නොසිටින බවත් ප්‍රකාශ කරමි.

........................................................................
අපේක්ෂකයාගේ අත්සන.

දිනය : ..............................

*අදාළ නොවන වචන කපා හරින්න.

### "ආ" ආකෘතිය

### 29(2) වන වගන්තිය

### ඡන්ද පත්‍රිකාවේ ඉදිරිපස ආකෘතිය

| | |
|---|---|
| උප පත්‍රිකා අංකය : | "XX" * |
| සැලකිය යුතුයි— | "XX" * |
| ඡන්ද පත්‍රිකාවේ පිටිපස ඇති අංකය සමග අනුරූප වන අංකයක් උප පත්‍රිකාවෙහි තිබිය යුතු ය. | "XX" * |
| | "XX" * |
| | "XX" * |
| | "XX" * |

* එක් එක් අපේක්ෂකයාට වෙන් කර දුන් ලකුණ මෙහි මුද්‍රණය කරන්න.

XX අපේක්ෂකයාගේ නම අකාරාදිය අනුව සිංහලෙන් මුද්‍රණය කරන්න.

### "ඇ" ආකෘතිය

### 36 වන වගන්තිය යටතේ ඡන්ද පත්‍රිකා භාර දෙනු නොලැබූ ඡන්දදායකයන් පිළිබඳ ලැයිස්තුව

මැතිවරණ කොට්ඨාසයේ නම සහ අංකය : ........................................

ඡන්ද ප්‍රදේශය : ........................................................................

ඡන්ද කොට්ඨාසය :......................................................................

ඡන්ද පොළ : ............................................................................

ඡන්ද විමසීමේ දිනය : ...............................................

| ඡන්ද හිමි නාම ලේඛනයේ ඡන්දදායකයාගේ අංකය | ඡන්දදායකයාගේ නම | ඡන්ද පත්‍රිකාව භාර නොදීමට හේතුව | | |
|---|---|---|---|---|
| | | නිසි පරීක්ෂණය ප්‍රතික්ෂේප කරයි | නිසි සලකුණින් කලින් සලකුණු කර තිබේ | නිසි සලකුණින් සලකුණු කරනු ලැබීම ප්‍රතික්ෂේප කරයි |
| | | | | |

........................................................................
ඡන්ද ස්ථානාධිපතිවරයාගේ අත්සන.

5—ඒ 51455 (81/04)

"ඈ" ආකෘතිය

41 වන වගන්තිය

ප්‍රකාශය

........................................................ (ලිපිනය) පදිංචි ..........................
..................................... (සම්පූර්ණ නම) වන මම, මේ මැතිවරණ කොට්ඨාසය සඳහා දැනට බල පැවැත්වෙන ඡන්ද හිමි නාම ලේඛනයේ " අ. ආ " වශයෙන් නම් දැක්වෙන තැනැත්තා මා බව මෙයින් ප්‍රකාශ කරමි.

.................................................

(ඡන්දදායකයාගේ අත්සන හෝ මාපටැඟිලි සලකුණ).

19......, .............................. මස ...... වන මෙදින

මා ඉදිරිපිට දී ප්‍රකාශ කරන ලදි.

............................................................

(ඡන්ද ස්ථානාධිපතිවරයාගේ අත්සන).

මැතිවරණ කොට්ඨාසයේ නම සහ අංකය : ..................

ඡන්ද ප්‍රදේශය : ........................................................

ඡන්ද කොට්ඨාසය : ........................................................

ඡන්ද පොළ : ..............................................

"ඉ" ආකෘතිය

41 වන වගන්තිය

ප්‍රකාශය

........................................................ (ලිපිනය) පදිංචි .............. ..........
..................................... (සම්පූර්ණ නම) වන මම, මේ තෝරා පත්කර ගැනීමේ දී මෙහි දී හෝ වෙනත් ස්ථානයක දී කලින් ඡන්දය දී නොමැති බව මෙයින් ප්‍රකාශ කරමි.

............................................................

(ඡන්දදායකයාගේ අත්සන හෝ මාපටැඟිලි සලකුණ.)

19......, .............................. මස ...... වන මෙදින

මා ඉදිරිපිට දී ප්‍රකාශ කරන ලදි.

............................................................

(ඡන්ද ස්ථානාධිපතිවරයාගේ අත්සන).

මැතිවරණ කොට්ඨාසයේ නම සහ අංකය : ..................

ඡන්ද ප්‍රදේශය : ........................................................

ඡන්ද කොට්ඨාසය : ........................................................

ඡන්ද පොළ : ..............................................

"ඊ" ආකෘතිය

41 වන වගන්තිය

ප්‍රකාශය

........................................................ (ලිපිනය) පදිංචි .........................
.............................. (සම්පූර්ණ නම) වන මම, මේ තෝරා පත්කර ගැනීමේ දී ඡන්දය දීමට නීතියෙන් අශක්‍ය හෝ නුසුදුසු වූ තැනැත්තකු නොවන බව මෙයින් ප්‍රකාශ කරමි.

....................................................................
(ඡන්දදායකයාගේ අත්සන හෝ මාපටැඟිලි සලකුණ)

19...... .................................. මස ...... වන මෙදින
මා ඉදිරිපිට දී ප්‍රකාශ කරන ලදී.

..........................................................
(ඡන්ද ස්ථානාධිපතිවරයාගේ අත්සන).

මැතිවරණ කොට්ඨාසයේ නම සහ අංකය : ..............................................

ඡන්ද ප්‍රදේශය : ......................................................

ඡන්ද කොට්ඨාසය : ................................................

ඡන්ද පොළ : ......................................................

"උ" ආකෘතිය

41 වන වගන්තිය

ප්‍රකාශය

....................................................................... (ලිපිනය) පදිංචි
.................................................................... (සම්පූර්ණ නම) වන මම, මේ තෝරා පත්කර ගැනීමේ දී වෙනත් යම් මැතිවරණ කොට්ඨාසයක කලින් ඡන්දය දී නොමැති බව මෙයින් ප්‍රකාශ කරමි.

................................................................
(ඡන්දදායකයාගේ අත්සන හෝ මාපටැඟිලි සලකුණ)

19........,......................මස..............වන මෙදින
මා ඉදිරිපිට දී ප්‍රකාශ කරන ලදී.

..........................................................
(ඡන්ද ස්ථානාධිපතිවරයාගේ අත්සන)

මැතිවරණ කොට්ඨාසයේ නම සහ අංකය : ..........................................

ඡන්ද ප්‍රදේශය : ..........................................................

ඡන්ද කොට්ඨාසය : ....................................................

ඡන්ද පොළ : ..............................................................

### " ඌ " ආකෘතිය

### 43 වන වගන්තිය

### ප්‍රකාශය

..........................................................................මැතිවරණ කොට්ඨාසය සඳහා වූ ඡන්ද හිමි නාම ලේඛනයෙහි අංක ............................................ (අනුක්‍රමික අංකය) දරන ............................................................................ (නම) වශයෙන් නම දක්වෙන තැනැත්තා මා බව ගම්භීරතා පූර්වකව හා අවංකව ප්‍රකාශ කරමි.

............................................................
(ඡන්දදායකයාගේ අත්සන හෝ මාපටැඟිලි සලකුණ)

19........,.................. මස.......................වන මෙදින
මා ඉදිරිපිට දී ප්‍රකාශ කරන ලදී.

.......................................................
(ඡන්ද ස්ථානාධිපතිවරයාගේ අත්සන)

මැතිවරණ කොට්ඨාසයේ නම සහ අංකය : ..........................................

ඡන්ද ප්‍රදේශය : ..................................................................

ඡන්ද කොට්ඨාසය : ............................................................

ඡන්ද පොළ : ..................................................................

### " ඒ " ආකෘතිය

### 43 වන වගන්තිය

### ද්විත්ව ඡන්ද ලැයිස්තුව

| ඡන්දදායකයාගේ අංකය | ඡන්දදායකයාගේ නම |
|---|---|
| | |

.......................................................
(ඡන්ද ස්ථානාධිපතිවරයාගේ අත්සන)

දිනය : ..................................................

මැතිවරණ කොට්ඨාසයේ නම සහ අංකය : ..........................................

ඡන්ද ප්‍රදේශය : ..................................................................

ඡන්ද කොට්ඨාසය : ............................................................

ඡන්ද පොළ : ..................................................................

"ඊ" ආකෘතිය

45 වන වගන්තිය

ඡන්ද පත්‍රිකා විස්තරය

මැතිවරණ කොට්ඨාසයේ නම සහ අංකය : ..............................................

ඡන්ද ප්‍රදේශය : ..............................................

ඡන්ද කොට්ඨාසය : ..............................................

ඡන්ද පොළ : ..............................................

ලැබුණු ඡන්ද පත්‍රිකා සංඛ්‍යාව : ..............................................

නරක් වූ ඡන්ද පත්‍රිකා හැර නිකුත් කරන ලද ඡන්ද පත්‍රිකා සංඛ්‍යාව : ..............................

නරක් වූ ඡන්ද පත්‍රිකා : ..............................................

පාවිච්චි නොකළ ඡන්ද පත්‍රිකා : ..............................................

ලැබුණු ද්විත්ව ඡන්ද පත්‍රිකා සංඛ්‍යාව : ..............................................

ඡන්දදායකයන්ට නිකුත් කරන ලද ද්විත්ව ඡන්ද පත්‍රිකා සංඛ්‍යාව : ..............................

පාවිච්චි නොකළ ද්විත්ව ඡන්ද පත්‍රිකා සංඛ්‍යාව : ..............................................

..............................................

(ඡන්ද ස්ථානාධිපතිවරයාගේ අත්සන)

දිනය : ..............................................

"ම" ආකෘතිය

75 වන වගන්තිය

රහස්‍යතා ප්‍රකාශය පිළිබඳ ආකෘතිය

මේ තෝරා පත්කරගැනීමේ දී, මට කියවා දී ඇති, 1981 ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම පිළිබඳ පනතේ 75 වන වගන්තියෙන් තහනම් කරනු ලැබ ඇති කිසිවක් මා නොකරන බවට මම ගම්භීරතා පූර්වකව පොරොන්දු වී, ප්‍රකාශ කරමි.

..............................................

(ප්‍රකාශකගේ අත්සන.)

19...... .............................. මස ...... වන මෙදින මා ඉදිරිපිට දී ප්‍රකාශ කරන ලදී.

..............................................

(ප්‍රකාශය ලබාගන්නා තැනැත්තාගේ අත්සන.)

සැලකිය යුතුයි.—ප්‍රකාශය ලබා ගන්නා තැනැත්තා විසින් වගන්තිය ප්‍රකාශකට කියවා දිය යුතු ය.

(23 වන වගන්තිය)

## දෙවන උපලේඛනය

### 1981 තැපැල් ඡන්දදායකයන් පිළිබඳ නියෝග

ලුහුඬු නාමය.

1. මේ නියෝග 1981 (ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ) තැපැල් ඡන්දදායකයන් පිළිබඳ නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

අර්ථ නිරූපණය.

2. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ නියෝගවල කාර්යය සඳහා—

"නිකුත් කිරීම" යන්නට, මුල් නිකුත් කිරීම සහ පසුව කෙරෙන යම් නිකුත් කිරීමක් ඇතුළත් වේ;

"තැපැල් ඡන්ද පත්‍රිකාව" යන්නෙන්, තැපැල් ඡන්දදායකයකුට නිකුත් කරනු ලැබූ ඡන්ද පත්‍රිකාවක් අදහස් වේ;

"තැපැල් ඡන්දදායකයා" යන්න, තෝරා පත්කර ගැනීමක් සම්බන්ධයෙන් යෙදෙන විට, තෝරා පත්කර ගැනීමේ කාර්යය සඳහා තැපැල් ඡන්දදායකයකු වශයෙන් සලකනු ලැබීමට හිමිකම් ඇති තැනැත්තකු ඉන් අදහස් වේ;

"උපලේඛනය" යන්නෙන්, මේ නියෝගවල උපලේඛනය අදහස් වේ;

"පනත" යන්නෙන්, 1981 ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම පිළිබඳ පනත අදහස් වේ.

තැපැල් ඡන්දදායකයකු වශයෙන් සලකනු ලැබීමට ඉල්ලුම් කිරීමේ ආකෘතිය.

3. තැපැල් ඡන්දදායකයකු වශයෙන් සලකනු ලැබීම සඳහා වූ ඉල්ලීමක් උපලේඛනයේ "අ" ආකෘතියට සාරානුකූලව කරනු ලැබිය යුතු ය.

තැපැල් ඡන්දදායකයන් පිළිබඳ වාර්තාව හා ලැයිස්තුව.

4. (1) මේ නියෝගයේ විධිවිධානවලට යටත්ව, පනත යටතේ තේරීම් භාර නිලධරයා විසින් තබා ගන්නා තැපැල් ඡන්දදායකයන් පිළිබඳ වාර්තාව සහ ලැයිස්තුව පහසු යයි ඔහුට පෙනී යන ආකෘතියක විය යුතු ය.

(2) තැපැල් ඡන්දදායකයකුගේ ඡන්ද පත්‍රිකාවක් යවනු ලැබිය යුතු ලිපිනය තැපැල් ඡන්දදායකයන් පිළිබඳ ලැයිස්තුවෙහි ඔහුගේ නමට ඉදිරියෙන් සඳහන් කරනු ලැබිය යුතු ය.

(3) තැපැල් ඡන්දදායකයන් පිළිබඳ ලැයිස්තුවෙහි ඇති නම්වලට අනුගාමීව අංක යොදනු ලැබිය යුතු ය.

(4) තැපැල් ඡන්දදායකයන් පිළිබඳ ලැයිස්තුව පිළියෙළ කරනු ලැබූ වහා ම, තේරීම් භාර නිලධරයා විසින්, එහි පිටපතක් පරීක්ෂණය සඳහා තම කාර්යාලයෙහි තබමින්, එය ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු ය.

තැපැල් ඡන්ද පත්‍රිකාවේ ආකෘතිය.

5. තැපැල් ඡන්ද පත්‍රිකාවක්, තැපැල් ඡන්දදායකයන් නොවන ඡන්ද දායකයන්ට භාර දෙනු ලබන ඡන්ද පත්‍රිකාවල ආකෘතියෙහි ම සහ ඒ ඡන්ද පත්‍රිකාවලින් වෙන් ව හඳුනාගත නොහැකි පරිදි විය යුතු ය.

අනන්‍යතා ප්‍රකාශය පිළිබඳ ආකෘතිය.

6. තැපැල් ඡන්දදායකයකුට, තම තැපැල් ඡන්ද පත්‍රිකාව සමග යවනු ලබන අනන්‍යතා ප්‍රකාශය පිළිබඳ ආකෘතිය උපලේඛනයේ "ආ" ආකෘතියට සාරානුකූල විය යුතු ය.

ලිපිකරුවන් පත් කිරීම.

7. තැපැල් ඡන්ද පත්‍රිකා නිකුත් කිරීමේ කටයුතුවල දී තේරීම් භාර නිලධරයාට ලිපිකරුවන් වශයෙන් සහාය වීම සඳහා තැනැත්තන් පත් කරනු ලැබිය හැකි ය:

එසේ වුව ද, තෝරා පත්කර ගැනීමේ දී හෝ තෝරා පත්කර ගැනීම සම්බන්ධයෙන් අපේක්ෂකයකු විසින් හෝ ඔහු වෙනුවෙන් සේවයෙහි යොදවනු ලැබූ කිසිම තැනැත්තකු එසේ පත් කරනු නොලැබිය යුතු ය.

තැපැල් ඡන්ද පත්‍රිකා නිකුත් කිරීමේ දී භාර ගැනීමේ දී පැමිණ සිටීමට හිමිකම් ඇති තැනැත්තන්.

8. (1) (අ) තේරීම් භාර නිලධරයා සහ ඔහුගේ ලිපිකරුවන්,

(ආ) බලයලත් නියෝජිතයකු,

(ඇ) බලයලත් නියෝජිතයකු විසින් තමා වෙනුවට පැමිණ සිටීම පිණිස පත් කරනු ලැබූ තැනැත්තකු, සහ

(ඈ) මේ නියෝගයේ (2) වන ඡේදය යටතේ පත් කරනු ලැබූ යම් නියෝජිතයන්

හැර අන් කිසි තැනැත්තකු තැපැල් ඡන්ද පත්‍රිකා නිකුත් කිරීමේ කටයුතුවල දී පැමිණ නොසිටිය යුතු ය.

(2) තැපැල් ඡන්ද පත්‍රිකා කාණ්ඩ දෙකක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් එක වර නිකුත් කළ යුතු අවස්ථාවක, එක් එක් බලයලත් නියෝජිතයා විසින් පත් කරනු ලැබීමට තේරීම් භාර නිලධරයා විසින් බලය දෙනු ලැබිය හැකි එක් නියෝජිතයකු හෝ ඊට වැඩි ගණනක් ඒ කාණ්ඩ සංඛ්‍යාව නොඉක්මවන සේ පත් කරනු ලැබිය හැකි ය. එසේ වුවද, එක් එක් බලයලත් නියෝජිතයා සම්බන්ධයෙන් බලය දෙනු ලැබූ ගණන සමාන විය යුතු ය.

(3) බලයලත් නියෝජිතයා විසින්, මේ නියෝගයේ (2) වන ඡේදය යටතේ පත් කරන ලද තැනැත්තන්ගේ නම් සහ ලිපිනයන් දැක්වෙන පත් කිරීමේ දැන්වීම, තැපැල් ඡන්ද පත්‍රිකා නිකුත් කිරීම සඳහා නියමිත වේලාවට කලින් තේරීම් භාර නිලධරයාට දෙනු ලැබිය යුතු ය.

(4) නියෝජිතයකු මිය ගියහොත් හෝ ක්‍රියා කිරීමට නොහැකි වුවහොත් බලයලත් නියෝජිතයා විසින් ඔහු වෙනුවට වෙනත් නියෝජිතයකු පත් කරනු ලැබිය හැකි අතර, පත් කරන ලද නියෝජිතයාගේ නම සහ ලිපිනය පිළිබඳ දැන්වීම ලියවිල්ලකින්, තේරීම් භාර නිලධරයාට වහාම දෙනු ලැබිය යුතු ය.

(5) නියෝජිතයන් පත් කිරීම හා ඔවුන් පත් කිරීම පිළිබඳ දැන්වීම් තේරීම් භාර නිලධරයාට දීම බලයලත් නියෝජිතයා විසින් ම කරනු ලැබීම වෙනුවට, ඔහු විසින් ලියවිල්ලකින් පත් කරනු ලැබූ වෙනත් තැනැත්තකු විසින් කරනු ලැබිය හැකි ය.

(6) මේ නියෝගවල නියෝජිතයන් පිළිබඳ සඳහන් කිරීම්, ස්වකීය පත්වීම් නිසි පරිදි කරනු ලැබූ හා ඇතුළුවීමට දෙනු ලැබූ නියෝජිතයන් පිළිබඳ සඳහන් කිරීම් වශයෙන් ද, මේ නියෝගයේ (2) වන ඡේදය යටතේ පත් කරන ලද නියෝජිතයන් සම්බන්ධයෙන් වූ විට, තේරීම් භාර නිලධරයා විසින් බලය දෙන ලද ගණන ඇතුළත වූ නියෝජිතයන් පිළිබඳ සඳහන් කිරීම් වශයෙන් ද තේරුම් ගත යුතු ය.

(7) බලයලත් නියෝජිතයකු විසින් තමාගේ යම් නියෝජිතයකු පත් කරනු ලැබුවහොත්, ඔහුට කිරීමට බලය දෙනු ලැබිය හැකි වූ යම් ක්‍රියාවක් හෝ දෙයක්, බලයලත් නියෝජිතයා විසින් ම, කිරීම හෝ එවැනි යම් ක්‍රියාවක් හෝ දෙයක් කිරීමෙහි ලා තමාගේ නියෝජිතයාට සහාය වීම කරනු ලැබිය හැකි ය.

(8) මේ නියෝගවල යම් ක්‍රියාවක් හෝ දෙයක් බලයලත් නියෝජිතයකු හෝ ඔහුගේ නියෝජිතයන් ඉදිරිපිට කරනු ලැබීමට නියමිත හෝ බලය දෙන ලද අවස්ථාවක, ඒ ක්‍රියාව හෝ දෙය අන්‍යාකාරයෙන් නීත්‍යනුකූලව කරන ලද්දේ නම්, ඒ කාර්යය සඳහා නියමිත වේලාවට සහ ස්ථානයට එවැනි යම් තැනැත්තකු හෝ තැනැත්තන් නොපැමිණීම නිසා, ඒ ක්‍රියාව හෝ දෙය නිර්බල නොවන්නේ ය.

රහස්‍යතා ප්‍රකාශය.

9. (1) තැපැල් ඡන්ද පත්‍රිකා නිකුත් කිරීමේ කටයුතුවල නිරත වන සෑම තැනැත්තකු විසින් ම, ඒ ඡන්ද පත්‍රිකා නිකුත් කිරීමට පෙර, උපලේඛනයේ "ඇ" ආකෘතියට සාරානුකූලව රහස්‍යතා ප්‍රකාශයක් කරනු ලැබිය යුතු ය.

(2) මේ නියෝගයේ (1) වන ඡේදය යටතේ වූ ප්‍රකාශයක් තේරීම් භාර නිලධරයා විසින් සමාදාන විනිශ්චයකාරවරයකු ඉදිරිපිට කරනු ලැබිය යුතු අතර වෙනත් යම් තැනැත්තකු විසින් කරනු ලබන අවස්ථාවක දී, එය තේරීම් භාර නිලධරයා හෝ සමාදාන විනිශ්චයකාරවරයකු ඉදිරිපිට කරනු ලැබිය යුතු ය.

(3) තැපැල් ඡන්ද පත්‍රිකා නිකුත් කිරීම පිළිබඳ කටයුතුවල නිරත වන සෑම තැනැත්තකු විසින් ම, ඡන්ද දීමේ රහස්‍යතාව පැවැත් වීම සහ එය පැවැත් වීමෙහි ලා ආධාර දීම කරනු ලැබිය යුතු අතර—

(අ) නීතියෙන් බලය දෙන ලද යම් කාර්යයක් සඳහා මිස, ඡන්ද විමසීම අවසන් කිරීමට පෙර, තැපැල් ඡන්ද පත්‍රිකා මත කරන ලද නිල සලකුණ සම්බන්ධයෙන් එම් කටයුතුවල දී ලබාගත් යම් තොරතුරක් කිසිම තැනැත්තකුට දැනුම් දීම; හෝ

(ආ) නීතියෙන් බලය දෙන ලද යම් කාර්යයක් සඳහා මිස, තැපැල් ඡන්ද පත්‍රිකාවක් පිටිපස ඇති අංකය සම්බන්ධයෙන් එම කටයුතුවල දී ලබාගත් තොරතුරක් කිසිම අවස්ථාවක කිසිම තැනැත්තකුට දැනුම් දීම

නොකරනු ලැබිය යුතු ය.

(4) මේ නියෝගයේ (3) වන ඡේදයේ විධිවිධාන උල්ලංඝනය කරන සෑම තැනැත්තකුම වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් පන් සියයකට නොවැඩි දඩයකට හෝ මාස හයකට නොවැඩි දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ යටත් විය යුතු ය.

**තැපැල් ඡන්ද පත්‍රිකා නිකුත් කිරීමේ දැන්වීම.**

10. (1) තේරීම් භාර නිලධරයා විසින්, නාම යෝජනා කිරීමේ දිනයට පසු, දින දහයක් ඉකුත් වීමට පෙර, තමා විසින් තැපැල් ඡන්ද පත්‍රිකා නිකුත් කරනු ලබන වේලාව හා ස්ථානය සහ එකී නිකුත් කිරීමේ දී පැමිණ සිටීම පිණිස 8 වන නියෝගයේ (2) වන ඡේදය යටතේ බලයලත් නියෝජිතයා විසින් පත් කරනු ලැබිය හැකි නියෝජිතයන් සංඛ්‍යාව එක් එක් බලයලත් නියෝජිතයාට දැනුම් දිය යුතු ය.

(2) තේරීම් භාර නිලධරයා විසින්, ඡන්ද පත්‍රිකා කිසිවක් පසුව නිකුත් කරනු ලබන අවස්ථාවක, තමා විසින් එසේ පසුව නිකුත් කරනු ලබන වේලාව හා ස්ථානය සහ නිකුත් කිරීමේ දී පැමිණ සිටීම පිණිස 8 වන නියෝගයේ (2) වන ඡේදය යටතේ බලයලත් නියෝජිතයා විසින් පත් කරනු ලැබිය හැකි නියෝජිතයන් සංඛ්‍යාව එක් එක් බලයලත් නියෝජිතයාට හැකි පහසු ඉක්මණින් දැනුම් දෙනු ලැබිය යුතු ය.

**තැපැල් ඡන්ද පත්‍රිකා මත තැබිය යුතු නිල සලකුණ.**

11. (1) එක් එක් තැපැල් ඡන්දදායකයකුට නිකුත් කරනු ලබන තැපැල් ඡන්ද පත්‍රිකාව පිටිපස නිල සලකුණ මුද්‍රා කිරීම හෝ සිදුරු කිරීම කරනු ලැබිය යුතු ය. තවද, ඒ ඒ ඡන්දදායකයාගේ නම සහ අංකය හඬ නඟා කතා කොට, ඒ ඒ ඡන්දදායකයාගේ අංකය ඒ ඒ ඡන්ද පත්‍රිකාවේ උප පත්‍රිකාව මත සටහන් කරනු ලැබිය යුතු ය. තවද, ඒ ඡන්ද පත්‍රිකාව ඔහුට නිකුත් කරන ලද බව ඇඟවීම සඳහා තැපැල් ඡන්දදායකයන් පිළිබඳ ලැයිස්තුවෙහි ඒ ඡන්දදායකයාගේ අංකය ඉදිරියෙන් සලකුණක් තැබිය යුතු අතර ඔහුට නිකුත් කරන ලද්දේ කවර ඡන්ද පත්‍රිකාව ද යන බව ඉන් නොදක්වනු ලැබිය යුතු ය.

(2) තැපැල් ඡන්දදායකයාට නිකුත් කරන ලද තැපැල් ඡන්ද පත්‍රිකාවේ උප පත්‍රිකාවේ සටහන් කළ යුතු තැපැල් ඡන්දදායකයාගේ අංකය, තැපැල් ඡන්දදායකයන් පිළිබඳ ලැයිස්තුවෙහි සඳහන් ඒ ඡන්දදායකයාගේ අංකය විය යුතු ය.

(3) තැපැල් ඡන්දදායකයකුට නිකුත් කරනු ලබන තැපැල් ඡන්ද පත්‍රිකාවක් මත මුද්‍රිත අංකය ඒ ඡන්දදායකයාට යවනු ලබන අනන්‍යතාව ප්‍රකාශ කිරීමේ ආකෘතිය මත සටහන් කරනු ලැබිය යුතු ය. එසේ සටහන් කරනු ලබන අංකය "අනන්‍යතා ප්‍රකාශය මත සටහන් කරන ලද අංකය" යනුවෙන් මෙහි මින් මතු සඳහන් කරනු ලැබේ.

**තැපැල් ඡන්ද පත්‍රිකාව නිකුත් කිරීම ප්‍රතික්ෂේප කිරීම.**

12. තැපැල් ඡන්දදායකයන් පිළිබඳ ලැයිස්තුවෙහි ඇතුළත් සටහන් දෙකක් එකම තැපැල් ඡන්දදායකයා සම්බන්ධයෙන් වන බවට තේරීම් භාර නිලධරයකු සෑහීමට පත්වන අවස්ථාවක, ඔහු විසින් ඒ ඡන්දදායකයා වෙනුවෙන් එක තැපැල් ඡන්ද පත්‍රිකාවකට වැඩි ගණනක් නිකුත් නොකරනු ලැබිය යුතු ය.

13. (1) ඡන්ද පත්‍රිකා කවරය මත සටහන් කරන ලද අංකය, "ඡන්ද පත්‍රිකා කවරය මත සටහන් කරන ලද අංකය" යනුවෙන් මේ නියෝගවල සඳහන් කරනු ලැබේ.

(2) නිසි පරිදි සලකුණු කොට ඡන්ද පත්‍රිකා කවරයේ බහාලූ තැපැල් ඡන්ද පත්‍රිකාව සහ නිසි පරිදි පුරවන ලද අනන්‍යතාව ප්‍රකාශ කිරීමේ ආකෘතිය ආපසු එවීමේ කවරය, "ආවරණ කවරය" යනුවෙන් මේ නියෝගවල හඳුන්වනු ලැබේ.

"ඡන්ද පත්‍රිකා කවරය මත සටහන් කරන ලද අංකය" යන යෙදුම සහ "ආවරණ කවරය" යන යෙදුම අර්ථ නිරූපණය කිරීම.

14. තේරීම් භාර නිලධරයා විසින්, තැපැල් ඡන්දදායකයන් වෙත යොමු කරන ලද සියලු කවර ගණන් කොට ඒවා ඉහාම කිට්ටු තැපැල් කාර්යාලය වෙත වහාම භාර දෙනු ලැබිය යුතු අතර, තැපැල් ස්ථානාධිපතිවරයා විසින්, එසේ භාර දෙන ලද කවර සංඛ්‍යාව සඳහන් කරමින් තේරීම් භාර නිලධරයා විසින් ඉදිරිපත් කරනු ලබන කුවිතාන්සි ආකෘතියක් තැපැල් කාර්යාලයීය දින මුද්‍රාවෙන් මුද්‍රා කර, ඒ කවර, ඒවා යොමු කරන ලද තැනැත්තන් වෙත භාර දීම සඳහා වහාම යවනු ලැබිය යුතු ය.

තැපැල් ඡන්දදායකයන් වෙත යොමු කරන ලද කවර තැපැල් කාර්යාලයට භාර දීම.

15. (1) තේරීම් භාර නිලධරයා විසින්, තැපැල් ඡන්ද පත්‍රිකා නිකුත් කොට අවසන් වූ පසුව හැකි ඉක්මණින් සහ බලයලත් නියෝජිතයන්ගේ නියෝජිතයන් ඉදිරිපිට දී,—

(අ) තැපැල් ඡන්දදායකයන් පිළිබඳ ලැයිස්තුවේ සලකුණු කරන ලද පිටපත්; සහ

(ආ) නිකුත් කරන ලද තැපැල් ඡන්ද පත්‍රිකාවල උප පත්‍රිකා වෙන වෙන ම පැකැට්ටුවල අසුරා ඒ පැකැට්ටු මුද්‍රා තබනු ලැබිය යුතු ය.

(2) තේරීම් භාර නිලධරයා විසින්, තැපැල් ඡන්ද පත්‍රිකා පසුව නිකුත් කිරීමේ කාර්යය සඳහා, තැපැල් ඡන්දදායකයන් පිළිබඳ ලැයිස්තුවේ සලකුණු කරන ලද පිටපත් අඩංගු මුද්‍රා තබන ලද පැකැට්ටුව විවෘත කරනු ලැබිය හැකි අතර, නිකුත් කිරීම අවසන් වූ පසු මේ නියෝගයේ (1) වන ඡේදය අනුව යළිත් ඒ පිටපත් අසුරා මුද්‍රා තබනු ලැබිය යුතු ය.

තැපැල් ඡන්දදායකයන් පිළිබඳ ලැයිස්තුව සහ උප පත්‍රිකා මුද්‍රා තැබීම.

16. (1) තේරීම් භාර නිලධරයා විසින්, තැපැල් ඡන්දදායකයන්ට තැපැල් ඡන්ද පත්‍රිකා මුලින් නිකුත් කිරීමේ කටයුතුවල දී තැපැල් ඡන්දදායකයන්ගෙන් ලැබෙන ආවරණ කවර දැමීම සඳහා ඡන්ද පෙට්ටියක් හෝ ඡන්ද පෙට්ටි ගණනක් සැපයිය යුතු ය. ඒ හැම ඡන්ද පෙට්ටියක් ම පනතේ 54 වන වගන්තියේ කාර්ය සඳහා ඡන්ද පෙට්ටියක් වශයෙන් සලකනු ලැබිය යුතු ය.

(2) මේ නියෝගයේ (1) වන ඡේදයෙහි සඳහන් සෑම ඡන්ද පෙට්ටියක් ම, පැමිණ සිටින බලයලත් නියෝජිතයන්ගේ නියෝජිතයන්ට විවෘතව හා හිස් ව පෙන්වා, තේරීම් භාර නිලධරයාගේ මුද්‍රාවෙන් සහ තම මුද්‍රා තැබීමට කැමති නියෝජිතයන්ගේ මුද්‍රාවලින් මුද්‍රා තබා, "තැපැල් ඡන්දදායකයන්ගේ ඡන්ද පෙට්ටිය" යන්න සහ ඒ මැතිවරණ කොට්ඨාසයේ අංකය හා නාම ද සලකුණු කරනු ලැබිය යුතු අතර තේරීම් භාර නිලධරයා විසින් ඒ ඡන්ද පෙට්ටියේ සුරක්ෂිත භාරය සම්බන්ධයෙන් විධිවිධාන සලස්වනු ලැබිය යුතු ය.

තැපැල් ඡන්දදායකයන්ගේ ඡන්ද පෙට්ටි සැපයීම.

17. තේරීම් භාර නිලධරයා විසින්, ඡන්ද විමසීම අවසන් වීමට පෙර ආවරණ කවරයක් ලැබුණු විට, එය විවෘත නොකොට, වහාම තැපැල් ඡන්දදායකයන්ගේ ඡන්ද පෙට්ටිය තුළ බහා ලිය යුතු ය.

තැපැල් ඡන්දදායකයන්ගෙන් ආවරණ කවර ලැබීම.

18. කොමසාරිස්වරයාගේ සාමාන්‍ය හෝ විශේෂ විධානයන්ට යටත් ව, තේරීම් භාර නිලධරයා විසින්, තැපැල් ඡන්ද පත්‍රිකා ගණන් කරනු ලබන ගණන් කිරීමේ මධ්‍යස්ථානයෙහි හෝ එක් එක් ගණන් කිරීමේ මධ්‍යස්ථානයක ඡන්ද ගණන් කිරීම භාරව සිටීමට ගණන් කිරීමේ නිලධරයකු සහ සිය කාර්ය ඉටු කිරීමෙහි ලා ඒ ගණන් කිරීමේ නිලධරයාට සහාය වීම පිණිස සහකාරයන්, ලිපිකරුවන් හා වෙනත් නිලධරයන් යම් සංඛ්‍යාවක් පත් කිරීම සහ පත් කිරීම ප්‍රත්‍යාදිෂ්ට කිරීම කරනු ලැබිය හැකි ය.

ගණන් කිරීමේ නිලධරයන්.

ගණන් කිරීම පිළිබඳ දැන්වීම.

19. තේරීම් භාර නිලධරයා විසින්, ඡන්ද විමසීම අවසන් වූ පසු හැකි ඉක්මණින් තැපැල් ඡන්ද පත්‍රිකා මත වූ ඡන්ද ගණන් කිරීම සඳහා විධිවිධාන සලස්වනු ලැබිය යුතු අතර තැපැල් ඡන්ද පත්‍රිකා ගණන් කරනු ලබන ගණන් කිරීමේ මධ්‍යස්ථානයේ හෝ එක් එක් ගණන් කිරීමේ මධ්‍යස්ථානයේ පිහිටීම සහ ඒ ගණන් කිරීම ආරම්භ කිරීමේ දිනය හා වේලාව පිළිබඳ දැන්වීම එක් එක් බලයලත් නියෝජිතයා වෙත ලියවිල්ලකින් දෙනු ලැබිය යුතු ය.

ගණන් කිරීමේ නියෝජිතයන් පත් කිරීම.

20. එක් එක් බලයලත් නියෝජිතයා විසින්, තැපැල් ඡන්ද පත්‍රිකා ගණන් කරනු ලබන එක් එක් ගණන් කිරීමේ මධ්‍යස්ථානයෙහි ඡන්ද ගණන් කිරීමට පැමිණ සිටීම සඳහා, ඒ ගණන් කිරීම ආරම්භ වීමට පෙර, (මෙහි මින් මතු "ගණන් කිරීමේ නියෝජිතයන්" යනුවෙන් හඳුන්වනු ලබන) නියෝජිතයන් දෙදෙනකුට නොවැඩි ගණනක් පත් කරනු ලැබිය හැකි ය. බලයලත් නියෝජිතයා විසින්, පත් කරන ලද තැනැත්තන්ගේ නම් සහ ලිපිනයන් සඳහන් ඒ පත් කිරීම් පිළිබඳ ලියවිල්ලකින් වූ දැන්වීමක් ගණන් කිරීම ආරම්භ වීමට පෙර, ගණන් කිරීමේ නිලධරයාට දෙනු ලැබිය යුතු ය. යම් ගණන් කිරීමේ නියෝජිතයකුගේ නම සහ ලිපිනය එසේ නොදෙනු ලැබූ විට ගණන් කිරීමේ නිලධරයා විසින් ඒ ගණන් කිරීමේ නියෝජිතයා ගණන් කිරීමේ මධ්‍යස්ථානයට ඇතුළු කර ගැනීම ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි ය.

ගණන් කිරීමේ දී පැමිණ සිටීමට හිමිකම් ඇති තැනැත්තන්

21. ගණන් කිරීමේ නිලධරයා, ඔහුට සහාය වීමට පත් කරනු ලැබූ තැනැත්තන් සහ ගණන් කිරීමේ නියෝජිතයන් හැර වෙනත් කිසිම තැනැත්තකු ගණන් කිරීමේ නිලධරයාගේ අනුමතය ඇතිව මිස ඡන්ද ගණන් කිරීමේ දී පැමිණ නො සිටිය යුතු ය.

ගණන් කිරීමේ දී රහස්‍යතාව පැවැත්වීම.

22. පනතේ 75 වන වගන්තියේ විධිවිධාන තැපැල් ඡන්ද පත්‍රිකා ගණන් කිරීමේ කටයුතුවලට අදාළ විය යුතු ය.

තැපැල් ඡන්ද-දායකයන්ගේ ඡන්ද පෙට්ටිය විවෘත කිරීම.

23. තැපැල් ඡන්දදායකයන්ගේ සෑම ඡන්ද පෙට්ටියක් ම, ගණන් කිරීමේ නිලධරයා විසින්, ඡන්ද විමසීම අවසන් වූවාට පසුව සහ ඒ නිලධරයා ඡන්ද ගණන් කිරීම ආරම්භ කිරීමට පෙර, ගණන් කිරීමේ නියෝජිතයන් ඉදිරිපිට දී විවෘත කරනු ලැබිය යුතු ය.

ආවරණ කවර විවෘත කිරීම.

24. (1) තැපැල් ඡන්දදායකයන්ගේ ඡන්ද පෙට්ටියක් විවෘත කරනු ලැබූ අවස්ථාවක, ගණන් කිරීමේ නිලධරයා විසින්, ආවරණ කවර ගණන් කර ඒ සංඛ්‍යාව සටහන් කර, ඉන් පසුව එක් එක් ආවරණ කවරය වෙන වෙන ම විවෘත කරනු ලැබිය යුතු ය.

(2) ගණන් කිරීමේ නිලධරයා විසින් ආවරණ කවරයක් විවෘත කරනු ලැබූ, එය තුළ—

(අ) (i) අනන්‍යතා ප්‍රකාශයක් සහ ඡන්ද පත්‍රිකා කවරයක්, හෝ

(ii) අනන්‍යතා ප්‍රකාශයක් සහ ඡන්ද පත්‍රිකා කවරයක බහා නොමැති ඡන්ද පත්‍රිකාවක්, හෝ

(iii) අනන්‍යතා ප්‍රකාශයක් පමණක්, හෝ

(iv) ඡන්ද පත්‍රිකා කවරයක බහා නොමැති ඡන්ද පත්‍රිකාවක් පමණක්, හෝ

(v) ඡන්ද පත්‍රිකා කවරයක් පමණක්

ඇති බව සොයා ගනු ලබන අවස්ථාවක, නැතහොත්,

(ආ) කිසිවක් නොමැති බව සොයා ගනු ලබන අවස්ථාවක

මේ නියෝගයේ අනුයාත විධිවිධාන අදාළ විය යුතු ය.

(3) මේ නියෝගයේ (2) වන ඡේදයේ (අ) (i) අනුඡේදයෙහි සහ (අ) (ii) අනුඡේදයෙහි සඳහන් අවස්ථාවල දී, අනන්‍යතා ප්‍රකාශය යථා පරිදි අත්සන් කොට සාක්ෂි දරනු ලබා ඇති බවටත්, පූර්වෝක්ත (අ) (i) අනුඡේදයෙහි සඳහන් අවස්ථාවක, අනන්‍යතා ප්‍රකාශය මත සලකුණු කරන ලද අංකය, ඡන්ද පත්‍රිකා කවරය මත සලකුණු කරන ලද ඒ හා සමාන අංකයට ද, පූර්වෝක්ත (අ) (ii)

අනුඡේදයේ සඳහන් අවස්ථාවක, අනන්‍යතා ප්‍රකාශය මත සලකුණු කරන ලද අංකය, ඡන්ද පත්‍රිකාව මත සලකුණු කරන ලද ඒ හා සමාන අංකයකට ද අනුරූප වන බවත, ගණන් කිරීමේ නිලධරයා සෑහීමට පත් විය යුතු ය. ඔහු එසේ සෑහීමට පත් වන්නේ නම්, ඔහු විසින් ඒ ප්‍රකාශය, (මෙහි මින්මතු "අනන්‍යතා ප්‍රකාශ සඳහා වූ බඳුන" යනුවෙන් හඳුන්වනු ලබන) වෙනම බඳුනකට ද, පූර්වෝක්ත (අ) (i) අනුඡේදයෙහි සඳහන් අවස්ථාවක ඡන්ද පත්‍රිකා කවරය සහ පූර්වෝක්ත (අ) (ii) අනුඡේදයෙහි සඳහන් අවස්ථාවක ඡන්ද පත්‍රිකාව (මෙහි මින්මතු "තැපැල් ඡන්දදායකයන්ගේ ඡන්ද පත්‍රිකා සඳහා වූ බඳුන" යනුවෙන් හඳුන්වනු ලබන) වෙනත් බඳුනකට ද දැමිය යුතු ය.

(4) මේ නියෝගයේ (2) වන ඡේදයේ (අ) (i) අනුඡේදයෙහි සහ (අ) (ii) අනුඡේදයෙහි සඳහන් අවස්ථාවල දී, මේ නියෝගයේ (3) වන ඡේදය මගින් නියමිත පරිදි ගණන් කිරීමේ නිලධරයා සෑහීමට පත් නොවන විටෙක ඔහු විසින්—

(අ) "අනන්‍යතා ප්‍රකාශය ප්‍රතික්ෂේප කරන ලදී" යන වචන අනන්‍යතා ප්‍රකාශය මත සටහන් කරනු ලැබිය යුතු ය;

(ආ) ඒ ප්‍රකාශය, පැමිණ සිටින ගණන් කිරීමේ නියෝජිතයන්ට පෙන්වනු ලැබිය යුතු අතර ඒ ප්‍රකාශය සම්බන්ධයෙන් ගණන් කිරීමේ නිලධරයා විසින් ගන්නා ලද තීරණයට යම් නියෝජිතයකු විසින් යම් විරෝධයක් ඉදිරිපත් කරන ලද්දේ නම්, ඉහතින් ම වූ (අ) අනුඡේදය යටතේ ඒ ප්‍රකාශය මත සටහන් කරන ලද වචනවලට "ප්‍රතික්ෂේප කිරීමට විරෝධය දක්වනු ලදී" යන වචන එකතු කරනු ලැබිය යුතු ය;

(ඇ) පූර්වෝක්ත (අ) (i) අනුඡේදයෙහි සඳහන් අවස්ථාවක, ඡන්ද පත්‍රිකා කවරය, හෝ පූර්වෝක්ත (අ) (ii) අනුඡේදයෙහි සඳහන් අවස්ථාවක, ඡන්ද පත්‍රිකාව ඒ ප්‍රකාශයට ඇමිණිය යුතු ය; තවද

(ඈ) ඒ ප්‍රකාශය සහ ඉහතින් ම වූ (ඇ) අනුඡේදය යටතේ ඒ ප්‍රකාශයට අමුණා ඇති ලේඛන (මෙහි මින්මතු "තැපැල් ඡන්දදායකයන්ගේ ප්‍රතික්ෂිප්ත ඡන්ද සඳහා වූ බඳුන" යනුවෙන් හඳුන්වනු ලබන) බඳුනකට දැමිය යුතු ය.

(5) මේ නියෝගයේ (2) වන ඡේදයේ (අ) (iii) අනුඡේදයෙහි සඳහන් අවස්ථාවක, ගණන් කිරීමේ නිලධරයා විසින්, "අනන්‍යතා ප්‍රකාශය ප්‍රතික්ෂේප කරන ලදී, ඡන්ද පත්‍රිකාවක් සහ ඡන්ද පත්‍රිකා කවරයක් නොලැබුණි" යන වචන අනන්‍යතා ප්‍රකාශය මත සටහන් කරනු ලැබිය යුතු අතර ඒ ප්‍රකාශය, තැපැල් ඡන්දදායකයන්ගේ ප්‍රතික්ෂිප්ත ඡන්ද සඳහා වූ බඳුනට දැමිය යුතු ය.

(6) මේ නියෝගයේ (2) වන ඡේදයේ (අ) (iv) අනුඡේදයෙහි සඳහන් අවස්ථාවක, ගණන් කිරීමේ නිලධරයා විසින්, "ප්‍රතික්ෂේප කරන ලදී, අනන්‍යතා ප්‍රකාශය නොලැබුණි" යන වචන ඡන්ද පත්‍රිකාව මත සටහන් කරනු ලැබිය යුතු අතර ඡන්ද පත්‍රිකාව, තැපැල් ඡන්දදායකයන්ගේ ප්‍රතික්ෂිප්ත ඡන්ද සඳහා වූ බඳුනට දැමිය යුතු ය.

(7) මේ නියෝගයේ (2) වන ඡේදයේ (අ) (v) අනුඡේදයෙහි සඳහන් අවස්ථාවක, ගණන් කිරීමේ නිලධරයා විසින්, අනන්‍යතා ප්‍රකාශයක් ඡන්ද පත්‍රිකා කවරයේ බහා ඇති දැයි නිශ්චය කිරීම සඳහා ඒ කවරය විවෘත කරනු ලැබිය යුතු ය.

(8) මේ නියෝගයේ (7) වන ඡේදය යටතේ ඡන්ද පත්‍රිකා කවරය විවෘත කරනු ලැබූ කල්හි, අනන්‍යතා ප්‍රකාශයක් සහ ඡන්ද පත්‍රිකාවක් ඒ කවරය තුළ තිබේ නම්, ඒ ප්‍රකාශය යථා පරිදි අත්සන් කොට සාක්ෂි දරනු ලබා ඇති බවටත්, අනන්‍යතා ප්‍රකාශය මත සලකුණු කරන ලද අංකය, ඒ ඡන්ද පත්‍රිකාව මත සලකුණු කරන ලද ඒ හා සමාන අංකයකට අනුරූප වන බවටත් ගණන් කිරීමේ නිලධරයා සෑහීමට පත් විය යුතු අතර ඔහු විසින්—

(අ) එසේ සෑහීමට පත් වන්නේ නම්, ඒ ප්‍රකාශය අනන්‍යතා ප්‍රකාශ සඳහා වූ බඳුනට දැමිය යුතු අතර ඒ ඡන්ද පත්‍රිකාව තැපැල් ඡන්දදායකයන්ගේ ඡන්ද පත්‍රිකා සඳහා වූ බඳුනට දැමිය යුතු ය; තවද

(ආ) එසේ සෑහීමට පත් නොවන්නේ නම්—

(i) ඒ ප්‍රකාශය මත "අනන්‍යතා ප්‍රකාශය ප්‍රතික්ෂේප කරන ලදී" යන වචන සටහන් කිරීම;

(ii) ඒ ප්‍රකාශය පැමිණ සිටින ගණන් කිරීමේ නියෝජිතයන්ට පෙන්වීම සහ ඒ ප්‍රකාශය සම්බන්ධයෙන් ගනු ලැබූ ගණන් කිරීමේ නිලධාරියාගේ තීරණයට යම් නියෝජිතයකු විසින් යම් විරෝධතාවක් පළ කරනු ලැබුවහොත්, ඉහතින් ම වූ (i) වන අනුච්ඡේදය යටතේ ඒ ප්‍රකාශය මත සටහන් කරන ලද වචනවලට, "ප්‍රතික්ෂේප කිරීමට විරෝධය දක්වන ලදී" යන වචන එකතු කිරීම;

(iii) ඒ ප්‍රකාශයට ඡන්ද පත්‍රිකා කවරය සහ ඒ ඡන්ද පත්‍රිකාව ඇමිණීම; සහ

(iv) ඒ ප්‍රකාශය සහ ඉහතින් ම වූ (iii) වන අනුච්ඡේදය යටතේ ඒ ප්‍රකාශයට අමුණන ලද ලේඛන තැපැල් ඡන්දදායකයන්ගේ ප්‍රතික්ෂිප්ත ඡන්ද සඳහා වූ බඳුනට දැමීම

කරනු ලැබිය යුතුය.

(9) ගණන් කිරීමේ නිලධරයා විසින් මේ නියෝගයේ (7) වන ඡේදය යටතේ ඡන්ද පත්‍රිකා කවරය විවෘත කරනු ලැබූ කල්හි—

(අ) එහි අනන්‍යතා ප්‍රකාශයක් පමණක් තිබුණහොත් හෝ

(ආ) ඡන්ද පත්‍රිකාවක් පමණක් තිබුණහොත් හෝ

(ඇ) කිසිවක් නොතිබුණහොත්,

ඔහු විසින්—

(i) ඉහතින් වූ (අ) අනුච්ඡේදයෙහි සඳහන් අවස්ථාවක, ඒ ප්‍රකාශය මත "අනන්‍යතා ප්‍රකාශය ප්‍රතික්ෂේප කරන ලදී, ඡන්ද පත්‍රිකාවක් නොලැබුණි" යන වචන සටහන් කිරීම;

(ii) ඉහතින් වූ (ආ) අනුච්ඡේදයෙහි සඳහන් අවස්ථාවක, ඒ ඡන්ද පත්‍රිකාව මත "ප්‍රතික්ෂේප කරන ලදී, අනන්‍යතා ප්‍රකාශයක් නොලැබුණි" යන වචන සටහන් කිරීම;

(iii) ඉහතින් වූ (ඇ) අනුච්ඡේදයෙහි සඳහන් අවස්ථාවක, ඡන්ද පත්‍රිකා කවරය මත "ප්‍රතික්ෂේප කරන ලදී, බහාලූ කිසිවක් නොලැබුණි" යන වචන සටහන් කිරීම; සහ

(iv) අනන්‍යතා ප්‍රකාශයක් හෝ ඡන්ද පත්‍රිකාවක් හෝ ඡන්ද පත්‍රිකා කවරය තුළ තිබුණේ නම්, ඒ ප්‍රකාශය හෝ ඡන්ද පත්‍රිකාව ඒ කවරයට ඇමිණීම

කරනු ලැබිය යුතු අතර, ඡන්ද පත්‍රිකා කවරය සහ ඉහතින් වූ (iv) වන අනුච්ඡේදය යටතේ ඒ කවරයට අමුණා ඇති ලේඛනය හෝ ලේඛන වේනොත් ඒ ලේඛනය හෝ ලේඛන තැපැල් ඡන්දදායකයන්ගේ ප්‍රතික්ෂිප්ත ඡන්ද සඳහා වූ බඳුනට දැමිය යුතු ය.

(10) (2) වන ඡේදයේ (ආ) අනුච්ඡේදයෙහි සඳහන් අවස්ථාවක, ගණන් කිරීමේ නිලධරයා විසින් ආවරණ කවරය මත "ප්‍රතික්ෂේප කරන ලදී, බහාලූ කිසිවක් නොලැබුණි" යන වචන සටහන් කරනු ලැබිය යුතු අතර ඒ කවරය තැපැල් ඡන්දදායකයන්ගේ ප්‍රතික්ෂිප්ත ඡන්ද සඳහා වූ බඳුනට දැමිය යුතු ය.

(11) අනන්‍යතා ප්‍රකාශයක්, ඒ අනන්‍යතා ප්‍රකාශය පිළිබඳ ආකෘතියේ පිටුපස සඳහන් උපදෙස් ප්‍රකාර අත්සන් කොට සාක්ෂි දරනු ලැබ ඇති නම් මිස, විධිමත් ලෙස අත්සන් කොට සාක්ෂි දරනු ලැබූ බව නොසැලකිය යුතු ය.

25. (1) 24 වන නියෝගය යටතේ කෙරෙන කටයුතු අවසානයේ දී, ගණන් කිරීමේ නිලධරයා විසින් තැපැල් ඡන්දදායකයන්ගේ ඡන්ද පත්‍රිකා සඳහා වූ බඳුනේ තැබූ එක් එක් ඡන්ද පත්‍රිකා කවරය වෙන වෙනම විවෘත කරනු ලැබිය යුතු ය. ඡන්ද පත්‍රිකා කවර විවෘත කිරීම.

(2) ඡන්ද පත්‍රිකා කවරයක ඡන්ද පත්‍රිකාවක් අඩංගු නොවන අවස්ථාවක, ගණන් කිරීමේ නිලධරයා විසින් ඒ කවරය මත "ඡන්ද පත්‍රිකාවක් බහා නොමැත" යන වචන සටහන් කොට එය තැපැල් ඡන්දදායකයන්ගේ ප්‍රතික්ෂිප්ත ඡන්ද සඳහා වූ බඳුනෙහි දැමිය යුතු ය.

(3) ඡන්ද පත්‍රිකා කවරයක ඡන්ද පත්‍රිකාවක් අඩංගු වන අවස්ථාවක, ගණන් කිරීමේ නිලධරයා විසින්—

(අ) ඒ කවරය මත සලකුණු කරන ලද අංකය ඡන්ද පත්‍රිකාව මත සලකුණු කරන ලද ඒ හා සමාන අංකයකට අනුරූපවන්නේ නම්, ඒ ඡන්ද පත්‍රිකාව තැපැල් ඡන්දදායකයන්ගේ ඡන්ද පත්‍රිකා සඳහා වූ බඳුනෙහි දැමීම ; සහ

(ආ) ඒ කවරයෙහි ඡන්ද පත්‍රිකාවක් අඩංගු වන අතර, ඒ ඡන්ද පත්‍රිකාව මත සලකුණු කරන ලද අංකය, ඒ කවරය මත සලකුණු කරන ලද අංකයට අනුරූප නොවන්නේ නම්, ඒ කවරය මත "ප්‍රතික්ෂේප කරන ලදී" යන වචන සටහන් කොට, ඒ ඡන්ද පත්‍රිකාව ඒ කවරයට අමුණා, ඒවා තැපැල් ඡන්දදායකයන්ගේ ප්‍රතික්ෂිප්ත ඡන්ද සඳහා වූ බඳුනෙහි දැමීම

කරනු ලැබිය යුතු ය.

26. 25 වන නියෝගය යටතේ වූ කටයුතු අවසානයේ දී, ගණන් කිරීමේ නිලධරයා විසින්, තැපැල් ඡන්දදායකයන්ගේ ප්‍රතික්ෂිප්ත ඡන්ද සඳහා වූ බඳුනෙහි අඩංගු දේ, සහ අනන්‍යතා ප්‍රකාශ සඳහා වූ බඳුනෙහි අඩංගු දේ වෙන වෙනම පැකැට්ටු දෙකක බහා ඒ පැකැට්ටු මුද්‍රා තැබිය යුතු ය. ප්‍රතික්ෂිප්ත ඡන්ද හා අනන්‍යතා ප්‍රකාශ මුද්‍රා තැබීම.

27. (1) ගණන් කිරීමේ නිලධරයා විසින් ගණන් කිරීම ආරම්භ කිරීමට පෙර, ඔහු විසින් හෝ ඔහු විසින් බලය දෙනු ලැබූ තැනැත්තකු විසින්, එහි පැමිණ සිටින ගණන් කිරීමේ නියෝජිතයන් ඉදිරිපිට දී තැපැල් ඡන්දදායකයන්ගේ ඡන්ද පත්‍රිකා සඳහා වූ බඳුනෙහි තබා ඇති ඡන්ද පත්‍රිකා පිටතට ගෙන ඒවා ගණන් කර, ඒ බඳුනෙහි තිබුණු ඡන්ද පත්‍රිකා සංඛ්‍යාව සටහන් කරනු ලැබිය යුතු ය. ගණන් කිරීම.

(2) තැපැල් ඡන්දදායකයන්ගේ ඡන්ද පත්‍රිකා සඳහා වූ බඳුනෙහි තබා ඇති ඡන්ද පත්‍රිකාවල ඡන්ද ගණන් කිරීමේ දී, පනතේ 50 වන වගන්තියේ (3) වන සහ (4) වන උපවගන්තිවල සහ 51 වන, 52 වන, 58 වන සහ 59 වන වගන්තිවල විධිවිධාන අදාළ විය යුතු ය.

28. ගණන් කිරීම අවසාන කළ පසු, ගණන් කිරීමේ නිලධරයා විසින්— ගණන් කිරීම සමාප්ත කිරීම.

(අ) ගණන් කරන ලද ඡන්ද පත්‍රිකා ;

(ආ) ප්‍රතික්ෂිප්ත ඡන්ද පත්‍රිකා ;

(ඇ) එක් එක් අපේක්ෂකයාට දෙන ලද ඡන්ද සංඛ්‍යාව පිළිබඳව පනතේ 51 වන වගන්තියේ (7) වන උපවගන්තිය ප්‍රකාර පිළියෙළ කරන ලද, ලිඛිත ප්‍රකාශය ;

(ඈ) 27(1) වන නියෝගය යටතේ වූ ගණන් කිරීම පිළිබඳ සටහන ;

(ඉ) පනතේ 51 වන වගන්තියේ (6) වන උපවගන්තිය ප්‍රකාර සම්පාදිත ප්‍රකාශය ; සහ

(ඊ) 26 වන නියෝගයෙහි සඳහන් මුද්‍රා තබන ලද පැකැට්ටු දෙක

මුද්‍රා තබන ලද පැකැට්ටුවල බහා තේරීම් භාර නිලධරයාට වහාම භාර දිය යුතු ය.

### මෙම නියෝගවල උපලේඛනය

### "අ" ආකෘතිය

3 වන නියෝගය

### තැපැල් ඡන්දදායකයකු වශයෙන් සලකනු ලැබීම සඳහා ඉල්ලුම් කිරීම.

අංක ........................................ දරන මැතිවරණ කොට්ඨාසයේ තේරීම්
(මැතිවරණ කොට්ඨාසයේ අංකය හා නම යොදන්න)

භාර නිලධරයා වෙත ........ ........................ . ........... වන මම, පූර්වෝක්ත මැතිවරණ කොට්ඨාසයේ ඡන්ද හිමි නාම ලේඛනයෙහි........................................ යනුවෙන් මගේ නම දැක්වෙන බව මෙයින් ප්‍රකාශ කරමි. නාම ලේඛනයෙහි මගේ නම දැක්වෙන්නේ පහත සඳහන් අනුක්‍රමික අංකය, ඡන්ද ප්‍රදේශය සහ ඡන්ද කොට්ඨාසය යටතේ වේ :—

ඡන්ද ප්‍රදේශයේ අක්ෂරය : .. ........................................

ඡන්ද කොට්ඨාස අංකය : ........................................

මගේ නමට අයත් අනුක්‍රමික අංකය : ........................................

*(1)*(අ) ශ්‍රී ලංකා යුද හමුදාවේ/ශ්‍රී ලංකා නාවික හමුදාවේ/ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සාමාජිකයකු වශයෙන් ;

*(ආ) පොලිස් දෙපාර්තමේන්තුවේ/ ශ්‍රී ලංකා ආණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුවේ/තැපැල් දෙපාර්තමේන්තුවේ සහ විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ/ශ්‍රී ලංකා මධ්‍යම ගමනාගමන මණ්ඩලයේ/ .................. ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයේ නිලධරයකු හෝ සේවකයකු වශයෙන් ;

*(ඇ) තෝරා පත් කර ගැනීම හා සම්බන්ධිත කාර්ය සඳහා පත් කරනු ලැබූ */පත් කරනු ලැබීමට ඉඩ ඇති රජයේ සේවයේ නිලධරයකු හෝ සේවකයකු වශයෙන් ;

*(ඈ) ඒ තෝරා පත් කර ගැනීම හා සම්බන්ධිත කාර්ය සඳහා පත් කරනු ලැබූ*/පත් කරනු ලැබීමට ඉඩ ඇති ශ්‍රී ලංකා මහ බැංකුවේ නිලධරයකු හෝ සේවකයකු වශයෙන්—

මගේ සේවා නියුක්තියේ විශේෂ අවශ්‍යතානුගත තරාණුවල හේතුවෙන් ;

*(2) මා අපේක්ෂකයකු වීම හේතුවෙන්

මට වෙන් කරන ලද ඡන්ද පොළට පෞද්ගලිකව ගොස් මට ඡන්දය දීමට නොහැකි/නොහැකි වීමට ඉඩ ඇති බැවින් ජනාධිපතිවරයකු තෝරා පත් කර ගැනීමේ දී තැපැල් ඡන්දදායකයකු වශයෙන් සලකනු ලැබීමට මම මෙයින් ඉල්ලුම් කරමි.

මගේ ඡන්ද පත්‍රිකාව සහ අනිකුත් ලේඛන එවනු ලැබිය යුතු ලිපිනය පහත දැක්වේ :—

පහත දැක්වෙන සටහන ප්‍රකාර සහතික
කිරීමේ නිලධරයකු වශයෙන් ක්‍රියා කිරීමට
ඉල්ලුම්කරුට හිමිකමක් නොමැති නම්,
ඉල්ලුම්කරුගේ සහතික කරන නිලධරයාගේ
නිල නාමය සහ ලිපිනය සඳහන් කරන්න.
සහතික කිරීමේ නිලධරයකු වශයෙන් ක්‍රියා
කිරීමට ඉල්ලුම්කරුට හිමිකම තිබේ නම්
ඉල්ලුම්කරුගේ නිල නාමය සහ ලිපිනය
සඳහන් කරන්න.

.......... ....................
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :........................

මා*/ඉල්ලුම්කරු විසින් මේ ඉල්ලුම් පත්‍රයේ සඳහන් කරන ලද කරුණු හේතු කොට ගෙන මට*/ඔහුට වෙන් කරන ලද ඡන්ද පොළට පෞද්ගලිකව ගොස් මට*/ඔහුට ඡන්දය දීමට නොහැකි*/නොහැකිවීමට ඉඩ ඇති බව මම මෙයින් සහතික කරමි.

මේ ඉල්ලුම් පත්‍රයේ දැක්වෙන මගේ නිල නාමය සහ ලිපිනය නිවැරදි ය.

දිනය සහ නිල මුද්‍රාව :........ .......................

................................
සහතික කරන නිලධරයාගේ*/
ඉල්ලුම්කරුගේ අත්සන සහ නිල නාමය.

*අදාළ නොවන වචන කපා හරින්න.

සටහන

1. සෑම ඉල්ලුම් පත්‍රයක් ම පනතේ 2 වන වගන්තිය යටතේ නියමය ප්‍රකාශයට පත් කරනු ලැබීමේ දිනයේ සිට දින දහයක් ඇතුළත, ඉල්ලුම්කරු ඡන්ද හිමියකු වශයෙන් ලියාපදිංචි වී සිටින මැතිවරණ කොට්ඨාසයේ තේරීම් භාර නිලධරයාම ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

2. සෑම ඉල්ලුම් පත්‍රයක් ම නිසි පරිදි පූරවා තිබිය යුතු ය. එසේ නොවුවහොත් තේරීම් භාර නිලධරයා විසින් එය ප්‍රතික්ෂේප කරනු ලැබීමට යටත් වන්නේ ය.

3. සෑම ඉල්ලුම්කරුවකුට ම තේරීම් භාර නිලධරයාගේ තීරණය දන්වනු ලැබේ.

4. යම් ඉල්ලුම්කරුවකුගේ ඉල්ලුම් පත්‍රය අනුව අවසර දෙනු ලැබූ විට ඉල්ලුම්කරු සහතික කිරීමේ නිලධරයකු වශයෙන් ක්‍රියා කිරීමට හිමිකම් ලබා ඇත්නම්, ඔහුගේ ඉල්ලුම් පත්‍රයෙහි දක්වා ඇති ඔහුගේ නමට සහ ලිපිනයට හෝ, ඔහු එසේ හිමිකම් ලබා නොමැති නම්, ඔහුගේ ඉල්ලුම් පත්‍රයෙහි නිල නාමය සහ ලිපිනය දක්වා ඇති සහතික කිරීමේ නිලධරයාගේ භාරය යටතේ හෝ ඡන්ද පත්‍රිකාව සහ වෙනත් ලේඛන යවනු ලැබේ.

5. "සහතික කිරීමේ නිලධරයා" යන යෙදුම—

(අ) ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ හෝ ශ්‍රී ලංකා නාවික හමුදාවේ හෝ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සාමාජිකයකු වන යම් ඉල්ලුම්කරුවකු සම්බන්ධයෙන් වන විට—

(i) ඒ ඉල්ලුම්කරු එම යුද්ධ හමුදාවේ අණ දෙන නිලධරයා හෝ එම නාවික හමුදාවේ අණ දෙන නිලධරයා හෝ එම ගුවන් හමුදාවේ අණ දෙන නිලධරයා හෝ වන්නේ නම්, නැතහොත්, ඒ ඉල්ලුම්කරු, තමා සේවය කරන ඒකකයේ හෝ ආයතනයේ ඉහළම කාර්ය භාර නිලධරයා වන්නේ නම්, ඒ ඉල්ලුම්කරු ඉන් අදහස් වේ ; නැතහොත්

(ii) ඒ ඉල්ලුම්කරු, මේ අනුඡේදයේ (i) වන වගන්තියෙහි සඳහන් තැනැත්තකු නොවන්නේ නම්, ඉල්ලුම්කරු සේවය කරන ඒකකයේ හෝ ආයතනයේ ඉහළම කාර්ය භාර නිලධරයා ඉන් අදහස් වේ ;

(ආ) රජයේ සේවයේ හෝ ශ්‍රී ලංකා මහ බැංකුවේ නිලධරයකු හෝ සේවකයකු වන යම් ඉල්ලුම්කරුවකු සම්බන්ධයෙන් වන විට—

(i) ඒ ඉල්ලුම්කරු, යම් කාර්යාලයක් භාරව සිටින ඉහළ ම නිලධරයා වන්නේ නම්, ඒ ඉල්ලුම්කරු ඉන් අදහස් වේ ; නැතහොත්

(ii) ඒ ඉල්ලුම්කරු, මේ අනුඡේදයේ (i) වන වගන්තියේ සඳහන් තැනැත්තකු නොවන්නේ නම්, ඉල්ලුම්කරු සේවය කරන කාර්යාලය භාරව සිටින ඉහළ ම නිලධරයා ඉන් අදහස් වේ ;

(ඇ) අපේක්ෂකයකු වන යම් ඉල්ලුම්කරුවකු සම්බන්ධයෙන් වන විට, ඉල්ලුම්කරු ඡන්ද හිමියකු වශයෙන් ලියා පදිංචි කරනු ලැබූ මැතිවරණ කොට්ඨාසයේ තේරීම් භාර නිලධරයා ඉන් අදහස් වේ

"ආ" ආකෘතිය

අනන්‍යතාව ප්‍රකාශ කිරීමේ ආකෘතිය
ආකෘතියේ ඉදිරිපස

6 වන නියෝගය.

ඡන්ද පත්‍රිකාවේ අනුක්‍රමික අංකය :.................................................
(ඡන්ද විමසීම් භාර නිලධරයා විසින් ලිවීම සඳහා)

*(මට දැන් භාර දෙන ලද) යථෝක්ත අනුක්‍රමික අංකය දරන ඡන්ද පත්‍රිකාව සහ ඒ ඡන්ද පත්‍රිකාව අඩංගු කවරය, මගේ අත්සනට සාක්ෂිකරුවකු වන පහත සඳහන් නිලධරයාගේ භාරයේ එවනු ලැබූ තැනැත්තා මා බව මම මෙයින් ප්‍රකාශ කරමි.

**ඉහත දැක්වෙන පරිදි අංක යෙදූ ඡන්ද පත්‍රිකාව සහ ඒ ඡන්ද පත්‍රිකාව අඩංගු කවරය (යන මා දැන් ඉදිරිපත් කරන ඒ දෙකම) කෙලින් ම එවනු ලැබූ තැනැත්තා මා බව මම මෙයින් ප්‍රකාශ කරමි.

................,
ඡන්දදායකයාගේ අත්සන.

දිනය :...........................

ඉහත නම් සඳහන් තැනැත්තාට, ඔහුගේ සහතික කිරීමේ නිලධරයා වශයෙන් සිටින මා භාරයේ මෙහි සඳහන් කරන ලද ඡන්ද පත්‍රිකාව සහ කවරය එවන ලදී. ඉහත නම් සඳහන් තැනැත්තා, අපේක්ෂකයකු වශයෙන් */මා භාරයේ තිබෙන ඒකකයේ*/ආයතනයේ/කාර්යාලයේ සේවය කරන්නකු වශයෙන් පුද්ගලිකව මම හඳුනමි.

ඡන්දදායකයා වෙත භාර දෙන ලද ඡන්ද පත්‍රිකාව ඔහු විසින්, මගේ කාර්යාලයෙහි සපයා ඇති ඡන්ද කුටිය තුළ දී වහාම සලකුණු කරන ලදී. සලකුණු කරන ලද ඡන්ද පත්‍රිකාව ඔහු විසින් පත්‍රිකා කවරය තුළ බහාලන ලද අතර මා සහ ඡන්දදායකයා ඉදිරිපිට දී කවර මුද්‍රා තබන ලදී.

යථෝක්ත අනන්‍යතා ප්‍රකාශය ඡන්දදායකයා විසින් ඡන්දය දීමට කලින් මා ඉදිරිපිට දී අත්සන් කරන ලදී.

** මා පෞද්ගලිකව හඳුනන ඉහත නම් සඳහන් තැනැත්තා විසින් ඉහත සඳහන් ඡන්ද පත්‍රිකාව සහ කවරය මට පෙන්වන ලද අතර යථෝක්ත ප්‍රකාශය මා ඉදිරිපිට දී අත්සන් කරන ලදී.

...................,
සාක්ෂිකරුගේ අත්සන හා නිල නාමය.

දිනය සහ නිල මුද්‍රාව :—

(මේ ආකෘතියේ පිටුපස ඇති උපදෙස් බලන්න)

*අදාළ නොවන්නේ නම් කපා හරින්න.

**. ඡන්ද පත්‍රිකාව සහ වෙනත් ලේඛන තම නිල නාමය හා ලිපිනය වෙතට කෙළින්ම යවනු ලැබූ ඡන්දදායකයන් සම්බන්ධයෙන් පමණක් අදාළ වන අතර අදාළ නොවන්නේ නම් කපා හැරිය යුතු ය. ඒ ඡන්දදායකයන් සම්බන්ධයෙන් ප්‍රකාශය පිළිබඳ සාක්ෂිකරු පසු පිටුවේ උපදෙස්වල නියම කර ඇති පරිදි විය යුතු ය.

ආකෘතියේ පිටුපස

අ. තමාගේ සහතික කිරීමේ නිලධරයා භාරයේ ඡන්ද පත්‍රිකාව සහ වෙනත් ලේඛන යවනු ලැබූ ඡන්දදායකයාට උපදෙස්.

1. තමාගේ සහතික කිරීමේ නිලධරයා භාරයේ ඡන්ද පත්‍රිකාව සහ වෙනත් ලේඛන යවනු ලැබූ ඡන්දදායකයා විසින්, ප්‍රකාශය අත්සන් කිරීමට පෙර—

(i) ඒ නිලධරයා භාරයේ ඡන්දදායකයා වෙත එවන ලද අනන්‍යතා ප්‍රකාශය පිළිබඳ ආකෘතිය සහ ඡන්ද පත්‍රිකාව බහාලූ කවරය ;

(ii) අනන්‍යතා ප්‍රකාශයෙහි නිශ්චිත වශයෙන් දක්වා ඇති, ඡන්ද පත්‍රිකාවේ අනුක්‍රමික අංකය ඔහු වෙත භාර දෙන ලද ඡන්ද පත්‍රිකාවේ දැක්වෙන අංකය ම බව—

දැක බලා ගත යුතු ය.

ඉන්පසු ඡන්දදායකයා විසින්, තමාගේ සංක්ෂිකරු වශයෙන් ක්‍රියා කළ යුතු ඒ නිලධරයා ඉදිරිපිට දී ප්‍රකාශය අත්සන් කළ යුතු ය.

2. ඡන්දදායකයාට ඇත්තේ එක ඡන්දයකි.

3. ඡන්දදායකයා පහත සඳහන් උපදෙස් අනුව ඡන්දය දිය යුතු ය.

ඡන්දදායකයා විසින්, ඡන්ද පත්‍රිකා සලකුණු කිරීම සඳහා වෙන් කර ඇති ස්ථානය තුළට ගොස් තමා ඡන්දය දෙන අපේක්ෂකයාගේ ලකුණ සහ නම ඉදිරියෙන් ඡන්ද පත්‍රිකාවේ දකුණු අත පැත්තේ තත් කාර්යය සඳහා සලසා ඇති ඉඩ ප්‍රමාණයෙහි "1" දරන ඉලක්කම සලකුණු කරනු ලැබිය යුතු ය—

| | | |
|---|---|---|
| ඒ | ලකුණ | 1 |
| බී | ලකුණ | |

ඡන්දදායකයා විසින්, යම් අපේක්ෂකයකුට තම ඡන්දය දෙන අතර—

(අ) තෝරා පත්කර ගැනීම සඳහා අපේක්ෂකයන් තුන් දෙනකු සිටින අවස්ථාවක, තමාගේ දෙවන මනාපය, ඒ අපේක්ෂකයාගේ ලකුණ සහ නම ඉදිරියෙන් "2" දරන ඉලක්කම සලකුණු කිරීමෙන් දැක්විය හැකි ය;

| | | |
|---|---|---|
| ඒ | ලකුණ | 1 |
| බී | ලකුණ | |
| සී | ලකුණ | 2 |

(ආ) තෝරා පත්කර ගැනීම සඳහා අපේක්ෂකයන් තුන් දෙනකුට වැඩියෙන් සිටින අවස්ථාවක, අපේක්ෂකයාගේ ලකුණ සහ නම ඉදිරියෙන්, දෙවන මනාපය දැක්වීම සඳහා "2" දරන ඉලක්කම සලකුණු කිරීමෙන් ද, තුන්වන මනාපය දැක්වීම සඳහා "3" දරන ඉලක්කම සලකුණු කිරීමෙන් ද, තම දෙවන සහ තුන්වන මනාපයන් දැක්විය හැකි ය;

| | | |
|---|---|---|
| ඒ | ලකුණ | 1 |
| බී | ලකුණ | |
| සී | ලකුණ | 2 |
| ඩී | ලකුණ | 3 |

4. ඡන්දදායකයා, තමා ඡන්දය දුන්නේ කවර ආකාරයටදැයි කිසිම තැනැත්තකුට දැකීමට ඉඩ නොතැබිය යුතු ය.

5. ඡන්දදායකයා විසින්, ඡන්දය දුන් වහාම ඡන්ද පත්‍රිකාව නවා "ඡන්ද පත්‍රිකා කවරය" යන වචන මතු පිටින් මුද්‍රණය කරනු ලැබ, සපයා ඇති කුඩා කවරය තම සාක්ෂිකරුගෙන් ලබා ගෙන ඒ තුළ සලකුණු කරන ලද ඡන්ද පත්‍රිකාව, ඒ ඡන්ද පත්‍රිකාවේ ඉදිරිපස නොපෙන්වමින් බහා කවරය තදින් වැසිය යුතු ය. ඉන්පසුව කවරය ඡන්දදායකයා සහ ඔහුගේ සාක්ෂිකරු ඉදිරිපිටදී මුද්‍රා තබනු ලැබිය යුතු ය.

ඉන්පසුව, ඡන්දදායකයා විසින්, සම්පූර්ණ කරන ලද තම අනන්‍යතා ප්‍රකාශය සහ මුද්‍රා තබන ලද ඡන්ද පත්‍රිකා කවරය, තෝරීම් භාර නිලධාරියා වෙත යොමු කරන ලදුව බහා එවා ඇති අනෙක් ලොකු කවරය තුළ දමා කවරය තදින් වසා එය අප්‍රමාදව යැවීම සඳහා තම සාක්ෂිකරුට භාර දිය යුතු ය.

6. නිසි පරිදි අත්සන් කොට සාක්ෂි දරනු ලැබූ අනන්‍යතා ප්‍රකාශය සමග සහ ඡන්ද විමසන දිනයේ දී ඡන්ද විමසීම අවසන් කිරීමට පෙර, තෝරීම් භාර නිලධරයා වෙත ලැබෙන සේ තැපැල් ඡන්ද පත්‍රිකාවක් ආපසු නො එවනු ලැබුවහොත්, ඒ තැපැල් ඡන්ද පත්‍රිකාව නිසි පරිදි ආපසු නො එවනු ලැබූ බව සලකනු ලැබිය යුතු ය.

ආ. ඡන්ද පත්‍රිකාව සහ වෙනත් ලේඛන කෙලින් ම තමාට තම නිල නාමය සහ ලිපිනය යටතේ යවනු ලැබූ ඡන්දදායකයාට උපදෙස්.

1. ඡන්දදායකයා විසින්, තම අනන්‍යතා ප්‍රකාශය අත්සන් කිරීමට පෙර ඒ ප්‍රකාශය තමා අත්සන් කළ යුත්තේ යම් තැනැත්තකු ඉදිරිපිට දී ද ඒ තැනැත්තාට—

(අ) ඒ ප්‍රකාශයේ නිශ්චිත වශයෙන් සඳහන් කර ඇති අංකය ම දරන ඡන්ද පත්‍රිකාව ; සහ

(ආ) ඡන්දදායකයාට එවන ලද අනන්‍යතා ප්‍රකාශය පිළිබඳ ආකෘතිය හා ඡන්ද පත්‍රිකාව බහාලූ කවරය

පෙන්වනු ලැබිය යුතු ය.

2. (අ) ඡන්දදායකයා ශ්‍රී ලංකා යුද හමුදාවේ, හෝ ශ්‍රී ලංකා නාවික හමුදාවේ, හෝ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සාමාජිකයකු වන්නේ නම්, ඒ යුද හමුදාවේ, නාවික හමුදාවේ, හෝ ගුවන් හමුදාවේ අධිකාරය ලත් නිලධරයකු වන්නා වූ ද ;

(ආ) ඡන්දදායකයා රජයේ සේවයේ හෝ ශ්‍රී ලංකා මහ බැංකුවේ නිලධරයකු හෝ සේවකයකු වන්නේ නම්, ඒ සේවයේ ජ්‍යෙෂ්ඨ නිලධරයකු වන්නා වූ, හෝ ඡන්දදායකයාට ජ්‍යෙෂ්ඨ නිලධරයකු නොසිටින්නේ නම්, ඒ සේවයේ වෙනත් යම් නිලධරයකු වන්නා වූ ද

සාක්ෂිකරුවකු ඉදිරිපිට දී ඡන්දදායකයා අනන්‍යතා ප්‍රකාශය අත්සන් කළ යුතු ය. ඡන්දදායකයාට ඇත්තේ එක ඡන්දයකි.

3. ඡන්දදායකයා පහත සඳහන් උපදෙස්වලට අනුව ඡන්දය දිය යුතු ය.

ඡන්දදායකයා විසින්, ඡන්ද පත්‍රිකා සලකුණු කිරීම සඳහා වෙන්කර ඇති ස්ථානය තුළට ගොස් තමා ඡන්දය දෙන අපේක්ෂකයාගේ ලකුණ සහ නම ඉදිරියෙන් ඡන්ද පත්‍රිකාවේ දකුණු අත පැත්තේ තත් කාර්යය සඳහා සලසා ඇති ඉඩ ප්‍රමාණයෙහි "1" දරන ඉලක්කම සලකුණු කරනු ලැබිය යුතුය.

| | | |
|---|---|---|
| ඒ | ලකුණ | 1 |
| බී | ලකුණ | |

ඡන්දදායකයා විසින්, යම් අපේක්ෂකයකු සඳහා තම ඡන්දය දෙන අතර—

(අ) තෝරා පත්කර ගැනීම සඳහා අපේක්ෂකයන් තුන් දෙනකු සිටින අවස්ථාවක, තම දෙවන මනාපය, ඒ අපේක්ෂකයාගේ ලකුණ සහ නම ඉදිරියෙන් "2" දරන ඉලක්කම සලකුණු කිරීමෙන් දැක්විය හැකි ය;

| | | |
|---|---|---|
| ඒ | ලකුණ | 1 |
| බී | ලකුණ | |
| සී | ලකුණ | 2 |

(ආ) තෝරා පත්කර ගැනීම සඳහා, අපේක්ෂකයන් තුන් දෙනකුට වැඩියෙන් සිටින අවස්ථාවක, අපේක්ෂකයාගේ ලකුණ සහ නම ඉදිරියෙන්, දෙවන මනාපය දැක්වීම සඳහා "2" දරන ඉලක්කම සලකුණු කිරීමෙන් ද, තුන්වන මනාපය දැක්වීම සඳහා "3" දරන ඉලක්කම සලකුණු කිරීමෙන් ද, තම දෙවන සහ තුන්වන මනාපයන් දැක්විය හැකි ය.

| | | |
|---|---|---|
| ඒ | ලකුණ | 1 |
| බී | ලකුණ | |
| සී | ලකුණ | 2 |
| ඩී | ලකුණ | 3 |

4. ඡන්දදායකයා තමා ඡන්දය දුන්නේ කවර ආකාරයකටදැයි දැක ගැනීමට කිසිම තැනැත්තකුට ඉඩ නොහැරිය යුතු ය.

5. ඡන්දදායකයා විසින්, ඡන්දය දුන් වහාම "ඡන්ද පත්‍රිකා කවරය" යන වචන මතු පිටින් මුද්‍රණය කරනු ලැබ, ඔහු එවන ලද කුඩා කවරය තුළ, සලකුණු කරන ලද ඡන්ද පත්‍රිකාව දමා කවරය තදින් වැසිය යුතු ය. ඉන්පසු, ඡන්දදායකයා විසින්, අනන්‍යතා ප්‍රකාශය සමග ඡන්ද පත්‍රිකා කවරය, තේරීම් භාර නිලධරයා වෙත යොමු කරන ලදුව ඔහු එවා ඇති අනෙක් විශාල කවරය තුළ දමා ඒවා අප්‍රමාදව තැපෑලෙන් යැවිය යුතු ය. ඡන්දදායකයා විසින් ඡන්ද පත්‍රිකාව වහාම ආපසු නොඑවන්නේ නම් එය, ගණන් කරනු ලැබීමට ප්‍රමාද වැඩි විය හැකි ය.

6. නිසි පරිදි අත්සන් කොට සාක්ෂි දරනු ලැබූ අනන්‍යතා ප්‍රකාශය සමග සහ ඡන්ද විමසන නියමිත දිනයේ දී ඡන්ද විමසීම අවසන් කිරීමට පෙර තේරීම් භාර නිලධරයා වෙත ලැබෙන සේ තැපැල් ඡන්ද පත්‍රිකාවක් ආපසු නොඑවනු ලැබුවහොත්, ඒ තැපැල් ඡන්ද පත්‍රිකාව නිසි පරිදි ආපසු නොඑවනු ලැබූ බව සලකනු ලැබිය යුතු ය.

**"ඇ" ආකෘතිය**

**9 (1) වන නියෝගය**

රහස්‍යතා ප්‍රකාශය පිළිබඳ ආකෘතිය

මට කියවා දෙන ලද, ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම පිළිබඳ පනතේ දෙවන උපලේඛනයේ ඇතුළත් නියෝගවල 9 වන නියෝගයේ (3) වන ඡේදය මගින් තහනම් කරන ලද කිසිවක් මේ කටයුතුවල දී මා නොකරන බව මම ගම්භීරතා පූර්වකව පොරොන්දු වී ප්‍රකාශ කරමි.

..............................
ප්‍රකාශකගේ අත්සන.

.........................................
**ප්‍රකාශය කරන ලද්දේ යම්**
**තැනැත්තකු ඉදිරිපිට දී ද**
ඒ තැනැත්තාගේ අත්සන.

**දිනය :—**

**සැළකිය යුතුයි.—ප්‍රකාශය කරනු ලබන්නේ යම් තැනැත්තකු ඉදිරිපිට දී ද, ඒ තැනැත්තා විසින් ප්‍රකාශක වෙත ඉහත සඳහන් කරන ලද ඡේදය කියවා දෙනු ලැබිය යුතු ය.**

තුන්වන උපලේඛනය

(27 වන වගන්තිය)

ඡන්දදායකයන්ගේ ප්‍රයෝජනය සඳහා උපදෙස්

**1. ඡන්දදායකයා, ඡන්ද පත්‍රිකා සලකුණු කිරීම සඳහා වෙන් කර ඇති ස්ථානය තුළට ගොස්, තමා ඡන්දය දෙන අපේක්ෂකයාගේ ලකුණ සහ නම ඉදිරියෙන් ඡන්ද පත්‍රිකාවේ දකුණු අත පැත්තේ ඒ කාර්යය සඳහා සලසා ඇති ඉඩ ප්‍රමාණයෙහි "1" දරන ඉලක්කම සලකුණු කළ යුතු ය.**

| | | |
|---|---|---|
| ඒ | ලකුණ | 1 |
| බී | ලකුණ | |

**2. ඡන්දදායකයා විසින්, යම් අපේක්ෂකයකුට තම ඡන්දය දෙන අතර—**

**(අ) තෝරා පත්කර ගැනීම සඳහා අපේක්ෂකයන් තුන් දෙනකු සිටින අවස්ථාවක, තම දෙවන මනාපය ඒ අපේක්ෂකයාගේ ලකුණ සහ නම ඉදිරියෙන් "2" දරන ඉලක්කම සලකුණු කිරීමෙන් දැක්විය හැකි ය;**

| | | |
|---|---|---|
| ඒ | ලකුණ | 1 |
| බී | ලකුණ | |
| සී | ලකුණ | 2 |

(ආ) තෝරාපත්කර ගැනීම සඳහා අපේක්ෂකයන් තුන් දෙනකුට වැඩියෙන් සිටින අවස්ථාවක, තම දෙවන මනාපය දැක්වීම සඳහා "2" දරන ඉලක්කම සලකුණු කිරීමෙන් ද, තම තුන්වන මනාපය දැක්වීම සඳහා "3" දරන ඉලක්කම සලකුණු කිරීමෙන් ද, තම දෙවන සහ තුන්වන මනාපයන් දැක්විය හැකි ය.

| | | |
|---|---|---|
| ඒ | ලකුණ | 1 |
| බී | ලකුණ | |
| සී | ලකුණ | 2 |
| ඩී | ලකුණ | 3 |

3. ඉන් පසු ඡන්දදායකයා විසින් ඡන්ද පත්‍රිකාව පිටිපස ඇති නිල සලකුණ පෙනෙන පරිදි එය නැමිය යුතු අතර, ඡන්ද පත්‍රිකාවේ ඉදිරිපස කිසිවකුට නො පෙන්වා, පිටිපස ඇති නිල සලකුණ ඡන්ද ස්ථානාධිපතිවරයාට පෙන්වා, ඒ ඡන්ද පත්‍රිකාව ඡන්ද පෙට්ටිය තුළ බහා ඡන්ද පොළෙන් වහාම පිටවිය යුතු ය.

4. ඡන්දදායකයා විසින්, අනවධානයෙන් ඡන්ද පත්‍රිකාවක් නරක් කරනු ලැබූ අවස්ථාවක, එය ඡන්ද ස්ථානාධිපතිවරයා වෙත ආපසු දෙනු ලැබිය හැකි අතර ඒ අනවධානය පිළිබඳව ඡන්ද ස්ථානාධිපතිවරයා සෑහීමට පත්වන්නේ නම්, ඔහු විසින් තවත් පත්‍රිකාවක් ඡන්දදායකයාට දෙනු ලැබේ.

5. ඡන්දදායකයා, පසු අවස්ථාවක දී තමා හඳුනා ගනු ලැබීමට ආධාර විය හැකි යම් සලකුණක් ඡන්ද පත්‍රිකාව මත තබන්නේ නම්, ඔහුගේ ඡන්ද පත්‍රිකාව අවලංගු වන අතර එය ගණන් කරනු නොලැබේ.

6. යම් ඡන්ද පත්‍රිකාවක, ඡන්දදායකයකු විසින්—

(අ) කිසිම අපේක්ෂකයකුට ඡන්දය දී නොමැති ; හෝ

(ආ) එක් අපේක්ෂකයකුට වඩා වැඩි ගණනකට ඡන්දය දී ඇති ; හෝ

(ඇ) දෙවන මනාපය හෝ තුන්වන මනාපය පමණක් නැතහොත් ඒ මනාප දෙක පමණක් දක්වා ඇති

අවස්ථාවක, ඡන්ද පත්‍රිකාව අවලංගු වන අතර එය ගණන් කරනු නොලැබේ.

## හතරවන උපලේඛනය

## 1981 ජනාධිපති ඡන්ද පෙත්සම් රීති

1. මේ රීති 1981 ජනාධිපති ඡන්ද පෙත්සම් රීති වශයෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ රීතිවල— අර්ථ නිරූපණය.

"කොමසාරිස්වරයා" යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 103 වන ව්‍යවස්ථාව යටතේ පත් කරනු ලැබූ මැතිවරණ කොමසාරිස්වරයා අදහස් වේ ;

"අධිකරණය" යන්නෙන්, ශ්‍රේෂ්ඨාධිකරණය අදහස් වේ ;

"රෙජිස්ට්‍රාර්වරයා" යන්නෙන්, ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා අදහස් වේ ; තවද

"පනත" යන්නෙන්, 1981 ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම පිළිබඳ පනත අදහස් වේ.

පෙත්සම් ඉදිරිපත් කිරීමේ පිළිවෙළ.

3. (1) ඡන්ද පෙත්සමක් රෙජිස්ට්‍රාර්වරයාගේ කාර්යාලයේ දී භාර දීමෙන් ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, ලදුපතක් ඉල්ලනු ලැබුවහොත් පෙත්සම භාර දෙනු ලබන රෙජිස්ට්‍රාර්වරයා විසින් හෝ ඔහුගේ දෙපාර්තමේන්තුවේ නිලධරයා විසින්, පහත දැක්වෙන ආකෘතිය අනුව ලදුපතක් දෙනු ලැබිය යුතු ය :—

................................ (පෙත්සම්කරුවන්ගේ නම් ඇතුළත් කරන්න) විසින් ඉත්සන් කරන ලදැයි අදහස් කෙරෙන, ................................ ජනරජයේ ජනාධිපතිවරයා වශයෙන් ඒ. බී. තෝරා පත්කර ගැනීම සම්බන්ධයෙන් වන පෙත්සම 19 ................................ මස ............... දින, ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයාගේ කාර්යාලයේ දී භාර ගන්නා ලදී.

රෙජිස්ට්‍රාර්වරයා.

(2) පෙත්සම සමග එහි පිටපත් දෙකක් ද තැබිය යුතු ය.

ඡන්ද පෙත්සමේ ආකෘතිය.

4. පහත දැක්වෙන ආකෘතිය හෝ ඊට සමාන ආකෘතියක්, ප්‍රමාණවත් වන්නේ ය :—

**ශ්‍රී ලංකා ජනරජයේ ශ්‍රේෂ්ඨාධිකරණයේ දී ය.**

1981 ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම පිළිබඳ පනත

19.................... මස ...................... දින පවත්වනු ලැබූ ජනාධිපති ධුරය සඳහා තෝරා පත්කර ගැනීම.

පහත නම් සඳහන්, ................................ පදිංචි "ඇක්ස්" ගේ (හෝ අවස්ථාවෝචිත පරිදි, ................................ පදිංචි "ඇක්ස්" ගේ සහ ................................ පදිංචි "වයි" ගේ) පෙත්සම.

(1) "ඇක්ස්" නමැති ඔබේ පෙත්සම්කරු යථෝක්ත තෝරා පත්කර ගැනීමේ දී අපේක්ෂකයකු වූ අතර ඒ තෝරා පත්කර ගැනීමේ දී තෝරා පත්කර ගනු ලැබූ බවට ප්‍රකාශ කරනු ලැබීමට හෝ තෝරා පත්කර ගනු ලැබීමට අයිතියක් තිබුණු බවට හිමිකම් කියා සිටියි, නැතහොත් ඒ තෝරා පත්කර ගැනීමේ දී අපේක්ෂකයකුගේ නාම යෝජනා පත්‍රය අත්සන් කළ තැනැත්තෙකි. "වයි" නමැති ඔබේ පෙත්සම්කරු (එක් එක් පෙත්සම්කරුගේ අයිතිය ඒ ආකාරයෙන් මෙහි සඳහන් කරන්න.)

(2) තවද, ඒ.බී., සී.ඩී., සහ ඊ.ඇෆ්. අපේක්ෂකයන් වශයෙන් ඇතිව 19.............. මස ............... දින තෝරා පත්කර ගැනීම පවත්වන ලද බවත්, ඒ. බී. නිසි පරිදි තෝරා පත් කරන ලද බව කොමසාරිස්වරයා විසින් ප්‍රකාශ කර ඇති බවත් ඔබේ පෙත්සම්කරුවෝ ප්‍රකාශ කර සිටිති.

(3) (පෙත්සම්කරුවන් විසින් පදනම් කර ගනු ලබන කරුණු සහ හේතු මෙහි සඳහන් කරන්න.) බව ඔබේ පෙත්සම්කරුවෝ කියා සිටිති.

එහෙයින් එකී ඒ. බී. යථා පරිදි තෝරා පත්කර ගනු නොලැබූ බව හෝ යථා පරිදි තෝරා පත්කර ගනු ලැබූ බව ප්‍රකාශ කර නොමැති බව හා තෝරා පත් කර ගනු ලැබීම ශූන්‍ය බව (හෝ එකී ඊ.එෆ්. යථා පරිදි තෝරා පත්කරගනු ලැබූ බව හා තෝරා පත්කරගනු ලැබූ බව ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ බව හෝ අවස්ථාවෝචිත පරිදි) තීරණය කරන ලෙස ඔබගේ පෙත්සම්කරුවෝ අයදිති.

අත්සන් කළේ, එක්ස්.
වයි.

එකම තෝරා පත් කර ගැනීම සම්බන්ධයෙන් එකකට වැඩි සංඛ්‍යාවක් පෙත්සම් ඉදිරිපත් කොට තිබෙන අවස්ථාවක.

5. එකම තෝරා පත්කර ගැනීම හෝ තෝරා පත් කර ගනු ලැබූ බව ප්‍රකාශ කිරීම සම්බන්ධයෙන් පෙත්සම් එකකට වැඩි සංඛ්‍යාවක් ඉදිරිපත් කරනු ලැබ ඇති අවස්ථාවක, ඒ පිළිබඳ විභාග කිරීම සම්බන්ධයෙන් ඒ සියලු පෙත්සම් එක් පෙත්සමක් ලෙස සලකා කටයුතු කරනු ලැබිය යුතු ය.

පරාජිත අපේක්ෂකයා විසින් ධුරයට හිමිකම් පෑන අවස්ථාවක විරෝධතා දක්වන ඡන්ද පිළිබඳ ලැයිස්තුව.

6. පෙත්සම්කරුවකු විසින් පරාජිත අපේක්ෂකයකු වෙනුවෙන් ධුරයට හිමිකම් පානු ලබන අවස්ථාවක, තෝරා පත්කර ගැනීම හෝ තෝරා පත්කර ගනු ලැබූ බව ප්‍රකාශ කිරීම පිළිබඳ පැමිණිලි කරන හෝ ආරක්ෂා කරන පාර්ශ්වය විසින්, විභාගය සඳහා නියමිත දිනයට දින හයකට පෙර රෙජිස්ට්‍රාර්වරයාට හා අවසථා වෝචිත පරිදි, පෙත්සම්කරු හා වගඋත්තරකරු විසින් ලිපිනයන් දී ඇත් නම්, ඒ ලිපිනයන්ට ද විරෝධතා දැක්වීමට අදහස් කොට ඇති ඡන්ද හා ඒ එක් එක් ඡන්දය සම්බන්ධයෙන් වූ විරෝධතා ශීර්ෂ පිළිබඳ ලැයිස්තුවක් භාර දෙනු ලැබිය යුතු අතර, රෙජිස්ට්‍රාර්වරයා විසින්, ඒ ලැයිස්තු පරීක්ෂා කිරීමට අවසරය හා ඒ ලැයිස්තුවල කාර්යාල පිටපත් අදාළ සියලු පාර්ශ්වයන්ට දිය යුතු ය; ලැයිස්තුව සංශෝධනය කිරීම, විභාගය කල් දැමීම හා ගාස්තු ගෙවීම් සම්බන්ධයෙන් එසේ කරනු ලැබිය හැකි නියමයන් මත, අධිකරණයේ අවසරය ඇතිව හැර, ලැයිස්තුවෙහි සඳහන් කර නැති යම් ඡන්දයක වලංගු භාවයට විරුද්ධව හෝ යම් විරෝධතා ශීර්ෂයක් මත හෝ කිසිම සාක්ෂියක් නොදෙනු ලැබිය යුතු ය.

ප්‍රතිවිරුද්ධ නඩුවක දී විරෝධතා ලැයිස්තුව.

7. අයථා තෝරා පත් කර ගැනීම් ප්‍රකාශයක් පිළිබඳව පැමිණිලි කරන සහ යම් තැනැත්තකු සඳහා ධුරයට හිමිකම් පාන පෙත්සමක වගඋත්තරකරු විසින්, ඒ තැනැත්තා තෝරා පත්කර ගැනීම අයථා බව ඔප්පු කිරීමට සාක්ෂි ඉදිරිපත් කරනු ලැබිය හැකි ය; එවැනි අවස්ථාවක දී, නඩු විභාගය සඳහා නියම කරනු ලැබ ඇති දිනයට දින හයකට පෙර ඒ වගඋත්තරකරු විසින්, රෙජිස්ට්‍රාර්වරයා වෙත ද පෙත්සම්කරු විසින් යම් ලිපිනයක් දී ඇත් නම්, ඒ ලිපිනයට ද, එම තෝරා පත්කර ගැනීම සම්බන්ධයෙන් තමා ආධාර කර ගැනීමට අදහස් කරන විරෝධතා ලැයිස්තුවක් භාර දිය යුතු අතර, එම විරෝධතාවල කාර්යාල පිටපත් පරීක්ෂා කිරීමට, රෙජිස්ට්‍රාර්වරයා විසින් අදාළ සියලු පාර්ශ්වකරුවනට ඉඩ දෙනු ලැබිය යුතු ය. අධිකරණයේ අවසරය ඇතිව සහ ලැයිස්තුවෙහි සංශෝධන, විභාගය කල් තැබීම සහ ගාස්තු ගෙවීම පිළිබඳව නියම කරනු ලැබිය හැකි නියමයන් අනුව මිස, කිසිදු වගඋත්තරකරුවකු විසින්, ලැයිස්තුවෙහි සඳහන්ව නොමැති, තෝරා පත්කර ගැනීම පිළිබඳ වූ යම් විරෝධතාවක් සම්බන්ධයෙන් සාක්ෂි ඉදිරිපත් නොකරනු ලැබිය යුතු ය.

පෙත්සම්කරු විසින් නියෝජිතයකු පත් කිරීම.

8. පෙත්සම සමග පෙත්සම්කරු හෝ පෙත්සම්කරුවන් විසින් අවස්ථාවෝචිත පරිදි ඔහුගේ හෝ ඔවුන්ගේ නියෝජිතයා ලෙස ක්‍රියා කිරීමට ඔහු හෝ ඔවුන් විසින් බලය දෙනු ලබන නීතිඥවරයකු ලෙස කටයුතු කිරීමට සුදුසුකම් ලත් යම් තැනැත්තකුගේ නම සඳහන් කරමින් නැතහොත් ඔහු හෝ ඔවුන් තමා හෝ තමන් වෙනුවෙන් ක්‍රියා කරන බව ප්‍රකාශ කරමින් හා ඒ කවර අවස්ථාවක දී වුව ද, දැන්වීම් යවනු ලැබිය හැකි කොළඹ නගරය තුළ පිහිටි ලිපිනයක් සඳහන් කරමින්, ඔහු හෝ ඔවුන් විසින් අත්සන් කරන ලද ලියවිල්ලක් රෙජිස්ට්‍රාර්වරයාගේ කාර්යාලයෙහි තබනු ලැබිය යුතු ය; එවැනි ලියවිල්ලක් යවනු නොලැබී නම් හෝ ලිපිනයක් නොදෙනු ලැබී නම්, සියලු දැන්වීම් රෙජිස්ට්‍රාර්වරයාගේ කාර්යාලයෙහි තැබීමෙන් කරනු ලැබිය හැකි ය. ඒ සෑම ලියවිල්ලක් මත ම, තත්කාලයෙහි බල පවත්නා නීතිය යටතේ ඒ සඳහා ගෙවිය යුතු මුද්දර ගාස්තු අනුව මුද්දර අලවා තිබිය යුතු ය.

වගඋත්තරකරු විසින් නියෝජිතයකු පත් කිරීම

9. ජනාධිපතිවරයා වශයෙන් තෝරා පත්කරගනු ලැබූ බව ප්‍රකාශ කරන ලද තැනැත්තා විසින්, ඔහු එසේ තෝරා පත්කර ගනු ලැබූ බව ප්‍රකාශ කරනු ලැබීමෙන් පසු යම් අවස්ථාවක, ඔහුට විරුද්ධව ඡන්ද පෙත්සමක් ඉදිරිපත් කරනු ලැබ ඇතොත් තම නියෝජිතයා ලෙස ක්‍රියා කිරීම පිණිස, නීතිඥවරයකු වශයෙන් කටයුතු කිරීමට සුදුසුකම්ලත් තැනැත්තකු පත් කරමින් හෝ තමා වෙනුවෙන් තමා ම ක්‍රියා කිරීමට අදහස් කරන බව ප්‍රකාශ කරමින්, ඒ කවර අවස්ථාවක වුව ද, ඔහුට යවනු ලබන දැන්වීම් යැවිය හැකි කොළඹ නගරය තුළ පිහිටි ලිපිනයක් සඳහන් කරමින් තමා විසින් හෝ වෙනුවෙන් අත්සන් කළ ලියවිල්ලක් රෙජිස්ට්‍රාර්වරයාගේ කාර්යාලයට යැවීම හෝ එහි තැබීම කරනු ලැබිය හැකි අතර, එවැනි ලියවිල්ලක් නොයවනු ලැබී නම් හෝ ලිපිනයක් නොදෙනු ලැබී නම් සියලු දැන්වීම් දීම හා නඩු කටයුතු භාරදීම රෙජිස්ට්‍රාර්වරයාගේ කාර්යාලයේ තැබීමෙන් කරනු ලැබිය හැකි ය. ඒ සෑම ලියවිල්ලක් මත ම තත්කාලයෙහි බල පවත්නා නීතිය යටතේ ඒ සඳහා ගෙවිය යුතු මුද්දර ගාස්තු අනුව මුද්දර ඇලවිය යුතු ය.

රෙජිස්ට්‍රාර්වරයා විසින් නියෝජිතයන්ගේ නම් හා ලිපිනයන් සහිත පොතක් පවත්වා ගෙන යා යුතු බව.

10. රෙජිස්ට්‍රාර්වරයා විසින්, 8 වන රීතිය හෝ 9 වන රීතිය යටතේ දෙන ලද නියෝජිතයන්ගේ සියලු නම් සහ ලිපිනයන් ඇතුළත් කළ යුතු පොතක් තම කාර්යාලයේ පවත්වාගෙන යාමට සලස්වනු ලැබිය යුතු අතර, ඒ පොත, ඔහුගේ කාර්යාලීය වේලාව තුළ දී යම් තැනැත්තකු විසින් පරීක්ෂා කරනු ලැබීමට ඉඩ දිය යුතු ය.

ඡන්ද පෙත්සමේ ගාස්තු ආදිය සඳහා පෙත්සම්කරු විසින් ඇප තැබිය යුතු බව.

11. (1) පෙත්සම ඉදිරිපත් කරන අවස්ථාවේ දී නැතහොත් ඉන් පසු දින තුනක් ඇතුළත, පෙත්සම්කරු විසින් ගෙවනු ලැබිය හැකි සියලු ගාස්තු, අය කිරීම් සහ වියදම් ගෙවීම සඳහා පෙත්සම්කරු වෙනුවෙන් රුපියල් විසිදහසක මුදලක මූලික ඇපයක් තබනු ලැබිය යුතු ය.

(2) ඡන්ද පෙත්සමක් විභාග කරනු ලබන කාලය තුළ යම් අවස්ථාවක අධිකරණය විසින් පෙත්සම්කරු විශ්වාසය තබන එක් එක් පැහැදිලි හේතුවක් සංයුක්ත වන චෝදනා සංඛ්‍යාව නිශ්චය කොට, පෙත්සම්කරු විසින් ගෙවනු ලැබිය හැකි සියලු ගාස්තු, අය කිරීම් සහ වියදම් ගෙවීම සඳහා ඒ එක් එක් චෝදනාව සඳහා රුපියල් පන්දහසක් බැගින් ගණන් බලනු ලැබූ අතිරේක ඇපයක් තබන ලෙස පෙත්සම්කරුට අණ කළ හැකි ය. මේ ඡේදය යටතේ නියම කරන ලද ඇපය, ඒ නිශ්චය කිරීම කරන ලද දින සිට දින තුනක් ඇතුළත පෙත්සම්කරු වෙනුවෙන් ගෙවනු ලැබිය යුතු ය.

(3) (1) වන හෝ (2) වන ඡේදයෙහි සඳහන් ඇපය මුදල් තැන්පත් කිරීමකින් දෙනු ලැබිය යුතු ය.

(4) මේ රීතියෙන් විධිවිධාන සලසා ඇති පරිදි වූ ඇපය පෙත්සම්කරු විසින් දෙනු නොලැබුවේ නම්, පෙත්සම සම්බන්ධයෙන් වැඩිදුර නඩු කටයුතු කර ගෙන යනු නොලැබිය යුතු අතර, පෙත්සම ප්‍රතික්ෂේප කිරීම සහ වගඋත්තරකරුගේ ගාස්තු ගෙවීම සඳහා විධාන කරන ආඥාවක් සඳහා වගඋත්තරකරු විසින් අධිකරණය වෙත ඉල්ලීමක් කළ හැකි ය. ඒ ඉල්ලීම විභාග කිරීමේ සහ තීරණය කිරීමේ ගාස්තුව අධිකරණය විසින් ආඥා කරනු ලබන පරිදි ගෙවිය යුතු අතර එවැනි ආඥාවක් නොකරනු ලැබුවහොත් ඒ ගාස්තු පෙත්සමේ සාමාන්‍ය ගාස්තුවල කොටසක් විය යුතු ය.

(5) පෙත්සම පිළිබඳව පවත්වන ලද නඩු කටයුතු අවසන් වූ විට, (1) වන ඡේදය යටතේ නැතහොත් (1) වන සහ (2) වන ඡේද යටතේ තැන්පත් කරන ලද ඇපයෙන් අධිකරණය විසින් නිශ්චය කරන ලද පරිදි පෙත්සම්කරු විසින් විශ්වාසය තබන එක් එක් පැහැදිලි හේතුව සංයුක්ත වන එක් එක් චෝදනාව සඳහා රුපියල් පන්දහස බැගින් ගණන් බලනු ලැබූ මුදලක් අඩු කිරීමෙන් පසු ඉතිරිව ඇති මුදල අධිකරණය විසින් පෙත්සම්කරුට ආපසු ගෙවනු ලැබිය යුතු ය.

මුදල් තැන්පත් කිරීමෙන් තබන ඇපය.

12. (1) පෙත්සම්කරු විසින් ගෙවිය යුතු වන ගාස්තු, අයකිරීම් හා වියදම් ගෙවීම් සඳහා ඇප වශයෙන් මුදල් තැන්පත් කිරීම, රෙජිස්ට්‍රාර්වරයා වෙත ගෙවීමෙන් කරනු ලැබිය යුතු අතර ඒ තැන්පතු අග්‍ර විනිශ්චයකාරවරයා වෙත සතුවිය යුතු ය. තව ද මේ රීතිවලින් ඇපයක් අවශ්‍ය යයි නියම වී ඇත්තේ කවර කාර්ය සඳහා ද ඒ කාර්ය සඳහා අග්‍ර විනිශ්චයකාරවරයා විසින් කලින් කල ආපසු ගත යුතු ය. ඒ සඳහා රෙජිස්ට්‍රාර්වරයා විසින් ලදුපතක් නිකුත් කරනු ලැබිය යුතු ය.

(2) රෙජිස්ට්‍රාර්වරයා විසින්, අදාළ සියලු පාර්ශ්වයන් විසින් පරීක්ෂා කර බැලීම සඳහා විවෘත පොතක් පවත්වා ගෙන යා යුතු අතර, එහි කලින් කලට මුදල් ප්‍රමාණය හා එය අදාළ වන පෙත්සම සටහන් කරනු ලැබිය යුතු ය.

එසේ තැන්පත් කළ මුදල ආපසු දීම.

13. (1) එසේ තැන්පත් කළ මුදල්, ඒ ගාස්තු, අයකිරීම් හා වියදම් ගෙවීම සහතික කිරීම සඳහා තවදුරටත් අවශ්‍ය නොවන්නේ නම් හා එසේ අවශ්‍ය නොවන විට, අග්‍ර විනිශ්චයකාරවරයාගේ ආඥාවක් මගින් නියම කරනු ලබන පරිදි යුක්ති යට අනුව ආපසු දීම හෝ අන්‍යාකාරයෙන් බැහැර කිරීම කරනු ලැබිය යුතු ය.

(2) එවැනි ආඥාවක් ඉල්ලීමට අදහස් කිරීම පිළිබඳව දැනුම් දීම හා සියලු සාධාරණ හිමිකම් පෑම් පියවීම හෝ අන්‍යාකාරයෙන් ප්‍රමාණවත් ලෙස ප්‍රතිපාදනය කිරීම අග්‍ර විනිශ්චයකාරවරයා නියම කරන පරිදි කරනු ලැබූ විට එවැනි ආඥාවක් කරනු ලැබිය හැකි ය.

(3) නැත්පත් කිරීම කරන ලද්දේ යම් තැනැත්තකුගේ නමට නම් ඒ තැනැත්තාට හෝ එය ලැබීමට හිමිකම් ඇති යම් තැනැත්තකුට හෝ ගෙවීම කරන ලෙස ඒ ආඥාව මගින් විධාන කරනු ලැබිය හැකි ය.

14. (1) පෙත්සමක් ඉදිරිපත් කිරීම පිළිබඳ දැන්වීම, එහි පිටපතක් සමග, පෙත්සම ඉදිරිපත් කොට දින දහයක් ඇතුළත— | වගඋත්තරකරු වෙත පෙත්සම පිළිබඳ දැන්වීම හා පෙත්සමේ පිටපත භාරදීම.

(අ) පෙත්සම්කරු විසින් වගඋත්තරකරුට භාර දෙනු ලැබිය යුතු ය; නැත හොත්

(ආ) වගඋත්තරකරු වෙත භාර දෙනු ලැබීම සඳහා රෙජිස්ට්‍රාර්වරයාගේ කාර්යාලයට භාරදිය යුතු අතර, ලදුපතක් ඉල්ලා සිටිනු ලැබුවහොත් ඒ දැන්වීම හා පිටපත භාර දෙනු ලැබූ රෙජිස්ට්‍රාර්වරයා හෝ ඔහුගේ දෙපාර්තමේන්තු නිලධරයා විසින්, අග්‍ර විනිශ්චයකාරවරයා විසින් අනුමත කරනු ලබන ආකෘතියකින් ලදුපතක් නිකුත් කරනු ලැබිය යුතු ය.

(2) පෙත්සමක් ඉදිරිපත් කිරීම පිළිබඳ දැන්වීම හා එහි පිටපතක් (1) වන ඡේදය යටතේ පෙත්සම්කරු විසින් වගඋත්තරකරුට භාරදීම, 9 වන රීතිය යටතේ වගඋත්තරකරු විසින් පත් කරන ලද නියෝජිතයාට ඒ දැන්වීම හා පිටපත භාරදීම මගින් හෝ 9 වන රීතිය යටතේ දෙන ලද ලිපිනයට සාමාන්‍ය තැපැල් කටයුතුවල දී, ඉහත සඳහන් කාලසීමාව තුළ දී ලිපිය ලැබිය හැකි වන පරිදි වූ වේලාවක දී ලියාපදිංචි ලිපියක් මගින් තැපැලෙන් යැවීමෙන් නැතහොත්, ඒ පෙත්සම ඉදිරිපත් කොට ඇති බව හා වගඋත්තරකරු විසින් රෙජිස්ට්‍රාර්වරයාගේ කාර්යාලයෙන් ඉල්ලීමක් කිරීමෙන් එහි පිටපත් ලබා ගත හැකි බව ප්‍රකාශ කරමින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දැන්වීමක් මගින් කරනු ලැබිය හැකි ය.

(3) පෙත්සමක් ඉදිරිපත් කිරීම පිළිබඳ දැන්වීම, පෙත්සමේ පිටපතක් සමග වගඋත්තරකරු වෙත භාරදෙනු පිණිස (1) වන ඡේදය යටතේ රෙජිස්ට්‍රාර්වරයාගේ කාර්යාලයට දෙනු ලැබූ අවස්ථාවක, ඒ භාරදීම, අධිකරණයක් විසින් නිකුත් කරන ලද දැන්වීමක් භාරදීම සිවිල් නඩු විධාන සංග්‍රහය යටතේ ක්‍රියාත්මක කරනු ලබන ආකාරයෙන්ම ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

15. පෙත්සම් ඉදිරිපත් කිරීම සඳහා සීමා කරන ලද කාලය ගෙවී යාමෙන් ඉක්බිතිව, පෙත්සම විවාදයට භාජනව ඇති සේ සලකනු ලැබිය යුතු ය. | පෙත්සම විවාදයට භාජන වූ සේ සැලකිය යුතු අවස්ථාව.

16. රෙජිස්ට්‍රාර්වරයා විසින් ඡන්ද පෙත්සම් ලැයිස්තුව සකස් කරනු ලැබිය යුතු ය. ඔහු විසින්, පිළිවෙලින් 8 වන රීතිය හා 9 වන රීතිය යටතේ පත් කරන ලද, පෙත්සම්කරුවන්ගේ හා වගඋත්තරකරුවන්ගේ නියෝජිතයන්ගේ නම් හා දැන්වීම් යැවිය යුතු ලිපිනයන් තිබේ නම් ඒ ලිපිනයන් ද එහි ඇතුළත් කරනු ලැබිය යුතු ය. ඒ ලැයිස්තුව, කාර්යාල වේලාවන් තුළ යම් වේලාවක දී රෙජිස්ට්‍රාර්වරයාගේ කාර්යාලයේ දී පරීක්ෂා කරනු ලැබිය හැකි අතර, ඒ කාර්ය සඳහා, පනත යටතේ නඩු කටයුතු සඳහා වෙන් කරන ලද "1981 ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම පිළිබඳ පනත" යන ශීර්ෂය යටතේ වූ දැන්වීම් පුවරුවක් මත ඒ ලැයිස්තුව අලවනු ලැබිය යුතු ය. | පෙත්සම් ලැයිස්තුව.

17. එක් එක් ඡන්ද පෙත්සම විභාග කිරීමේ වේලාව හා ස්ථානය, පනතේ 97 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, අධිකරණය විසින් නියම කරනු ලැබිය යුතු අතර ඒ පිළිබඳ දින දාහතරකට නොඅඩු කාලයක දැන්වීමක් පෙත්සම්කරු හෝ වගඋත්තරකරු විසින් රෙජිස්ට්‍රාර්වරයා වෙත තබන ලද ලිපිනයට යොමු කරනු ලබන ලිපියක් මගින් හෝ එසේ ලිපිනයක් තබා නොමැති නම්, ගැසට් පත්‍රයෙහි පළකරනු ලබන දැන්වීමක් මගින් පෙත්සම්කරුට හා වගඋත්තරකරුට දෙනු ලැබිය යුතු ය. | ඡන්ද පෙත්සම විභාග කිරීමේ වේලාව හා ස්ථානය

**නඩු විභාගය කල් දැමීම.**

18. අධිකරණය විසින් කලින් කල පෙත්සමේ පාර්ශ්වකරුවකුගේ ඉල්ලීම මත කරනු ලබන ආඥාවක් මගින්, නඩු විභාගයක් ආරම්භ කිරීම අධිකරණය නියම කරන දිනයක් දක්වා කල් දැමිය හැකි ය; තව ද ඒ ආඥාව කරනු ලැබූ විට රෙජිස්ට්‍රාර්වරයා විසින් එය නොපමාව ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු ය.

**නඩු විභාගය අඛණ්ඩව කල් තැබීම හා පවත්වාගෙන යාම.**

19. ඡන්ද පෙත්සමක් විභාග කරන අධිකරණයක විධිමත් අඛණ්ඩව කල් තැබීමක් අවශ්‍ය නොවිය යුතු නමුත්, විභාග කිරීම අවසාන වන තෙක් නඩු විභාගය දිනෙන් දින අඛණ්ඩව කල් තැබූ සේ සලකනු ලබන අතර දිගටම පවත්වා ගෙන යනු ලැබිය හැකි ය. නඩු විභාගය ආරම්භ කරනු ලැබුවේ යම් විනිශ්චයකාරවරයකු ඉදිරිපිට ද ඒ විනිශ්චයකාරවරයා රෝගාතුර වීමේ හේතුවෙන් හෝ අන්‍යාකාරයකින් අශක්‍ය වූ විටක දී අග්‍ර විනිශ්චයකාරවරයා විසින් ඒ විනිශ්චයකාරවරයා වෙනුවට වෙනත් විනිශ්චයකාරවරයකු නම් කරනු ලැබිය යුතු ය.

**ඡන්ද පෙත්සම් ඉල්ලා අස්කර ගැනීම.**

20. (1) අධිකරණයේ අවසරය නොමැතිව ඡන්ද පෙත්සමක් ඉල්ලා අස්කර ගනු නොලැබිය යුතු ය. ඒ අවසරය, ගාස්තු ගෙවීම සම්බන්ධයෙන් හා අන්‍යාකාරයෙන් සුදුසු යයි අධිකරණය අදහස් කරන නියමයක් මත දෙනු ලැබිය හැකි ය.

(2) ඡන්ද පෙත්සමක් ඉල්ලා අස්කර ගැනීම සඳහා අවසරය දීමට පෙර, මේ රීතියෙන් නියම කරනු ලැබ ඇති පරිදි, පෙත්සමේ සියලු පාර්ශ්වකරුවන් හා ඔවුන්ගේ නීතිඥයන් සහ තෝරා පත්කරගනු ලැබීමේ දී අපේක්ෂකයන් වූ සියලු පාර්ශ්වකරුවන් විසින් දිවුරුම් පත්‍ර ඉදිරිපත් කරනු ලැබිය යුතු ය; එහෙත් යම් නිශ්චිත තැනැත්තකු දිවුරුම් පත්‍රයක් ඉදිරිපත් කිරීමෙන් නිදහස් කිරීම විශේෂ කරුණු මත සාධාරණ යයි දක්වන ලද හේතූන් අනුව අධිකරණයට පෙනී යන්නේ නම් අධිකරණය විසින්, එසේ කරනු ලැබිය හැකි ය.

(3) ප්‍රකාශකගේ උපරිම දැනීම හා විශ්වාසය අනුව, පෙත්සම ඉල්ලා අස්කර ගැනීම සම්බන්ධයෙන් කවර වූ හෝ ආකාරයක ගිවිසුමකට හෝ නියමයන්ට එළඹ නොමැති බව හා කිසිම පොරොන්දුවක් ඇති කර ගෙන නොමැති බව එක් එක් දිවුරුම් පත්‍රය මගින් ප්‍රකාශ කරනු ලැබිය යුතු ය; එහෙත්, පෙත්සම ඉල්ලා අස්කර ගැනීම සම්බන්ධයෙන් යම් නීත්‍යනුකූල ගිවිසුමකට එළඹ තිබේ නම් දිවුරුම් පත්‍රයෙහි ඒ ගිවිසුම දක්වා තිබිය යුතු අතර, දිවුරුම් පත්‍රයෙන් පෙනෙන කරුණුවලට සටත්ව ඉහත සඳහන් ප්‍රකාශය කරනු ලැබිය යුතු ය.

(4) ඉල්ලුම්කරුගේ හා ඔහුගේ නීතිඥවරයාගේ දිවුරුම් පත්‍ර මගින්, තවදුරටත්, පෙත්සම ඉල්ලා අස්කර ගැනීමට අදහස් කරන්නේ කවර කරුණු පදනම් කර ගෙන ද යන වග ප්‍රකාශ කරනු ලැබිය යුතු ය.

**පෙත්සම ඉල්ලා අස්කර ගැනීම සඳහා වූ ඉල්ලීමේ ආකෘතිය.**

21. (1) පෙත්සමක් ඉල්ලා අස්කර ගැනීම සඳහා අවසර ඉල්ලීම ලියවිල්ලකින් විය යුතු අතර, පෙත්සම්කරු හෝ ඔහුගේ නියෝජිතයා හෝ පෙත්සම්කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් විසින් අත්සන් කරනු ලැබිය යුතු ය. එහි, ඉල්ලීම සනාථ කරන කරුණු ප්‍රකාශ කරනු ලැබිය යුතු ය.

(2) පහත දැක්වෙන ආකෘතිය ප්‍රමාණවත් විය යුතු ය:—

"1981 ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම පිළිබඳ පනත, 19............... මස ...................... වන දින ඉදිරිපත් කරන ලද (පෙත්සම්කරුගේ නම සඳහන් කරන්න) .................. "එක්ස්" ගේ ............... පෙත්සම පහත දැක්වෙන කරුණු මත (කරුණු ප්‍රකාශ කරන්න) ......... ... ... නම පෙත්සම ඉල්ලා අස්කර ගැනීම සඳහා පෙත්සම්කරු ඉල්ලා සිටියි. තව ද, නම ඉල්ලීම විභාග කිරීම සඳහා දිනයක් නියම කරන මෙන් පෙත්සම්කරු අයැද සිටියි.

19 ..............., මස .................. වන මෙදින දී ය.

(අත්සන් කළේ) ..........................

(3) ඉල්ලා අස්කර ගැනීම සඳහා අවසර ලබා ගැනීම පිණිස වූ ඉල්ලීම රෙජිස්ට්‍රාර්වරයාගේ කාර්යාලයේ තබනු ලැබිය යුතු ය.

22. ඒ ඉල්ලීමේ පිටපතක් පෙත්සම්කරු විසින් වගඋත්තරකරුට දෙනු ලැබිය යුතු අතර, පෙත්සම්කරු විසින් අත්සන් කරන ලද පහත දැක්වෙන ආකාරයේ දැන්වීමක් පෙත්සම්කරු විසින් ඔහුගේ වියදමින් ගැසට් පත්‍රයෙහි වහා ම පළ කරනු ලැබිය යුතු ය:—

ඉල්ලීමේ පිටපතක් වගඋත්තරකරුට දිය යුතු බව.

"1981 ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම පිළිබඳ පනත.

........................ පෙත්සම්කරු වන් නා වූ ද ........................ වගඋත්තරකරුවන් නා වූ ද ඡන්ද පෙත්සම සම්බන්ධයෙනි.

ඉහත සඳහන් පෙත්සම්කරු විසින්, පෙත්සම ඉල්ලා අස්කර ගැනීම සඳහා අවසර ලබා ගැනීම පිණිස ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයාගේ කාර්යාලයට ............... ක් වූ ...............දින ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබූ බවත්, පහත දැක්වෙන්නේ එහි පිටපතක් බවත් මෙයින් දන්වා සිටිනු ලැබේ:—

තව ද, "1981, ජනාධිපති ඡන්ද පෙත්සම් රීති" යටතේ, ඒ තෝරා පත්කර ගැනීම සම්බන්ධයෙන් පෙත්සම්කරුවකු විය හැකිව සිටි යම් තැනැත්තකු විසින්, මේ දැන්වීම ප්‍රසිද්ධ කිරීමේ දිනට පසු දින පහක් තුළ දී, ඉල්ලීම විභාග කිරීමේ දී තමා පෙත්සම්කරුවකු වශයෙන් ආදේශ කරනු ලැබීමට ඇති අභිප්‍රාය ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයාට ලිඛිත දැන්වීමක් මගින් දන්වනු ලැබිය යුතු ය.

(අත්සන් කළේ) ........................"

23. පෙත්සම අදාළ වන තෝරා පත්කර ගැනීම සම්බන්ධයෙන් පෙත්සම්කරුවකු විය හැකිව සිටි යම් තැනැත්තකු විසින්, පෙත්සම්කරු විසින් ඒ දැන්වීම ප්‍රසිද්ධ කරනු ලැබ දින පහක් තුළ දී, පෙත්සම විභාග කිරීමේ දී පෙත්සම්කරුවකු වශයෙන් ආදේශ කරනු ලැබීමට ඇති ඔහුගේ අභිප්‍රාය පිළිබඳ දැන්වීම ඔහු විසින් හෝ ඔහු වෙනුවෙන් අත්සන් කරන ලද ලියවිල්ලක් මගින් රෙජිස්ට්‍රාර්වරයා වෙත දෙනු ලැබිය යුතු ය; එහෙත්, ඇත්ත වශයෙන් ම ඒ ඉල්ලීම, විභාග කිරීමේ දී කරනු ලැබුවේ නම්, ඒ දැන්වීම නොදෙනු ලැබීම හේතු කොටගෙන ඉල්ලීම පරාජය නොවිය යුතු ය.

ඉල්ලා අස්කර ගැනීමේ දී පෙත්සම්කරුවකු වශයෙන් ආදේශ කරනු ලැබීමට ඉල්ලීම.

24. ඉල්ලීම විභාග කරනු ලබන දිනය හා ස්ථානය අධිකරණය විසින් නියම කරනු ලැබිය යුතු වුවත්, ඉල්ලා අස්කර ගැනීමට අවසර ලබා ගැනීම සඳහා වූ ඉල්ලීම මෙහි ඉහත විධිවිධාන සලසා ඇති පරිදි රෙජිස්ට්‍රාර්වරයාගේ කාර්යාලයට ඉදිරිපත් කරනු ලැබීමෙන් සතියකට අඩු කාලයක දී නොවිය යුතු අතර, විභාග කිරීම සඳහා නියම කොට ඇති වේලාව හා දිනය, පෙත්සම්කරුවන් වශයෙන් ආදේශ කරනු ලැබීමට ඉල්ලීම සඳහා වූ අභිප්‍රාය පිළිබඳ දැන්වීම රෙජිස්ට්‍රාර්වරයාට දුන් තැනැත්තකු හෝ තැනැත්තන් සිටී නම් ඒ තැනැත්තාට හෝ තැනැත්තන්ට හා අධිකරණය විධාන කරන වෙනත් ආකාරයකින් හා වේලාවක දී දන්වනු ලැබිය යුතු ය.

ඉල්ලීම විභාග කරන වේලාව හා ස්ථානය.

25. (1) ඉල්ලා අස්කර ගැනීම සඳහා වූ ඉල්ලීම විභාග කිරීමේ දී, පෙත්සම අදාළ වන තෝරා පත්කර ගැනීම සම්බන්ධයෙන් පෙත්සම්කරුවකු විය හැකිව සිටි යම් තැනැත්තකු විසින්, පෙත්සම ඉල්ලා අස්කර ගැනීමට එසේ කැමැත්ත දක්වන පෙත්සම්කරු වෙනුවට පෙත්සම්කරුවකු ලෙස ආදේශ කරනු ලැබීමට අධිකරණය වෙත ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය.

වෙනත් පෙත්සම්කරුවකු ආදේශ කිරීම.

(2) අධිකරණය විසින්, සුදුසු යයි අධිකරණය අදහස් කරන්නේ නම්, එවැනි යම් ඉල්ලුම්කරුවකු පෙත්සම්කරුවකු ලෙස ආදේශ කරනු ලැබිය හැකි අතර, එසේ ම තවදුරටත්, යෝජිත ඉල්ලා අස්කර ගැනීම යම් දූෂිත කේවල් කිරීමක් හෝ ප්‍රතිඥාවක් මගින් පොළඹවනු ලැබ ඇති බව අධිකරණයේ මතය වේ නම්, මුල් පෙත්සම්කරු වෙනුවෙන් දෙන ලද ඇපය ආදේශ කරනු ලැබූ පෙත්සම්කරු විසින් දරනු ලැබිය හැකි යම් ගාස්තුවක් සඳහා ඇපය වශයෙන් තිබිය යුතු බවට හා ඒ ඇපයේ සඳහන් මුදලේ ප්‍රමාණයට ආදේශ කරනු ලැබූ පෙත්සම්කරුගේ ගාස්තු ගෙවීමට මුල් පෙත්සම්කරු බැඳී ඇති බවට ආඥාවක් මගින් විධාන කරනු ලැබිය හැකි ය.

(3) මුල් පෙත්සම්කරු වෙනුවෙන් තබන ලද ඇපය සම්බන්ධයෙන් එවැනි ආඥාවක් නො කරනු ලබන්නේ නම්, අලුත් පෙත්සමක් ඉදිරිපත් කරන අවස්ථාවක නියම කරනු ලැබිය හැකි මුදල් ප්‍රමාණයට හා සමාන කොන්දේසිවලට යටත්ව, ආදේශ කරනු ලැබූ පෙත්සම්කරු වෙනුවෙන්, ඔහු තම පෙත්සම පිළිබඳ කටයුතු කිරීම ආරම්භ කිරීමට පෙර හා ආදේශ කිරීමේ ආඥාව නිකුත් කොට දින තුනක් ඇතුළත, ඇපයක් තබනු ලැබිය යුතු ය.

(4) ඉහත කී විධිවිධානයන්ට යටත්ව, ආදේශ කරනු ලැබූ පෙත්සම්කරුවකු හැකිතාක් දුරට මුල් පෙත්සම්කරු සිටි තත්ත්වයෙන්ම සිටිය යුතු අතර, මුල් පෙත්සම්කරු යටත් වූ බැඳීම්වලට ම යටත් විය යුතු ය.

(5) පෙත්සමක් ඉල්ලා අස් කර ගනු ලැබුවේ නම්, වගඋත්තරකරුගේ ගාස්තු ගෙවීමට පෙත්සම්කරු යටත් විය යුතු ය.

(6) පෙත්සම්කරුවන් එක් අයකුට වැඩි ගණනක් සිටින අවස්ථාවක, සියලුම පෙත්සම්කරුවන්ගේ අනුමතය ඇතිව මිස, පෙත්සමක් ඉල්ලා අස් කර ගැනීමට ඉල්ලීමක් නොකරනු ලැබිය යුතු ය.

ජනාධිපති ධුරය හිස් කිරීම නිසා පමණක් ඡන්ද පෙත්සමක් අහෝසි නොවන බව.

26. ඡන්ද පෙත්සමක්, ඊට විෂය වී ඇත්තේ යම් තැනැත්තකු ජනාධිපති ධුරයට තෝරා පත්කර ගනු ලැබීම ද ඒ තැනැත්තා විසින් ජනාධිපති ධුරය හිස් කිරීම නිසා පමණක් අහෝසි නොවිය යුතු අතර, ඒ අනුව, එසේ ධුරය හිස් කරනු ලබන අවස්ථාවක දී, ඒ ධුරය හිස් නොකරනු ලැබූ පරිද්දෙන්, ඒ පෙත්සම විභාග කිරීම හෝ විභාග කිරීම පවත්වා ගෙන යාම හා තීරණය කිරීම කරනු ලැබිය යුතු ය.

මියයාම නිසා පෙත්සම අහෝසි වීම.

27. (1) ඡන්ද පෙත්සමක්, එකම පෙත්සම්කරුගේ හෝ පෙත්සම්කරුවන් කීපදෙනකු අතුරින් ජීවත්ව සිටින පෙත්සම්කරුගේ මරණය නිසා අහෝසි විය යුතු ය.

(2) පෙත්සමක් අහෝසි වීම, ඊට පෙර දරන ලද ගාස්තු ගෙවීමට පෙත්සම්කරු හෝ වෙනත් යම් තැනැත්තකු යටත් වීම කෙරෙහි බලපෑමක් නොකළ යුතු ය.

අහෝසි වීමේ දී පෙත්සම්කරු වශයෙන් ආදේශ කරනු ලැබීම සඳහා ඉල්ලීම.

28. (1) පෙත්සම්කරුගේ හෝ ජීවත්ව සිටින පෙත්සම්කරුගේ මරණය නිසා පෙත්සමක් අහෝසි වීම පිළිබඳ දැන්වීම, පෙත්සමක් ඉල්ලා අස්කර ගැනීම සඳහා වූ ඉල්ලීමක් පිළිබඳ දැන්වීම කරනු ලබන ආකාරයෙන්ම, සම්බන්ධතාවක් ඇති පාර්ශ්වය හෝ තැනැත්තා විසින් කරනු ලැබිය යුතු අතර, පෙත්සම්කරුවකු වශයෙන් ආදේශ කරනු ලැබීම සඳහා අධිකරණයට ඉල්ලීමක් කරනු ලැබිය යුතු කාලය එක් ලිත් මාසයක් හෝ අධිකරණය විසින් යම් විශේෂ කරුණක් සලකා බැලීම මත ඉඩ දෙනු ලබන තවදුරටත් වූ කාලයක් විය යුතු ය.

(2) පෙත්සම අදාළ වන තෝරා පත්කර ගැනීම සම්බන්ධයෙන් පෙත්සම්කරුවකු විය හැකිව සිටි යම් තැනැත්තකු විසින් පෙත්සම්කරුවකු ලෙස ආදේශ කරනු ලැබීමට අධිකරණයට ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය.

(3) අධිකරණය විසින්, සුදුසු යයි අදහස් කරන්නේ නම්, ආදේශ කරනු ලැබීමට කැමැත්තක් දක්වන්නාවූත්, අලුත් පෙත්සමක් ඉදිරිපත් කිරීමේ දී අවශ්‍ය කෙරෙන මුදල් ප්‍රමාණයට ම තමා වෙනුවෙන් ඇප තබනු ලැබුවාවූත් එවැනි යම් ඉල්ලුම්කරුවකු පෙත්සම්කරුවකු වශයෙන් ආදේශ කරනු ලැබිය හැකි ය.

වගඋත්තරකරු මියයාම, ඉල්ලා අස් වීම හෝ විරුද්ධවීමට අදහස් නොකරන බවට දැන්වීම නොතකා පෙත්සම පවත්නා බව.

29. (1) ඡන්ද පෙත්සමක් විභාග කිරීමට පෙර වගඋත්තරකරුවකු මියගිය හොත් හෝ ඉල්ලා අස් වුවහොත් හෝ, තමා පෙත්සමට විරුද්ධවීමට අදහස් නොකරන බව ලිඛිතව අධිකරණයට දැනුම් දුනහොත් හෝ, පෙත්සම අහෝසි නොවිය යුතු අතර, මෙහි මින් මතු විධිවිධාන සලසා ඇති පරිදි, වගඋත්තරකරු වශයෙන් ඇතුළත් කිරීමට යම් තැනැත්තකු ඉල්ලුම් කරතත් නැතත්, පෙත්සම පැවතිය යුතු ය.

(2) වගඋත්තරකරුවකු මිය ගොස් ඇති බව හෝ ඉල්ලා අස්වී ඇති බව හෝ පෙත්සමට විරුද්ධවීමට තමා අදහස් නොකරන්නේ යයි ඔහු විසින් ලිඛිතව දන්වනු ලැබ ඇති බව පිළිබඳ දැන්වීම රෙජිස්ට්‍රාර්වරයා විසින් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු ය.

(3) ඒ දැන්වීම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබ දින දහයක් තුළ දී හෝ අධිකරණය විසින් ඉඩ දෙනු ලැබිය හැකි තවදුරටත් වන කාලයක් තුළ දී, පෙත්සම අදාළ වන තෝරා පත්කර ගැනීම සම්බන්ධයෙන් පෙත්සම්කරුවකු විය හැකිව සිටි යම් තැනැත්තකු විසින්, පෙත්සමට විරුද්ධවීම සඳහා වගඋත්තර කරුවකු වශයෙන් ඇතුළත් කරනු ලැබීමට අධිකරණයට ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය.

(4) පෙත්සමට විරුද්ධවීමට තමා අදහස් නොකරන බව වගඋත්තරකරු අධිකරණයට දැන්වීම විභාග කිරීම සඳහා නියමිත දිනයට පැහැදිලි දින හයකට කලින් දිනක දී, වගඋත්තරකරු විසින් අත්සන් කරන ලද ලියවිල්ලක් මගින් ඒ පිළිබඳ දැන්වීමක් රෙජිස්ට්‍රාර්වරයාගේ කාර්යාලයේ තබනු ලැබීමෙන් කරනු ලැබිය යුතු ය.

**පෙත්සමට විරුද්ධ නොවන වගඋත්තරකරු පාර්ශ්වයක් වශයෙන් පෙනී නොසිටිය යුතු බව.**

30. තමා පෙත්සමට විරුද්ධවීමට අදහස් නොකරන බව දැනුම් දී ඇති වගඋත්තරකරුවකුට, ඒ පෙත්සම පිළිබඳ යම් නඩු කටයුත්තක දී ඒ පෙත්සමට විරුද්ධව පාර්ශ්වකරුවකු වශයෙන් පෙනී සිටීමට හෝ ක්‍රියා කිරීමට ඉඩ නොදෙනු ලැබිය යුතු ය.

**පෙත්සම අහෝසි වූ අවස්ථාව ආදියෙහි දී විභාග කිරීම පිළිබඳ දැන්වීම ප්‍රතිනියෝග කිරීම.**

31. පෙත්සම ඉල්ලා අස්කර ගැනීමට අවසර ලබා ගැනීම සඳහා පෙත්සම්කරුගේ ඉල්ලීම හෝ පෙත්සමට විරුද්ධවීමට වගඋත්තරකරු අදහස් නොකරන බවට වූ දැන්වීම හෝ මරණය හේතුකොටගෙන පෙත්සම අහෝසිවීම පිළිබඳ දැන්වීම හෝ 29 වන රීතියෙහි සඳහන් යම් සිදුවීමක් පිළිබඳ දැන්වීම හෝ ලැබීමෙන් පසු, ඒ දැන්වීම ලැබුයේ විභාග කිරීම පිළිබඳ දැන්වීම කරනු ලැබූ පසු හා විභාග කිරීම ආරම්භ කිරීමට පෙර නම්, රෙජිස්ට්‍රාර්වරයා විසින් වහාම විභාග කිරීම පිළිබඳ දැන්වීම ප්‍රතිනියෝග කරනු ලැබිය යුතු ය. ප්‍රතිනියෝග කිරීම පිළිබඳ දැන්වීම හැකිතාක් දුරට විභාග කිරීම පිළිබඳ දැන්වීම කළ ආකාරයෙන් ම කරනු ලැබිය යුතු ය.

**ගාස්තු.**

32. පෙත්සමක් ඉදිරිපත් කිරීමේ හා ඊට ආනුෂංගික සියළු ගාස්තු හා පෙත්සම හා සම්බන්ධ නඩු කටයුතුවල හා ඊට ආනුෂංගික සියලු ගාස්තු, පෙත්සම්කරුගේ හෝ වගඋත්තරකරුගේ පීඩාකාරී චර්යා පදනම් රහිත චෝදනා හෝ පදනම් රහිත විරෝධතා හේතුකොට වූ, බවට අධිකරණයේ මතය වන යම් ගාස්තුවකට ඉඩ නොදීම කෙරෙහි සැලකිල්ල දක්වමින් ද අනවශ්‍ය වියදම් ඇති කරනු ලැබුවේ යම් පාර්ශ්වකරුවන් විසින් ද, ඒ පාර්ශ්වකරුවන් සමස්තයක් වශයෙන් ජය ලැබුවත් නැතත්, ඒ වියදම් ගෙවීමේ බර ඒ පාර්ශ්වකරුවන් මත තැබීමෙන් යම් අනවශ්‍ය වියදමක් දැරීම අධෛර්ය කිරීම කෙරෙහි සැලකිල්ල දක්වමින් ද අධිකරණය විසින් නිශ්චය කරනු ලබන ආකාරය හා අනුපාතයන් අනුව පෙත්සමේ පාර්ශ්වකරුවන් විසින් ගෙවනු ලැබිය යුතු ය.

**ගාස්තු තක්සේරු කිරීම හා අයකර ගැනීම.**

33. (1) ගාස්තු නියම කරන ආඥාව කිරීම මත එහි සඳහන් ආකාරයට රෙජිස්ට්‍රාර්වරයා විසින්, ගාස්තු තක්සේරු කරනු ලැබිය යුතු ය ; ගාස්තු තක්සේරු කරනු ලැබූ පසු නඩුවක ගාස්තු අයකර ගනු ලබන ආකාරයෙන් ම, අයකර ගනු ලැබිය හැකි ය.

(2) 11 වන රීතියෙහි හා 12 වන රීතියෙහි විධිවිධාන යටතේ ඇපයක් වශයෙන් තැන්පත් කරන ලද යම් මුදලක කොටසක් හෝ මුළු මුදලම තක්සේරු කරන ලද ගාස්තු ගෙවීම සඳහා යොදන ලෙස අග්‍ර විනිශ්චයකාරවරයා විසින් විධාන කරනු ලැබිය හැකි ය.

(3) මේ රීති යටතේ වූ පරීක්ෂා කිරීම, කාර්යාල පිටපත් හා වෙනත් කටයුතු සඳහා ගෙවිය යුතු කාර්යාල ගාස්තු අග්‍ර විනිශ්චයකාරවරයා විසින් නියම කරනු ලබන පරිදි විය යුතු ය.

**නීතිඥවරයකුට මේ රීති යටතේ නියෝජිතයකු වශයෙන් ක්‍රියා කළ හැකි බව.**

34. නීතිඥවරුන්ගේ නාමාවලියෙහි තම නාමය ඇතුළත් වන යම් තැනැත්තකුට ඡන්ද පෙත්සමක යම් පාර්ශ්වකරුවකුගේ නියෝජිතයා ලෙස ක්‍රියා කළ හැකි ය.

**නියෝජිතයා පත්කිරීම පිළිබඳ දැන්වීම.**

35. නියෝජිතයකු විසින්, තමා එසේ පත් කරනු ලැබූ වහාම, ඒ පිළිබඳ ලිඛිත දැන්වීම රෙජිස්ට්‍රාර්වරයාගේ කාර්යාලයෙහි තබනු ලැබිය යුතු ය.

**දැන්වීම්** නියෝජිතයන්ට භාරදීම.

36. දැන්වීම් හා කටයුතු ඒ නියෝජිතයන් වෙත භාරදීම සියලු කාර්යයන් සඳහා ප්‍රමාණවත් විය යුතු ය.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත් වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 30 කි. (විදේශීය) රු. 40 කි, කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.